# දෙවැනි කොටස

# දෙවැනි කොටස
# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

**පිටුව**


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 87 |
| 3. | බැංකු විදු පියෙස | 90 |
| 4. | සන්නිවේදන | 91 |
| 5. | ව්‍යවහාර මුදල් | 93 |
| 6. | දේශීය මෙහෙයුම් කටයුතු | 95 |
| 7. | ආර්ථික පර්යේෂණ | 99 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 103 |
| 9. | පහසුකම් කළමනාකරණ | 106 |
| 10. | මූල්‍ය කටයුතු | 106 |
| 11. | මූල්‍ය පාරිභෝගික සබඳතා | 108 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 109 |
| 13. | විදේශ විනිමය | 111 |
| 14. | විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම් | 115 |
| 15. | මානව සම්පත් | 116 |
| 16. | තොරතුරු තාක්ෂණ | 123 |
| 17. | අභ්‍යන්තර විගණන | 125 |
| 18. | ජාත්‍යන්තර මෙහෙයුම් | 126 |
| 19. | නීති හා අනුකූලතා | 128 |
| 20. | සාර්ව විචක්ෂණතා අධ්‍යයන | 129 |
| 21. | ගෙවීම් සහ පියවීම් | 131 |
| 22. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 134 |
| 23. | රාජ්‍ය ණය | 134 |
| 24. | ප්‍රාදේශීය සංවර්ධන | 137 |
| 25. | නිරාකරණ හා බලගැන්වීම් | 142 |
| 26. | අවදානම් කළමනාකරණ | 144 |
| 27. | ලේකම් දෙපාර්තමේන්තුව | 145 |
| 28. | ආරක්ෂක සේවා | 146 |
| 29. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 146 |
| 30. | සංඛ්‍යාන | 147 |
| 31. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | 150 |

# 1. ගිණුම්කරණ සහ මූල්‍ය

**2022 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළ, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ක්‍රියාකාරී වාර්තාව**

**1. හැඳින්වීම**

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩල අනු කමිටුවකි. එය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද උපදේශන විගණන කමිටු රාමුව මගින් පාලනය වන අතර, ඒ අනුව මෙම ක්‍රියාකාරී වාර්තාවේ අන්තර්ගතය සැකසී ඇත. මෙම කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණුවලට අදාළ ප්‍රතිපත්ති පිළිබඳව මුදල් මණ්ඩලයට නිර්දේශ ලබා දීම සිදු කරයි.

**2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය**

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපතීත්වය මුදල් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු විසින් දරනු ලබන අතර, සෙසු සාමාජිකයන් ලෙස විගණන/ගණකාධිකරණ වෘත්තීයවේදීහු දෙදෙනෙකු කටයුතු කරති.

2022 වර්ෂය තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) ආචාර්ය රාණි ජයමහ - සභාපතිනිය

ii) අනුෂා අයි. මොහොට්ටි මහත්මිය - සාමාජිකා

iii) ඒ. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා - සාමාජික

මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධුරය දරනු ලබන අතර, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කමිටුවේ සහකාර ලේකම් ධුරය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කමිටුවේ ලේඛන කටයුතු සඳහා පහසුකම් සපයයි. මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරී මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී, නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී වෙති. කමිටුව විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත සාකච්ඡා සඳහා සහ විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය වූ විට ආරාධනා කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේ දී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමට පත් කරන ලද විගණන ආයතනයේ හවුල්කරු ද ආරාධනාව පරිදි කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වරක් රැස්විය යුතු ය. කමිටුවේ ලේකම් විසින් සභාපතිනියගේ අනුමැතිය සහිතව මුදල් මණ්ඩලයේ, බාහිර විගණකයන්ගේ/ප්‍රධාන ගණකාධිකාරීගේ හෝ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ සහ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරීවරයාගේ ඉල්ලීම පරිදි කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපතිනිය ඇතුලුව සාමාජිකයින් දෙදෙනෙකි.

**3.** කමිටුව 2022.01.01 දින සිට 2023.03.31 දින දක්වා රැස්වීම් දහනවයක් (19) (2022 වර්ෂය තුළදී රැස්වීම් පහළොවක් සහ 2023 වර්ෂය තුළ දී රැස්වීම් හතරක්) පවත්වන ලදී. 2022 සහ 2023 වර්ෂයන්හී දී පහත සඳහන් කාර්යයන් එම රැස්වීම්වල දී ඉටු කොට ඇත.

3.1 **2022 වර්ෂය තුළ දී උපදේශන විගණන කමිටුව විසින් සිදු කළ කාර්යයන් පහත සඳහන් වෙයි.**

3.1.1. **මූල්‍ය වාර්තාකරණය සහ බාහිර විගණනය**

කමිටුව විසින්,

i) 2021.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය ට අදාළව KPMG ආයතනය විසින් ඉදිරිපත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය, අවසන් කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර,

ii) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන,

iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියට අනුකූලව 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව සහ ඒ සඳහා වූ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර,

iv) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

v) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව,

vi) 2021.12.31 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් පහේ (05) (විශ්‍රාම අරමුදල, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල, නව විශ්‍රාම අරමුදල, නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල) මූල්‍ය ප්‍රකාශන,

vii) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

viii) ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් E & Y ආයතනයේ විගණන සැලැස්ම, සමාලෝචනය කරන ලදී.

**3.1.2. අභ්‍යන්තර පාලනයන්**

කමිටුව විසින්,

i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කර අවශ්‍ය උපදේශයන් සපයන ලදී.

ii) අදාල පාර්ශවකරුවන් විසින් කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

**3.1.3. අභ්‍යන්තර විගණනය**

කමිටුව විසින්,

i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අභ්‍යන්තර විගණනයන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම,

ii) ක්‍රියාවලි හිමිකරුවන් විසින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය සමාලෝචනය කිරීම,

iii) 2022 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම සහ නැවත තක්සේරු කිරීම,

iv) 2023 - 2026 කාලපරිච්ඡේදය සඳහා වන උපාය මාර්ගික විගණන සැලැස්ම සහ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම නිර්දේශ කිරීම,

v) 2021 වසර සඳහා වූ අඛණ්ඩ ප්‍රගති අධීක්ෂණයන් (Ongoing Monitoring of Performance) සහ කාලානුරූප ස්වයං තක්සේරුකරණයන් (Periodic Self-Assessment) හි වාර්තා සමාලෝචනය කිරීම,

vi) සංශෝධිත අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රය නිර්දේශ කිරීම,

vii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආරක්ෂණ තක්සේරුව (Safeguards Assessment of International Monetary Fund) සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම.

**3.2 උපදේශන විගණන කමිටුව විසින් 2022 මූල්‍ය වාර්තාවලට අදාලව 2023 වසරේ දී සිදු කළ කාර්යයන් පහත දැක්වේ.**

i) 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා E & Y ආයතනය විසින් නිකුත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය,

ii) 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

iii) 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, සමාලෝචනය කරන ලදී.

## 2022 මූල්‍ය වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ක්‍රියාකාරකම් වාර්තාව

### 1. හැඳින්වීම

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee) යනු මුදල් මණ්ඩලය (Monetary Board) විසින් පත් කරන ලද අනුකමිටුවකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් සඳහා පුළුල් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සතු වන අතර, එය බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සහතික කිරීමට මුදල් මණ්ඩලයට සහාය වේ.

### 2. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ මුලසුන හොබවන්නේ, මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ස්වාධීන මුදල් මණ්ඩල සාමාජිකයෙකු විසිනි. එහි සාමාජිකත්වය, මෙම කමිටුවට පත්වීමට පෙර අවම වශයෙන් වසරක කාලයක් මූල්‍ය සේවා අංශයට සම්බන්ධ නොවී සිටියා වූත්, අදාළ විශේෂිත දැනුම් සහ කුසලතාවලින් යුක්ත වූත්, ස්වාධීන බාහිර විශේෂඥයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

2022 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) සංජීව ජයවර්ධන මහතා, ජනාධිපති නීතිඥ - මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජික (සභාපති)

ii) නයෝමාල් ගුණවර්ධන මහතා (ස්වාධීන බාහිර සාමාජික - වසර 3 ක නිල කාලය 2022/03/14 දිනෙන් අවසන් විය)

iii) ට්‍රෙවින් ජයසේකර මහතා (ස්වාධීන බාහිර සාමාජික - 2022/07/23 දින පත් කරන ලදී)

iv) එච්. ඒ. කරුණාරත්න මහතා (ස්වාධීන බාහිර සාමාජික - 2022/07/23 දින පත් කරන ලදී)

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ලේකම් තනතුර මුදල් මණ්ඩල ලේකම් විසින් හොබවන අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී) මෙහි සහකාර ලේකම් තනතුර දරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවට ලේකම් පහසුකම් සපයයි.

සියලුම නියෝජ්‍ය අධිපතිවරුන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කමිටුවේ (Business Continuity Planning Committee) සභාපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරී සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි හෝ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි, අවම වශයෙන් සෑම කාර්තුවකට වරක් හෝ ඊට වැඩි වාර ගණනක් කමිටු රැස්වීම් පැවැත්වේ. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ රැස්වීම්, එම කමිටුවේ ලේකම් විසින් කැඳවනු ලැබේ. රැස්වීමක් සඳහා වූ ගණපූරණය දෙදෙනෙකු වන අතර එයට අනිවාර්යයෙන්ම සභාපතිවරයා ඇතුළත් විය යුතුය.

### 3. 2022 මුදල් වර්ෂය තුළ ක්‍රියාකාරකම්

**2022 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු රැස්වීම් 02ක් පැවැත්වූ අතර සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.**

i) දෙපාර්තමේන්තු අවදානම් ලේඛන (Departmental Risk Register) සමාලෝචනය කර මෙහෙයුම් අවදානම් අවම කිරීම කඩිනම් කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ii) සංශෝධනය කරන ලද මෙහෙයුම් අවදානම් වර්ගීකරණය (Operational Risk Taxonomy) සමාලෝචනය කර, එය මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

iii) සංශෝධනය කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශය (Risk Management Policy Statement) සමාලෝචනය කර, එය මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

iv) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල්වල (ජාත්‍යන්තර සංචිත (International Reserves), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ සේවක අර්ථසාධක අරමුදල (Employees' Provident Fund)) අවදානම් සමාලෝචනය කරන ලද අතර, අදාළ ආයෝජන නිර්දේශිත පරාමිතීන් තුළ පවතින බව සහතික කරන ලදී.

v) ජාත්‍යන්තර සංචිත සහ අභ්‍යන්තර ආයෝජන අරමුදල් සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශ (Investment Policy Statements) වැඩිදියුණු කිරීම් සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

vi) ජාත්‍යන්තර සංචිත, සේවක අර්ථසාධක අරමුදල සහ අභ්‍යන්තර ආයෝජන අරමුදල් සඳහා යෝජිත නව උපාය මාර්ගික වත්කම් වෙන්කිරීම් (Strategic Asset Allocation) සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

vii) ජාත්‍යන්තර සංචිත සහ අභ්‍යන්තර ආයෝජන අරමුදල් සඳහා ආයෝජන මාර්ගෝපදේශ (Investment Guidelines) වැඩිදියුණු කිරීම් සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2022 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුෂාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } බීඑෆ්/ජී/සීබීඑස්එල්/1/22/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මාර්තු 31 දින


ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි අනාවරණය කිරීම ද මුදල් මණ්ඩලයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් කරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මුදල් මණ්ඩලය යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් වැදගත් විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරනු ලබන පාර්ශවයන් මම දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලු ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් දෑ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ :

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2022 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 8 | 651,687,864 | 512,762,452 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 9 | 10,867,425 | 8,818,244 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | 401,580 | 54,022,836 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 11 | 281,421,074 | 188,045,837 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 30.3 | 37,022,631 | - |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 981,400,574 | 763,649,369 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 12 | 2,498,995,015 | 1,377,820,347 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | 13 | 698,069,219 | 567,532,312 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 14 | 235,638,700 | 150,128,800 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 15 | 1,817,132 | 1,671,218 |
| බැංකු සඳහා දෙන ලද ණය | 16 | 28,257,902 | 90,572,746 |
| අනෙකුත් වත්කම් | 17 | 30,182,560 | 34,063,770 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | 3,492,960,528 | 2,221,789,193 |
| **මුළු මූල්‍ය වත්කම්** | | 4,474,361,102 | 2,985,438,562 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 18 | 10,031,610 | 35,151,981 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 19 | 4,788,407 | 4,928,533 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | 1,222,568 | 961,456 |
| දේපල පිරියත සහ උපකරණ | 20 | 19,035,278 | 19,235,994 |
| අස්පෘශ්‍ය වත්කම් | 21 | 908,137 | 561,632 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | 35,986,000 | 60,839,596 |
| **මුළු වත්කම්** | | 4,510,347,102 | 3,046,278,158 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 22 | 146,408,028 | 13,701 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | 71,697,994 | 1,139,323 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 23 | 736,258,129 | 104,764,616 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 24 | 1,127,925,092 | 670,065,243 |
| අනිකුත් | 25 | 594,383,451 | 357,295,676 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | 2,676,672,694 | 1,133,278,559 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 26 | 323,046,181 | 300,704,162 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 27 | 221,411 | 1,392,301 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම | 28 | 330,637,059 | 101,062,880 |
| සංසරණයෙහි පවතින මුදල් | 29 | 1,026,567,252 | 1,005,099,066 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 30 | 68,320,347 | 19,163,882 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | 1,748,792,250 | 1,427,422,291 |
| **මුළු මූල්‍ය බැරකම්** | | 4,425,464,944 | 2,560,700,850 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 31 | 1,834 | 1,178 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 32 | 1,772,429 | 17,929,737 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 33 | 855,043 | 4,027,349 |
| **මුළු අනිකුත් බැරකම්** | | 2,629,306 | 21,958,264 |
| **මුළු බැරකම්** | | 4,428,094,250 | 2,582,659,114 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | 50,000,000 | 50,000,000 |
| අනෙකුත් සංචිත | 34 | (191,184,970) | 315,128,226 |
| රඳවාගත් ලාභ | | 223,437,822 | 98,490,818 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | 82,252,852 | 463,619,044 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | 4,510,347,102 | 3,046,278,158 |

පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2023 මාර්තු 31 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ආචාර්ය පී.නන්දලාල් වීරසිංහ - අධිපති

ඩී.එස්.එල්. සිරිමාන්න - ප්‍රධාන ගණකාධිකාරී

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ආදායම් ප්‍රකාශය

| | සටහන | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම:** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 36 | 1,579,295 | 4,379,048 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/ (පාඩුව) | 37 | (127,286,104) | 41,859,703 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය/ (පාඩුව) | | (9,968,941) | 20,317,794 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | (135,675,750) | 66,556,544 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 38 | (32,293,277) | (3,634,528) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 39 | (763,218) | 2,282,695 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | (33,056,495) | (1,351,833) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව) | | (610,149,293) | 34,041,805 |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම** | | (778,881,538) | 99,246,516 |
| **ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 36 | 482,676,527 | 68,612,928 |
| මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/ (පාඩුව) | | (7,866,974) | (387,202) |
| පොළී වියදම | 38 | (37,619,594) | (8,469,897) |
| දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 39 | 497,432 | (808,696) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම** | | 437,687,391 | 58,947,133 |
| අනිකුත් ආදායම් | 40 | 2,454,218 | 16,280,370 |
| අනිකුත් වියදම් | 40.1 | (10,260,110) | - |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම** | | (349,000,039) | 174,474,019 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 41 | | |
| - වැටුප් සහ වේතන | | (6,691,770) | (7,116,223) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | (11,550,422) | (1,717,811) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | | (2,091,404) | (1,891,272) |
| | | (20,333,596) | (10,725,306) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | (737,304) | (526,675) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | (2,339,653) | (2,780,250) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 42 | (1,910,381) | (2,279,122) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | (25,320,934) | (16,311,353) |
| **බදු වලට පෙර ලාභය/ (අලාභය)** | | (374,320,973) | 158,162,666 |
| බදු | 43 | - | - |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (අලාභය)** | | (374,320,973) | 158,162,666 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය/ (අලාභය) | | (374,320,973) | 158,162,666 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| **පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 34 | (1,189,382) | (16,108,192) |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 34 | 11,225,713 | (11,641,542) |
| | | 10,036,331 | (27,749,734) |
| **පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්(වියදම)/ආදායම | 32 | 14,163,877 | 1,293,721 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | 34 | 145,915 | 55,862 |
| | | 14,309,792 | 1,349,583 |
| අනෙකුත් විස්තීරණ ආදායම/(වියදම) | | 24,346,123 | (26,400,151) |
| **මුළු විස්තීරණ ආදායම/(වියදම)** | | (349,974,850) | 131,762,515 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

| | දායක ප්‍රාග්ධනය රු. 000 | අනිකුත් සංචිත රු. 000 | රඳවාගත් ලාභ රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| 2021 ජනවාරි 1 දිනට ශේෂය | 50,000,000 | 282,012,023 | 15,153,549 | 347,165,572 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 158,162,666 | 158,162,666 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | 369,008 | (369,008) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | 1,293,721 | 1,293,721 |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR) | - | 34,041,805 | (34,041,805) | - |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම | - | - | (291,870) | (291,870) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | - | (16,108,192) | - | (16,108,192) |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 23,574,367 | (23,574,367) | - |
| පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 2,859,208 | (2,859,208) | - |
| 2020 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | - | - | (15,016,745) | (15,016,745) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | (72) | (72) |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 757,613 | (757,613) | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ප්‍රාග්ධන ආයෝජනවල වෙළඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | - | 55,862 | - | 55,862 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | - | (11,641,542) | - | (11,641,542) |
| දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන ලාභ | - | (791,926) | 791,570 | (356) |
| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය | 50,000,000 | 315,128,226 | 98,490,818 | 463,619,044 |
| **2022 ජනවාරි 1 දිනට ශේෂය** | **50,000,000** | **315,128,226** | **98,490,818** | **463,619,044** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ (අලාභය) | **-** | **-** | **(374,320,973)** | **(374,320,973)** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | **-** | **438,146** | **(438,146)** | **-** |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | **-** | **-** | **14,163,877** | **14,163,877** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(පාඩුව) මාරු කිරීම (IRR) | **-** | **(610,149,293)** | **610,149,293** | **-** |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම | **-** | **-** | **(355,494)** | **(355,494)** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ පාඩුව | **-** | **(1,189,382)** | **-** | **(1,189,382)** |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | **-** | **49,638,590** | **(49,638,590)** | **-** |
| පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම් | **-** | **27,526,076** | **(27,526,076)** | **-** |
| 2021 වර්ෂයට අදාළ ලාභය අනුව ප්‍රා.සං.දෙපාර්තුමේන්තුවේ මෙහෙයුම් සඳහා මධ්‍යම හා දිගුකාලීන ණය සංචිතයට අරමුදල් මාරු කිරීම | **-** | **15,000,000** | **(15,000,000)** | |
| 2021 වසර සඳහා ලාභ විසර්ජනය - 2021 වසර සඳහා වන ලාභයෙන් ශ්‍රී ලංකා රජය සමග ඇති බැඳීම් අයකර ගැනීම | **-** | **-** | **(31,035,788)** | **(31,035,788)** |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | **-** | **-** | **(60)** | **(60)** |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කීම | **-** | **1,051,039** | **(1,051,039)** | **-** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල රජයේ සුරැකුම්පත් වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | **-** | **11,225,713** | **-** | **11,225,713** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | **-** | **145,915** | **-** | **145,915** |
| 2022 දෙසැම්බර් 31 දිනට | **50,000,000** | **(191,184,970)** | **223,437,822** | **82,252,852** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ. පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **1,550,703** | 16,510,461 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **3,498,481** | 2,433,655 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **(17,835,915)** | 14,468,586 |
| උපලබ්ධි වූ විනිමය අලාභය | | **(179,967,468)** | (13,003,097) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **8,020,273** | 1,572,512 |
| | | **(184,733,926)** | 21,982,117 |
| **විය පැහැදම්:** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **23,170,613** | 5,841,243 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **40,437,692** | 6,571,438 |
| සේවකයින්ට ගෙවීම් | | **12,435,846** | 8,295,030 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **(31,924,158)** | 498,361 |
| | | **44,119,993** | 21,206,072 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 44 | **(228,853,919)** | 776,045 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම | | **(2,431,705)** | (3,542,041) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **49,642** | 5,534 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම | | **(234)** | 338,246 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | **229,574,179** | (108,445,017) |
| | | **227,191,882** | (111,643,278) |
| **විය පැහැදම් :** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ අඩුවීම | | **31,403,136** | (755,979,008) |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **(42,189,977)** | 22,242,111 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම | | **(704,622,720)** | 218,313,967 |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම | | **(3,660)** | 489 |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | **3,773** | 686,469 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **879,377** | 72,928 |
| කල්බදු වත්කම් මිලදී ගැනීම් | | **-** | 9,113 |
| රන් සංචිතයේ ශුද්ධ අඩුවීම | | **(26,108,952)** | (38,743,707) |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන්/ (අයකරගත්) ණය හා අත්තිකාරම් | | **(61,796,952)** | (30,118,054) |
| | | **(802,435,975)** | (583,515,692) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **1,029,627,857** | 471,872,414 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **347,595,479** | 390,975,631 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(326,127,293)** | (220,684,424) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **21,468,186** | 170,291,207 |
| **විය පැහැදම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතු | 45 | **851,954,489** | 1,172,364,801 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්) | 46 | **(22,342,019)** | (171,102,641) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතු | | **829,612,470** | 1,001,262,160 |
| **සංසරණ මුදල් ශුද්ධ අඩුවීම** | | **(808,144,284)** | (830,970,953) |
| **විය පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ලැබීම්/ (ආපසු ගෙවීම්) | | **27,384,295** | (145,925,443) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **60** | 72 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | **3,363,735** | 7,547,179 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **30,000,000** | 15,000,000 |
| | | **60,748,090** | (123,378,192) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(868,892,374)** | (707,592,761) |
| මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **(68,118,436)** | (234,944,302) |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **(3,321,000)** | 28,871,146 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **197,504,486** | 403,577,642 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 8 | **126,065,050** | 197,504,486 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන**

## 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව (“බැංකුව” හෝ “ශ්‍රී.ලං.ම.බැ.”) ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2023 මාර්තු 31 වැනි දින අනුමත කරන ලදී.

### 1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවරෙන අතර, බැංකුවේ කළමණාකාරීත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- නිල විදේශ සංචිතය කළමනාකරණය කිරීම.
- මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම.
- බැංකු හා තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය සහ අධීක්ෂණය.
- පියවීම් පහසුකම් සඳහා ප්‍රතිපාදන හා ගෙවීම් පද්ධතිය නියාමනය කිරීම.
- ආර්ථික දත්ත සම්පාදනය, බෙදාහැරීම සහ විශ්ලේෂණය.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජයේ හා එහි නියෝජිතයන් හෝ බැංකුකරු ලෙස කටයුතු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ වාණිජ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන්ට ජංගම ගිණුම් පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාලව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

## 2. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ.

### 2.2 මිනුම් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

- රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම් කිරීම.
- අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන එහෙත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කරන ඉඩම් හා ගොඩනැගිලි.
- සේවා නියුක්තිකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

### 2.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 7 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 2.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. වාර්තා කර ඇති සියලූ අගයන් ආසන්නතම දහස් සංඛ්‍යාවට දක්වා ඇති අතර බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදුවී නැත.

### 2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතම හා අසමාන ස්වභාවයක් හා කාර්යයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

**2.6 හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ හැක්කේ බැංකුවට හඳුනාගත් අගයන් හිලව් කිරීමට නෛතික අයිතියක් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම් නිරවුල් කිරීමට අපේක්ෂා කරයි නම් පමණි.

**2.7 සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍ය විටක වර්තමාන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

**3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය**

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

**3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි.

**3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 32 හි දැක්වේ.

**3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. විනිශ්චයන්වලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

**3.4 අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 හි පොදු බලපෑම**

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී බැංකුව විසින් අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19න් ඇති වූ බලපෑම සැලකිල්ලට ගනු ලැබීය. විනිශ්චයන් සඳහා යොදා ගනු ලබන විශේෂ අයිතමයන් නොවෙනස්ව පැවතුන ද, අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 හි බලපෑම හේතුවෙන් අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවිය.

ඒ අනුව මූලික වශයෙන් බැංකු සඳහා දෙන ලද ණය ශේෂය සහ අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී මෙකී අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු බැංකුව විසින් යොදා ගනු ලැබීය.

කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක්වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් පරාසයක විහිදුණු සහන හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇති වඩාත් වැදගත් සහන ක්‍රියාමාර්ගය ලෙස ක්‍රියාත්මක කළ නව ණය යෝජනා ක්‍රම හැඳින්විය හැක. ඒ අනුව බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනුරුද අදියර I, II, III හා ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම මැයෙන් වන ප්‍රතිමූල්‍ය හා ණය යෝජනා ක්‍රම සහනදායි පොළී අනුපාත යටතේ මාස 6ක් වසර 2ක් අතර වන කල් පිරීම් කාල සීමාවක් සහිතව වසංගත තත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා ණය ලබා දීමේ කොන්දේසියට යටත්ව බලපත්‍රලාභී වානිජ හා බලපත්‍රලාභී විශේෂිත බැංකු තුළින් ක්‍රියාත්මක කරන ලදී. 2022 වසර තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන් නිසා ලබාදුන් ණය සහන දිගු හේතුවෙන් මෙම පහසුකම් වලින් බොහොමයක් 2022 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු ලෙස දැක්වේ.

තක්සේරු කිරීමේ ශිල්පිය ක්‍රම හා තක්සේරු යෙදවුම් අදාළ හා සුදුසු බවට විශේෂයෙන් තහවුරු කිරීම සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් හා විනිශ්චයන් තක්සේරු ශිල්පීය ක්‍රම තුළ යොදා ගනු ලැබේ. එවන් තක්සේරු ශිල්පක්‍රම භාවිතයෙන් වත්කමක සාධාරණ අගය මිනුම් කරනු ලබයි. ඒ අනුව ඉහත සඳහන් කළ ණය යෝජනා ක්‍රම වල මූලික හඳුනාගැනීමේ සාධාරණ අගය ගණනය කිරීමේදී ණය ආපසු ගෙවීම් කොන්දේසි හා වෙළඳපොළ පොලී අනුපාත යනාදී

තීරණාත්මක උපකල්පනයන් හා විනිශ්චය යොදා ගන්නා ලදී.

පෙර කාලපරිච්ඡේද වල යොදාගත් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලිය හා බැඳුණු මූලික අපේක්ෂිත ණය අලාභ ආකෘතිය, ක්‍රම හා ක්‍රමවේදය ස්ථාවර හා නොවෙනස්ව පැවතිය ද බැංකුව විසින් අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 බලපෑම, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලියේ යෙදවුම්, උපකල්පනයන් හා ඉදිරි දැක්මක් පවතින සාර්ව ආර්ථික විචල්‍යයන් තුළින් හඳුනාගෙන ඇත. ඊට අමතරව අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික විචල්‍යයන්හි සිදුවූ චලනයන් හේතුවෙන් ඒවා යෙදවුම් ලෙස යොදා ගන්නා අපේක්ෂිත ණය අලාභ ආකෘතියේ ඇතිවන්නා වූ අනපේක්ෂිත සංඛ්‍යානමය වෙනස්වීම් අවම කර ගැනීම සඳහා බැංකුව විසින් සාමාන්‍යකරණය කරන ලද ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික විචල්‍යයන් භාවිතා කරන ලදී.

කෙසේ වෙතත් බැංකු තක්සේරුවට අනුව මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයට අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 මගින් බලපෑමක් ඇතිවී නොමැති අතර එම වත්කම් සුදුසු වටිනාකමට 2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශ වල තක්සේරු කර ඇත.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම

මෙම මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

## 5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල් වර්ගය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **247.0237** | 145.5851 |
| කැනේඩියානු ඩොලර් 1 | **268.4335** | 158.6150 |
| යුරෝ 1 | **388.3461** | 227.8832 |
| ජපන් යෙන් 1 | **2.7703** | 1.7417 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **483.3276** | 280.9312 |
| ස්ටර්ලින් පවුම් 1 | **437.4023** | 271.2270 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **363.1100** | 200.4338 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | **52.6513** | 31.5294 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 5.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 50 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධූරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධුරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම් තුළින් (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

### 5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

#### 5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම් දිනයේදී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

#### 5.3.2 වර්ගීකරණය

**මූල්‍ය වත්කම්**

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

**ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම**

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය
- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය

හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුව.**

බැංකුව විසින් මූලික හා මූලික මුදල මත පොළිය පමණක් යන කොන්දේසිය (SPPI Test) තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මේ සඳහා මූල්‍ය වත්කමක් පළමු වරට හඳුනාගැනීමේදී ඇති සාධාරණ අගය "මූලික මුදල" ලෙසද කිසියම් කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානමත්, අනෙකුත් මූලික ණය දීමේ අවධානම හා පිරිවැයත්, මුදලේ කාලීන වටිනාකමෙහි අගයත් "මූලික මුදල මත වන පොළිය" ලෙස අර්ථ දැක්වේ.

මූලික ණය දීමේ එකඟතාවයකදී පොළියේ ඇති වඩාත් වැදගත් මූලිකාංගයන් ලෙස මුදලේ කාලීන අගය හා ණය අවධානම සඳහා ගෙවනු ලබන අගය හැඳින්විය හැකිය.

SPPF තක්සේරුව කිරීම සඳහා බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර මූල්‍ය වත්කම් නිරූපනය කරන මුදල් ඒකකය හා පොළී අනුපාතය නියම කර ඇති කාලපරිච්ඡේදය යනාදිය අදාළ සාධක ලෙස සලකා බලනු ලබයි.

කෙසේ වුවද ණයදීම පිළිබඳ මූලික එකඟතාවයන් හා සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනය වන ස්වභාවයට අනාවරණය වීම් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPF) පමණක් වූ මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවන්හිදී, එකී මූල්‍ය වත්කම ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරනු ලැබේ.

**ප්‍රතිවර්ගීකරණය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේ දී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

### 5.3.3. ඉවත් කිරීම්

**මූල්‍ය වත්කම්**

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන්නේ නම් හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැහෙන දුරට පැවරුම් කර හෝ රඳවාගෙන නොමැති විට හා වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට එය පොත් වලින් ඉවත් කළ යුතුය.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී,

(i) එහි ධාරණ අගය හා ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ

(ii) විස්තීරණ ආදායම් තුළ කලින් හඳුනා ගන්නා ලද සම්මුච්චිත ලාභය හෝ අලාභය

යන දෙකම ආදායම ප්‍රකාශය තුළ නිරූපණය විය යුතුය.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී ඊට අදාළව විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් නොකෙරේ.

පැවරුම කිරීමකින් පොත්වලින් ඉවත් කරන ලද මූල්‍ය වත්කමකට අදාළව ජනනය කරන ලද හෝ රඳවා ගත් පොළිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත හඳුනාගෙන පවරන ලද එහෙත් සියළු අවදානම් හා ප්‍රතිලාභයන් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් රඳවාගත් වත්කම් ඉවත් කරනු නොලබයි. සුරැකුම්පත් ණයට දීම, විකිණීම සහ ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු මේ සඳහා උදාහරණයන් වේ. මෙබඳු ගණුදෙනු වලදී බැංකුව අදාළ මූල්‍ය වත්කමෙහි හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන් හෝ කොටසක් රඳවා ගැනීම හෝ මාරු කිරීම සිදු කරනු නොලබන අතර වත්කමෙහි පාලනය බැංකුව සතුව රඳවා ගනී. අදාළ වත්කම කෙරෙහි බැංකුව දක්වන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව එම වත්කම හඳුනා ගැනේ.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි ගිවිසුම්ගත බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය.

### 5.3.4. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන අලාභ හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ. බැංකුව විසින් ඉහළ ආයෝජන ශ්‍රේණියෙහි පිහිටි (Baa3/BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයන් හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන ලද බැංකුවේ බහුතරයක් ආයෝජන Baa3/BBB- අගයට ඉහළින් ශ්‍රේණිගතය. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ "පළමු අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ.

මුල්වරට හඳුනාගැනීමේදී පහළ ආයෝජන ශ්‍රේණිගත හෝ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ණය ශ්‍රේණිය පහළ හෙළන ලද (Baa3/BBB- අගයට වඩා පහළ ශ්‍රේණිගත) ආයෝජන උපකරණ සඳහා හෝ මුල්වරට හඳුනා ගැනීමෙන් පසු ගෙවීම්

පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වූ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරයි. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරන අලාභයන් හඳුනාගනු ලබන, එහෙත් මුළුමනින්ම ණය හානිකරණය නොකරන ලද ණය උපකරණ "දෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ. ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරනු ලබන විට ඒවා (මුළුමනින්ම ණය හානිකරණය කරන ලද ණය උපකරණ) "තෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හැඳින්වේ.

**අපේක්ෂිත ණය අලාභ මැනීම**

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමඟ විස්තර කර ඇත.

**ණය පැහැර හැරීමේ සම්භාවිතාව**

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවයි. අදාළ පහසුකම (ආයෝජනය/ණය) පොත්වලින් ඉවත් කොට නොමැතිනම් හා තවමත් ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක.

බැංකුව විසින් සියලු විදේශ ආයෝජන (ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කරන වත්කම්) සඳහා නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් බ්ලූම්බර්ග් (Bloomberg) තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු පැහැර හැරීමේ සම්භාවිතා වගුව (Common PD Table) මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

**ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය**

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා ඒ මත වන පොලිය ආපසු ගෙවීම, කොන්ත්‍රාත්තුවකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මඟහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

**පැහැර හැරීමකදී වන අලාභය**

පැහැර හැරීමකදී වන අලාභය යනු දී ඇති දිනයකදී ගෙවීම් පැහැර හැරීම නිසා බැංකුවට සිදුවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවයි. එය ලැබීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා බැංකුව ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනසට ඇප වශයෙන් තබා ඇති වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළත් කිරීමෙන් ගණනය කෙරේ. බැංකුවට එක් එක් වෙන්වූ මූල්‍ය වත්කමෙන් වන අවදානම් නිරාවරණය මත පදනම්ව යොදාගත යුතු පැහැර හැරීමකදී වන අලාභ ප්‍රතිශතය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

**ආර්ථික සාධක ගැලපීම**

යම් කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින (වාර්තා කරන දිනට) පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. බැංකුව, පැහැර හැරීමේ සම්භාවිතාව වෙනස් කිරීම සඳහා ප්‍රධාන ආර්ථික සාධක ලෙස දළ දේශීය නිෂ්පාදනය, උද්ධමනය හා පොළී අනුපාතය යන දත්ත යොදාගනී.

**ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්දැයි ඇගයීම**

මූල්‍ය වත්කම්/ උපකරණ මුල් වරට හඳුනාගැනීමේ දිනට පසු සිදුවන ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක වර්ධනයක් හෝ අදාළ මූල්‍ය වත්කම/ උපකරණ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයේ ශ්‍රේණිගත කිරීම BBB - වලට වඩා පහළ යාමක් සිදුවේ නම් එය අදාළ මූල්‍ය උපකරණයේ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ලෙස බැංකුව සලකා බලනු ලැබේ.

ඉහත කරුණු ඉහළ ආයෝජන ශ්‍රේණියක සිට පහළ ආයෝජන ශ්‍රේණියක් දක්වා වන සියලු ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් (Baa3 සිට Ba1 දක්වා වූ සුළු පහත වැටීමක්ද ඇතුළත්ව) ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක හෝ ඊට වැඩි අගයකින් වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

**ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකර යනාදිය ණය හානිකරණය වී ඇත්දැයි (අදියර 3 ලෙස සඳහන් කර ඇති මූල්‍ය වත්කම්) සෑම වාර්තා කරන දිනකදීම බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වලට අවාසිදායක බලපෑමක් වී ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලට පහත සිද්ධීන් පිළිබඳව දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැලකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා
- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක්
- ණය ගැණුම්කරුවන් බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යූහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව

**අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම්, මූල්‍ය තත්ව

ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් : අදාළ මූල්‍ය වත්කමේ දළ ධාරණ වටිනාකමෙන් අඩු කොට දැක්වීම.
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් : මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මෙවැනි දළ ධාරණ වටිනාකම සාධාරණ අගය වන හෙයින් ණය අලාභ වෙන් කිරීම් කිසිවක් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ හඳුනාගනු නොලබයි. කෙසේ වෙතත් අදාළ ණය අලාභ වෙන් කිරීම් විස්තීරණ ආදායම තුළ හඳුනාගෙන අනාවරණය කර ඇත.
- ණය ඇපකර ගිවිසුම : වෙන්කිරීමක් ලෙස.

**ලියා හැරීම**

ණය දීමක් හෝ ණය සුරැකුම්පතක් නැවත අය කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන්) බැංකුවට සාධාරණ අපේක්ෂාවන් නොමැති විට ඒවා ලියා හරිනු ලබයි. ලියා හැරීමට යටත් ණයගැතියන්ට ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති විට මෙසේ ණය ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම සම්බන්ධයෙන් සිදුකරන අතර, කලින් ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමකදී එම මුදල ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ "මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ" යන මැයෙන් ඇතුළත් කරනු ලැබේ.

### 5.4 ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ දරණ ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/පාඩුව ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ.

### 5.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. මෙයට ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුළත් වේ.

මෙම ආයෝජන පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන, වෙළඳපොළ අගයන් නොමැතිවීම හේතුවෙන් ඒ ඒ ආයෝජන පවතින ආයතනයන්ගේ ශුද්ධ වත්කම් මත පදනම්ව අගය කර ඇත.

මෙම වර්ගීකරණයට අදාළ දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි එම වත්කම් විකිණීම, ප්‍රතිග්‍රහණය, ඉවත් කිරීම හෝ හානිකරණය වන තෙක් කෙලින්ම බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය (විස්තීරණ ආදායම) හි ඇති අනෙකුත් සංචිත තුළ පෙන්වන අතර ඉහත සඳහන් ක්‍රමවලින් වත්කම පොත් වලින් ඉවත් කරන විට අදාළ ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලබයි.

කෙසේ වෙතත් ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී එයට අදාළ වෙළඳපොළ අගයන්ගේ වෙනස්වීමෙන් ලද ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.

මෙම වත්කම් වලට අදාළ පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතා කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

### 5.6 ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අරමුණින් යුතු ව්‍යාපාර ආකෘතිය යටතේ රඳවාගත් හා ගිවිසුම්ගත කොන්දේසි අනුව නිශ්චිත දිනයන්හිදී මූලික මුදල හා ඒ මත පොලිය පමණක් ලබාදෙන මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම උපකරණ පසුකාලීනව සඵල පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

### 5.7 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි.

ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශ වලින් ඉවත් කල විට පමණක් ආදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

**5.8 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. සමඟ වූ පංගුව ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජා.මූ.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා.මූ.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මූ.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**5.9 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 45 සහ සටහන් 46 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**5.10 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදීගනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනිමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදි ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණිම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු ඒවායේ උපචිත ආදායම් හා වියදම් ද ඇතුළුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ වාර්තා කරනු ලැබේ.

**5.11 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, (පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) හා සර්ව සම අතර මෙය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනී.

**5.12 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත්

කරනු ලබයි. මෙසේ නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරනු ලැබේ.

**5.13 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් වලින් සහ බැඳුම්කර වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය ලෙස වාර්තා කරනු ලැබේ.

**5.14 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

**5.15 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

**5.16 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වාර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

**5.17 සේවක ණය**

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.මු.වා.ප්‍ර. 9 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - ශ්‍රී.ලං.ම. බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන, නිශ්චිත කාලයක් සඳහා අදාළ වන දිගු කාලීන උද්ධමන ඉලක්ක හා අපේක්ෂිත මූර්ත පොළී අනුපාතයට බැංකුවේ උපදේශන විගණන කමිටුව මඟින් අනුමත කළ පරිදි සියයට 1ක අවදානම් අධිභාරයක් එකතු කළ අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරන අතර එය, ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් සිදුවී නොමැත.

**5.18 රන්**

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. මුදල් නීති පනතේ 67(2) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ සෘජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස පවත්වාගත යුතුයි. මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

**5.19 මුදල් තොග**

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**5.20 අනෙකුත් තොග**

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

**5.21 දේපළ, පිරියත සහ උපකරණ**

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි

සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් අනතුරුව හඳුනාගන්නා සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සිත්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සිත්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඪාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 3කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මිට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේදී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

### 5.22 කල්බදු

යම් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද යන්න හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව විසින් නිර්ණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවේදී යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතිය ගිවිසුමකින් පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකින් සමන්විත වේ. යම් ගිවිසුමක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතියක් ලබාදේද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් ජා.මු.වා.ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය යොදා ගනු ලැබේ.

**බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම.**

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේදී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරීමේ හිමිකම ආරම්භයේදී පිරිවැයට මනිනු ලැබේ. මෙහිදී පිරිවැය ලෙස සලකනුයේ කල්බද්ද ආරම්භ වන දින හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් ගලපන ලද ආරම්භක කල්බදු වගකීමට බැංකුව විසින් දරන ලද මූලික සෘජු පිරිවැය හා අදාල කල්බදු ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා කරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය එකතු කළ විට ලැබෙන අගයයි.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, කල්බද්ද ආරම්භ කළ දිනයේ සිට කල්බදු වාරය අවසන් වන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් හානිකරන අලාභ අඩුකරන අතර කල්බදු වගකීමේ නැවත මැනීම් ගැලපීමද සිදුකරනු ලැබේ.

කල්බදු වාරය ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර එම පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදී පහත සඳහන් කල්බදු ගෙවීම් සලකා බලනු ලැබේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්;
- දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම සහතික කිරීම් යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂා කරන අගය; හා
- බැංකුව විසින් මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල, බැංකුවට කල්බදු වාරය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවක් ඇති විට, එසේ කල්බදු වාරය දීර්ඝ කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම කාලය තුළදී ගෙවීමට අපේක්ෂිත කල්බදු ගෙවීම් හා කල්බදු වාරය අවසන් වීමට පෙර බැංකුව විසින් කල්බද්ද අවසන් කිරීමට ක්‍රියාත්මක වේ නම් ඒ සඳහා

අදාල වන දඩ ගෙවීම්.

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එනමුදු යම් දර්ශකයක හෝ අනුපාතිකයක වෙනස්වීමක් මත වන අනාගත කල්බදු වාරිකවල වන වෙනසක්, අවශේෂ වටිනාකම සහතික කිරීම යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂිත අගයේ සිදුවන වෙනසක්, කල්බදු වාරය දීර්ඝ කිරීමේ අවස්ථාවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ බැංකුවේ අදහස වෙනස්වීමක්, කල්බදු වාරය අවසන් වීමට පෙර කල්බද්දක් අවසන් කිරීම වෙනුවෙන් බැංකුව විසින් ගෙවිය යුතු දඩයක් හා ප්‍රධාන ස්ථාවර ගෙවීම්වල සිදුවන වෙනස්වීම් හේතුවෙන් කල් බදු වගකීම් නැවත මැනීමට සිදු වේ.

ඉහත අයුරින් නැවත මනින ලද කල්බදු වගකීමෙහි වන වෙනස්වීම අදාළ වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ. අදාල වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශුන්‍ය වේ නම් එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් දේපල, පිරියත හා උපකරණ (සටහන 20) හා විවිධ බැරකම් හා උපචිතයන් (සටහන 33) තුළ දක්වා ඇත.

### 5.23 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමගින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක ඵලදායී ජීව කාලයක් තුළ සෘජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 5.24 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

### 5.25 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සළකුණු දක්වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් එම වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කිරීම සිදු කරනු ලබයි.

වත්කම් හානිකරණ පරීක්ෂාව සඳහා, අනෙකුත් වත්කම්වල මුදල් ගලාඒම් වලින් බොහෝ දුරට ස්වාධීන වූ මුදල් ගලා ඒම් ඇති වත්කම් කුඩා වත්කම් සමූහවලට කාණ්ඩගත කරනු ඇත.

"වත්කමක අයකරගත හැකි වටිනාකම" එම වත්කමෙහි "භාවිතයේ පවතින වටිනාකම" හෝ සාධාරණ අගයෙන් විකිණීමට දරණ පිරිවැය අඩුකොට ගන්නා වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. වත්කමක භාවිතයේ පවතින වටිනාකම වනුයේ එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ එකී වත්කමේ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුවේ කාල අගය හා එම වත්කමටම විශේෂ වූ අවදානම් පිළිබිඹු කරනා පූර්ව බදු වට්ටම් අනුපාතයකින් වට්ටම් කිරීමෙන් ලැබෙන වර්තමාන අගයයි.

වත්කමක ධාරණ අගය එකී වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි.

ගලපන ලද හානිකරණ අලාභ නැවත හැරවිය හැක්කේ අදාළ වත්කමේ ධාරණ අගය එම වත්කම මත හානිකරණ අගයක් හඳුනා නොගත් අවස්ථාවක නිර්ණය කළ, ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපන ලද ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයන අවස්ථාවක පමණි.

### 5.26 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

### 5.27 සංසරණයේ පවතින මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

### 5.28 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ

අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කරවල තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 32 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

**5.29 නිශ්චිත දායක සැලසුම්**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන්වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

**5.30 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශයට මුදාහරිනු ලැබේ.

**5.31 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

නිශ්චිත නොවන අනාගත සිදුවීම් මගින් පවතින බවට තහවුරු කෙරෙන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ එහි ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙළිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

**ආදායම් ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය**

**5.32 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**5.32.1 පොලී ආදායම් සහ වියදම්**

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොලී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන හා සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත් හා අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල, පොලී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොලී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොලී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**5.32.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**5.32.3 විවිධ ආදායම් හා වියදම්**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, (විකුණුම් ප්‍රතිශ්ඨාවෙන් වත්කමේ ධාරණ අගය සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන) විකුණුම් වියදම්, ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**5.32.4 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**5.32.5 ආදායම් බදු වියදම**

1949 අංක 58 දරණ මුදල් නීති (සංශෝධිත) පනතේ 118 වගන්තිය, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය සහ ඉන්පසුව කරන ලද 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2017 අංක 7 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2017 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව විසින් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. එහෙත් 2018 අංක 33 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2018 ඔක්තෝබර් මස සිට උපලබ්ධි නොවූ ලාභ සහ විදේශ මූල්‍ය වත්කම්වල මිල වෙනස්වීමෙන් වන උපලබ්ධි නොවූ ලාභ ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වේ. තවද 2013 අංක 17 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

2020 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අහෝසිකරන ලදී.

**5.33 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අදාල පරිදි, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සංශෝධන හෝ හෙළිදරව් කිරීම් ලෙස දක්වා ඇත.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ජා.ගි.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා වන "ඍජු ක්‍රමය" භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත. මුදල්/මුදල් විධානයන්ගේ ගලායෑම් ගැළපීමෙන් අනතුරුව ලැබෙන අගය ඉහත නිර්වචනය කළ පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

## 6. ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බල සහිත නොවූ ප්‍රමිතීන් මත වූ සංශෝධන සහ නිර්වචනයන්

පහත ප්‍රමිතීන් මත වූ සංශෝධන හා බැඳුනු නව නිර්වචනයන් 2022 ජනවාරි 01 දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදවලට බල පැවැත්වෙන අතර ඒවා නියමිත දිනට පෙර යොදා ගැනීමට අවසර ඇත. එසේ වුවද, මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී බැංකුව විසින් මෙකී සංශෝධිත ප්‍රමිතීන් නියමිත දිනට පෙර අදාළ කර නොගන්නා ලදී. තවද පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

**6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම (ජා.ගි.ප්‍ර 1 සහ ජා.මු.වා.ප්‍ර** (Practice Statement) **2 සඳහා කරන ලද සංශෝධන)**

ජා.ගි.ප්‍ර. 1 හි ප්‍රධාන සංශෝධනයන්හි ඇතුළත් වන්නේ,

- සමාගමක සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට වඩා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාවය ආදේශ කිරීම:
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී, ආයතන, ප්‍රමාණාත්මක සංකල්පය අදාළ කරගන්නා ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම:
- වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම.

මෙම සංශෝධන 2023 ජනවාරි 1 සිට බලපැවැත්වේ.

**6.2 ගිණුම්කරණ ඇස්තමේන්තු අර්ථ දැක්වීම (ජා.ගි.ප්‍ර. 8ට කරන ලද සංශෝධන)**

මෙම සංශෝධන මගින් ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා නව අර්ථ දැක්වීමක් හඳුන්වා දෙන අතර ඒවා මිනුම් අවිනිශ්චිතතාවයට යටත් වන මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රමාණයන් බව පැහැදිලි කෙරේ.

එසේම, ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මගින් දක්වා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා බැංකුව විසින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සකස් කිරීම ඔස්සේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ ඇස්තමේන්තු අතර වන සම්බන්ධය මෙම සංශෝධන මගින් පැහැදිලි කෙරේ.

ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ගොඩනැගීමේදී පහත කරුණු දෙකම ඇතුළත් කෙරේ.

- මිනුම් ක්‍රමයක් තෝරා ගැනීම (ඇස්තමේන්තු කිරීම හෝ තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය) උදා ජා.මු.වා.ප්‍ර. 9 'මූල්‍ය උපකරණ' අනුව අපේක්ෂිත ණය පාඩු සඳහා අලාභ දීමනාව මැනීමට භාවිතා කරනු ලබන ඇස්තමේන්තු ක්‍රමය; හා
- තෝරාගත් මිනුම් ක්‍රමය යොදන විට භාවිතා කළ යුතු යෙදවුම් තෝරා ගැනීම උදා - ජා.මු.පා.ප්‍ර. 37 'ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්' අනුව වගකීම් සඳහා ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා අපේක්ෂිත මුදල් ගලායෑම්

මෙම සංශෝධන 2023 ජනවාරි 1 දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන අතර, කලින් යොදා ගැනීමට අවසර ලබා දී ඇත.

බැංකුව විසින් සංශෝධන අදාළ කර ගනු ලබන පළමු වාර්ෂික වාර්තාකරණ කාලසීමාව ආරම්භයේ හෝ ඉන්පසුව සිදුවන ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් අනාගත කාලපරිච්ඡේදවලට බලපාන ලෙස යොදා ගනු ලැබේ.

## 7. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

**7.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යූරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**7.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කිරීම මගින් ද්‍රවශීලතා කළමනාකරණය සිදුකරනු ලබයි. මෙම කටයුතු බොහොමයක් දෛනික විවට වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත

ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**7.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

## 8. මුදල් සහ මුදල් සමානයන්

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| බැංකු සමඟ ඇති ශේෂයන් | **7,626,592** | 23,385,534 |
| බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | **-** | 49,430,045 |
| එක්දින ස්ථාපනය කිරීම් | **118,410,171** | 124,669,823 |
| මුදල් සහ මුදල් සමානයන් සඳහා ලැබිය යුතු පොලී | **28,287** | 19,084 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | **126,065,050** | 197,504,486 |
| සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් (සටහන 8.1) | **526,467,646** | 315,345,334 |
| අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 8.2) | **(844,832)** | (85,368) |
| **එකතුව** | **651,687,864** | 512,762,452 |

**8.1** 25.5 සටහනෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී.ලං.ම.බැ. හා පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා අතර ඇති වූ ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම යටතේ ලැබුනු චීන යුආන් බිලියන 10ක මුදල සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

මෙම පහසුකම යටතේ ලැබුණු මුදල්, රටවල් දෙක අතර වෙළඳ කටයුතුවලදී, ඍජු ආයෝජනවලදී සහ දෙපාර්ශවය මගින් එකඟවන වෙනත් කාරණයක් සඳහා යොදාගත හැකිය.

**8.2 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය**

| | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **52,009** | **33,359** | **85,368** | 90,277 | 180,061 | 270,338 |
| වර්ෂය තුල අය කිරීම්/(ආපසු හැරවුම්) | **789,431** | **(29,967)** | **759,464** | (38,268) | (146,702) | (184,970) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **841,440** | **3,392** | **844,832** | 52,009 | 33,359 | 85,368 |

## 9. විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **10,867,425** | 8,818,244 |
| විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව | **10,867,425** | 8,818,244 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 9.1) | **4,744** | 995 |

**9.1 අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය**

| | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **995** | **-** | **995** | 36,546 | 2,062,175 | 2,098,721 |
| වර්ෂය තුළ අය කිරීම්/(ආපසු හැරවුම්) | **3,749** | **-** | **3,749** | (35,551) | (2,062,175) | (2,097,726) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,744** | **-** | **4,744** | 995 | - | 995 |

## 10. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**10.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **401,580** | **71,669,551** | **208,591,719** | 54,022,803 | 1,130,519 | 197,002,554 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forex Forward) | **-** | **28,443** | **1,724,773** | 33 | 8,804 | 229,487 |
| එකතුව | **401,580** | **71,697,994** | **210,316,492** | 54,022,836 | 1,139,323 | 197,232,041 |

**10.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමග හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රට තුළට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

**10.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**10.4** විනිමය අනුපාත අවදානම සහ කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ග යක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමග එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

**10.5** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**10.6** සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

**10.7 දිගු කාලීන ඇ.එ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු පහසුකම් (USD/LKR Buy-Sell Swap Agreements)**

විදේශ සංචිත ඉහළ නැංවීමේ අරමුණින් බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සමග දිගුකාලීන (2023.06.30 න් පසුව කල්පිරෙන) ඇ.එ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු පහසුකම් වලට එළඹීම් සටහන අංක 10.1 හි අන්තර්ගතවේ. 2022 දෙසැම්බර් 31 දිනට පවතින පහසුකම් සඳහා ගෙවිය යුතු මුදල් පහත පරිදි වේ.

| බැංකුව | ගිවිසුම්ගත දිනය | කාල්පනික ගෙවිය යුතු මුදල ඇ.එ.ජ. ඩොලර් මිලියන | අවසාන වාරිකය කල් පිරෙන දිනය | කාලසීමාව/ කොන්දේසි | ගනුදෙණුවේ අදාළත්වය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 2021 අප්‍රේල් 22 | 45.00 | 2027 දෙසැම්බර් 15 | • අවුරුදු 6ක් සඳහා ශුන්‍ය පිරිවැය ලෙස<br>• ආසන්න වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මි. 10 ක් සෑම මාස 6ක දීම පියවෙන පරිදි අඩියර 5 කදී පියවීම කළ යුතුය. | Asian Infrastructure Investment Bank මගින් කොවිඩ්-19 හදිසි හා ආපදා සහන ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ණය |
| ලංකා බැංකුව | 2021 ජුනි 29 | 44.78 | | | |
| මහජන බැංකුව | 2021 අප්‍රේල් 23 | 45.00 | | | |
| මහජන බැංකුව | 2021 සැප්තැම්බර් 30 | 44.78 | | | |
| DFCC බැංකුව | 2021 පෙබරවාරි 24 | 125.00 | 2028 අගෝස්තු 15 | • අවුරුදු 7ක් සඳහා ශුන්‍ය පිරිවැය ලෙස<br>• ඇ.එ.ජ. ඩොලර් මි. 6.25 ක් සෑම මාස 3කට වරක්ම පියවෙන පරිදි අඩියර 20කදී පියවීම කළ යුතුය. | United States International Development Finance Corporation මඟින් ලබාදුන් ණය. |
| කොමර්ෂල් බැංකුව | 2021 නොවැම්බර් 17 | 35.00 | 2026 නොවැම්බර් 23 | • වසර 05 ක කාලසීමාවක් සහිත මෙම ගිවිසුම පළමු මාස 18 සඳහා ශුන්‍ය පිරිවැය යටතේත්, ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ. ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය.<br>• කල් පිරෙන දිනයේදී සම්පූර්ණ මුදලම පියවිය යුතුය. | එක්සත් රාජධානියේ CDC PLC වෙතින් ලැබුණු ණය. |
| ජාතික සංවර්ධන බැංකුව (NDB) | 2022 මාර්තු 18 | 36.00 | 2029 මාර්තු 19 | • සම්පූර්ණ කාලසීමාව අවුරුදු 7කි. ඉන් පළමු මාස 18 තුළදී ඇ.එ.ජ ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගිනුත් ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය.<br>• ඇ.එ.ජ. ඩොලර් මිලියන 3ක් අර්ධ වාර්ෂිකව පියවෙන පරිදි අඩියර 12 ක් යටතේ පියවිය යුතුය. | United States International Development Finance Corporation මඟින් ලබාදුන් ණය. |

## II. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| **ලාභ/අලාභ මත සාධාරණ අගයට මිනුම් කළ** | | |
| ජා.මූ.අ. පංගුව (සටහන 11.1) | **279,779,554** | 162,603,548 |
| විශේෂ ගැනුම් හිමිකමේ දැරීම (සටහන 11.2) | **626,461** | 24,800,563 |
| | **280,406,015** | 187,404,111 |
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කළ** | | |
| ජා.මූ.අ. තැන්පතු (සටහන 11.3) | **377,081** | 216,785 |
| කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය | **637,986** | 424,944 |
| අඩුකළා: ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 11.4) | (8) | (3) |
| | **1,015,059** | 641,726 |
| | **281,421,074** | 188,045,837 |

### II.1 ජා.මූ.අ. පංගුව (IMF quota)

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී. (වර්තමානයේ ජා.මූ.අ. සාමාජිකයින් ගණන 190 කි.)

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මු.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මු.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

සාමාජිකයෙකු ජා.මු.අ. වෙතින් ඉවත්වුවහොත්, එහි පංගු දායකත්වය ජා.මු.අ. වෙත ශුද්ධ බැඳීම් පියවීමට අවශ්‍ය නොවන ප්‍රමාණය දක්වා ආපසු ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, සාමාජිකයන්ට ජා.මු.අ. පංගුව සඳහා පොලියක් හිමි නොවන අතර එම නිසා මුදල් වල කාල වටිනාකම සඳහා වන්දි මුදලක් හිමි නොවේ. එම නිසා, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

**i.)** **දායකය** - ජා.මු.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මු.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

**ii.)** **ඡන්දය දීමේ බලතල** - ජා.මු.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

**iii.)** **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මු.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සම්පස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද (ජා.මු.අ කොවිඩ් -19 තත්වයට ප්‍රතිචාර වශයෙන් තාවකාලිකව මෙය පංගුවෙන් සියයට 245ක් දක්වා 2021 වර්ෂය අවසාන තෙක් වැඩි කරන ලදී.) සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**iv.)** **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ. ඇ.එ.ජ. ඩොලර් බිලියන 650 කට සමාන, සාමාන්‍ය වි.ගැ.හි. වෙන්කිරීමක් ජා.මු.අ සාමාජිකයන් මෙන්ම වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ සහභාගීවන්නන්හට ඔවුන්ගේ පවතින පංගුවට සමානුපාතිකව 2021 අගෝස්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදෙන ලදී. මෙම සාමාන්‍ය වි.ගැ.හි වෙන් කිරීමෙන් ශ්‍රී ලංකාව ලද කොටස වි.ගැ.හි මිලියන 554.80 ක් විය.

### II.2 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මු.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. වි.ගැ.හි සංචිත වත්කමක් ලෙස සලකනුයේ ජා.මු.අ. සාමාජිකයින් වි.ගැ.හි දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාළ විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම තුළිනි. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මු.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වේච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

විශේෂ ගැණුම් හිමිකම් දැරීම සතුව මුදල් වලට සමාන ලක්ෂණ පවතී. එමනිසා, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

### II.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මු.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

### II.4 ජා.මු.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| අදියර 1 | | |
| ජනවාරි 1 දිනට ශේෂය | 3 | 2 |
| වර්ෂය තුළ දී අයකිරීම්/(ආපසු හැරවුම්) | 5 | 1 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 8 | 3 |

## 12. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ. එයට අමතරව, රාජ්‍ය සුරැකුම්පත් කළඹ තුළ මුදල් නීති පනතේ 112 වගන්තිය යටතේ බැංකුව විසින් මිලදීගත් සුරැකුම්පත්ද අන්තර්ගත වේ.

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | **2,480,822,291** | 1,351,378,149 |
| භාණ්ඩාගාර බැඳුම්කර | **17,708,352** | 25,876,232 |
| ලැබිය යුතු පොළී | **464,372** | 565,966 |
| | **2,498,995,015** | 1,377,820,347 |

ශ්‍රී.ලං.ම.බැ. මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් ජා.මු.වා.ප්‍ර. 9ට අනුකූලව සමුච්චිත හානිකරන වෙන් කිරීම සඳහා ගැළපිය යුතුය. කෙසේ වෙතත් 2021 දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශ වල, රාජ්‍ය සුරැකුම්පත් වල අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී ශුන්‍ය අලාභ දීමනාවක් භාවිතා කර ඇත. පසුගිය 2023 මාර්තු 30 වන දින ශ්‍රී.ලං.ම.බැ. විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟ එක්ව දේශීය ණය ප්‍රශස්තකරණය (Domestic Debt Optimization) පිළිබඳව පවත්වන ලද ආයෝජක ඉදිරිපත් කිරීමේදී සඳහන් කළ පරිදි බලධාරීන් විසින් දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා විවිධ විකල්පයන් ඇගයීමට ලක් කරමින් සිටියි. කෙසේ වෙතත්, ශ්‍රී.ලං.ම.බැ. විසින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් කළඹේ අපේක්ෂිත ණය අලාභ ගණනය මත දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියේ බලපෑම තීරණය කිරීමට ප්‍රමාණවත් තොරතුරු මෙතෙක් ලැබී නොමැත.

## 13. ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | **691,637,000** | 567,297,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී | **6,432,219** | 235,312 |
| | **698,069,219** | 567,532,312 |

## 14. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ අදාළ වර්ෂය සඳහා රජය වෙත ලැබිය යුතු ඇස්තමේන්තු ගත ආදායමෙන් 10%ක උපරිමයකට යටත්ව ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි. රජය විසින් මෙම අත්තිකාරම පොළී රහිත නැවත ලබාගත හැකි ණය පහසුකමක් ලෙස භාවිතාකරන අතර මාස 6ක් නොඉක්මවන කාලයක් තුළදී නැවත පියවීමට බැඳී සිටී.

## 15. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

### 15.1 ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2022 කොටස් ගණන | 2022 ධාරණ අගය රු.000 | 2021 කොටස් ගණන | 2021 ධාරණ අගය රු.000 |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **2,986,824** | **769,866** | 2,986,824 | 653,414 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **500,000** | **-** | 500,000 | - |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **48,244** | **1,047,266** | 48,244 | 1,017,804 |
| | | | **1,817,132** | | 1,671,218 |

2022 නොවැම්බර් 03 වැනිදා සිට සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම සහ ලංකා පේ (පුද්ගලික) සමාගම යන සමාගම් 'ලංකා පේ (පුද්ගලික) සමාගම' යන තනි නාමයෙන් හඳුන්වනු ලබයි.

**15.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්කන්ධ ආයෝජන 2022 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයට වාර්තා කර ඇත. එම ආයෝජනවල සාධාරණ අගය, බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන දිනට ආයෝජිත සමාගම් විසින් හෙළිදරව් කරන ලද විගණනය නොකල නවතම මූල්‍ය වාර්තාවල සඳහන් කොටසක ශුද්ධ වත්කම් අගය අනුව ගණනය කරනු ලැබේ. ඒ අනුව, මෙහි දැක්වෙන දිනයන්හි පැවති කොටසක ශුද්ධ වත්කම් අගය ඉහත ගණනය කිරීම් සඳහා යොදාගන්නා ලදී.

| | |
|---|---|
| සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම | - 2022 දෙසැම්බර් 31 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | - රු. 257.75 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | - 2022 නොවැම්බර් 30 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | - රු. -4.60 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | - 2022 දෙසැම්බර් 31 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | - රු. 21,707.69 |

## 16. බැංකු සඳහා දෙන ලද ණය

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| බැංකු සඳහා දෙන ලද ණය (සටහන 16.1) | **28,601,832** | **90,621,674** |
| අඩු කළා: බැංකු සඳහා දෙන ලද ණය මත අපේක්ෂිත ණය අලාභ (සටහන 16.2) | **(343,930)** | **(48,928)** |
| | **28,257,902** | **90,572,746** |

### 16.1 බැංකු සඳහා දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව එලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| **මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **18,173** | 20,368 |
| **උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **42,260** | 89,707 |
| **සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද සහන ණය පහසුකම (සටහන 16.1.1)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **1,337,217** | 60,373,446 |
| - අනෙකුත් | **484,532** | 9,245,265 |
| **සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම (සටහන 16.1.2)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **11,207,691** | 8,644,208 |
| - අනෙකුත් | **2,570,533** | 3,173,742 |
| **සෞභාග්‍යා ණය පහසුකම (සටහන 16.1.3)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **10,469,090** | 6,850,588 |
| - අනෙකුත් | **2,087,594** | 2,211,334 |
| **ශ්‍රී.ලං.ම.බැංකුවේ ණය ඇපකර පහසුකම යටතේ ලබාදුන් ණය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **86,307** | 13,016 |
| **දේශීය කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය (නියමු ව්‍යාපෘතිය) (සටහන 16.1.4)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **227,305** | - |
| - අනෙකුත් | **71,130** | - |
| | **28,601,832** | **90,621,674** |

16.1.1 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීමට පහසුකම් සැපයීමක් ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 83 කොටස ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කොවිඩ්-19 පැතිර යාමෙන් අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර වෙත ණය ලබාදීම යන කොන්දේසියට යටත්ව ලබා දෙන ලදී.

16.1.2 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම: කොවිඩ්-19 පැතිර යාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍යම අංශයේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සහ රටේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම නව ප්‍රතිමූල්‍ය ණය පහසුකම සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ 2020 වසරේදී දියත් කරන ලදී.

16.1.3 සෞභාග්‍යා ණය පහසුකම: මුදල් නීති පනතේ 88(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආපදාවන්ගෙන් හානිවූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය 2010 වසරේදී හඳුන්වා දෙන ලදී.

16.1.4 දේශීය කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය (නියමු ව්‍යාපෘතිය) (DAD-PP): මුදල් නීති පනතේ 88(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සැමට ප්‍රතිලාභ බෙදී යන කෘෂිකාර්මික සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා පරිමාණ ගොවි ප්‍රජාව වෙත දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව වඩාත් හොඳ වෙළඳපොළ අවස්ථා උදාකිරීම හා තාක්ෂණික සහය ලබාදීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

### 16.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අදියර 1<br>රු. 000 | අදියර 2<br>රු. 000 | අදියර 3<br>රු. 000 | එකතුව<br>රු. 000 | අදියර 1<br>රු. 000 | අදියර 2<br>රු. 000 | අදියර 3<br>රු. 000 | එකතුව<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **14,435** | **21,477** | **13,016** | **48,928** | 6,215 | 148,153 | - | 154,368 |
| වර්ෂය තුළදී අය කිරීම් / (ආපසු හැරවුම්) | **(8,378)** | **230,088** | **73,291** | **295,001** | 8,220 | (120,676) | 13,016 | (105,440) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **6,057** | **251,565** | **86,307** | **343,930** | 14,435 | 21,477 | 13,016 | 48,928 |

## 17. අනිකුත් වත්කම්

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | |
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | 18,557,124 | 16,490,667 |
| අඩුකළා: අභ්‍යන්තර අරමුදලෙහි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.1) | (405) | (280) |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | 18,556,719 | 16,490,387 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ආයෝජන | - | 5,380,169 |
| අඩුකළා: ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.2) | - | (150) |
| | - | 5,380,019 |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | 5,355,855 | 5,592,375 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යංශ වලින් ලැබිය යුතු දෑ | 3,540,585 | 4,087,983 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 2,258,723 | 2,258,932 |
| අඩුකළා: අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.3) | (2,226,887) | (2,226,887) |
| | 8,928,276 | 9,712,403 |
| | 27,484,994 | 31,582,809 |
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | 2,697,566 | 2,480,961 |
| | 30,182,560 | 34,063,770 |

### 17.1 අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1 රු. 000 | අදියර 2 රු. 000 | එකතුව රු. 000 | අදියර 1 රු. 000 | අදියර 2 රු. 000 | එකතුව රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 39 | 241 | 280 | 48 | 79,524 | 79,572 |
| වර්ෂය තුළ අයකිරීම්/(ආපසු හැරවුම්) | 47 | 78 | 125 | (9) | (79,283) | (79,292) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 86 | 319 | 405 | 39 | 241 | 280 |

### 17.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙහෙයවන ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනයන්

| | 2022 අදියර 01 රු. 000 | 2021 අදියර 01 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 150 | - |
| වර්ෂය තුළදී අය කිරීම් | (150) | 150 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 150 |

### 17.3 අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2022 අදියර 03 රු. 000 | 2021 අදියර 01 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 2,226,887 | 183,276 |
| වර්ෂය තුළදී අය කිරීම් | - | - |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය ශේෂයන් මාරු කිරීම් | - | 2,043,611 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,226,887 | 2,226,887 |

## 18. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව භෞතිකව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

## 19. තොග

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | 2,485,880 | 1,788,014 |
| සංසරණය සඳහා ඇති කාසි | 2,074,163 | 2,821,514 |
| මාර්ගස්ථ කාසි | - | - |
| මාර්ගස්ථ නෝට්ටු | 144,188 | 253,168 |
| | 4,704,231 | 4,862,696 |
| අඩුකළා : සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | (2,446) | (2,446) |
| | 4,701,785 | 4,860,250 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | 86,622 | 68,124 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | - | 159 |
| මුළු තොගය | 4,788,407 | 4,928,533 |

2022 දී තොගයන්හි වටිනාකමින් රුපියල් මිලියන 2,339.65 (2021 - රු.මිලියන 2,780.25) තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) ලෙස සටහන් කර ඇත.

## 20. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය/තක්සේරු වටිනාකම | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2022 | එකතුව 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට ශේෂය | **18,174,063** | **1,615,478** | **1,394,680** | **611,793** | **1,141,540** | **69,049** | **57,417** | **154,042** | **23,218,062** | 24,026,767 |
| එකතු කිරීම් | **2,473** | **14,042** | **221,970** | **-** | **9,841** | **-** | **286** | **216,736** | **465,348** | 293,823 |
| බැහැර කිරීම් | **-** | **(95)** | **(5,357)** | **-** | **(2,025)** | **-** | **-** | **-** | **(7,477)** | (1,091,338) |
| මාරු කිරීම් | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **(177,699)** | **(177,699)** | - |
| බැහැර කළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | (11,190) |
| දෙසැම්බර් 31 දිනට අගය | **18,176,536** | **1,629,425** | **1,611,293** | **611,793** | **1,149,356** | **69,049** | **57,703** | **193,079** | **23,498,234** | 23,218,062 |

| සමුච්චිත ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2022 | එකතුව 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | **219,099** | **1,143,599** | **1,133,460** | **463,386** | **974,746** | **8,194** | **39,584** | **-** | **3,982,068** | 3,571,315 |
| වර්ෂය සඳහා ක්ෂය | **219,129** | **75,892** | **82,240** | **30,973** | **72,414** | **7,161** | **242** | **-** | **488,051** | 503,845 |
| බැහැර කිරීම් | **-** | **(56)** | **(5,198)** | **-** | **(1,909)** | **-** | **-** | **-** | **(7,163)** | (81,902) |
| බැහැර කළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | (11,190) |
| දෙසැම්බර් 31 දිනට අගය | **438,228** | **1,219,435** | **1,210,502** | **494,359** | **1,045,251** | **15,355** | **39,826** | **-** | **4,462,956** | 3,982,068 |
| ශුද්ධ පොත් අගය | **17,738,308** | **409,990** | **400,791** | **117,434** | **104,105** | **53,694** | **17,877** | **193,079** | **19,035,278** | 19,235,994 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2020 දෙසැම්බර් 31 දිනට වරලත් තක්සේරුකරු ඒ.ඒ.එම්. ෆාතිහු මහතා විසින් සිදු කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට පවතින මෙම ඉඩම් හා ගොඩනැගිලිවල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයන් හා සසඳන කළ සැලකිය යුතු වෙනසකට භාජනය වී නොමැති බව බැංකුවේ අදහසයි.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 617.28 (2021 - රු.මිලියන 680.89) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2022 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 2,939.00 ක් වේ (2021 - රු. මිලියන 1,929.55).

### තක්සේරුකරණ ප්‍රවේශය සහ සින්නක්කර ඉඩම්, ගොඩනැගිලි සහ කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ඉඩම්වල ඇති ගොඩනැගිලි තක්සේරු කිරීමේදී යොදාගත් සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.) | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.) | ඇස්තමේන්තුගත මාසික කුලිය (රු.) | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් | දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය (රු.000) |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 15,750,000 | 11,000 - 18,500 | - | - | - | 10,437,567 |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය | 13,200,000 | - | 7,000,000 | 35% | 16.66 | 783,407 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය | 14,400,000 | - | 10,000,000 | 35% | 16.66 | 1,077,180 |
| බැංකු විදු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 3,600,000 | 3,000 - 12,000 | - | - | - | 2,660,026 |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 10,000,000 | 4,000 - 11,000 | - | - | - | 1,709,163 |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,000,000 - 4,000,000 | 4,000 - 9,500 | - | - | - | 360,397 |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 150,000 - 750,000 | 3,000 - 9,500 | - | - | - | 222,786 |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,350,000 | 5,000 - 8,750 | - | - | - | 334,193 |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 270,000 | 5,000 - 12,500 | - | - | - | 231,605 |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 4,500 - 9,500 | - | - | - | 90,783 |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 7,000 | - | - | - | 21,960 |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 2,000 - 8,500 | - | - | - | 199,050 |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 11,750 - 12,000 | - | - | - | 45,946 |

**ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය**

| | ධාරණ අගය 2022 රු. 000 | ධාරණ අගය 2021 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **10,855,725** | 10,855,725 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **6,593,850** | 6,798,976 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **288,733** | 300,263 |
| | **17,738,308** | 17,954,964 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 7,133.73 ක් වේ (2021 - රු.මි. 7,273.50).

## 21. අස්පෘෂ්‍ය වත්කම්

| | 2022 අස්පෘෂ්‍ය වත්කම් රු. 000 | 2022 නොනිමි අස්පෘෂ්‍ය වත්කම් රු. 000 | 2022 එකතුව රු. 000 | 2021 රු. 000 |
|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග : | | | | |
| පිරිවැය: | | | | |
| ජනවාරි 01 දිනට අගය | **1,083,541** | **481,375** | **1,564,916** | 1,088,965 |
| වර්ෂය තුළදී එකතු කිරීම් | **879,377** | **329,632** | **1,209,009** | 475,951 |
| වර්ෂය තුළදී මාරු කිරීම් | **-** | **(613,507)** | **(613,507)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,962,918** | **197,500** | **2,160,418** | 1,564,916 |
| ක්‍රමක්ෂය: | | | | |
| ජනවාරි 01 දිනට අගය | **1,003,284** | **-** | **1,003,284** | 980,713 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **248,997** | **-** | **248,997** | 22,571 |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,252,281** | **-** | **1,252,281** | 1,003,284 |
| ශුද්ධ පොත් අගය: | | | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **710,637** | **197,500** | **908,137** | 561,632 |

වර්ෂය තුළ දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 879.38 (2021 - රු.මි. 78.50) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 982.69 (2021 රු. මි. 957.20)ක් වේ.

## 22. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **146,381,827** | 7,380 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **26,201** | 6,321 |
| | **146,408,028** | 13,701 |

විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් ලෙස දක්වා ඇති රු.බි. 146.37 ක මුදල, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (සාර්ක්) රටවල් සඳහා වන මුදල් හුවමාරු පහසුකම් විධිවිධාන යටතේ ශ්‍රී.ලං.ම.බැ සහ ඉන්දියානු මහ බැංකුව අතර 2020 ජුලි මාසයේ ඇතිවූ මුදල් හුවමාරු ගිවිසුම අනුව ගෙවිය යුතු ශේෂය වේ. මෙම ගිවිසුම යටතේ ඇ.එ.ජ. ඩොලර් මි. 400ක් ශ්‍රී ලංකාවට මූලික වශයෙන් 2020 ජුලි මාසයේදී ලැබුණු අතර 2020 නොවැම්බර් මාසයේදී සිදුකළ එහි පළමු දීර්ඝ කිරීමෙන් පසු 2021 පෙබරවාරි මාසයේදී එම හුවමාරු පහසුකම සම්පූර්ණයෙන් ගෙවා දමන ලදී. 2022 ජනවාරි මාසයේදී ශ්‍රී.ලං.ම.බැ. විසින් පෙර ගිවිසුම යටතේ ඇ.එ.ජ. ඩොලර් මි. 400ක දෙවන ලබාගැනීමක් කළ අතර එය 2022 අප්‍රේල් මාසයේදී නැවත දීර්ඝ කිරීමෙන් පසුව ගෙවාදැමීමට නියමිතව පවතී.

## 23. ආසියානු නිශ්කාෂණ සංගමය

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| ආසියානු නිශ්කාෂණ සංගමය වෙත ඇති බැඳීම් | **731,375,677** | 104,755,558 |
| උපචිත පොළිය | **4,882,452** | 9,058 |
| | **736,258,129** | 104,764,616 |

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, ඉරානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය සහ පකිස්ථානය එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. එක් එක් සහභාගීවන රටවල ශුද්ධ පියවුම් තත්ත්වය ඔවුන්ගේ මාස දෙකක් තුළ දෛනික හිඟ ශේෂය මත ගණනය කරනු ලබන අතර එකී පියවීම් ඊලඟ මාසයේ වැඩ කරන දින 4ක් තුළ සිදුකරනු ඇත. මෙයට අදාළ පොළී අනුපාතිකය 2022 වර්ෂය තුළ 0.10%ත් 4.09% (2021 වර්ෂය තුළදී 0.09% සහ 0.15%) ත් අතර පරාසයක් තුළ පැවතිනි.

## 24.ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | සටහන | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|---|
| පොළිය දරන ණය | 24.1 | **385,639,212** | 253,476,993 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | 24.2 | **459,264,653** | 266,944,782 |
| පංගු බැරකම් | 24.3 | **129,765,698** | 75,425,522 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | 24.4 | **153,255,529** | 74,217,946 |
| | | **1,127,925,092** | 670,065,243 |

**24.1** පොළී දරණ ණය, ජා.මු. අරමුදලෙන් ලබාගන්නා විස්තීර්ණ ණය පහසුකම් (EFF) වලින් සමන්විත වේ. විස්තීර්ණ ණය පහසුකම යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මු.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මු.අ. 2016 ජුනි හිදී විස්තීර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මු. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජුනි මස විස්තීර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 167.20), හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 251.40), පස්වන වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 252.00) හයවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.10) සහ හත්වන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.00) පිළිවෙලින් 2016 නොවැම්බර්, 2017 ජූලි, 2017 දෙසැම්බර්, 2018 ජුනි, 2019 මැයි සහ නොවැම්බර් 2019 යන මාස වලදී ලබාදී ඇත. හත්වන වාරිකය නිදහස් කිරීමත් සමග විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. බිලියන 1.31 ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොළී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොළී අනුපාතයට (2022 දෙසැම්බර් 31 දිනට වාර්ෂිකව 2.916%) පදනම් අංක 100 ක එකතුවට සමාන වේ.

| | සඵල පොළී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|---|---|
| විස්තීර්ණ ණය පහසුකම (EFF) | **0.077** | **2029** | **385,639,212** | 253,476,993 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **385,639,212** | 253,476,993 |

**24.2** විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.) යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 11 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

**24.3** පංගු බැරකම: අංක 11.1 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

**24.4** ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්: මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

## 25. අනෙකුත්

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 25.1) | **179** | 99 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 25.2) | **30,071** | 16,599 |
| DST විශේෂ ඩොලර් ගිණුම 2 (සටහන 25.3) | **991,218** | 1,484,824 |
| මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහබැංකුවට (Bangaladesh Bank) වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.4) | **73,060,873** | 40,161,167 |
| මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.5) | **520,231,000** | 315,452,000 |
| අනෙකුත් විදේශීය බැරකම් | **70,110** | 180,987 |
| | **594,383,451** | 357,295,676 |

### 25.1 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි

නඟා සිටුවීම සඳහා වන වියදම් මුල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2019 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 19.13 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී සිදුකල බෙදාහැරීම් වලින් අනතුරුව 2020 දෙසැම්බර් 31 දිනට මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004කි. 2021 සහ 2022 වර්ෂ තුළදී කිසිදු ගණුදෙනුවක් සිදුනොවූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනටද මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004 කි.

### 25.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය, 2019 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 20.24 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.83ක් බෙදාහරින ලද අතර 2021 සහ 2022 වර්ෂ තුළදී කිසිදු බෙදාහැරීමක් සිදු නොකළ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.082 කි.

### 25.3 DST විශේෂ ඩොලර් ගිණුම 2

මෙම ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යන අතර ඇ.එ.ජ. මුදලින් භාණ්ඩාගාරයට බැර කරනු ඇත.

2022 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මඟින් ලද මුදල් සහ දේශිය සහ විදේශිය ආයතන මඟින් භාණ්ඩාගාරයට ලැබුණු විවිධ ඇ.එ.ජ. ඩොලර් ලැබීම් භාවිතා කරමින් රජය වෙනුවෙන් ණය ගෙවීම් සිදු කරන ලදී. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 2.73 කි.

### 25.4 බංගලාදේශ මහ බැංකුව (Bangaladesh Bank) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහ බැංකුවට ගෙවීමට ඇති මුදල

ශ්‍රී.ලං.ම.බැ. සහ බංගලාදේශ මහ බැංකුව 2021 අගෝස්තු මාසයේදී මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලද අතර 2022 මැයි මාසයේදී එම ගිවිසුමට අතිරේක ගිවිසුමක් එකතු විය. මෙම ගිවිසුම් ප්‍රකාරව, 2021 අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 200ක මුදලක්, ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට අදියර 03ක් යටතේ මාස 03 කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලද අතර එය සමාන කාලයක් සඳහා අවස්ථා පහකදී නැවත ලබාගැනීමේ හැකියාවකින් යුතු වේ.

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී යළි ලබාගත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 200 දැක්වෙන අතර එහි මීළඟ ලබාගැනීම, මහ බැංකු දෙක අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාවය මත 2023 පෙබරවාරි සහ මාර්තු මාසවලදී සිදුකිරීමට නියමිතව ඇත.

### 25.5 පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා (People's Bank of China) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල

ශ්‍රී.ලං.ම.බැ. සහ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා 2021 මාර්තු 19 වැනි දින මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රකාරව, 2021 දෙසැම්බර් මාසයේදී සීමා සහිත භාවිතයක් සඳහා (සටහන 8.1) චීන යුආන් බිලියන 10ක මුදලක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන මුදලක්) ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට, වසරක කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලදී. 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස 2022 දෙසැම්බර් මාසයේදී වසරක කාලයක් සඳහා යලි ලබාගත් චීන යුආන් බිලියන 10 ක මුදල දැක්වෙන අතර, එහි දෙවන ලබා ගැනීම 2023 දෙසැම්බර් මාසයේ සිට ගිවිසුම කල් ඉකුත්වන 2024 මාර්තු මාසය දක්වා ලබාගැනීම, බැංකු දෙක අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාවය මත සිදුවනු ඇත.

## 26. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශ්වයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **240,719,873** | 221,738,927 |
| - අනිකුත් | **70,817,929** | 67,657,247 |
| | **311,537,802** | 289,396,174 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **216** | 21 |
| - අනිකුත් | **11,508,163** | 11,307,967 |
| | **11,508,379** | 11,307,988 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **323,046,181** | 300,704,162 |

## 27. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **160,513** | 160,511 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **60,898** | 1,231,790 |
| | **221,411** | 1,392,301 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

## 28. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | **330,637,059** | 101,062,880 |
| | **330,637,059** | 101,062,880 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් ශේෂයක් නොමැත. (2021-ශේෂයක් නොමැත)

මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ද නිත්‍ය තැන්පතු පහසුකම යොදාගනී. මෙම පහසුකම දෛනික ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියේදී ද්‍රවශීලතා අවශ්‍යතාවයන් ලබාගැනීමට නොහැකිවන, ඒ සඳහා සහභාගී වන ආයතන සඳහා අදාළ වේ. මෙය එක්දින පදනම යටතේ පමණක් සිදුවන සුරැකුම් රහිතව පවතින පහසුකමක් වේ.

## 29. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| **කාසි** | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,709** | 5,709 |
| සත 5 | **23,267** | 23,267 |
| සත 10 | **39,236** | 39,236 |
| සත 25 | **122,475** | 121,246 |
| සත 50 | **185,097** | 185,147 |
| රුපියල් 1 | **1,054,291** | 1,023,087 |
| රුපියල් 2 | **1,633,948** | 1,587,838 |
| රුපියල් 5 | **5,373,467** | 5,168,455 |
| රුපියල් 10 | **8,278,530** | 7,673,980 |
| රුපියල් 20 | **149,777** | 40,955 |
| සමරු කාසි | **604,099** | 598,953 |
| | **17,473,527** | 16,471,504 |
| **නෝට්ටු** | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,694** | 26,694 |
| රුපියල් 5 | **37,191** | 37,191 |
| රුපියල් 10 | **1,247,314** | 1,249,128 |
| රුපියල් 20 | **7,714,028** | 7,235,137 |
| රුපියල් 50 | **7,672,840** | 7,086,604 |
| රුපියල් 100 | **27,890,398** | 27,472,139 |
| රුපියල් 200 | **126,206** | 126,412 |
| රුපියල් 500 | **52,838,832** | 52,284,157 |
| රුපියල් 1,000 | **154,427,683** | 160,770,610 |
| රුපියල් 2,000 | **2,709,640** | 2,950,509 |
| රුපියල් 5,000 | **754,397,918** | 729,384,000 |
| | **1,009,093,725** | 988,627,562 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **1,026,567,252** | 1,005,099,066 |

## 30. අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| වෙන්කිරීම් සහ අයකිරීම් | **7,910,908** | 3,791,015 |
| වානිජ බැංකු සඳහා ගෙවිය යුතු මුදල් | **-** | 431,145 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් (සටහන 30.1) | **15,415,255** | 11,592,360 |
| විස්කම් ණය යෝජනා ක්‍රමය යටතේ දායක වූ බැංකු සඳහා ඇති ගෙවීම් | **-** | 1,683,468 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන් (සටහන 30.2) | **12,361** | 8,701 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් (සටහන 30.3) | **44,981,823** | 1,657,193 |
| | **68,320,347** | 19,163,882 |

**30.1** අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

### 30.2. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයන් හි ශේෂය | **12,361** | 8,701 |
| | **12,361** | 8,701 |

**30.3.** අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ අන්තර්ගත රු.බි 37.02 ක මුදල, දේශීය බැංකු මඟින් කල්පිරෙන දිනයේදී පියවීම් සිදු නොකළ ඇ.එ.ජ. ඩොලර් / රුපියල් හුවමාරු හේතුවෙන් ශ්‍රී.ලං.ම. බැංකුවට ලැබිය යුතු ඇ.එ.ජ. ඩොලර් ප්‍රමාණය නිරූපණය කරන අතර අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ අන්තර්ගත රු.බි. 35.67 ක මුදල ඉහත හුවමාරුවේ ගෙවිය යුතු රුපියල් අගය වේ.

## 31. විලම්භිත ප්‍රදානයන්

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **1,178** | 789 |
| වර්ෂය තුළදී එකතු කිරීම් | **1,288** | 3,089 |
| වර්ෂය තුළ ක්‍රමක්ෂය | **(632)** | (2,700) |
| දෙසැම්බර් 31 දිනට | **1,834** | 1,178 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

මෙම එකතු කිරීම් අතර, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සඳහා නව ස්වයංක්‍රීය පද්ධතියක් සකස්කිරීමට අවශ්‍ය මෘදුකාංග වැඩිදියුණු කිරීම සඳහා වැයවන මුදලෙන් 70% ක් වන පරිදි SAPP හි ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් ශ්‍රී.ලං.ම.බැංකුවට කරන ලද ප්‍රදානයක් (රු.මි.1.29), Bank of Korea හි Knowledge Partnership Program මගින් 2020 සහ 2021 වසරවල දී ශ්‍රී.ලං.ම.බැංකුවේ සේවක සේවිකාවන් සඳහා වන පුහුණු වැඩසටහන් වල වියදම් දරා ගැනීම සඳහා ලබාදුන් රු.මි. 1.45ක පරීක්ෂණ ප්‍රදානයන් දෙකක් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ තිරසාර මූල්‍යනය සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ලබාදුන් රු.මි. 2.32 ක ප්‍රදානයක් ඇතුළත් වේ.

## 32. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාමවැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන්, දෙමව්පියන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය වන රු.මි. 43,838.73 (2021 - රු.මි. 53,334.41) ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 40,853.23 (2021 - රු.මි. 66,279.21) ඉක්මවා යන අතර වාර්තාකරණ කාලය අවසානයේදී රු.මි. 2,985.49 (2021- හිඟය රු.මි. 12,944.80) ක අතිරික්තයක් පෙන්නුම් කරයි.

| 2022 දෙසැම්බර් 31 දිනට<br>ප්‍රතිලාභ බැරකම/ (වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 28,743,485 | 742,361 | 6,594,557 | 769,222 | 256,344 | 316,311 | 3,430,954 | 40,853,234 |
| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ වටිනාකම | (27,133,747) | (4,890,127) | (5,575,619) | (2,151,516) | (1,101,040) | (210,570) | (2,776,110) | (43,838,729) |
| **ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 1,609,738 | (4,147,766) | 1,018,938 | (1,382,294) | (844,696) | 105,741 | 654,844 | (2,985,495) |

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **1,609,738** | 15,142,138 |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **(4,147,765)** | (3,589,011) |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **1,018,938** | 2,649,217 |
| වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **(455,747)** | (455,747) |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (දළ අගය) | **316,311** | 379,276 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (දළ අගය) | **3,430,954** | 3,803,864 |
| | **1,772,429** | 17,929,737 |

| 2022 දෙසැම්බර් 31 දිනට<br>ප්‍රතිලාභ බැරකම්/(වත්කම) වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2022 ජනවාරි 01 දිනට | 15,142,138 | (3,589,011) | 2,649,217 | (1,147,643) | (455,747) | 53,957 | 291,888 | 12,944,799 |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්) | 1,753,459 | (336,011) | 258,156 | (146,789) | (175,238) | 35,323 | 1,131,049 | 2,519,949 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය | (11,675,870) | 342,225 | (1,777,027) | (87,862) | (213,711) | 16,461 | (768,093) | (14,163,877) |
| දායක ගෙවීම් | (3,609,989) | (564,969) | (111,408) | - | - | - | - | (4,286,366) |
වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| 2022 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | ස්ටර්ලිං පවුම් |
|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| මිලදී ගැනුම් | 38,782,950 | 242,870,513 | 5,467,529 |
| විකුණුම් | (186,160,301) | (38,126,550) | - |
| ඉදිරි ප්‍රති ගිණුම | - | - | - |

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

| | මුදල් වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යූරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විගැහි | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 138,000,677 | 568,045 | 9,461,477 | 1,996,158 | - | 650,773 | 31,353 | 11,271 | 362,128,066 | 512,847,820 |
| ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති හා අනිකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 8,818,244 | - | - | - | - | - | - | - | - | 8,818,244 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 55,853 | - | - | - | - | - | - | - | 53,966,983 | 54,022,836 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 188,045,840 | - | - | - | - | 188,045,840 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | 146,874,774 | 568,045 | 9,461,477 | 1,996,158 | 188,045,840 | 650,773 | 31,353 | 11,271 | 416,095,049 | 763,734,740 |
| සමානුපාතය | 19.23% | 0.08% | 1.24% | 0.26% | 24.62% | 0.09% | 0.00% | 0.00% | 54.48% | 100.00% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 13,641 | - | - | - | - | - | - | - | 60 | 13,701 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - | - | - | - | - | 1,139,323 | 1,139,323 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 104,764,616 | - | - | - | - | - | - | - | - | 104,764,616 |
| ජා.මූ.අ. | 480,115 | - | - | - | 669,585,128 | - | - | - | - | 670,065,243 |
| අනෙකුත් | 41,662,689 | - | - | - | - | - | - | - | 315,632,987 | 357,295,676 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 146,921,061 | - | - | - | 669,585,128 | - | - | - | 316,772,370 | 1,133,278,559 |
| සමානුපාතය | 12.97% | 0.00% | 0.00% | 0.00% | 59.08% | 0.00% | 0.00% | 0.00% | 27.95% | 100.00% |
| **ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය** | (46,287) | 568,045 | 9,461,477 | 1,996,158 | (481,539,288) | 650,773 | 31,353 | 11,271 | 99,322,679 | (369,543,819) |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ

| 2021 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | ජපන් යෙන් |
|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| මිලදී ගැනුම් | 145,161,075 | 50,073,176 | - |
| විකුණුම් | (45,145,128) | (147,228,648) | (4,876,735) |
| ඉදිරි ප්‍රති ගිණුම | 2,016,260 | - | - |

පහත සඳහන් විනිමය අනුපාතිකයන් බැංකුව විසින් යොදාගන්නා ලදී.

| මුදල් වර්ගය | සාමාන්‍ය අනුපාතය | | වර්ෂ අවසාන එතැන් අනුපාතය | |
|---|---|---|---|---|
| | **2022** | **2021** | **2022** | **2021** |
| | රු. | රු. | රු. | රු. |
| ඇ.එ.ජ. ඩොලර් 1 | 328.1818 | 200.1553 | 363.1100 | 200.4338 |
| යූරෝ 1 | 343.2079 | 236.2532 | 388.3461 | 227.8832 |
| ජපන් යෙන් 1 | 2.4762 | 1.8137 | 2.7704 | 1.7417 |
| ස්ටර්ලින් පවුම් 1 | 400.7632 | 275.2172 | 437.4023 | 271.2270 |
| වි.ගැ.හි. 1 | 436.4326 | 285.0534 | 483.3276 | 280.9312 |
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | 226.3545 | 149.8331 | 247.0237 | 145.5851 |

**සංවේදිතා විශ්ලේෂණය**

වාර්තාකරණ දිනය ප්‍රකාරව ඉහත සඳහන් මුදල් වර්ගයක් ශ්‍රී ලංකා රුපියලට එරෙහිව සාධාරණ ලෙස ශක්තිමත් වීම/(දුර්වල වීම), විදේශීය මුදල් වලින් මූල්‍ය උපකරණ මිනුම් කිරීම මත බලපෑමක් ඇති කරනු ලැබූ අතර, ලාභය හෝ අලාභය කෙරෙහි පහත පෙන්වන පරිදි බලපා ඇත.

| | ලාභයන් හෝ අලාභය | |
|---|---|---|
| | ශක්තිමත් වීම | දුර්වල වීම |
| 2022 දෙසැම්බර් 31 | රු. 000 | රු. 000 |
| ඇ.එ.ජ. ඩොලර් (5% විචලනය) | (38,211,334) | 38,211,334 |
| යූරෝ (5% විචලනය) | 100,119 | (100,119) |
| ජපන් යෙන් (5% විචලනය) | 6,506 | (6,506) |
| ස්ටර්ලින් පවුම් (5% විචලනය) | 18,650 | (18,650) |
| වි.ගැ.හි. (5% විචලනය) | (42,325,201) | 42,325,201 |
| ඕස්ට්‍රේලියානු ඩොලර් (5% විචලනය) | 3,125 | (3,125) |

| | ලාභයන් හෝ අලාභය | |
|---|---|---|
| | ශක්තිමත් වීම | දුර්වල වීම |
| 2021 දෙසැම්බර් 31 | රු. 000 | රු. 000 |
| ඇ.එ.ජ. ඩොලර් (5% විචලනය) | (2,314) | 2,314 |
| යූරෝ (5% විචලනය) | 28,402 | (28,402) |
| ජපන් යෙන් (5% විචලනය) | 473,074 | (473,074) |
| ස්ටර්ලින් පවුම් (5% විචලනය) | 99,808 | (99,808) |
| වි.ගැ.හි. (5% විචලනය) | (24,076,964) | 24,076,964 |
| ඕස්ට්‍රේලියානු ඩොලර් (5% විචලනය) | 32,539 | (32,539) |

## 48.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

| 2022 දෙසැම්බර් 31 දිනට | මාස 6ට අඩු<br>රු. 000 | මාස 6 සිට වර්ෂ 1 දක්වා<br>රු. 000 | වර්ෂ 1 සිට 2 දක්වා<br>රු. 000 | වර්ෂ 2 සිට 5 දක්වා<br>රු. 000 | වර්ෂ 5ට වැඩි<br>රු. 000 | එකතුව<br>රු. 000 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 651,687,864 | - | - | - | - | **651,687,864** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 76,939 | 1,166,269 | 122,550 | 11,138,399 | - | **12,504,157** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 2,036,025 | - | - | 377,081 | 279,007,968 | **281,421,074** |
| අනිකුත් ලැබිය යුතු දෑ | 37,022,631 | - | - | - | - | **37,022,631** |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 690,823,459 | 1,166,269 | 122,550 | 11,515,480 | 279,007,968 | **982,635,726** |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 2,576,853,759 | 1,110,750 | 1,648,793 | 162,211 | - | **2,579,775,513** |
| නැවත විකිණීමේ ගිවිසුම මත මිලදීගත් සුරැකුම්පත් | 698,069,219 | - | - | - | - | **698,069,219** |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 235,638,700 | - | - | - | - | **235,638,700** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 1,817,132 | **1,817,132** |
| බැංකු සඳහා දෙන ලද ණය | 17,790,731 | 2,406,273 | 3,778,538 | 5,463,674 | - | **29,439,216** |
| අනෙකුත් වත්කම් | 10,080,599 | 2,433,073 | 4,303,462 | 12,088,605 | 108,728,649 | **137,634,388** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 3,538,433,008 | 5,950,096 | 9,730,793 | 17,714,490 | 110,545,781 | **3,682,374,168** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 4,229,256,467 | 7,116,365 | 9,853,343 | 29,229,970 | 389,553,749 | **4,665,009,894** |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 146,408,028 | - | - | - | - | **146,408,028** |
| ආසියානු නිශ්කාෂන සංගමය | 736,258,129 | - | - | - | - | **736,258,129** |
| ජා.මූ.අ. | 42,676,142 | 47,398,218 | 102,078,683 | 264,345,549 | 994,038,353 | **1,450,536,945** |
| අනෙකුත් | 73,060,873 | 521,322,578 | - | - | - | **594,383,451** |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | 998,403,172 | 568,720,796 | 102,078,683 | 264,345,549 | 994,038,353 | **2,927,586,553** |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 323,046,181 | - | - | - | - | **323,046,181** |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 221,411 | - | - | - | - | **221,411** |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම | 330,637,059 | - | - | - | - | **330,637,059** |
| සංසරණයෙහි පවත්නා මුදල් | 1,026,567,252 | - | - | - | - | **1,026,567,252** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 68,320,347 | - | - | - | - | **68,320,347** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | 1,748,792,250 | - | - | - | - | **1,748,792,250** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | 2,747,195,422 | 568,720,796 | 102,078,683 | 264,345,549 | 994,038,353 | **4,676,378,803** |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)** | 1,482,061,045 | (561,604,431) | (92,225,340) | (235,115,579) | (604,484,604) | **(11,368,909)** |

| 2022 දෙසැම්බර් 31 දිනට | මාස 6ට අඩු | මාස 6 සිට වර්ෂ 1 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5ට වැඩි දක්වා | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 27,845,531 | 5,982,333 | 14,498,792 | 51,034,302 | 6,360,968 | 105,721,926 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 31,340,783 | 10,620,241 | 25,779,358 | 89,890,059 | 10,076,303 | 167,706,744 |

**විදේශීය මුදල් පරිවර්තනය**

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියළුම අනාගත මූල්‍ය ප්‍රවාහ, වාර්තාගතකරණ මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ, වාර්තාකරණ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

| 2021 දෙසැම්බර් 31 දිනට | මාස 6ට අඩු | මාස 6 සිට වර්ෂ 1 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| විදේශීය මූල්‍ය වත්කම් | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 512,762,452 | - | - | - | - | 512,762,452 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 72,720 | 72,720 | 2,851,296 | 6,215,953 | - | 9,212,689 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 38,245,157 | - | - | 216,785 | 149,583,895 | 188,045,837 |
| මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම් | 551,080,329 | 72,720 | 2,851,296 | 6,432,738 | 149,583,895 | 710,020,978 |
| දේශීය මූල්‍ය වත්කම් | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 1,039,925,021 | 356,959,017 | 2,731,167 | 24,517,061 | - | 1,424,132,266 |
| නැවත විකිණීමේ ගිවිසුම මත මිලදීගත් සුරැකුම්පත් | 567,532,312 | - | - | - | - | 567,532,312 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 150,128,800 | - | - | - | - | 150,128,800 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 1,671,218 | 1,671,218 |
| බැංකු සඳහා දෙන ලද ණය | 79,700,303 | 4,111,486 | 4,107,462 | 3,432,763 | - | 91,352,014 |
| අනෙකුත් වත්කම් | 13,862,510 | 1,675,011 | 5,311,071 | 10,164,003 | 15,569,723 | 46,582,318 |
| මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම් | 1,851,148,946 | 362,745,514 | 12,149,700 | 38,113,827 | 17,240,941 | 2,281,398,928 |
| මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම් | 2,402,229,275 | 362,818,234 | 15,000,996 | 44,546,565 | 166,824,836 | 2,991,419,906 |
| විදේශීය මූල්‍ය වගකීම් | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 13,701 | - | - | - | - | 13,701 |
| ආසියානු නිශ්කාෂන සංගමය | 104,764,616 | - | - | - | - | 104,764,616 |
| ජා.මූ.අ. | 16,817,583 | 15,339,852 | 38,786,708 | 135,825,841 | 475,810,517 | 682,580,501 |
| අනෙකුත් | 40,161,167 | 317,134,509 | - | - | - | 357,295,676 |
| මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම් | 161,757,067 | 332,474,361 | 38,786,708 | 135,825,841 | 475,810,517 | 1,144,654,494 |
| දේශීය මූල්‍ය වගකීම් | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 300,704,162 | - | - | - | - | 300,704,162 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 1,392,301 | - | - | - | - | 1,392,301 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම | 101,062,880 | - | - | - | - | 101,062,880 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 1,005,099,066 | - | - | - | - | 1,005,099,066 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 19,163,882 | - | - | - | - | 19,163,882 |
| මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම් | 1,427,422,291 | - | - | - | - | 1,427,422,291 |
| මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම් | 1,589,179,358 | 332,474,361 | 38,786,708 | 135,825,841 | 475,810,517 | 2,572,076,785 |
| ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්) | 813,049,917 | 30,343,873 | (23,785,712) | (91,279,276) | (308,985,681) | 419,343,121 |

| 2021 දෙසැම්බර් 31 දිනට | මාස 6ට අඩු | මාස 6 සිට වර්ෂ 1 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 17,388,862 | 14,913,000 | 5,154,573 | 45,842,140 | 16,748,562 | 100,047,137 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 16,884,671 | 15,032,535 | 5,260,986 | 46,097,369 | 16,698,942 | 99,974,503 |

**48.5 ද්‍රවශීලතා අවදානම**

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැඳීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීම සඳහා ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා, ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා ඉතා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් වත්කම් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා ද විදේශීය සංචිත ඇවර කිරීමේ විභව අවශ්‍යතාවය මෙයින් ගම්‍ය වේ. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විවට වෙළෙඳපොල කටයුතු වැනි දේශීය මුදල් ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල ද්‍රවශීලතා අවදානම අඩු කිරීම සඳහා ඉතා ද්‍රවශීලී වෙළෙඳපොළ උපකරණ වන භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර, ඇප සුරැකුම් ලෙස භාවිතා කර ඇත. මහ බැංකු සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරු වැනි උපකරණ භාවිතයෙන්, විදීම් හා උකහා ගැනීම් ඔස්සේ බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතා තත්වය කළමනාකරණය කරනු ලබයි.

**(ඇ) අනාගත මූල්‍යනයට සහාය වීම සඳහා පවතින මූල්‍ය වත්කම්**

අනාගත මූල්‍යනයට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූල්‍ය වත්කම් පහත සටහනින් දැක්වේ.

| 2022 දෙසැම්බර් 31 දිනට | යටත් වූ ඇපකරයක් ලෙස ඔඩපන කල රු. 000 | යටත් නොවූ ඇපකරයක් ලෙස යොදාගත හැකි රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | - | 651,687,864 | **651,687,864** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 1,090,124 | 9,777,301 | **10,867,425** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 401,580 | **401,580** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | 281,421,074 | **281,421,074** |
| අනෙකුත් ලැබිය යුතු දෑ | - | 37,022,631 | **37,022,631** |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | 2,498,995,015 | **2,498,995,015** |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | - | 698,069,219 | **698,069,219** |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | - | 235,638,700 | **235,638,700** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | 1,817,132 | **1,817,132** |
| බැංකු සඳහා දෙන ලද ණය | - | 28,257,902 | **28,257,902** |
| අනෙකුත් වත්කම් | - | 30,182,645 | **30,182,645** |
| මුළු වත්කම් | 1,090,124 | 4,473,271,064 | **4,474,361,188** |

| 2021 දෙසැම්බර් 31 දිනට | යටත් වූ ඇපකරයක් ලෙස ඔඩපන කල රු. 000 | යටත් නොවූ ඇපකරයක් ලෙස යොදාගත හැකි රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | - | 512,762,452 | 512,762,452 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 2,830,756 | 5,987,488 | 8,818,244 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 54,022,836 | 54,022,836 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | 188,045,837 | 188,045,837 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | 1,377,820,347 | 1,377,820,347 |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදී ගත් සුරැකුම්පත් | - | 567,532,312 | 567,532,312 |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | - | 150,128,800 | 150,128,800 |
| මූල්‍ය හා අනෙකුත් ආයතයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | 1,671,218 | 1,671,218 |
| බැංකු සඳහා දෙන ලද ණය | - | 90,572,746 | 90,572,746 |
| අනෙකුත් වත්කම් | - | 34,063,770 | 34,063,770 |
| මුළු වත්කම් | 2,830,756 | 2,982,607,806 | 2,985,438,562 |

## 49. මූල්‍ය වත්කම් හා වගකීම්

### 49.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පේළි අයිතම සහ මූල්‍ය උපකරණ කාණ්ඩයන් අතර සැසඳුමක් පහත සටහනින් සපයයි.

| 2022 දෙසැම්බර් 31 දිනට | ලාභ/අලාභ මගින් සාධාරණ අගය | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ | ක්‍රමක්ෂය පිරිවැය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | - | - | - | 651,687,864 | **651,687,864** |
| අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | - | 10,867,425 | - | - | **10,867,425** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 401,580 | - | - | - | **401,580** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | 280,406,015 | - | - | 1,015,059 | **281,421,074** |
| අනිකුත් ලැබිය යුතු දෑ | - | - | - | 37,022,631 | **37,022,631** |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | 280,807,595 | 10,867,425 | - | 689,725,554 | **981,400,574** |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | 2,498,995,015 | - | - | **2,498,995,015** |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | - | - | - | 698,069,219 | **698,069,219** |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | - | - | - | 235,638,700 | **235,638,700** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | 1,817,132 | - | **1,817,132** |
| බැංකු සඳහා දෙන ලද ණය | - | - | - | 28,257,902 | **28,257,902** |
| අනෙකුත් වත්කම් | - | - | - | 30,182,560 | **30,182,560** |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | - | 2,498,995,015 | 1,817,132 | 992,148,381 | **3,492,960,528** |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | - | - | - | 146,408,028 | **146,408,028** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 71,697,994 | - | - | - | **71,697,994** |
| ආසියානු නිෂ්කාශන සංගමය | - | - | - | 736,258,129 | **736,258,129** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) | - | - | - | 1,127,925,092 | **1,127,925,092** |
| අනෙකුත් | - | - | - | 594,383,451 | **594,383,451** |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | 71,697,994 | - | - | 2,604,974,700 | **2,676,672,694** |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | - | - | - | 323,046,181 | **323,046,181** |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | - | - | - | 221,411 | **221,411** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම | - | - | - | 330,637,059 | **330,637,059** |
| සංසරණයේ පවත්නා මුදල් | - | - | - | 1,026,567,252 | **1,026,567,252** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | - | - | - | 68,320,347 | **68,320,347** |
| මුළු දේශීය මූල්‍ය බැරකම් | - | - | - | 1,748,792,250 | **1,748,792,250** |

| 2021 දෙසැම්බර් 31 දිනට | ලාභ/අලාභ මගින් සාධාරණ අගය | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ | ක්‍රමක්ෂය පිරිවැය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | - | - | - | 512,762,452 | 512,762,452 |
| අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | - | 8,818,244 | - | - | 8,818,244 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 54,022,836 | - | - | - | 54,022,836 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | 187,404,111 | - | - | 641,726 | 188,045,837 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | 216,626,384 | 8,818,244 | - | 538,204,741 | 763,649,369 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | 1,377,820,347 | - | - | 1,377,820,347 |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | - | - | - | 567,532,312 | 567,532,312 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | - | - | - | 150,128,800 | 150,128,800 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | 1,671,218 | - | 1,671,218 |

| | | | | | |
|---|---|---|---|---|---|
| බැංකු සඳහා දෙන ලද ණය | - | - | - | 90,572,746 | 90,572,746 |
| අනිකුත් වත්කම් | - | - | - | 34,063,770 | 34,063,770 |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | - | 1,377,820,347 | 1,671,218 | 842,297,628 | 2,221,789,193 |
| විදේශීය මූල්‍ය බැරකම් | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | - | - | - | 13,701 | 13,701 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 1,139,323 | - | - | - | 1,139,323 |
| ආසියානු නිශ්කාශන සංගමය | - | - | - | 104,764,616 | 104,764,616 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) | - | - | - | 670,065,243 | 670,065,243 |
| අනිකුත් | - | - | - | 357,295,676 | 357,295,676 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | 1,139,323 | - | - | 1,132,139,236 | 1,133,278,559 |
| දේශීය මූල්‍ය බැරකම් | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | - | - | - | 300,704,162 | 300,704,162 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | - | - | - | 1,392,301 | 1,392,301 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම | - | - | - | 101,062,880 | 101,062,880 |
| සංසරණයේ පවත්නා මුදල් | - | - | - | 1,005,099,066 | 1,005,099,066 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | - | - | - | 19,163,882 | 19,163,882 |
| මුළු දේශීය මූල්‍ය බැරකම් | - | - | - | 1,427,422,291 | 1,427,422,291 |

## 50. සාධාරණ අගය පිළිබඳ හෙළිදරව් කිරීම්

### 50.1 වත්කම් හා වගකීම් වල සාධාරණ අගය

සාධාරණ අගය යනු වෙළඳපල ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම් ගත කරනු ලබන දිනයට, ප්‍රධාන වෙළඳපොළෙහි දී හෝ එවැනි ප්‍රධාන වෙළඳපොළක් නොමැති අවස්ථාවක දී එම දිනයේ දී ලඟා විය හැකි වඩාත් වාසි සහගත වෙළඳපොළෙහි දී, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදලයි. වගකීමක සාධාරණ අගය මගින් එම වගකීම ඉටු නොවීමේ අවදානම පිළිඹිබු වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 5.2 හි විස්තර කර ඇති පරිදි නිරීක්ෂණය කල හැකි වෙළඳපොළ මිල ගණන් නොමැති අවස්ථාවක දී මූල්‍ය වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා තක්සේරු ශිල්පයම භාවිතා කරයි.

නිරන්තර වෙළඳාම් සිදු නොවන සහ ඉතා අඩු මිල විනිවිදභාවයක් සහිත මූල්‍ය උපකරණ ඒවාහි නිවැරදි සාධාරණ අගය නිරූපණය නොකරයි. ඒවාහි සාධාරණ අගය මිණුම් කිරීමේදී, ද්‍රවශීලතාවය, සංකේන්ද්‍රය, වෙළඳපොළ සාධකයන්හි අවිනිශ්චිත බව, මිල උපකල්පන හා විශේෂිත උපකරණයන්ට බලපාන අනෙකුත් අවදානම් මත පදනම් වූ විවිධ මට්ටම්වල විනිශ්චයන් යොදාගනු ලැබේ.

මූල්‍ය උපකරණ සඳහා වූ සාධාරණ අගය ධූරාවලිය පහත දැක්වේ

**පළමුවන මට්ටම** : අනන්‍ය වත්කම හෝ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොගලපන ලද) මිල ගණන් භාවිතයෙන් සාධාරණ අගය මැනීම;

**දෙවන මට්ටම** : පළමුවන මට්ටමේ සඳහන් ප්‍රකාශිත මිල ගණන් නොවන, එහෙත් ඍජුව (උදා:- මිල ගණන්) හෝ වක්‍රව (උදා:- මිල ඔස්සේ තීරණය වුණු) වත්කම් හා වගකීම් සඳහා නිරීක්ෂිත යෙදවුම් භාවිතයෙන් සාධාරණ අගය මැනීම, සහ

**තෙවන මට්ටම** : නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ (උදා:- නිරීක්ෂණය කළ නොහැකි) යෙදවුම් භාවිතයෙන් වත්කම් හා වගකීම්හි සාධාරණ අගය මැනීම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

| 2022 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| මූල්‍ය වත්කම් | | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත් | 10,867,425 | - | - | **10,867,425** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 401,580 | - | **401,580** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 280,406,015 | - | - | **280,406,015** |
| | 291,273,440 | 401,580 | - | **291,675,020** |
| මූල්‍ය නොවන විදේශ වත්කම් | | | | |
| රන් | 10,031,610 | - | - | **10,031,610** |
| | 10,031,610 | - | - | **10,031,610** |
| දේශීය මූල්‍ය වත්කම් | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 2,498,995,015 | - | - | **2,498,995,015** |
| මූල්‍ය සහ රජයේ ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | - | - | 1,817,132 | **1,817,132** |
| | 2,498,995,015 | - | 1,817,132 | **2,500,812,147** |
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම් | | | | |
| ඉඩම් | - | - | 10,855,725 | **10,855,725** |
| ගොඩනැගිලි | - | - | 7,099,239 | **7,099,239** |
| | - | - | 17,954,964 | **17,954,964** |
| මූල්‍ය වගකීම් | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 71,697,994 | - | **71,697,994** |
| | - | 71,697,994 | - | **71,697,994** |

| 2021 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම | දෙවන මට්ටම | තෙවන මට්ටම | එකතුව |
|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මූල්‍ය වත්කම් | | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත් | 8,818,244 | - | - | 8,818,244 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 54,022,836 | - | 54,022,836 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | 187,404,111 | - | - | 187,404,111 |
| | 196,222,355 | 54,022,836 | - | 250,245,191 |
| මූල්‍ය නොවන විදේශ වත්කම් | | | | |
| රන් | 35,151,981 | - | - | 35,151,981 |
| | 35,151,981 | - | - | 35,151,981 |
| දේශීය මූල්‍ය වත්කම් | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 1,377,820,347 | - | - | 1,377,820,347 |
| මූල්‍ය සහ රජයේ ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | - | - | 1,671,218 | 1,671,218 |
| | 1,377,820,347 | - | 1,671,218 | 1,379,491,565 |
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම් | | | | |
| ඉඩම් | - | - | 10,855,725 | 10,855,725 |
| ගොඩනැගිලි | - | - | 7,099,239 | 7,099,239 |
| | - | - | 17,954,964 | 17,954,964 |
| මූල්‍ය වගකීම් | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 1,139,323 | - | 1,139,323 |
| | - | 1,139,323 | - | 1,139,323 |

**මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන**

කොටසක ශුද්ධ වත්කම් තක්සේරු ශිල්ප ක්‍රමය භාවිතයෙන්, ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය ගණනය කරන ලදී.

**නිරීක්ෂණය කළ නොහැකි සුවිශේෂී යෙදවුම්**

කොටසක ශුද්ධ වත්කම් අගය

**සංවේදීතා විශ්ලේෂණය**

කොටසක ශුද්ධ වත්කම් අගයේ 10% ක වැඩිවීම හේතුවෙන් සාධාරණ අගය 10% කින් ඉහල යයි.

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **1,671,218** | 1,615,356 |
| වර්ෂය තුළ එකතු කිරීම | **-** | - |
| අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් සාධාරණ මිලට වූ ලාභය | **145,915** | 55,862 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,817,133** | 1,671,218 |

**ඉඩම් හා ගොඩනැගිලි**

**අගය කිරීමේ ක්‍රමය**

ඍජු සන්සන්දනාත්මක ක්‍රමය සමග වෙළඳපොල ප්‍රවේශය භාවිතා කරමින් ඉඩම් අගය කරනු ලබන අතර එහිදී වත්කම නුදුරේදී සිදුකරන ලද සමාන වත්කමක විකුණුම් අගය සමග සංසන්දනය කොට එකී අගයට එකතු කළ හෝ නාමිකව එකතු කළ වැඩිදියුණු අගයක් ගැලපුම් කිරීමකින් තොරව ස්ථානීය වෙනස්වීම් (Points of Difference) සඳහා පමණක් ගැලපුම් කිරීමෙන් සාධාරණ අගය ගණනය කරනු ලබයි.

පොදු මහජනතාවට සේවා සපයන රාජ්‍ය අංශ ඒකකයන් විසින් පාලනය කරනු ලබන වත්කම්, විවෘත ද්‍රවශීල වෙළඳපොලෙහි හුවමාරු නොවන බැවින් සෙන්ට්‍රල් පොයින්ට් සහ වයිට් අවේස්, ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි ක්ෂය කරන ලද ප්‍රවර්තන ප්‍රතිස්ථාපන පිරිවැය (DRC) ක්‍රමයට තක්සේරු කර ඇත.

අනෙකුත් ගොඩනැගිලි අගය කිරීම සඳහා, තනි වර්තමාන අගයකට හැර වූ (වට්ටම් කල) ඇස්තමේන්තුගත අනාගත ආදායම, ලාභය හෝ මුදල් ප්‍රවාහයන් මත පදනම්ව දේපල අගය කරනු ලබන ආදායම් ප්‍රවේශය යොදා ගන්නා ලදී.

පහත සඳහන් දෑ හේතුවෙන් වෙළඳපොල ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- පර්චසයක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- වර්ග අඩියක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- ගොඩනැගිලි සඳහා වන ක්ෂය අනුපාතය අඩුවීම/(වැඩිවීම)

පහත සඳහන් දෑ හේතුවෙන් ආදායම් ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- දළ වාර්ෂික කුලිය වැඩිවීම/(අඩුවීම)
- වසර මිලදී ගැනීම (years purchase) වැඩිවීම/(අඩුවීම)

**ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

ව්‍යුත්පන්න උපකරණ අගය කිරීමේ අගය ආකෘතින් යෙදවුම් ලෙස ඉදිරි මිල ගණන් (වෙළඳපොළෙහි ඇති ඉදිරි ලකුණු forward points පදනම් කරගනිමින් සකස් කරන ලද) හා අගය කරන දිනට අදාළ එක් එක් මුදල් වර්ගයන්හි ශුන්‍ය පොලී එළදා වක්‍ර මත පදනම්ව ගණනය කළ වට්ටම් අනුපාත යොදා ගැනේ. අගය කරන ලද උපකරණයේ ආන්තිකයක් අඩංගු වේ

නම්, ආන්තික අනුපාතයන් හි බලපෑම ඉදිරිපත් කිරීමටත් ඉදිරි මිල ගණන්වලට හා/හෝ පොළී අනුපාතයන්වලට ගැලපීම සිදුකරනු ලබයි.

රන්

| | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **35,151,981** | 76,220,055 |
| වර්ෂය තුළදී මිලදී ගැනීම්/(විකිණීම්) | **(26,108,952)** | (38,743,707) |
| විදේශ විනිමය ලාභ/(අලාභ) | **4,094,758** | 5,151,566 |
| රන් මිලෙහි වෙනස්වීම | **(3,106,177)** | (7,475,934) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **10,031,610** | 35,151,981 |

## 50.2 ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම් / නිත්‍ය තැන්පතු පහසුකම්

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට නිත්‍ය තැන්පතු පහසුකම රු.මි. 330,637,06 හා (2021 - රු.මි. 101,062,88) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 698,069,22 (2021 - රු.මි. 567,532,31) ක් වේ. 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් ශේෂයක් නොමැත. (2021-ශේෂයක් නොමැත).

## 50.3 සංසරණයේ ඇති මුදල්

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

## 50.4 තැන්පතු වටිනාකම

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

## 50.5 සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ

සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ පහත වගුවෙන් දැක්වේ.

| | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | 2022 රු. 000 | 2021 රු. 000 | 2022 රු. 000 | 2021 රු. 000 |
| විදේශීය මූල්‍ය වත්කම් | | | | |
| මුදල් සහ මුදල් සමානයන් | **651,687,864** | 512,762,452 | **651,687,864** | 512,762,452 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **1,641,520** | 25,442,289 | **1,632,712** | 25,446,757 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **37,022,631** | - | **37,022,631** | - |
| දේශීය මූල්‍ය වත්කම් | | | | |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් | **698,069,219** | 567,532,312 | **698,069,219** | 567,532,312 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | **235,638,700** | 150,128,800 | **235,638,700** | 150,128,800 |
| බැංකු සඳහා දෙන ලද ණය | **28,257,902** | 90,572,746 | **26,399,953** | 88,468,648 |
| අනිකුත් වත්කම් | **30,182,560** | 34,063,770 | **25,686,027** | 33,614,096 |
| විදේශීය මූල්‍ය වගකීම් | | | | |
| බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන | **146,408,028** | 13,701 | **146,408,028** | 13,701 |
| ආසියානු නිෂ්කාශන සංගමය | **736,258,128** | 104,764,616 | **736,258,128** | 104,764,616 |
| ජා.මූ.අ. | **1,127,925,092** | 670,065,243 | **1,127,925,092** | 670,065,243 |
| අනෙකුත් | **594,383,451** | 357,295,676 | **594,383,451** | 357,295,676 |
| දේශීය මූල්‍ය වගකීම් | | | | |
| බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු | **323,046,181** | 300,704,162 | **323,046,181** | 300,704,162 |
| රජයේ සහ රජයේ ආයතනවල තැන්පතු | **221,411** | 1,392,301 | **221,411** | 1,392,301 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවිකල සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම | **330,637,059** | 101,062,880 | **330,637,059** | 101,062,880 |
| සංසරණයේ පවතින මුදල් | **1,026,567,252** | 1,005,099,066 | **1,026,567,252** | 1,005,099,066 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **68,320,347** | 19,163,882 | **68,320,347** | 19,163,882 |

ජා.මූ.අ. සම්බන්ධ වත්කම්, බැංකු වෙත ලබා දී ඇති ණය හා අභ්‍යන්තර අරමුදල්වලින් කරන ලද ආයෝජනවල සාධාරණ වටිනාකම ඒවායේ ධාරණ වටිනාකමෙන් වෙනස් වේ.

විදේශ මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති මුදල් හා මුදල් සමානයන් හා අනෙකුත් ලැබිය යුතු දෑ, දේශීය මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් හා රජයට දෙන ලද කාලීන අත්තිකාරම්, විදේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, ආසියානු නිෂ්කාශන සංගමය, ජා.මූ.අ. සහ අනෙකුත් විදේශීය මූල්‍ය වගකීම් සහ දේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු, රජය හා රජයේ ආයතනවල තැන්පතු, ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්, සංසරණයේ පවත්නා මුදල් හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි සාධාරණ වටිනාකම හා ඒවායෙහි ධාරණ වටිනාකම් සමාන වේ.

## 51. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත්කිරීම හා අනුකූල වීම සඳහා පහත සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කරන ලදී.

### 51.1 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත වූ පොළී ආදායම සහ පොළී වියදම, මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වූ වාසිය ලෙස නැවත වර්ගීකරණය කිරීම.

ආදායම් ප්‍රකාශයට සිදු වූ වෙනස්වීම

| | 2021 | | |
|---|---|---|---|
| | පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | ගැළපීම් | නැවත වර්ගීකරණය කරන ලද |
| | රු.000 | රු.000 | රු.000 |
| පොළී ආදායම | 11,815,701 | (7,436,653) | 4,379,048 |
| පොළී වියදම | (5,609,176) | 1,974,648 | (3,634,528) |
| මිල වෙනස්කම්වලින් උපලබ්ධි වූ වාසිය | 14,855,788 | (5,462,005) | 20,317,793 |

මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම (සටහන 36) සිදු වූ වෙනස්කම්

| | 2021 | | |
|---|---|---|---|
| | පෙරාතුව ඉදිරිත් කළ ආකාරයට | ගැළපීම් | නැවත වර්ගීකරණය කරන ලද |
| | රු.000 | රු.000 | රු.000 |
| විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම | 11,815,701 | (7,436,653) | 4,379,048 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 7,436,653 | (7,436,653) | - |
| මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම | 80,428,629 | (7,436,653) | 72,991,976 |

මූල්‍ය බැරකම් මත පොළී වියදම් (සටහන 38) සිදු වූ වෙනස්වීම්

| | 2021 | | |
|---|---|---|---|
| | පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | ගැළපීම් | නැවත වර්ගීකරණය කරන ලද |
| | රු.000 | රු.000 | රු.000 |
| විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම | (5,609,176) | 1,974,648 | (3,634,528) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 1,974,648 | (1,974,648) | - |
| මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම | 14,079,073 | (1,974,648) | 12,104,425 |

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2021 වර්ෂයේ පොළී ආදායම යටතේ දක්වන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය වූ රු. මිලියන 7,436.65 සහ පොළී වියදම යටතේ දක්වන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අලාභය වූ රු. මිලියන 1,974.65, මේ වර්ෂයේදී මිල වෙනස්කම්වලින් උපලබ්ධි වූ වාසිය යටතේ අනාවරණය කරන ලදී.

### 51.2 අනෙකුත් ණය සහ අත්තිකාරම්වලින් ඉපැයූ පොළී ආදායම් යටතේ දක්වන ලද අභ්‍යන්තර අරමුදල්වලින් ඉපැයූ පොළී ආදායම අනෙකුත් වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම් ලෙස නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම (සටහන 36) සිදු වූ වෙනස්වීම

| | 2021 | | |
|---|---|---|---|
| | පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | ගැළපීම් | නැවත වර්ගීකරණය කරන ලද |
| | රු.000 | රු.000 | රු.000 |
| අනෙකුත් ණය සහ අත්තිකාරම් | 2,770,062 | 1,317,449 | 1,452,613 |
| අනෙකුත් වත්කම් | 1,317,449 | 1,317,449 | 2,634,898 |

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2021 වර්ෂයේ මූල්‍ය වත්කම් වලින් පොළී ආදායම සටහන යටතේ අනෙකුත් ණය සහ අත්තිකාරම් වලින් ඉපැයූ පොළී ආදායම් ලෙස දක්වන ලද අභ්‍යන්තර අරමුදල් වලින් ඉපයූ රු. මිලියන 1,317.45 පොළී ආදායම මේ වර්ෂයේ දී එම සටහන යටතේම අනිකුත් වත්කම් වලින් ඉපයූ පොළී ආදායම ලෙස අනාවරණය කරන ලදී.

### 51.3 අනෙකුත් ආදායම් යටතේ විවිධ ආදායම් ලෙස දක්වන ලද බලපත්‍ර ගාස්තු (වාර්ෂික සහ නව සේවාවන්), මූල්‍ය ආයතනයන්ට අදල බලපත්‍ර ගාස්තු ලෙස නැවත වර්ගීකරණය කිරීම

අනෙකුත් ආදායම් (සටහන 40) සිදු වූ වෙනස්වීම

| | 2021 | | |
|---|---|---|---|
| | පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | ගැළපීම් | නැවත වර්ගීකරණය කරන ලද |
| | රු.000 | රු.000 | රු.000 |
| විවිධ ආදායම් | 469,494 | 5,525 | 463,969 |
| මූල්‍ය ආයතනයන්ට අදල බලපත්‍ර ගාස්තු | 614,575 | 5,525 | 620,100 |

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2021 වර්ෂයේ අනෙකුත් ආදායම් සටහන යටතේ විවිධ ආදායම් ලෙස දක්වන ලද ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධති බලපත්‍රලාභී සේවා සපයන්නන් වෙතින් ලැබුණු රු. මිලියන 5.52, මේ වර්ෂයේ දී මූල්‍ය ආයතනයන්ට අදල බලපත්‍ර ගාස්තු යටතේ අනාවරණය කරන ලදී.

## 52. සම්බන්ධිත පාර්ශවයන්

### 52.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශ්වයන් සමග ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන, රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමග එළැඹි ගණුදෙනු සහ විධිවිධානයන් පහත පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | 2022 රු. 000 | 2021 රු. 000 |
|---|---|---|
| **ගනුදෙනු:** | | |
| විකුණන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **242,099** | 980,906 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **143,913,767,948** | 68,218,243,292 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම් හෝ වියදම් | **56,770,262** | 8,378,432 |
| රජය වෙනුවෙන් ලද අරමුදල් | **210,540,495** | 365,111,003 |
| රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම් | **211,034,101** | 362,223,823 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (සටහන 52.1.3) | **1,856,465** | 1,086,655 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ බදු සඳහා ගෙවීම් (සටහන 52.1.4) | **5,147,957** | 1,129,790 |
| වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (සටහන 52.1.6) | | |
| - විකුණුම් | **872,421,407** | 225,597,381 |
| - මිලට ගැනීම් | **695,124,187** | 61,515,180 |
| - ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **595,270,456** | 651,697,925 |
| වර්ෂය තුළදී අත්හල දේපල වෙනුවෙන් ලද අරමුදල් | **365,405** | 914,309 |
| කුලී ආදායම් | **207,763** | 282,173 |
| ලාභාංශ ආදායම් | **115,786** | 115,786 |
| අනෙකුත් ගනුදෙනු (සටහන 52.1.9) | **794,842** | 1,088,948 |
| **ශේෂයන් :** | | |
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (සටහන 52.1.7) | **2,498,995,015** | 1,377,820,347 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 14) | **235,638,700** | 150,128,800 |
| කොවිඩ් -19 පුනරුද ණය පහසුකම යටතේ ලබාදුන් ණය | **1,821,749** | 11,817,950 |
| නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත් | **17,930,602** | 15,938,729 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් (සටහන 26) | **240,719,873** | 221,738,927 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | **43,888** | 243,388 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙතින් ලැබිය යුතු දෑ | **3,540,670** | 4,087,983 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් (සටහන 25) | **1,021,468** | 1,484,824 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන් | **(297)** | (1,107,407) |
| අත්හල දේපල වල ශේෂයන් | **5,998,940** | 5,998,940 |
| අනෙකුත් ශේෂයන් (සටහන 52.1.9) | **13,321,704** | 292,917 |

**52.1.1** මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය කරනු ලබයි. 2022 දෙසැම්බර් 31 දිනට රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ සුවිශේෂ බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 04 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 01 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇති අතර ඒවා බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව වේ.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණය කරගෙන යනු ලබයි. ඒ අනුව, රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

**52.1.2** මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා සහ දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

**52.1.3** මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

**52.1.4** බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

**52.1.5** සටහන් අංක 56 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරු සහ අනෙකුත් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

**52.1.6** මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම නියැලෙන්නේය. කෙසේවෙතත්, 2022 වසර තුළදී ඇති වූ උග්‍ර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ විදේශ සංචිත දරුණු ලෙස පහත වැටීම යන කරුණු නිසා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ඇති වූ අහිතකර වර්ධනයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී.ලං.ම.බැ. විසින් වානිජ බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත පනවා තිබූ අනිවාර්ය විදේශ විනිමය විකිණීමේ අවශ්‍යතාවය මත විදේශ විනිමය මිලට ගැනීම සහ රට තුළ ආර්ථික කටයුතු අවම මට්ටමින් හෝ පවත්වා ගෙන යාමට අවශ්‍ය ඉන්ධන, ගෑස්, ගල් අඟුරු, බෙහෙත් සහ ආහාර වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා මූල්‍යනය කිරීමට විදේශ විනිමය වෙළඳපොළට විකිණීම වැනි අතිවිශේෂ ප්‍රයත්නයන් අනුගමනය කරමින් විදේශ විනිමය මැදිහත්වීම් සිදුකරන ලදී. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම ක්‍රියාවලින්වල ප්‍රතිඵල නියෝජනය කෙරේ.

**52.1.7** දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් අංක 12 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 36 සටහනෙහි දැක්වේ.

**52.1.8** රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුනි.

**52.1.9** තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමග බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

**52.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගණුදෙනු**

අධිපති ඇතුළු මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, නියෝජ්‍ය අධිපතිවරුන් සහ සහකාර අධිපතිවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමග සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

**52.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්**

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | **261,043** | 180,218 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**52.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමඟ වූ වෙනත් ගණුදෙනු**

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් හට දුන් ණය ශේෂය | **329,345** | 98,648 |
| වසර තුළදී ප්‍රදානය කළ ණය | **203,018** | 6,699 |
| වසර තුළදී අය කරගත් ණය | **187,331** | 10,038 |

මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොළී අනුපාතයන් සියයට 2 සිට සියයට 7 දක්වා පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**52.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමඟ ගණුදෙනු**

| | 2022<br>රු. 000 | 2021<br>රු. 000 |
|---|---|---|
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | **106,371** | 73,517 |

සටහන් අංක 32 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු.මි. 986.99 ක් (2021 - රු.මි. 717.59) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 30.2 සටහනෙහි දක්වා ඇත.

## 53. අසම්භාව්‍ය වගකීම්

### 53.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට එවැනි ඇප කිසිවක් නොවීය.

### 53.2 ණය ඇපකර

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ණය මත සහභාගී මූල්‍ය ආයතන වෙත ණය ඇපවීම් නිකුත් කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා පශ්චාත් ණය සුපරීක්ෂණය කිරීම සහ ණය ඇපකරු අරමුදල් පරිපාලනය කිරීමයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ණය ඇපකර පහසුකම් සැපයීම ප්‍රා.සං.දෙ. විසින් සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ආවරණයක් නොවන අතර සහභාගී වන මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශ්වයන්ගෙන් ණය ආපසු අයකර ගැනිමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි වූ මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු වෙත ලබා දුන් ණය ඇපකර :**

| | නොපියවා පැවැති ඇප ප්‍රමාණය | |
|---|---|---|
| | **2022**<br>රු. **000** | **2021**<br>රු. **000** |
| සම්බන්ධිත පාර්ශ්වයන් | **1,989,471** | 21,742,330 |
| අනෙකුත් | **88,808** | 526,405 |
| මුළු ණය ඇප ප්‍රමාණය | **2,078,279** | 22,268,735 |

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය ඇපකර මත හඳුනාගත් අපේක්ෂිත ණය අලාභය, සටහන 39 හි වාර්තා කොට ඇත.

### 53.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා අරමුදල් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

### 53.4 නෛතික හිමිකම්

බැංකුවට එරෙහිව නීති කෘත්‍යයන් ගණනාවක් 2022 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණු අතර මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

## 54. බැඳීම්

(අ) 2022 වසරේදී වානිජ බැංකුවල පැවති විදේශ මුදල් හිඟය හේතුවෙන් ඇතිවූ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අපනයනය කිරීමේ අපහසුතාවය මගහරවා ගැනීමට සහය දැක්වීමක් ලෙස, මුදල් නීති පනතේ 106(1) සහ 108(2) යන වගන්ති ප්‍රකාරව ශ්‍රී.ලං.ම.බැ. විසින් එවකට පැවති විදේශ මුදල් සංචිත මත පදනම්ව, ශ්‍රී ලංකා රුපියල් වලට හුවමාරු කිරීම සඳහා විදේශ මුදල් ලබාදෙන ලෙස වානිජ බැංකු වලට බැඳීම් ලිපි නිකුත් කරන ලදී. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට එලෙස නිකුත් කල බැඳීම් ලිපි වල වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 174.50 ක් ලෙස දැක්විණි. වාර්තාකරණ දිනයෙන් පසුව, එම බැඳීම් ප්‍රමාණයෙන්, එදින පැවති වෙළඳපොළ විනිමය අනුපාතයට සමානව රුපියල්වලට හුවමාරු කිරීමේ පදනමින් නිකුත් කරන ලද ඇ.එ.ජ. ඩොලර් මිලියන 40ක බැඳීම් ප්‍රමාණයක් භාවිතයේ ඇත.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම හා මුදල් නිෂ්පාදනය වෙනුවෙන් රු.මි. 657.37 ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | **2022**<br>**000** | **2021**<br>**000** |
|---|---|---|
| ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු | | |
| ඉදිරි විනිමය විකුණුම් | | |
| - ඇ.එ.ජ. ඩොලර් | **559,112** | 734,550 |
| - ස්ටර්ලිං පවුම් | **12,500** | - |
| - ජපන් යෙන් | **-** | 2,800,000 |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් | | |
| - ඇ.එ.ජ. ඩොලර් | **4,750** | 225,145 |

## 55. මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 5.3.3. හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම පවත්වාගැනීම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පවත්වාගැනීම හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදුවිය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදු කරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණු සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

### 55.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

**(අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්**

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්" යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

**(ආ) සුරැකුම්පත් ණයට දීම**

සුරැකුම්පත් ණය, ස්ථාපිත වෙළඳපල පුරුදු විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැදේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි.

නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට ඍජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

**(ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම්**

2017 ජනවාරි මාසය දක්වා සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35.0 ක සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30.0 ක ණය පහසුකම් ලබාග න්නා ලදී. වර්තමානයේදී යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කරන ලද සුරැකුම්පත්වල වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.0 කි. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර්හි වෙනම ගිණුමක රඳවා ඇත.

| | 2022 | 2021 |
|---|---|---|
| | අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් | අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් |
| | රු. 000 | රු. 000 |
| වත්කම් | | |
| යූරෝ ක්ලියර් බැංකුව වෙත ඔඩපන කරන ලද සුරැකුම්පත් | **1,090,124** | 2,830,756 |
| වත්කම් වල ධාරණ අගය | **1,090,124** | 2,830,756 |

## 56. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසනා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

**56.1** විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

**56.2** බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර ආයක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

**56.3** ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

**56.4** 2010 සැප්තැම්බර් 28 දිනැති වූ 1673/11 අංක දරණ (සංශෝධිත) ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු

රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

තවද අංක 2239/52 දරණ ගැසට් පත්‍රය අනුව 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 01 දරණ ආරම්භ රෙගුලාසිය අවලංගු කරමින් 2021 අගෝස්තු 06 දිනැති නව රෙගුලාසි අංක 2, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ලෙස නිකුත්කොට ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 67 කි. ඉහත ගැසට් පත්‍රයේ 5.1 වගන්තියට අනුව සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් 2010 හා 2011 වර්ෂවල කරන ලද මුදල් මණ්ඩලයේ මගපෙන්වීම් අනුව 2012 ජනවාරි 1 දිනට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත සැලසුම්වලට අනුව ස්කන්ධය බවට පරිවර්තනය වූ අතීතයේ තැන්පත්කරුවන් වූ දැනට කොටස් හිමියන්ගේ කොටස් රක්ෂණය කෙරෙන අතර ඉහත ගැසට් පත්‍රයේ වගන්ති 5.2 ට අනුව වන තැන්පතු වගකීම් හා සියලු ණය උපකරණ රක්ෂණයෙන් ඉවත් කරනු ලැබේ.

රු.මි. 350.20 ක් වූ ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති මූල්‍ය උපකරණ වල නැවත මැනීමෙන් ඇතිවූ පාඩුව වන රු.මි. 25,756.36 ක අගය සළකා බැලීමට පෙර 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදලේ ප්‍රමාණය රු.මි. 86,424.05 ක් (විගණනය නොකළ / තාවකාලික) ලෙස දැක්වේ. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලේ මුළු ස්කන්ධ ශේෂය රු.මි. 60,667.69ක් (විගණනය නොකළ / තාවකාලික) වේ. දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු. ලක්ෂ 11 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි. වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පත් රක්‍ෂණ ඒකකය මගින් මූල්‍ය මණ්ඩලය මගින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂකවරයාගේ අධීක්‍ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

**56.5** ලියාපදිංචි මූල්‍ය සමාගම් නියාමනය කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

**56.6 ශ්‍රී. ලං.ම.බැ. මුදල් මණ්ඩලය වෙනුවෙන් රජය හෝ විදේශ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අති විශේෂ නියෝජිතයා ලෙස ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි.**

**(i) නිමකර අවසන් ව්‍යාපෘති**

| ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 |
| කුඩා ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණත්වයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණත්වය වැඩි දියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම | 94.59 |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 |
| අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීමට ආධාර කිරීම. | 1,362.00 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා නිවාස සංවර්ධනයට ආධාර කිරීම | 1,915.76 |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 1.80 | වයඹ පලාත් වාසීන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ සුබ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තිරසාර වර්ධනය | 249.06 |
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පුද්ගලයන් හා දේපල නැවත නගා සිටුවීම | 843.00 |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ.එ.ජ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 |
| දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් අවම පිරිවැයක් සහිත තිරසාර ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 564.00 |
| EIB ගිවිසුම් B | යුරෝ | 10.00 | සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා අංශ ද ඇතුළත්ව සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | බහුවාර්ෂික භෝග අපනයනය සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 1,199.82 |

| | | | | |
|---|---|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා පවතින ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 100.00 |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම | 1,399.73 |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 |
| දිළිඳුකම පිටුදැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම | 3,213.20 |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම | 232.39 |
| වියලි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල කෘෂිකර්මාන්තය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් හරහා වැඩි ආදායමක් ඉපැයීමට අවස්ථාවක් සැලසීම | 252.95 |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ.එ.ජ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන් සඳහා අරමුදල් හා පුහුණුව සපයා දීම | 113.13 |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම | 487.66 |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්‍ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP) | රුපියල් | 1,049.84 | තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම | 1,049.84 |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 135.69 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම | 135.69 |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන සෘතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 302.04 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් තවදුරටත් වැඩි කිරීම | 302.04 |
| "තරුණ දිරිය" NADeP තරුණයින් බලගැන්වීමේ හා රැකියා යෝජනා ක්‍රමය | රුපියල් | 288.48 | කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීය මට්ටමේ දිළිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම. | 288.48 |
| වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.90 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.89 |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම | 1,564.75 |
| දිළිඳුකම පිටුදැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මගින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩි දියුණු කිරීම | 7,016.86 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Capital | ඇ.එ.ජ. ඩොලර් | 30.29 | වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරඟකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කන්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී | 125.85 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Seasonal | | | | 854.05 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Youth | | | | 14.45 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Income Generation | | | | 106.42 |

**(ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

| ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම | 964.87 |
| ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | රුපියල් | 4,000.00 | නව හා වත්මන් ව්‍යවසායකයින්ට මූල්‍ය සහනාධාර සැපයීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම | 4,448.50 |
| ''අත්වැල'' ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නඟා පිහිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ) | රුපියල් | 2,000.00 | රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් ණය ගැතියන්ට මූල්‍ය සහනාධාර සැපයීම | 1,687.52 |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 1,031.00 | විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 5,518.79 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Agribusiness | ඇ.එ.ජ. ඩොලර් | 30.29 | කෘෂි නිෂ්පාදනවල නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණාත්මක බව හා අගය එකතු කිරීම, වැඩි දියුණු කිරීම | 458.29 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Youth | | | | 405.09 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Youth | | | | 490.21 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Agribusiness | | | | 173.85 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Income Generation | | | | 121.32 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P FI Bulk Loan. | | | | 237.69 |
| කුඩා කෘෂි ව්‍යාපාර, හවුල්කාර වැඩසටහන RFFI Bulk Loan. | | | | 59.36 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Promoter Bulk Loan. | | | | 31.16 |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI II) | රුපියල් | 950.00 | ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කළ යෞවනයන් සඳහා නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාරයන් වැඩි දියුණු කිරීමට සහාය දීම | 493.13 |
| සැපයුම් දාමය නැවත පණ ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමය (SCREL) | රුපියල් | 500.00 | ලියාපදිංචි තේ නිෂ්පාදනය කරන්නන්ගේ ප්‍රතිව්‍යුහගත ණය සැලසුම් අවසන් කිරීම සඳහා පවතින ව්‍යාපාරයන් නඟා සිටුවීම සහ සැපයුම් දාමය නැවත පණගැන්වීම සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවීමට නියමිත හිඟමුදල් පියවීම | 213.75 |

## 57. වාර්තාකරණ දිනට පසු ඇතිවූ සිදුවීම්

පහත දැක්වෙන අයිතම හැර, මූල්‍ය ප්‍රකාශ වලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තාකරණ දිනට පසුව ඇති නොවීය.

(අ) ශ්‍රී ලංකා රජය වෙත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් විස්තීර්ණ ණය පහසුකම (EFF) යටතේ 2023 මාර්තු 22 දින වි.ගැ.හි. මිලියන 254.00 ක අරමුදල් ලැබීම.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය 2023 මාර්තු 30 වන දින දේශීය ණය ප්‍රශස්තකරණය පිළිබඳව මංගත ක්‍රමයට පැවැත්වූ ආයෝජක ඉදිරිපත් කිරීම අනුව බලධාරීන් විසින් දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා විවිධ විකල්පයන් ඇගයීමට ලක් කරමින් සිටීම.

## 2. බැංකු අධීක්ෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මෙරට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින්මතු බලපත්‍රලාභී බැංකු වශයෙන් හඳුන්වනු ලැබේ) අඛණ්ඩව අධීක්ෂණය කිරීම, කාලීනව ව්‍යවස්ථානුකූල පරීක්ෂා කිරීම සහ බලපත්‍රලාභී බැංකු සඳහා නියාමන මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා විශේෂිත බලතල සහ වගකීම් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබේ. බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ සවිමත්භාවය තහවුරු කිරීම සහ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල තැන්පතුකරුවන්ගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.

එකී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු නියාමනය සහ අධීක්ෂණය සිදු කිරීම, බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණශීලී නියාමන සකස් කිරීම සහ නිකුත් කිරීම, අඛණ්ඩ අධීක්ෂණය සහ කාලීන ව්‍යවස්ථානුකූල පරීක්ෂා කිරීම, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයන් හි නිරත වන නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම සහ අනුමත කිරීම, නියාමන අනුමැතීන් ලබා දීම, අවශ්‍ය තැන්හි දී මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති පරිදි නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ දැනුම්වත් කිරීම සහ ශක්‍යතා වර්ධනය යන ආදිය සිදු කරනු ලබයි.

2022 වසර අවසානය වන විට මෙරට බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. මෙයට අමතරව, විදේශීය බැංකුවල නියෝජිත කාර්යාල 4ක් ද ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. මෙරට ක්‍රියාත්මක බලපත්‍රලාභී බැංකු සහ නියෝජිත කර්යාලයන්ගේ නාමලේඛනය ඇමුණුම Iහි දක්වා ඇත.

2022 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1. විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

කොවිඩ් පසු කම්පන සහ අභියෝගාත්මක ආර්ථික පරිසරයෙන් යථා තත්ත්වයට පත්වීම මධ්‍යයේ, බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්වෝපායික විචක්ෂණශීලී නියාමන හඳුන්වා දීම සඳහා කටයුතු කරන ලද අතර බලපත්‍රලාභී බැංකුවල අගතියට පත් ණය ගණුදෙනුකරුවන් වෙත තවදුරටත් සහන ලබා දීමටද කටයුතු කරන ලදී.

2022 වසරේ දී හඳුන්වා දුන් ප්‍රධාන විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ගයන් කිහිපයක් පහත සාරාංශගතකර ඇත. මෙකී නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

(අ) පවතින අභියෝගාත්මක ආර්ථික තත්වයන් හමුවේ හඳුන්වා දුන් නියාමන අවශ්‍යතාවන්

(ආ) බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම්

(ඇ) බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ

(ඈ) පවතින අභියෝගාත්මක ආර්ථික තත්වයන් හමුවේ අගතියට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා වන සහන

(ඉ) ද්‍රවශීලතා අනුපාත පිළිබඳ නියාමන අවශ්‍යතා

(ඊ) බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කිරීම

(උ) පාරිභෝගික ප්‍රඥප්තියට අතිරේකය - විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන් හට බැංකු සේවා සඳහා ප්‍රවේශයන් සැලසීම

(ඌ) ආනයනයන්ට එරෙහිව ආන්තික අවශ්‍යතා නියම කිරීම

(එ) නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා බැංකු (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගය

(ඒ) බලපත්‍රලාභී බැංකුවල තැන්පත්කරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම

(ඔ) බලපත්‍රලාභී බැංකුවල ණය සහ තැන්පතු පහසුකම් සඳහා වන උපරිම පොලී අනුපාත

(ඕ) බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලට ගැනීම්

(අඅ) බලපත්‍රලාභී බැංකු වල වාර්ෂික බලපත්‍ර ගාස්තු

තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ණය පහසුකම් සම්බන්ධයෙන් පවතින උපරිම සීමාවන් පිළිබඳ බැංකු පනත් විධානය වැනි ප්‍රධාන විචක්ෂණ රෙගුලාසීන් සමාලෝචනය කිරීම ආරම්භ කරන ලදී.

### 2.2 නව බැංකු පනත කෙටුම්පත් කිරීම

බලපත්‍රලාභී බැංකුවල නෛතික සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නව බැංකු පනතක් කෙටුම්පත් කිරීම සඳහා අදාළ වන කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. යෝජිත නව බැංකු පනතෙහි සමානුපාතිකත්වය සඳහා විභේදිත නියාමන රාමුවක් හඳුන්වා දීම, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, මූල්‍යමය දණ්ඩනයන්/දඩ පැනවීම, සංස්පර්ශිත අවදානම අවම කිරීම සඳහා බැංකුවලට සීමානිර්ණ පැනවීම, අත්පත් කර ගැනීම්, ඒකාබද්ධ කිරීම් සහ මිලට ගැනීම් සඳහා ප්‍රතිපාදන ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වේ. මෙම නව පනත 2023 වසර අවසන් වන විට ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

## 2.3 මුදල් මණ්ඩලය සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ලබා දුන් අනුමැතීන්

(අ) බලපත්‍රලාභී බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක

2022 වර්ෂය අවසන් වන විට දී බැංකු ශාඛා සහ වෙනත් බැංකු ඒකක සඳහා වන ඉල්ලීම් 220ක් සලකා බැලූ අතර ඉන් 178ක් සඳහා අනුමැතීන් ලබා දී ඇති අතර විචක්ෂණශීලී හේතු මත 31ක් පමා කිරීම හෝ ප්‍රතික්ෂේප කර ඇත (II-1 සංඛ්‍යා සටහන). ඒ අනුව 2022 දෙසැම්බර් මස වන විට බැංකු ශාඛා 3,630ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,794ක් සහ ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර 6,678ක් ක්‍රියාත්මක විය.

2022 වසර තුළ දී, කොළඹ වරාය නගරය තුළ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු 4ක් සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත ප්‍රකාරව ගරු මුදල් අමාත්‍යවරයා විසින් බලපත්‍ර නිකුත් කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් එකඟතාව ලබා දී ඇත.

**II-1 සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක සඳහා ලබා දුන් අනුමැතීන්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | ඉල්ලීම් | අනුමැතීන් |
| **විවෘත කිරීම් සහ ස්ථාපනය කිරීම්** | **114** | **85** |
| ශාඛාවන් | 29 | 23 |
| ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර | 51 | 48 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 4 | 3 |
| වෙනත් බැංකුකරණ ඒකක | 3 | 2 |
| බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් | 27 | 9 |
| **ප්‍රතිස්ථාපන කිරීම්** | **72** | **62** |
| ශාඛාවන් | 63 | 54 |
| ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර | 5 | 4 |
| වෙනත් | 4 | 4 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් | 8 | 7 |
| ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර හා අනෙකුත් ස්වයංක්‍රිය යන්ත්‍ර ස්ථාපනය සඳහා ලබා දුන් අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම | 12 | 12 |
| බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් සඳහා ලබා දී ඇති අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම | 14 | 12 |
| මුළු එකතුව | 220 | 178 |

(ආ) වෙනත් නියාමන අනුමත කිරීම්

2022 වසර තුළ දී වෙනත් නියාමන අනුමැතීන් 283ක් ලබා දී ඇත (II-2 සංඛ්‍යා සටහන).

**II-2 සංඛ්‍යා සටහන**

**වෙනත් නියාමන අනුමත කිරීම්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා විදේශ විනිමය ව්‍යාපාර කටයුතුවල නිරත වන පුද්ගලයන් පත් කිරීම හා ධුරයේ අඛණ්ඩව රැඳී සිටීම සඳහා යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම | 185 |
| සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු | 19 |
| වෙළඳපළ වටිනාකමට වඩා අඩු වටිනාකමකට දේපළ බැහැර කිරීම | 20 |
| දෙවන ස්ථර ප්‍රාග්ධනයට ණයකර ඇතුළත් කිරීම | 3 |
| ණය පහසුකම් සම්බන්ධයෙන් පවතින උපරිම සීමාවන් ප්‍රමාණය ඉක්මවා යාම | 1 |
| අතහැර දැමූ දේපළ ප්‍රතිපූරණයන් | 1 |
| විදේශික සේවකයන් සඳහා නව වීසා බලපත්‍ර ලබා ගැනීම/ වීසා බලපත්‍ර අළුත් කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම | 17 |
| වෙනත් අනුමත කිරීම් | 37 |
| මුළු එකතුව | 283 |

(ඇ) නියාමන ක්‍රියාමාර්ග

2022 වර්ෂයේ දී බලපත්‍රලාභී බැංකු විසින් බැංකු පනත හා එම පනත යටතේ නිකුත් කළ නියාමනයන්ට අනුකූල නොවන අවස්ථා 25ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ බැංකුවලට නියම කරන ලදී.

## 2.4 අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කිරීම

(අ) බැංකු පද්ධතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ දිගුකාලීන පැවැත්ම සහතික කරලනු වස් අවදානම් හඳුනාගැනීමේ පූර්ව ක්‍රමවේදයක් ලෙස හා අවශ්‍ය අවස්ථාවන්හි දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවමින් තැන්පත්කරුවන්ගේ අරමුදල්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා එක් එක් බැංකුවේ කටයුතු පිළිබඳව නිරන්තර අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය, අඛණ්ඩ අධීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලැබේ. සාර්ව ආර්ථිකය සම්බන්ධයෙන් පැන නැගුණු ගැටලු හේතුවෙන් මතු වූ ප්‍රබල අභියෝග මධ්‍යයේ බැංකු අංශය සුරක්ෂිත කිරීම සහ ශක්තිමත් කිරීම අරඹයා අඛණ්ඩ අධීක්ෂණය තීව්‍ර කරන ලදී. බැංකු විසින් ජාලගත මාධ්‍යය පාදක කරගත් FinNet පද්ධතිය ඔස්සේ සතිපතා/මාසිකව/කාර්තුමය/වාර්ෂිකව, යොමු කරන්නා වූ කාලීන මූල්‍ය හා විචක්ෂණශීලී තොරතුරු පදනම්ව නිරන්තර අධීක්ෂණය සිදු කරනු ලබයි.

(ආ) 2022 වසරේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් හේතුවෙන් ඇති වූ ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ආතතීන් සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලයට විශේෂ මුදල් මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන සීමාවන් හේතුවෙන් බැංකු විසින් වර්තමානයේ මුහුණ දෙනු ලබන අභියෝග සහ එම සීමාවන් මඟහරවා ගැනීමට බැංකු විසින් අනුගමනය කරනු ලබන උපාය

මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මුදල් මණ්ඩලයේ සාමාජිකයින් සහ බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිතයින් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග රැස්වීම් පවත්වන ලදී.

(ඇ) තවද, 2022 වර්ෂය තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු දැනගැනීමේ පනත හා සම්බන්ධ ඉල්ලීම් ආසන්න වශයෙන් 29ක් සහ පාරිභෝගික පැමිණිලි 177ක් සම්බන්ධයෙන්ද කටයුතු සිදු කරන ලදී.

(ඈ) බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී හඳුනාගන්නා ලද නියාමන ගැටලු නියමිත කාලරාමු තුළ දී විසඳීමේ ප්‍රගතිය කාර්තුමය පදනමින් අධීක්ෂණය කිරීම ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

## 2.5 කාලීන පරීක්ෂණ පැවැත්වීම

(අ) 2022 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු 04ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ ද ඇතුළුව බලපත්‍රලාභී බැංකුවල සම්පූර්ණ විෂය පථය ආවරණය වන ව්‍යවස්ථාපිත පරීක්ෂණ 22ක් පවත්වන ලදි. මෙහිදී, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු මත පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 04න් 02ක් එම බැංකුවලට අයත් ආයතන සමූහයන්ගේ ඒකාබද්ධ අවධානම් තත්වයන් පරීක්ෂා කිරීම අරමුණු කර ගනිමින් ඒකාබද්ධ අවධානම් ඇගයීම මත පදනම් වූ ව්‍යවස්ථාපිත පරීක්ෂණ ලෙස දියත් කරන ලදි.

(ආ) 2022 වසර තුළ දී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳ වාර්තා 22ක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. මෙම වාර්තා 22, 2021 වසර තුළදී සහ 2022 වසර තුළදී පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා 12කින් සහ 10කින් පිළිවෙළින් සමන්විත වූ අතර, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු 02ක අතුරු පරීක්ෂණ වාර්තා 2ක්ද මෙයට ඇතුළත් වේ.

(ඇ) ඉහත කරුණුවලට අමතරව, බලපත්‍රලාභී බැංකු කිහිපයක අපනයනය ආදායම් පරිවර්තනය කිරීම් හා භාවිතා කිරීම්, විදේශ ශ්‍රමික ප්‍රේෂණ, විදේශ මුදල් ගණුදෙනු, Fin-Net දත්ත සත්‍යාපනය සහ පාරිභෝගික පැමිණිලි යනාදි වූ කරුණු විමර්ශනය කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සීමිත විෂය පථයක් සහිත ස්ථානීය පරීක්ෂණ 17ක් ද සිදු කරන ලදි.

(ඈ) තවද, 2022 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව සහ විදේශ ප්‍රේෂණ පහසුකම් සැලසීමේ දෙපාර්තමේන්තුව සමග සාමූහික ව්‍යාවස්ථාපිත පරීක්ෂණ ද සිදු කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් කටයුතු වල අවදානම් සාධක සහ අනුකූලතා තත්වයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් 2022 වර්ෂය තුළ දී සිදු කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 22න් 16ක් මූල්‍ය බුද්ධි ඒකකය සමගද එක් පරීක්ෂණයක් ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව සමග ද තවත් පරීක්ෂණ 02ක් විදේශ ප්‍රේෂණ පහසුකම් සැලසීමේ දෙපාර්තමේන්තුව සමග ද පවත්වන ලදී.

## 2.6 අර්බුද සඳහා වූ පෙර සූදානම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

අර්බුදකාරී තත්වයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්නා පෙර සූදානම ශක්තිමත් කිරීමෙහි අරමුණින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනෙක් දෙපාර්තමේන්තු ද සමග එක්ව බලපත්‍රලාභී බැංකු වෙත හදිසි ණය සහ අත්තිකාරම් ලබා දීම සඳහා රාමුවක් පිහිටුවීම සඳහා පියවර ගෙන ඇත. තවද, නිරාකරණය සහ තැන්පතු රක්ෂණය පිළිබඳ නියාමන රාමුව ශක්තිමත් කිරීමට සහ අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහාය විය.

## 2.7 බැංකු අංශයේ දැනුම්වත්භාවය, ධාරිතා වර්ධනය සහ 2022 වසර තුළදී පවත්වනු ලැබූ රැස්වීම්

බැංකු අංශයේ මෙන්ම වෙනත් අංශයන්හී ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම මෙන්ම, තම කාර්යමණ්ඩලය සඳහා පුහුණු හා සංවර්ධන අවස්ථා සැලසීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2022 වසරේදීත් අඛණ්ඩව කටයුතු කරන ලද අතර, මෙම වැඩසටහන් මඟින් බැංකුකරණය සහ මූල්‍ය, නියාමන අනුකූලතාව, අවදානම් කළමනාකරණය, සහ තිරසාර මූල්‍ය වැනි ක්ෂේත්‍ර ආවරණය විය. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් 2022 වසරේදීත් විවිධ කමිටු රැසක සාමාජිකත්වය දරමින් අඛණ්ඩව සේවය සැපයීමට කටයුතු කර ඇත.

පැවති අසාමාන්‍ය ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ආර්ථික ප්‍රවණතා සම්බන්ධ කරුණු සහ බැංකු ක්ෂේත්‍රය සහ රෙගුලාසි හා අධීක්ෂණ රාමුව පිළිබඳ කාරණා, සාකච්ඡාවට ලක් කිරීමේ අරමුණින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 දී බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ මාසික රැස්වීම් 10ක් සහ විශේෂ රැස්වීම් 4ක් පවත්වන ලදී. මීට අමතරව, බැංකු අංශයේ කාර්යසාධනය, ආර්ථිකයෙහි ඇති වූ වර්ධනයන් සහ පවතින ආර්ථික අර්බුදය හමුවේ බැංකු නියාමන අපේක්ෂාවන් පිළිබඳව අවබෝධයක් ඇති කිරීමේ අරමුණින්, බැංකු සභාපතිවරුන්ගේ රැස්වීම් 2ක් ද සංවිධානය කෙරිණි.

2022 වර්ෂය තුළ දී, මූල්‍ය අංශයේ ස්ථායීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියෝජනය කරන ලද දූත මණ්ඩල කිහිපයක් සමග සාකච්ඡා පැවැත්වීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් තම දායකත්වය ලබා දෙන ලදී.

**ඇමුණුම II-1**

**2022.12.31 දිනට බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පී එල් සී
2. ලංකා බැංකුව
3. බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
4. කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
5. සිටි බැන්ක් එන් ඒ
6. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
7. ඩොයිෂේ බැන්ක් ඒ ජී
8. ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
9. හබීබ් බැන්ක් ලිමිටඩ්
10. හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
11. ඉන්දියන් බැන්ක්
12. ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
13. එම් සී බී බැන්ක් ලිමිටඩ්
14. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
15. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී
16. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
17. මහජන බැංකුව
18. පබ්ලික් බැන්ක් බර්හාඩ්
19. සම්පත් බැන්ක් පී එල් සී
20. සෙලාන් බැන්ක් පී එල් සී
21. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
22. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
23. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
24. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
2. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
5. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
6. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

**විදේශ බැංකු වල නියෝජිත කාර්යාල**

1. දෝහා බැන්ක් කිව් පී එස් සී
2. ජේ පී මෝගන් චේස් බැන්ක් එන් ඒ
3. එම් යූ එෆ් ජී බැන්ක් ලිමිටඩ්
4. අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ්

## 3. බැංකු විදු පියෙස

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියෙස දශක 04 කටත් අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා අංශයේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා ඵලදායී පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරයි. ඊට අමතරව කාලීන වැදගත්කමකින් යුතු ආර්ථිකයට අදාල කාරණා පිළිබඳව සමාජයේ දැනුවත්බව වැඩි දියුණු කිරීම සඳහා විවිධ දේශන සහ සාකච්ඡාවන් ද බැංකු විදු පියෙස මගින් සංවිධානය කරයි. 2022 වසර තුළදී තාක්ෂණික වර්ධනයන් මගින් පෝෂණය වූ මූල්‍ය අංශයේ සීඝ්‍රයෙන් වෙනස් වන පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකු විදු පියෙසේ අවධානය මූලික වශයෙන් යොමුවූ අතර, එහි පාර්ශවකරුවන්ට බැංකු හා මූල්‍ය අංශය ඉහළ තලයකට ඔසවා තැබීමට අවශ්‍ය දැනුම සහ අති නවීන කුසලතා ලබා දීමෙන් ඔවුන්ගේ වෘත්තීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය විය. එසේම Covid-19 වසංගතයේ අවසාන අදියර මෙන්ම ආර්ථික අර්බුද සහ සමාජ නොසන්සුන්තාව හේතුවෙන් බාධා ඇති වුවද, බැංකු විදු පියෙස 2022 වසර පුරා සිය සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවතින වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් සහ ඉහළ ඉල්ලුමක් ඇති නව්‍ය සහ නැගී එන විෂය ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා 2022 දී බැංකු විදු පියෙස විසින් නව පුහුණු වැඩසටහන් ගණනාවක් හඳුන්වා දෙන ලදී. මෙම නව පුහුණු වැඩහටහන් ශ්‍රී ලාංකේය මූල්‍ය ක්ෂේත්‍රය පමණක් නොව, කලාපය පුරා උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් බැංකු සහ මූල්‍ය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව, භාණ්ඩාගාර මෙහෙයුම්, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, නීති සහ රෙගුලාසි, පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණ, ආර්ථික විද්‍යා, මානව සම්පත් සහ කළමනාකරණය, ග්‍රාමීය අංශ සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය, තොරතුරු තාක්ෂණය සහ මෘදු කුසලතා ඇතුළු විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හඳුන්වා දෙන ලදී.

බැංකු විදු පියෙස විසින් 2022 වසර තුළ දී පෙර සැලසුම් කරන ලද වැඩසටහන් 65ක් (අලුතින් හඳුන්වා දුන් වැඩසටහන් 10ක් ද ඇතුළුව), විශේෂිත වැඩසටහන් 19ක්, (විවිධ ආයතනවල ඉල්ලීම මත සකස් කරන ලද සහ වෙළඳපල ඉල්ලුමට අනුව සකස් කරන ලද වැඩසටහන්), සහතිකපත්‍ර පාඨමාලා 4ක් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහයෝගිත්වයෙන් සිදු කල වැඩසටහන් 4ක් ද ඇතුළුව සම්පූර්ණ වැඩසටහන් 140ක් පවත්වන ලදී. තවද, බැංකු විදු පියෙස ආසියානු කලාපයේ ප්‍රමුඛ ධාරිතා ගොඩනැංවීමේ හවුල්කරුවෙකු ලෙස මංසලකුණු ස්ථාපිත කිරීමේ අරමුණින්, 2022 වසරේ දී කලාපීය දැනුම බෙදාගැනීමේ වැඩසටහනක් හඳුන්වා දෙමින් බැංකු විදු පියෙස විසින් තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. “Developments in FinTech and Central Bank Digital Currencies” පිළිබඳව පැවැත්වූ මෙම වැඩසටහන සඳහා ආසියානු කලාපයෙන් විදේශිය සහභාගිවන්නන් රැසක් සහභාගී විය. තවද, බැංකු විදු පියෙස විසින් විවිධ අංශයන් නියෝජනය කරන ප්‍රවීණයන්ගේ සහභාගීත්වයෙන් වත්මන් ආර්ථික මාතෘකා සාකච්ඡා කිරීමට වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව 2022 මාර්තු මාසයේ දී විද්වත් මණ්ඩල කතිකා (EPD) මාලාවක් දියත් කරන ලදී. මෙම සාකච්ඡා මගින් අපේක්ෂා කරනුයේ සුමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා මහජනතාව සහ ව්‍යාපාරික ප්‍රජාව ප්‍රතිපත්ති සම්පාදකයින් හට ගැටළු සම්බන්ධයෙන් විවිධ දෘෂ්ටිකෝණයන් අවබෝධ කරලීම හා ව්‍යාපාරික ප්‍රජාව හා මහජනතාව අතර දැනුවත් භාවයක් ඇති කරලීමයි. මීට අමතරව, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු මෙවන් කතිකාවන් සඳහා උනන්දුවක් දක්වන සියලු

පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් "Confronting the current Foreign Exchange Crisis in Sri Lanka: Lessons from Global Experiance" යන මැයෙන් මෙම වසරේද ඉහළ පෙළ සම්මන්ත්‍රණයක් (HLS) සාර්ථකව පවත්වන ලදී.

තවද 2022 වසර තුළදීත්, ශ්‍රී ලංකාව තුල තිරසර මූල්‍ය ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කරන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේද (International Finance Corporation) සහාය ඇතිව බැංකු විදු පියෙස කටයුතු කරන ලදී. මීට අමතරව අග්නිදිග ආසියානු මහ බැංකු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය (The Southeast Asian Central Banks Research and Training Centre) සහ ජර්මනියේ මහ බැංකුව වන Deutsche Bundesbank ඇතුළු ලොව පිළිගත් මූල්‍ය ආයතනවල සහයෝගීත්වය සහිතව "Recovery and Resolution with a Focus on Credit Institutions", "Monetary Policy Implementation - Importance of Market Intelligence", "FinTech Regulation and Supervision" යන පුහුණු වැඩසටහන් බැංකු විදු පියෙස විසින් සංවිධානය කෙරිණි. එමෙන්ම ආර්ථික සංකල්ප සහ මූල්‍ය පද්ධතිය පිළිබඳ ජනමාධ්‍යවේදීන් සතු දැනුම ඉහළ නැංවීමේ අරමුණින් සම්පාදනය කරන ලද "ජනමාධ්‍යයවේදීන් සඳහා සාර්ව ආර්ථික විද්‍යාව" නමින් නව සහතික පත්‍ර පාඨමාලාවක් ද බැංකු විදු පියෙස විසින් 2022 වසරේදී දියත් කරන ලදී.

ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ මූල්‍ය සහ ආර්ථික සාක්ෂරතාවය ඉහළනැංවීමේ සමාජ වගකීම තව දුරටත් ඉටු කරමින්, විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් 2022 වසරේ දී බැංකු විදු පියෙස සංවිධානය කල අතර එයට ප්‍රසිද්ධ දේශනා 20ක් ද අන්තර්ගත විය. තවද රටෙහි අධ්‍යාපන ක්ෂේත්‍රයටද අවශ්‍ය දායකත්වය ලබා දෙමින් උපාධි අපේක්ෂකයන් සහ පාසල් සිසුන් සඳහා වැඩසටහන් 8ක් පවත්වන ලදී. මේ අතරට, ද්විතියික පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් "මූල්‍ය සාක්ෂරතාව" පිළිබඳ අලුතින් ආරම්භ කරන ලද වැඩසටහන් 2ක් ද ඇතුලත් විය.

තවද, උසස් පෙළ සඳහා ආර්ථික විද්‍යාව හදාරන සිසුන් ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනය කෙරෙන "තක්ෂිලාව" සහ " අරිවුට්රු" යන රූපවාහිනී වැඩසටහන් ද්විත්වය 2022 වසරේදී ද බැංකු විදු පියෙස විසින් සම්බන්ධීකරණය කරන ලදී. සිංහල සහ දමිල මාධ්‍යයන්ගෙන් විකාශනය වූ මෙම වැඩසටහන් කොටස් 20කින් සමන්විත විය. එමෙන්ම, බැංකු විදු පියෙස විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමග එක්ව ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් මාලාවක් ද වසර පුරා පවත්වන ලදී. සමස්තයක් ලෙස ගත් කල 2022 වසර තුළදී බැංකු විදු පියෙස පරිශ්‍රයට පැමිණ හෝ මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ පුද්ගලයින් 10,447දෙනෙකු මෙහි පැවැත්වූ වැඩසටහන්වලට සහභාගී වී ඇත.

තවද බැංකු විදු පියෙසෙහි මෙහෙයුම් වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා, නවීකරණය කරන ලද වෙබ් අඩවියට සමාන්තරව ආයතනික කළමණාකරණ පද්ධතියක් (IMS) ද 2022 වසරේදී හඳුන්වා දෙන ලදී.

ස්ථාවර මෙන්ම ශක්තිමත් මූල්‍ය පද්ධතියක පැවැත්ම සහතික කරලීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් දැනුමෙන් සහ කුසලතාවයන්ගෙන් තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් 2022 වසර අවසානයේ දී බැංකු විදු පියෙස විසින්, 2023 වසර සඳහා වූ සිය පාඨමාලා නාමාවලිය ද එළිදක්වන ලදි.

## 4. සන්නිවේදන

බොහෝ අවිනිශ්චිතතාවන් මධ්‍යයේ වුව ද 2022 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්තිමය තීරණ හා ඒවායින් ආර්ථිකය මත ඇති කරන බලපෑම පිළිබඳ ව වඩාත් පැහැදිලි කිරීමට සහ ජනතා අපේක්ෂා මත අනුබලයක් ඇති කිරීමේ අරමුණින් විවිධ තලයේ සන්නිවේදන උපායමාර්ග භාවිත කරමින් විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ මහජනතාව ඇතුළු ඉලක්කගත ග්‍රාහක සමූහයා වෙත තොරතුරු බෙදාහැරීමේ නිරත විය. එම අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන කටයුතු කලට වේලාවට ඉටු කරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට අවශ්‍ය සහයෝගය සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදි.

### 4.1 අභ්‍යන්තර සන්නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණවලට මාධ්‍ය විසින් දක්වනු ලබන ප්‍රතිචාර හඳුනා ගන්නා අතරතුර, මුදල් ප්‍රතිපත්ති විවරණයෙහි මූලික පණිවුඩ අදාළ පාර්ශ්වයන් වෙත ළඟා වීමේ සඵලදායීත්වය තක්සේරු කිරීමට, විශේෂයෙන් ම, එක් එක් මාධ්‍ය හමුවෙන් පසු සතියක කාලයක් තුළ හා මුදල් ප්‍රතිපත්ති විවරණ වටයන් ආරම්භයේ දී මාධ්‍යය විසින් වාර්තා කරනු ලබන පරිදි වෙළෙඳපොළ අභිප්‍රායයන් සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික පුරෝකථන විශ්ලේෂණ සිදු කිරීම මගින් නිසි කළමනාකරණ තොරතුරු ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිමය කර්තව්‍යයන් උදෙසා සහාය ලබා දුනි. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සිදුවීම් පිළිබඳ කාර්ය මණ්ඩලයේ මනා දැනුවත් බව තහවුරු කිරීමේ අරමුණින්, මහ බැංකුවේ මාධ්‍ය හමු සහ අනෙකුත් වැදගත් අවස්ථාවල සජීවී මාධ්‍ය ආවරණ ඔවුන්ගේ පරිගණක වෙත සැපයීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව සහාය විය. ඊකියා පරිසරයේ බෙදීම් සහ සීමා බිඳ දැමීමට සහ කාර්ය මණ්ඩලය අතර අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්ට අදාළව තොරතුරු හුවමාරු කර ගැනීමට 2022 වසරේ දී මංගත දැනුම හුවමාරු කර ගැනීමේ සැසියක් හඳුන්වා දෙනු ලැබූ අතර, මෙහි දී මයික්‍රොසොෆ්ට් ටීම්ස් (MS Teams) වේදිකාව ඔස්සේ කාලීන මාතෘකා 8ක් සාකච්ඡා කෙරිණි. මහ බැංකුවේ සියලුම කාර්ය මණ්ඩලය දේශීය ආර්ථිකය පිළිබඳව මෙන්ම ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි ප්‍රවණතාවන් පිළිබඳ මනා දැනුමින් හෙබි නිලධාරීන් බවට තහවුරු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින්, සියලුම අදාළ පුවත්පත් ලිපි අභ්‍යන්තර ජාලය වෙත උඩුගත කර අදාළ සියලුම මංගත පුවත් විද්‍යුත් තැපැල ඔස්සේ කාර්ය මණ්ඩලය අතර බෙදා හරින ලදී. සියලුම ඉතා වැදගත් පුවත් අයිතම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කරනු ලැබිණි. මුද්‍රිත පුවත්පත්වල මිල ඉහළ යෑම සලකා බලමින්,

පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය එම පිරිවැය අවම කර ගැනීම සඳහා විද්‍යුත් පුවත්පත් පරිශීලනයට අවතීර්ණ විය. වෙනත් රටවල් මෙවන් අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දී ඇත්තේ කෙසේද සහ ඔවුන් සිය රටවල අර්බුද ජය ගැනීමට ගත් ක්‍රියා මාර්ග මොනවාද යන්න පිළිබඳව තොරතුරු අඩංගු විද්‍යුත් ග්‍රන්ථ, ග්‍රන්ථවල අදාළ පරිච්ඡේද, විද්වත් ලිපි යනාදිය කාර්ය මණ්ඩලය අතර පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් බෙදා හරින ලදී. මීට අමතරව, පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය ජාතික කියවීමේ මාසය සමරනු වස් කාර්ය මණ්ඩලය සඳහා ග්‍රන්ථ විචාර තරගයක් යළි දියත් කළ අතර, ජයග්‍රාහකයන් දෙදෙනෙකු තෝරා ගනු ලැබිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයෙහි නිර්මාණ විශේෂාංග ලිපි සහ පුවත් ඇතුළත් නිල අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශනය වන "කවුළුව" ඩිජිටල් ආකෘතියෙන් ප්‍රකාශයට පත් කෙරුණු අතර, එය කාර්තුමය පදනමක් මත මංසල වෙත උඩුගත කෙරිණි.

## 4.2 බාහිර සන්නිවේදන

පසු ගිය වසරවල දී මෙන්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් පිළිවෙළින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විනිමය (විදුලි පැවරුම්) අනුපාතිකවලට අදාළව කෙටි පණිවුඩ සේවාව හරහා තත්කාලීන දැනුම් දීම් ද අඛණ්ඩව සිදු කරන ලදී. තවද, ව්‍යවහාර මුදල අවප්‍රමාණය වීම සලකා බලමින්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත එ.ජ.ඩො./ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය සහ විචල්‍ය අනුපාතිකය භාෂාත්‍රයෙන් ම නිකුත් කරන ලදී. මීට අමතරව, සන්නිවේදන දෙපාර්තමේන්තුව සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් 2022 වසර තුළ දී දෛනික, සතිපතා සහ මාසික පදනම මත ප්‍රධාන ආර්ථික දර්ශක ප්‍රකාශයට පත් කරන ලදී.

'මුදල් ප්‍රතිපත්ති විවරණය'ට අදාළ මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ සහ මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ සම්බන්ධව මාධ්‍ය නිවේදන 1,860ක් භාෂාත්‍රයෙන් ම නිකුත් කෙරිණි. වසර ආරම්භයේ දී අපේක්ෂා කළ පරිදි, සන්නිවේදන දෙපාර්තමේන්තුව මුදල් ප්‍රතිපත්ති විවරණය පිළිබඳව මාධ්‍ය හමු 8ක් සංවිධානය කළ අතර, සුවිසල් ප්‍රේක්ෂක ප්‍රජාවක් වෙත මෙම පණිවුඩ ප්‍රතිප්‍රචාරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ මාධ්‍ය නාලිකා ඔස්සේ සජීව විකාශය සිදු කෙරිණි. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුව විසින් මෙම තීරණ සඳහා මුල් වූ කරුණු සරලව පහදා දීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බැංකු විදු පියස සමග සහයෝගයෙන් පිළිවෙළින් නුවරඑළිය, ත්‍රිකුණාමලය, මාතලේ සහ මාතර යන ප්‍රාදේශීය කාර්යාලවල දී සිංහල සහ දෙමළ භාෂාවලින් මංගත දැනුවත් කිරීමේ සැසි 4ක් ද සංවිධානය කරන ලදී.

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් විදේශ ප්‍රේෂණ සම්බන්ධයෙන් සහ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳ අතිරේක මාධ්‍ය හමු කිහිපයක් සඳහා පහසුකම් සැලසූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ඉල්ලීම මත මාධ්‍ය හමුවක් පවත්වන ලදී. මේ අතර, 2022 වසරේ දී අනෙකුත් දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවන්ට අනුව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ගැසට් නිවේදන 12ක් සහ ප්‍රචාරණ දැන්වීම් ඇතුළුව මාධ්‍ය දැන්වීම් 141ක් ද නිකුත් කරන ලදී.

ජීවිතයකට යහපත් පුරුදු ඉගැන්විය හැක්කේ පාසල් වියේ දී වන බැවින්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ සහයෝගයෙන් කැකිරාව සහ රාජාංගනයෙහි පාසල්වල දරුවන්ගේ ආර්ථික විද්‍යා දැනුම සහ මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීමේ අරමුණතිව ඔවුන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී. මූල්‍ය සාක්ෂරතාවෙන් යුත් සමාජයක් ඇතිකරලීමට, නිති පදනමක් මත ඉතිරි කිරීමේ වැදගත්කම ඉස්මතු කරමින් මෙම අවස්ථාවට සමගාමීව, චිත්‍ර සහ රචනා තරග ද සංවිධානය කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයේ සහාය ඇතිව පොත් ලබා දීමේ වැඩසටහනක් ද සංවිධානය කෙරිණි. ඊට අමතරව, මහ බැංකු අරමුණු සහ කාර්යයන් මෙන්ම, ආර්ථික විද්‍යාව, බැංකුකරණය සහ මූල්‍යය යන විෂයයන් යටතේ තෝරා ගත් මාතෘකා මත දැනුවත් කිරීමේ වැඩසටහන් 52ක් පාසල් දරුවන් හා විද්‍යාර්ථීන් සඳහා ඉල්ලීම් මත සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ සංවිධානය කළ අතර, මේ සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් කෞතුකාගාරය නැරඹීමේ අවස්ථාව ද ලබා දුණි. මීට අමතරව, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉලක්ක කරගනිමින් "ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික තත්ත්වය සහ ඉදිරි ගමන්මග" පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කර ගැනීමට වැඩසටහන් මෙන්ම, බලපිටිය සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් ඉලක්ක කරගනිමින් "පිරමීඩ යෝජනා ක්‍රම ඇතුළුව, නීතිවිරෝධී සහ නීත්‍යානුකූල නොවන මූල්‍ය කටයුතු" පිළිබඳව ඔවුන්ගේ දැනුවත්බව වර්ධනය කර ගැනීමට තවත් වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

තවද, පාසල් දරුවන්ගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකු කාර්යයන්ට අදාළ මාතෘකා මත "ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව" නම් අලුතින් හඳුන්වා දුන් විෂයයෙහි විෂය නිර්දේශයට යෝජනා ඉදිරිපත් කිරීමට පත් කළ කමිටුවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු හයක් සහ ජාතික අධ්‍යාපන ආයතනය සමග සම්බන්ධීකරණය ප්‍රධාන දෙපාර්තමේන්තුව/ලේකම්වරයා ලෙස සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවල සහාය ද ඇතිව, සන්නිවේදන දෙපාර්තමේන්තුව යාවත්කාලීන කරන ලද මහ බැංකු නිල වෙබ් අඩවිය වසර පුරා ජාතික භාෂා ප්‍රතිපත්තියට

අනුකූලව භාෂාත්‍රයෙන් ම අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. මහ බැංකුව විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළව නිතර යොමු කරන මහජන විමසීම්වලට ප්‍රතිචාරයක් ලෙස, මහ බැංකු පොදු විද්‍යුත් තැපැල ඔස්සේ ලැබෙන විද්‍යුත් තැපැල් පණිවුඩ සමාලෝචනය කර, සෘජුවම ඒ සඳහා ප්‍රතිචාර කිරීමට හැකි වන සේ අදාළ දෙපාර්තමේන්තු වෙත යවන ලදි. ඇතැම් විමසීම් සඳහා අදාළ තොරතුරු ඇති අවස්ථාවල දී සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ම ප්‍රතිචාර දක්වන ලදී.

මාධ්‍ය නිවේදන, පුවත්පත් දැන්වීම්, විධාන, වාර්ෂික වාර්තාව යනාදිය ඇතුළු අනෙකුත් ප්‍රකාශනයන්හි දෙමළ භාෂා පරිවර්තන අවශ්‍යතා සපුරාලීමට සන්නිවේදන දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති දෙමළ භාෂා පරිවර්තන ඒකකය පිටු 5,022කින් සමන්විත කාර්යයන් 1,161ක නිරත විණි.

එමෙන්ම, සන්නිවේදන දෙපාර්තමේන්තුව මහ ජනයාගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීමට සහ විදේශ ප්‍රේෂණ සහ සේවක අර්ථසාධක අරමුදල් සේවා වැනි ආශ්‍රිත අංශ පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමට අනෙකුත් දෙපාර්තමේන්තු සමග සහයෝගීව ගුවන්විදුලි සාකච්ඡාවන් දෙකක් සහ රූපවාහිනී වැඩසටහන් තුනක් සංවිධානය කරන ලදී.

තම පර්යේෂණ කටයුතු සඳහා තොරතුරු අවශ්‍ය වූ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සහ අනෙකුත් බාහිර පර්යේෂකයන් විසින් සිදු කරන ලද ඉල්ලීම්වලට අනුව පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් ඊට ඉඩ ලබා දුන් අතර, තම සාකච්ඡා, දේශන සහ අධ්‍යයන කටයුතු සඳහා පුස්තකාලය භාවිත කිරීමට මහ බැංකුවේ සීමාවාසික පුහුණුවෙහි නිරත විශ්වවිද්‍යාල සිසුන් 36 දෙනෙකුට ඒ සඳහා පහසුකම් සලසන ලදී.

මීන් පෙර වසරේ දී මෙන්, මහ බැංකුවේ කතුවරයන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල හැකියාව වැඩි දියුණු කර ගැනීමට තෝතැන්නක් සපයමින්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් "සටහන", "නිව්ස් සර්වේ" සහ "වෛප්පහම්" යන වාර සඟරා අඛණ්ඩව වෙබ් අඩවියෙහි පළ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද සියලුම වැදගත් සිදුවීම්/අවස්ථාවන්හි ඡායාරූප ආවරණය සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය මගින් ඉටු කෙරිණි. සමස්තයක් ලෙස, අවස්ථා 160ක් ආවරණය කර ඇති අතර, ඉන් 64ක් වීඩියෝ දර්ශන ආවරණයන් වේ. සන්නිවේදන දෙපාර්තමේන්තුව ඡායාරූප සහ වීඩියෝ සංස්කරණ කාර්යයන් වැනි අනෙකුත් ආශ්‍රිත කටයුතුවල ද සේවා සපයන්නෙකු ලෙස ක්‍රියා කළ අතර, මාධ්‍ය හමු තුළින් අවස්ථා ග්‍රහණය කර ගනිමින්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ණය, සේ.අ.අ. මංගත සේවයේ ප්‍රතිලාභ, වංචනික මූල්‍ය ක්‍රම සඳහා නිරාවරණය වීමේ දරුණු ප්‍රතිවිපාක ආදිය සම්බන්ධයෙන් නව වීඩියෝ දර්ශන නිර්මාණය කිරීමට, දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීමේ කණ්ඩායම සමග සමීපව සම්බන්ධ විය.

# 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනත ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ පරම අයිතිය හා අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති මෙම ව්‍යවස්ථාපිත වගකීම් හා බැඳි කාර්යයන් හැසිරවීම මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. කෝවිඩ්-19 හේතුවෙන් ඇති වූ අභියෝග මධ්‍යයේ වුව ද, 2022 වර්ෂයේදී ද ආර්ථිකයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය වන ව්‍යවහාර මුදල් ඒකකයේ වටිනාකම හා විශ්වාසනීයත්වය ආරක්ෂා කරමින් සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය තොග පවත්වා ගනිමින් ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීම සහ එය පවත්වා ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී.

## 5.1 ව්‍යවහාර මුදල් සංසරණය

2022 මුල් භාගය තුළ ව්‍යවහාර මුදල් සඳහා පැවති ඉහළ ඉල්ලුම, අප්‍රේල් මාසයේ දී රුපියල් බිලියන 1,240 දක්වා වැඩි වූ අතර එය 2022 දෙවන භාගයේ දී ක්‍රමයෙන් අඩු විය. II-1 සංඛ්‍යා සටහන සහ II-1 රූප සටහන මගින් පෙන්වා ඇති පරිදි, 2022 දෙසැම්බර් 31 දින වන විට මුළු ව්‍යවහාර මුදල් සංසරණය පෙර වර්ෂයට වඩා සියයට 2.1 කින් රුපියල් බිලියන 1,026.0 ක් දක්වා වැඩි වී ඇත.

**II-3 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් සංසරණය (2022 දෙසැම්බර් 31 දින වන විට)**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස(%) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| නෝට්ටු | 627.1 | 663.1 | 819.3 | 988.6 | 1,009.1 | 7.1 | 5.7 | 23.6 | 20.7 | 2.1 |
| කාසි (අ) | 13.2 | 14.2 | 14.9 | 15.9 | 16.9 | 9.0 | 7.6 | 4.9 | 6.7 | 6.1 |
| එකතුව | 640.3 | 677.4 | 834.2 | 1,004.5 | 1,026.0 | 7.2 | 5.8 | 23.1 | 20.4 | 2.1 |

(අ) සමරු කාසි අන්තර්ගත නොවේ.

**II-1 රූප සටහන**
**ව්‍යවහාර මුදල් සංසරණය 2018-2022**



සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම 2022 වර්ෂයේ දී රුපියල් බිලියන 1,009.1 දක්වා සියයට 2.1 කින් වැඩි විය. II-2 රූප සටහන මගින් පෙන්වා ඇති පරිදි 2022 දෙසැම්බර් 31 දින වන විට සංසරණයේ පැවති රුපියල් 5000 සහ රුපියල් 1000 මුදල් නෝට්ටුවල වටිනාකමට අනුව එක්ව ගත්කළ එය සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටු වටිනාකමින් සියයට 90.1 ක තරම් සැලකිය යුතු ඉහළ ප්‍රතිශතයක් විය. එමෙන්ම, සංසරණයේ පැවති රුපියල් 20 සහ රුපියල් 100 නෝට්ටු ප්‍රමාණයට අනුව එක්ව ගත්කළ එය සියයට 54 කට ආසන්න අගයක් විය.

**II-2 රූප සටහන**

**2022 වර්ෂය අවසානයේ ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයේ වටිනාකම සහ ප්‍රමාණය**







## 5.2 ව්‍යවහාර මුදල් කළමනාකරණය

ගුණාත්මක තත්ත්වයෙන් යුතු ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මුදල් සංසරණයට නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම සහ භාවිතා කළ නොහැකි (සේවා අනිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මුදල් සංසරණයෙන් ඉවත් කිරීම මුදල් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් වේ. ව්‍යවහාර මුදල් කළමනාකරණයේ සඵලතාව සහතික කිරීම සඳහා 2022 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

### (අ) ව්‍යවහාර මුදල් මුද්‍රණය සහ ටංකනය කිරීම

මහජන ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් තොග පවත්වා ගැනීම සහ මුදල් සංසරණය තුළ ගුණාත්මක තත්ත්වයේ මුදල් නෝට්ටු පැවතීම තහවුරු කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළ දී මුදල් නෝට්ටු මිලියන 495 ක් ඇණවුම් කරන ලදී. මහජන ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් කාසි තොග ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සතුව පැවති බැවින් එම වර්ෂය තුළ කාසි ඇණවුම් නොකරන ලදී.

### (ආ) ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද මුදල් සංසරණය සඳහා නැවත යෙදවිය හැකි මුදල් නෝට්ටු (සේවා නිසි) බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සෘජුව හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. මේ හේතුවෙන් 2022 වර්ෂයේ දී මහ බැංකුව විසින් සිදු කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුතුව අඩු මට්ටමක විය. 2022 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මෙරට මුදල් සංසරණය වෙත නිකුත් කරන ලද මුදල් නෝට්ටු සහ කාසිවල වටිනාකම පිළිවෙළින් රුපියල් බිලියන 384.5 ක් සහ රුපියල් බිලියන 1.0 ක් විය.

**II-4 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම**

| නිකුත් කිරීම | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| සේවා නිසි නෝට්ටු | 467.0 | 526.5 | 467.1 | 172.7 | 167.6 |
| නව නෝට්ටු | 328.4 | 248.7 | 229.5 | 217.3 | 216.9 |
| කාසි(අ) | 1.1 | 1.0 | 0.7 | 0.9 | 1.0 |
| **එකතුව** | **796.5** | **776.2** | **697.3** | **390.9** | **385.5** |

(අ) සමරු කාසි අන්තර්ගත නොවේ.

### (ඇ) ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම

මූලික වශයෙන් මූල්‍ය ප්‍රතිපත්ති මෙවලක් වශයෙන් මහ බැංකුව විසින් පනවා ඇති ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා පවත්වා ගැනීම සහ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතුවල කොටසක් ලෙස ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් මුදල් තැන්පතු බාර ගනු ලබයි. 2022 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් II-5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි සේවා නිසි සහ සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් බාර ගන්නා ලදී. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු වටිනාකම ඉහළ ගියද බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු සෘජුව හුවමාරු කිරීමට පහසුකම් සැලසීම හේතුවෙන් 2022 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් තැන්පතු වටිනාකම සාමාන්‍යයෙන් අඩු මට්ටමක පැවතුණි.

**II-5 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු**

| තැන්පතු | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| සේවා නිසි නෝට්ටු | 524.1 | 606.9 | 445.0 | 144.6 | 272.5 |
| සේවා අනිසි නෝට්ටු | 229.6 | 132.1 | 95.4 | 76.1 | 91.6 |
| **එකතුව** | **753.7** | **739.0** | **540.4** | **220.7** | **364.1** |

සටහනː බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් මහ බැංකුව වෙත කරනු ලබන කාසි තැන්පතුවල වටිනාකම සැලකිය යුතු අගයක් නොගනී.

**(ඇ) සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම**

රටෙහි මුදල් සංසරණය තුළ ගුණාත්මක තත්ත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටු පැවතීම තහවුරු කිරීමේ අරමුණ ඇතිව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ දී රුපියල් බිලියන 207.3 ක වටිනාකමින් යුත් සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 238.5 ක් විනාශ කරන ලදී (II-6 සංඛ්‍යා සටහන).

**II-6 සංඛ්‍යා සටහන**

**සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම**

| නෝට්ටු | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| ප්‍රමාණය (මිලියන) | 343.8 | 235.0 | 127.3 | 108.2 | 238.5 |
| වටිනාකම (රුපියල් බිලියන) | 252.2 | 139.8 | 62.2 | 44.3 | 207.3 |

### 5.3 අනෙකුත් කටයුතු

**(අ) ව්‍යවහාර මුදල් කවුළු මෙහෙයවීම**

2022 වර්ෂය තුළ දී රුපියල් මිලියන 102 ක වටිනාකම සහිත පලුදු වූ මුදල් නෝට්ටු මහ බැංකුවේ පලුදු නෝට්ටු හුවමාරු කවුළුව හරහා හුවමාරු කිරීම මගින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මහජනතාව වෙත සිය සේවා සපයන ලදී. ලංකා බැංකු පිටකොටුව ශාඛාවෙහි මහජනතාව සඳහා ස්ථාපිත විශේෂ මුදල් හුවමාරු කවුළුව මගින් රුපියල් මිලියන 1,812.7 ක ව්‍යවහාර මුදල් නෝට්ටු සහ රුපියල් මිලියන 59.8 ක කාසි නිකුත් කරන ලදී.

**(ආ) ආර්ථික ඉතිහාස කෞතුකාගාරය මෙහෙයවීම**

2022 වර්ෂයේ මුල් භාගයේ රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ආර්ථික ඉතිහාස කෞතුකාගාරය එහි පූර්ණ විභවයෙන් ක්‍රියාත්මක නොවීය. එසේ වුවත්, නාණක විද්‍යාව, සමරු මුදල් නෝට්ටු, කාසි සහ අනෙකුත් සංග්‍රාහක අයිතම අලෙවි කිරීම සහ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම මගින් පුද්ගලයන් 4,415 කට ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සිය සේවාව සපයන ලදී. තවද, 2022 වර්ෂයේ දී අභාවිත පුරාකෘති සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ආර්ථික ඉතිහාස කෞතුකාගාරය විසින් ආරම්භ කර ඇත.

**(ඇ) ව්‍යවහාර මුදල් කෙරෙහි මහජන විශ්වාසය ආරක්ෂා කිරීම**

ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීමේ උත්සාහයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශය සහ නීතිය බලාත්මක කරනු ලබන බලධාරීන් සමඟ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සමීප සහයෝගයෙන් යුතුව කටයුතු කරන ලදී. 2022 වර්ෂයේ දී අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 1,987 ක් වේ. මුදල් සංසරණය තුළ පවතින මුදල් නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු ප්‍රමාණය අනුපාතයක් ලෙස 2022 වර්ෂයේ දී 1.4 ක් විය.

අධිකරණමය නඩු විභාගයන් සඳහා පහසුකම් සලසමින් ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සම්බන්ධ තීරණාත්මක සාක්ෂි වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව, අධිපතිතුමාගේ අත්සනින් යුත් සහතික 98 ක් නිකුත් කිරීමට පහසුකම් සපයන ලද අතර ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ සාක්ෂි දීමේ අධිකරණමය නඩු විභාග 6 ක් සඳහා සහභාගී විය.

**(ඈ) සමරු කාසි නිකුත් කිරීම**

කොළඹ විශ්ව විද්‍යාලයීය වෛද්‍ය පීඨයේ 150 වන සංවත්සරය සහ ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනයේ 150 වන සංවත්සරය සනිටුහන් කිරීම නිමිත්තෙන් රු.20 වටිනාකමින් යුතු සංසරණය සඳහා භාවිතා කරනු ලබන සමරු කාසි 2 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිල වශයෙන් නිකුත් කරන ලදී.

## 6. දේශීය මෙහෙයුම් කටයුතු

### 6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මිල හා ආර්ථික ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව යන මහ බැංකුවේ අරමුණු ද්විත්වයට අදාළ වන්නා වූ වගකීම්වලින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන් සමන්විත වේ. ඒ අනුව, සහභාගිත්ව ආයතන සමග විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත නියාමනය කිරීම, රජය, රජයේ නියෝජිත ආයතන සහ අනෙකුත් නියෝජිත ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස කටයුතු කිරීම, ඍජු අලෙවි සහභාගිවන්නන් සඳහා දවස ඇතුළත ද්‍රවශීලතා ණය පහසුකම සැපයීම සහ බලයලත් මුදල් තැරැව්කරුවන් නියාමනය හා අධීක්ෂණය කිරීම යනාදිය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්වලට අයත් වේ.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

#### 6.2.1 විවට වෙළඳපොළ කටයුතු

දැනට ක්‍රියාත්මක වන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) අඩු විචලතාවකින් යුතුව අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමේ අරමුණ ඇතිව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවට

වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. 2022 වසර තුළ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව දක්වා ඉහළ නැංවුණු බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඛණ්ඩව ඉහළ සීමාවෙහිම පැවතිණි. විශේෂයෙන්ම, රාජ්‍ය මූල්‍ය අංශය තුළ වර්ධනය වෙමින් පැවති තත්ත්වයන් හමුවේ වෙළඳපොළ තුළ අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් 2022 අප්‍රේල් මස සිට ඒක්ෂණ මුදල් වෙළඳපොළ ගනුදෙනු අවම මට්ටමක පැවතිණි.

### (අ) මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව පුරෝකථනය කිරීම

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සාධක ගණනාවක් මත පදනම්ව දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව දෛනික වශයෙන් ඇස්තමේන්තු කරයි. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හා අනුකූල වෙමින් සුදුසු විවට වෙළඳපොළ කටයුතු පැවැත්වීම හරහා සහභාගිත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමට මෙම ඇස්තමේන්තු භාවිතා කරනු ලැබේ. මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තියට අදාළව සිදු කරනු ලැබූ මෙහෙයුම් ක්‍රියාමාර්ගවල බලපෑම මෙන්ම, ද්‍රවශීලතාව කෙරෙහි බලපානු ලබන ස්වායක්ත සාධක වන සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනු, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු සංචිතවල සිදුවන වෙනස්වීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමග සිදු කරන ගනුදෙනු ද මේ සඳහා සැලකිල්ලට ගනු ලබයි. 2022 වසරේදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ද්‍රවශීලතා ඇස්තමේන්තු කටයුතු අභියෝග රැසක් මධ්‍යයේ සිදු කරන ලදී. වසර ආරම්භයේදී මුදල් වෙළඳපොළ හිඟ ද්‍රවශීලතාව රුපියල් බිලියන 335.75 ක් වූ අතර, වසර පුරා ද්‍රවශීලතාව හිඟ මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, 2022 වසරේ දෙවන භාගයේ සිට හිඟ ද්‍රවශීලතාව ක්‍රමිකව අඩුවූ අතර, දෙසැම්බර් මස වන විට හිඟ ද්‍රවශීලතාව රුපියල් බිලියන 231.25 ක් ලෙස වාර්තා විය.

### (ආ) වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත නිර්දේශ ලබා දීම

මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සමස්ත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දෛනික මුදල් මෙහෙයුම් බවට පත්කිරීමේ කාර්යභාරය වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත පැවරේ. මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ තීරණය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය සඳහා දේශීය මුදල් වෙළඳපොළෙහි ප්‍රවණතා හා ද්‍රවශීලතා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත ලබා දීම සිදු කෙරේ. ඒ අනුව, දේශීය මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළෙහි ප්‍රවණතා හේතුවෙන් දෛනිකව වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව මත ඇති වන බලපෑම සැලකිල්ලට ගනිමින් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටිකාලීන පොලී අනුපාතික කළමනාකරණයේදී වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ සලකා බැලීම සඳහා වන ක්‍රියාමාර්ග දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව යෝජනා කරයි. ඇස්තමේන්තුගත ද්‍රවශීලතාව, මෙහෙයුම් ඉලක්කයෙහි යෝග්‍ය මට්ටම, සහභාගිත්ව ආයතන අතර පවත්නා ද්‍රවශීලතා ව්‍යාප්තිය, මුදල් වෙළඳපොළට සුදුසු සංඥා සැපයීමේ අවශ්‍යතාව යනාදී සාධක සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබයි. 2022 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළෙහි සහභාගිත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතාව බෙදී යෑමේ අසමානතාව සහ ද්‍රවශීලතා පීඩන අවම කිරීමේ අරමුණින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මුදල් මෙහෙයුම් කටයුතු සිදු කළේය.

### (ඇ) වෙන්දේසි පැවැත්වීම

2022 වසරේදී සමස්ත ද්‍රවශීලතා කළමනාකරණයට සහාය වීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අවශ්‍යතාව අනුව ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම මෙන්ම, ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම සඳහා උපයෝගී කර ගනු ලැබූ විවට වෙළඳපොළ මෙහෙයුම් යටතේ වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, 2022 වසරේදී දේශීය මුදල් වෙළඳපොළ මත පැවති පීඩනය අවම කිරීම සඳහා උපයෝගී කර ගනු ලැබූ උපකරණ වශයෙන් පහත සඳහන් වෙන්දේසි පවත්වන ලදී (II-7 සංඛ්‍යා සටහන).

#### (i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා 2022 වසර මුලදී එක්දින සහ කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, එක්දින පදනමින් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා එක්දින ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි මෙන්ම, එදිනම පියවීමේ පදනම මත සතියක කාලසීමාවක් දක්වා ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී.

#### (ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ඇතැම් වාණිජ බැංකුවල පැවති ද්‍රවශීලතා පීඩනය අවම කිරීමේ අරමුණ ඇතිව දේශීය මුදල් වෙළඳපොළට ද්‍රවශීලතාව ලබාදීම සඳහා 2022 වසරේදී දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. කාලයක් තිස්සේ වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්වන ලද දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසිවල පියවීම් දිනය, වෙන්දේසි දිනට පසුව එළැඹෙන ව්‍යාපාරික දිනයේදී සිදු විය.

#### (iii) ස්ථිර පදනම මත වන වෙන්දේසි

මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළ හරහා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් වෙළඳපොළට සපයන ලද ද්‍රවශීලතාව ස්ථිර පදනමින් යළි අවශෝෂණය කර ගැනීම සඳහා 2022 වසරේදී මහ බැංකුව ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකුණුම් වෙන්දේසි පවත්වන ලදී. තවද, ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදීගැනීමේ වෙන්දේසි පැවැත්වීම හරහා දිගුකාලීන වශයෙන් ද්‍රවශීලතාව වෙළඳපොළට ලබාදීමට 2022 වසර අවසානයේදී උත්සාහ කළද එය සාර්ථක නොවීය. එමෙන්ම, 2022 වසරේදී ස්ථිර පදනම මත සිදු කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි නොපවත්වන ලදී.

**II-7 සංඛ්‍යා සටහන**
**2022 වසරේ දී පවත්වන ලද විවෘත වෙළඳපොළ වෙන්දේසි**

| වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි ගණන | රු. බිලියන | |
|---|---|---|---|
| | | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය |
| **ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි** | | | |
| එක් දින | 25 | 1,880.00 | 1,533.25 |
| කෙටිකාලීන (දින 7 ක් දක්වා) | 08 | 100.00 | 22.00 |
| දිගුකාලීන (දින 8 සිට දින 90 දක්වා) | - | - | - |
| **ප්‍රතිවිකුණුම් වෙන්දේසි** | | | |
| එක් දින | - | - | - |
| කෙටිකාලීන (දින 7 ක් දක්වා) | 03 | 235.00 | 235.00 |
| දිගුකාලීන (දින 8 සිට දින 90 දක්වා) | 25 | 1,235.00 | 954.50 |
| **ස්ථිර පදනම මත වන වෙන්දේසි** | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම | 11 | 150.00 | 23.53 |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම | 01 | 20.00 | 0.00 |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම | - | - | - |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම | - | - | - |
| **ද්‍රවශීලතා ආධාරක පහසුකම*** | | | |
| එක් දින | - | - | - |
| කෙටිකාලීන (දින 7 ක් දක්වා) | - | - | - |
| දිගුකාලීන (දින 8 සිට දින 90 දක්වා) | - | - | - |

* විවෘත වෙළඳපොළ කටයුතු යටතේ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වෙනම ලබාදෙන ප්‍රතිවිකුණුම් වෙන්දේසියකි.

**(ඇ) නිත්‍ය පහසුකම් සැපයීම**

මුදල් වෙළඳපොළ සහ විවෘත වෙළඳ කටයුතු හරහා දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා පූර්ණ වශයෙන් සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගීත්ව ආයතන සඳහා සිය ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මහ බැංකුව විසින් නිත්‍ය පහසුකම් (Standing Facilities) සපයනු ලැබේ. සහභාගිත්ව ආයතන සතු අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කරනු ලබන අතර, කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාගත නොහැකි සහභාගිත්ව ආයතනවලට ද්‍රවශීලතාව ලබාදීම සඳහා නිත්‍ය ණය පහසුකම භාවිතා කෙරේ. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය තැන්පතු පහසුකමද, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය ණය පහසුකමද මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතනවලට ලබා දෙන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම යටතේ 2022 වසරේදී රුපියල් බිලියන 54,528.34 ක් තැන්පත් කරන ලද අතර, නිත්‍ය ණය පහසුකම යටතේ රුපියල් බිලියන 163,058.05 ක් සහභාගිත්ව ආයතනවලට ලබාදෙන ලදී (II-8 සංඛ්‍යා සටහන).

**II-8 සංඛ්‍යා සටහන**
**2022 වසර තුළ නිත්‍ය පහසුකම් සැපයීම**

රු. බිලියන

| නිත්‍ය පහසුකම | අවමය | උපරිමය | සාමාන්‍යය | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | 51.37 | 378.67 | 227.20 | 54,528.34 |
| නිත්‍ය ණය පහසුකම | 424.16 | 850.60 | 679.41 | 163,058.05 |

### 6.2.2 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වාගෙන යෑම සහ අධීක්ෂණය කිරීම

සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම තමා සතු සමස්ත රුපියල් තැන්පතු වගකීම්වලට අනුපාතිකව, මහ බැංකුවේ පවත්වා ගෙන යා යුතු අවම සංචිත අවශ්‍යතාව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මගින් තීරණය කෙරේ. ව්‍යවස්ථාපිත සංචිත අනුපාත අවශ්‍යතාව පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකු විසින් දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි වගකීමකි. ඒ අනුව, 2022 වසර තුළ සියයට 4 ක් ලෙස නොවෙනස්ව පැවති ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය යටතේ සංචිත පවත්වාගෙන යෑම පරිපාලනය කිරීම සහ වාණිජ බැංකු විසින් ඊට දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

### 6.2.3 බැංකු අනුපාතිකය පරිපාලනය කිරීම

මුදල් නීති පනතේ 86 සහ 87 වන වගන්තිය යටතේ අවසාන ණය ලබාදෙන්නා ලෙස, එනම් මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සැපයීම සඳහා බැංකු අනුපාතිකය භාවිතා කරනු ලැබේ. 2020 වසරේ අප්‍රේල් මස 16 වන දින සිට, බැංකු අනුපාතිකය, නිත්‍ය තැන්පතු ණය පහසුකම් අනුපාතිකය සඳහා පදනම් අංක 300ක ආන්තිකයක් එකතු කොට ස්වයංක්‍රීය ලෙස ගැළපීමට ඉඩහරින ලදී. කෙසේ නමුත්, බැංකු අනුපාතිකය වෙළඳපොළ තත්ත්වයන් මත ගැළපීමට ඉඩහරිමින්, 2022 නොවැම්බර් මස 03 වන දින ව්‍යාපාරික දිනය අවසානය පටන් බලපැවැත්වෙන පරිදි බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකයට පදනම් අංක 700 ක ආන්තිකයක් එකතු කොට තීරණය කරන ලදී. තවද, දේශීය මුදල් වෙළඳපොළෙහි ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් 2023 ජනවාරි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි, බැංකු අනුපාතිකය සඳහා වූ ආන්තිකය, පදනම් අංක 300 ක් දක්වා අඩු කරන ලදී. 2022 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් ණය ලබාගැනීමේ හදිසි අවශ්‍යතා ඇති නොවූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හදිසි ණය සහ අත්තිකාරම් (Emergency Loans and Advances - ELA) සඳහා වූ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී.

## 6.3 වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ රජය සඳහා වන කාර්යයන්

### 6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම් පවත්වාගෙන යෑම

තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් සඳහා ගෙවීම් සහ පියවීම් පහසුකම් සපයමින් සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම ගෙවීම් සහ පියවීම් සිදු කරමින් ශ්‍රී ලංකා මහ

බැංකුව ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශාල වටිනාකමක් සහිත ගෙවීම් සිදු කිරීමට පහසුකම් සැපයීම සහ අන්තර් බැංකු මුදල් වෙළඳපොළෙහි කටයුතු සඳහා පහසුකම් සැපයීම තුළින් මෙම කාර්යභාරය ඉටු කෙරේ. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යනු ලබන පොදු ලෙජර් ගිණුම මගින් ගෙවීම් හා පියවීම් මෙන්ම, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් අතර නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල ගෙවීම් හා පියවීම් නිෂ්කාශනය සඳහා පහසුකම් සැපයීම ද සිදු කෙරේ. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයට අනුව සංචිත පවත්වාගෙන යෑම උදෙසා ද මෙම ගිණුම් භාවිතා කෙරේ. 2022 වසර අවසානයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු 24 ක්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 කට අදාළව තත්කාලීන දළ පියවීම් ගිණුම් පවත්වාගෙන යනු ලැබීය.

### 6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටුකරමින්, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නියෝජිත ආයතන සහ රාජ්‍ය ආයතන මෙන්ම, ඇතැම් විදේශීය ආයතන සඳහා ද බැංකු පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසර අවසානයේදී පවත්වාගෙන යන ලද එවැනි ගිණුම් සංඛ්‍යාව 48 ක් විය. එම ගිණුම්වල පවත්වා ගනු ලැබූ මුළු ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 90 කට ආසන්න ප්‍රමාණයක් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව, යම් මුදල් වර්ෂයක් සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව රජය වෙත පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබා දීමට මහ බැංකුව විසින් කටයුතු කරනු ලැබේ. රජය විසින් මෙම අත්තිකාරම චක්‍රීය ණය පහසුකමක් ලෙස භාවිතා කරනු ලබන අතර, එය මාස 6 කට නොවැඩි කාල සීමාවක් තුළ නැවත ගෙවිය යුතු වේ. 2022 වර්ෂය ආරම්භයේදී, තාවකාලික අත්තිකාරම් යටතේ ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය, 2022 වසරේ ඇස්තමේන්තුගත ආදායම මත පදනම්ව රුපියල් බිලියන 225.05 ක් දක්වා, එනම් රුපියල් බිලියන 73.01 කින් ඉහළ නංවන ලදී. කෙසේ නමුත්, 2022 වසර අවසානයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සංශෝධිත අතරමැදි රාජ්‍ය අයවැය අනුව, තාවකාලික අත්තිකාරම් යටතේ ලබාගත හැකි උපරිම ප්‍රමාණය අමතර රුපියල් බිලියන 12.33 කින් ඉහළ නංවන ලදී. ඒ අනුව, රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් මුදල් ප්‍රමාණය, 2021 වසර අවසානයේදී වාර්තා වූ රුපියල් බිලියන 152.04 හා සැසඳීමේදී 2022 වසර අවසානයේදී රුපියල් බිලියන 237.37 ක් විය. 2023 වසර සඳහා අනුමත කරන ලද රාජ්‍ය අයවැය මත පදනම්ව, වසර ආරම්භයේදී රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 344.95 දක්වා රුපියල් බිලියන 107.58 කින් ඉහළ ගියේය.

## 6.4 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සෘජු අලෙවිකරුවන් සඳහා දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම (Intra-day Liquidity Facility) සපයනු ලබයි. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් සහ ගාස්තුවකින් තොරව මෙම පහසුකම සපයන අතර, අදාළ දිනය තුළදී සුරැකුම්පත්වල වර්තමාන වෙළඳපොළ මිල ගණන් වෙනස්වීම හේතුවෙන් අදාළ සුරැකුම්පත්වල මිලෙහි ඇති විය හැකි උච්චාවචන මඟින් ඇති කෙරෙන අලාභය අවම කිරීම සඳහා යම් ගැළපීමක් (Haircut) අන්තර්ගත කරමින් අදාළ සුරැකුම්පත්වල නිල මිල ගණන් තීරණය කෙරේ. 2022 වර්ෂය තුළදී එක්දින ද්‍රවශීලතා පහසුකමේ මුළු අගය රුපියල් බිලියන 157,166.18 ක් ද, දෛනික සාමාන්‍ය අගය රුපියල් බිලියන 657.60 ක් ද විය. 2021 වසරේදී එම මුළු අගය රුපියල් බිලියන 50,777.45 ක් ද දෛනික සාමාන්‍ය අගය රුපියල් බිලියන 215.16 ක් ද විය. ඒ අනුව, පසුගිය වසරට සාපේක්ෂව 2022 වසරේදී එක්දින ද්‍රවශීලතා පහසුකම භාවිතය සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

## 6.5 බලයලත් මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

බලයලත් මුදල් තැරැව්කරුවන් (Authorised Money Brokers) විසින් මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් යන වෙළඳපොළ ගනුදෙනුවල අතරමැදිකරණ කාර්යයන් සිදු කෙරේ. දේශීය මුදල් වෙළඳපොළ තුළ මුදල් තැරැව්කරුවන්ගේ වෘත්තීයමය ක්‍රියාකාරිත්වය සහතික කිරීම පිණිස ශ්‍රී ලංකාවේ බලයලත් මුදල් තැරැව්කරුවන් නියාමනය කිරීමේ බලය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරමින් මුදල් නීති පනතේ 10(සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2013 සහ 2016 යන වසරවලදී නිකුත් කළ මුදල් තැරැව්කරණ රෙගුලාසි අවලංගු කරමින්, 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කර ඇත. ඉහත රෙගුලාසි යටතේ 2022 වසර අවසානය වන විට සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කර ඇති අතර, එම සමාගම් "බලයලත් මුදල් තැරැව්කරුවන්" ලෙස නම් කර ඇත. වසර තුළදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සියලුම බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා එතැන් පරීක්ෂණ සිදු කරන ලදී.

**2022.12.31 දිනට බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් ලේඛනය**

1. බී එම් ආර් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
3. ෆස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
5. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විෂ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

# 7. ආර්ථික පර්යේෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 25වන වගන්තිය මගින් මුදල් මණ්ඩලයට සහ මහ බැංකුවෙහි අධිපතිට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම පිණිස සහ මහජනතාව වෙත මුදල් හා බැංකු සහ පොදු උනන්දුවක් දක්වන වෙනත් ආර්ථික විෂයයන් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම සඳහා දත්ත සම්පාදනය කිරීමේ හා ආර්ථික පර්යේෂණ සිදු කිරීමේ වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. පෙර නොපැවති ආකාරයේ අභියෝගාත්මක දේශීය හා ජාත්‍යන්තර තත්ත්වයන් මධ්‍යයෙහි වුවද, 2022 වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ඵලදායී ලෙස සිය වගකීම් ඉටු කරන ලදී. සිය වගකීම් ඉටු කිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික සහ මිල ස්ථායීතාවයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් පිළිබඳ පුළුල් විශ්ලේෂණයන් සපයමින් කළමනාකාරීත්වයට හා මුදල් මණ්ඩලයට කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්ති නිර්දේශ කිරීම අඛණ්ඩව සිදු කළේය. මුදල් ප්‍රතිපත්තිය, වර්ධනයෙහි සහ උද්ධමනයෙහි වෙනස් වීම්, රාජ්‍ය මූල්‍ය අංශය සහ විදේශීය අංශය ඇතුළුව වසර තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් සාර්ව ආර්ථික අභියෝග කෙරෙහි දෙපාර්තමේන්තුවේ පර්යේෂණ න්‍යාය පත්‍රයෙහි මූලික අවධානය යොමු විය. වසර තුළ දී පුද්ගල සහභාගීත්වය සහිතව සිදු කරන ලද බොහෝ කටයුතුවලට අමතරව, මුදල් සමස්ත සහ ගෙවුම් ශේෂය හා සම්බන්ධ දත්තවල ප්‍රාථමික මූලාශ්‍රය ලෙස, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වෙත සංඛ්‍යාලේඛන සහ අනෙකුත් සාර්ව ආර්ථික තොරතුරු සැපයීමේ කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී. ප්‍රතිපත්ති කෙරෙහි නැඹුරු වූ පර්යේෂණ සහ දැනුම බෙදා ගැනීමේ කටයුතු සිදු කිරීමෙහිලා දැනටමත් ස්ථාපිත වී ඇති සම්ප්‍රදායට දායක වෙමින් වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිය හැකියාවන් තවදුරටත් ශක්තිමත් කර ගත් අතර, මහ බැංකුව තුළ පර්යේෂණ කටයුතු සිදු කිරීම ද ප්‍රවර්ධනය කරන ලදී. දැනුම බෙදා ගැනීමේ අරමුණ සම්පූර්ණ කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මහජනතාව ඇතුළු සියලු පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත් වූ අතර, ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය සහ ප්‍රතිපත්ති සමතුලිතව පවත්වා ගැනීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබඳව පැහැදිලි කිරීමට එමගින් අවස්ථාව හිමි විය. මහ බැංකුව සතු රටේ මූල්‍ය අධිකාරීමය ධාරිතාවය තුළ, විදේශීය පාර්ශ්වකරුවන්, ජාත්‍යන්තර නියෝජිතායතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග සමීප සම්බන්ධතාවයන් ස්ථාපිත කිරීමට සහ පවත්වාගෙන යෑම සඳහා, ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යෑමේ කේන්ද්‍රස්ථානය ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරන ලදී. විශේෂයෙන් ම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පැවති රැස්වීම්වලට අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සකස් කරමින් සහ අවස්ථා කිහිපයකදී ම ඔවුන්ගේ තාක්ෂණික මට්ටමේ ගැටලුවලට ප්‍රතිචාර දක්වමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි මහ බැංකුවට අදාළ සාකච්ඡාවලට පහසුකම් සැලසීමේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන භූමිකාව ඉටු කරන ලදී. රජය විසින් ක්‍රියාත්මක කර ඇති ණය ප්‍රතිව්‍යුහගතකරණයට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සඳහා පත් කළ මූල්‍ය සහ නීති උපදේශකයන් සමග සමීපව සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. තවද, 2022 වසර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධව සහ ක්ෂේත්‍ර කිහිපයක් සඳහා තාක්ෂණික සහාය ලබා දීමට පැවැත්වූ මෙහෙයුම් වැඩසටහන් කිහිපයක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී.

## 7.1 ආර්ථික සහ මිල ස්ථායීතාවය පවත්වා ගැනීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්වෝපායික සහ දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති තීරණවලට එළැඹීම සඳහා මුදල් මණ්ඩලයට සහාය වීමේ අරමුණ පෙරදැරිව ප්‍රක්ෂේපණ සහ පුරෝකථන සිදු කරමින් දේශීය ආර්ථිකයේ මුදල්, විදේශීය, මූර්ත සහ රාජ්‍ය මූල්‍ය අංශවල මෙන්ම ගෝලීය ආර්ථික ප්‍රවණතාවලට අදාළ දත්ත සම්පාදනය, අධීක්ෂණය සහ විශ්ලේෂණය අඛණ්ඩව සිදු කරන ලදී. මුදල් ප්‍රතිපත්ති කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පෙර සැලසුම් කරන ලද මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් අටක් පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී. මුදල් මණ්ඩලය වෙත දැනුම්වත් ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට ආර්ථිකයේ සිදුවන වර්ධනයන්, මුදල් තත්ත්වයන්, විදේශීය අංශයේ ගැටලු මෙන්ම, උද්ධමනය සහ ආර්ථික වර්ධනය වැනි ආකෘති මත පදනම් වූ සාර්ව ආර්ථික පුරෝකථනයන්ද ඇතුළත් විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සාර්ව ආර්ථික ස්ථායීතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඉස්මතු කරමින් විවිධ ආර්ථික ගැටලු පිළිබඳව මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත විශ්ලේෂණ සහ වාර්තා ලබා දෙන ලදී. මේ අතර, මීට පෙර මහ බැංකුවේ ක්‍රියාත්මක වූ මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව (MPCC) සහ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුව (FSSCC) ප්‍රතිස්ථාපනය කරමින් 2022 ජූලි මාසයේ දී පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව කමිටුව (SEC) පිහිටුවන ලදී. කීර්තිමත් වෘත්තිකයන්, විද්වතුන් සහ පෞද්ගලික අංශය නියෝජනය කරන්නන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව කමිටුව සාමාන්‍යයෙන් කාර්තුමය පදනමින් රැස්වන අතර රැස්වීම් සඳහා පහසුකම් මෙන්ම ලේකම් කටයුතු සහාය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සපයන ලදී. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සහ සන්නිවේදනය සඳහා දායක වන විශ්ලේෂණාත්මක ධාරිතාව පුළුල් කිරීමේ අඛණ්ඩ ප්‍රයත්නවල කොටසක් ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ලැබුණු තාක්ෂණික සහාය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය අභ්‍යන්තර ආකෘතීකරණ සහ පුරෝකථන හැකියාව අඛණ්ඩව වැඩිදියුණු කරන ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බැවින්, අපේක්ෂිත මැදි කාලීන උද්ධමන මාවත අනුව උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමේ අරමුණින්, බාහිර

සන්නිවේදනය වැඩිදියුණු කිරීමට සහ පොදු මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පියවර කිහිපයක් ආරම්භ කරන ලදී. මුදල් මණ්ඩලයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව මහජනතාව දැනුම්වත් කරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති සමාලෝචනය පිළිබඳ මාධ්‍ය නිවේදන අටක් ප්‍රකාශයට පත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද මුදල් ප්‍රතිපත්ති සමාලෝචන මාධ්‍ය සාකච්ඡා සඳහා පහසුකම් සලසමින් ඒවා මංගත ක්‍රමවේද සහ සමාජ මාධ්‍ය හරහා සජීවීව විකාශනය කරන ලද අතර එමගින් පුළුල් ව්‍යාප්තියක් සහිතව තත්කාලීනව මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය කළ හැකි විය. මහ බැංකුවේ සන්නිවේදන ප්‍රයත්නයන්ට සහාය වෙමින්, මුදල් ප්‍රතිපත්ති නිවේදනයෙන් පසුව මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සම්බන්ධීකරණය කරන මංගත සැසි සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සම්පත්දායකයන් ලබාදෙන ලදී. මහ බැංකුවේ කාර්යයන් සම්බන්ධ තෝරාගත් ක්ෂේත්‍ර පිළිබඳව මහ බැංකු කාර්ය මණ්ඩලයේ තාක්ෂණික අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන දැනුම හුවමාරු කරගැනීමේ සැසි සඳහා ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව දායක විය. මේ අතර, වසර තුළ දී මුදල් සහ පොලී අනුපාතික සංඛ්‍යාන සම්පාදනය කිරීම සහ බෙදා හැරීම තවදුරටත් වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පොලී අනුපාතික සංඛ්‍යාන පිළිබඳ වැඩි සංඛ්‍යාතයක් සහිත කාණ්ඩිත දත්ත රැස් කිරීම ආරම්භ කළ අතර, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ගේ සිදු වූ වෙනස්කම්වලින් පසුව මුදල් හා පොලී අනුපාතික දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලදී.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාවය පවත්වා ගැනීම

ආර්ථිකයේ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර වෙළඳාම, විදේශ මූල්‍ය, විනිමය අනුපාතික සහ දළ නිල සංචිත සම්බන්ධ සංඛ්‍යා දත්ත එකතු කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලය වෙත විදේශීය අංශය පිළිබඳ සුදුසු හා කාලීන ප්‍රතිපත්ති උපදෙස් සහ නිර්දේශ අඛණ්ඩව ලබා දෙන ලදී. අභියෝගාත්මක සහ අවදානම් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විනිමය අනුපාතිකයේ පීඩනය නිරන්තරයෙන් විශ්ලේෂණයට ලක් කරන ලද අතර, විදේශීය අංශයේ අවදානම් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමගින් විදේශීය අංශයේ වර්ධනයන් සහ ගැටලු පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ මුදල් මණ්ඩලයට අඛණ්ඩව ඉදිරිපත් කිරීම් සහ වාර්තා ලබාදීම් සිදු කරන ලදී. මුදල් නීති පනතේ 114වන වගන්තියට අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉල්ලීම පරිදි, යෝජිත විදේශ ණය ලබා ගැනීමට පෙර, එම ණය මගින් මුදල් තත්ත්වය මත ඇතිවන බලපෑම අඛණ්ඩව විශ්ලේෂණය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන ලේඛනයේ 6වන සංස්කරණ (BPM6) ආකෘතිය අනුව ගෙවුම් තුලන හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත කාර්තුමය පදනම මත ද, ජාත්‍යන්තර සංචිත දත්ත සටහන මාසික පදනම මත ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශ ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙත ද, වාර්ෂික පදනම මත සෘජු ආයෝජන දත්ත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය වෙත ද ඉදිරිපත් කරන ලදී. විදේශීය අංශයේ දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට සහ වඩාත් කාලීන තොරතුරු ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සම්බන්ධයෙන් වූ මාසික සමීක්ෂණ, පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ සමීක්ෂණය සහ නේවාසික හා අනේවාසික ගුවන් සමාගම්, නාවික සමාගම්, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ ආදී අංශ රැසක් ආවරණය කෙරෙන සේවා වෙළඳාම පිළිබඳ සමීක්ෂණය ඇතුළු සමීක්ෂණ රැසක් සිදු කරන ලදී. වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, බැංකු පද්ධතිය හරහා සිදු වන විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ සහ සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් වන අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතිය (ITRS) ක්‍රියාත්මක කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, විශේෂයෙන්ම විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට සහ 2022 සැප්තැම්බර් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළඹීම සඳහා විදේශීය පාර්ශ්වයන් සමග කටයුතු කිරීමට පහසුකම් සැලසීය.

## 7.3 පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන

2022 වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය, විදේශ විනිමය ප්‍රතිපත්තිය, විදේශ වෙළඳාම සහ රාජ්‍ය මූල්‍ය අංශය හා සම්බන්ධ ගැටලු පිළිබඳව මුදල් මණ්ඩලයට, රජයට සහ අනෙකුත් පාර්ශ්වයන්ට ප්‍රතිපත්ති උපදෙස් සැපයීමේ ප්‍රධාන භූමිකාව, අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඒ අනුව, ඉහළ කළමනාකාරීත්වයට සහ මුදල් මණ්ඩලයට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගරු මුදල් අමාත්‍යවරයාට, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු කමිටු කිහිපයකට රහස්‍ය වාර්තා සකස් කොට ඉදිරිපත් කරන ලදී. දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, මුදල් නීති පනතේ 64 සහ 68 වගන්ති යටතේ, මුදල් හා විදේශීය අංශ සම්බන්ධයෙන් දැනට පවතින සහ අපේක්ෂිත තත්ත්වයන් පිළිබඳව ගරු මුදල් අමාත්‍යවරයා වෙත රහස්‍ය වාර්තා ඉදිරිපත් කළ අතර, එමගින් ආර්ථික හා මිල ස්ථායීතාවය සහ විදේශීය අංශයේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා ගත යුතු පූර්වෝපායික ක්‍රියාමාර්ග ද යෝජනා කළේය. මුදල් නීති පනතේ 116 (1) වගන්තිය යටතේ, මහ බැංකුවෙහි අරමුණු ඉටු කර ගැනීමේ දී වත්මන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි බලපෑම අවධාරණය කරමින්, 2023 ජාතික අයවැයට අන්තර්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා ද ඇතුළත් කොට සැප්තැම්බර් 15 රහස්‍ය වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලදී.

2022 වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවශ්‍ය ප්‍රතිපත්තිමය කරුණු සැපයීම සඳහා මුදල් මණ්ඩල රැස්වීම්වලට නිරන්තරයෙන් සහභාගී වූ අතර, මුදල් ප්‍රතිපත්ති කමිටුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩල, පුහුණු කටයුතු කමිටුව සහ පුස්තකාල උපදේශන කමිටුව ඇතුළුව අභ්‍යන්තර කමිටු ගණනාවක අඛණ්ඩව සාමාජිකත්වය දරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි සහ ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි නිරීක්ෂකයෙකු ලෙස ද අඛණ්ඩව කටයුතු කළේය. මීට අමතරව, සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් සහ කාලීන වැදගත්කමක් ඇති විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය කරුණු සපයමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, නිත්‍ය සහ විශේෂ සැසිවාර මෙන් ම අභ්‍යන්තර කමිටු රැස්වීම් සහ මූල්‍ය ආයතනවල සභාපතිවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම් හා බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර සේවා ප්‍රධානීන්ගේ රැස්වීම් සඳහා සහභාගී විය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ලංකා මිනරල් සැන්ඩ්ස් සීමිත සමාගම විසින් ඛනිජ වැලි විකිණීමේ දී ඒ සඳහා නිශ්චිත මිල සීමාවක් නියම කිරීමේ කමිටුව, වහලය මත/බිම් මට්ටමින් සවි කෙරෙන සූර්ය බල පද්ධති සඳහා වන තීරු බදු සංශෝධනය කිරීමේ කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුවට සහාය වීමේ තාක්ෂණික කමිටුව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ජනනය කරන මෙගා වොට් 10ක් හෝ ඊට අඩු විදුලිය සඳහා සම්මත විදුලි ගාස්තු යාවත්කාලීන කිරීමේ කමිටුව, කුරුන්වතිච් ලුණු ලේවාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති කමිටුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ ප්‍රවර්ධන හා තොරතුරු පිළිබඳ උපදේශන කමිටුව, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව, ගෑස් සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීමේ කමිටුව, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීමේ කමිටුව, ජීවන වියදම පාලනය කිරීම සඳහා වන කමිටුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් මෙහෙයවන කාබනේට් පාෂාණ හා ඛනිජවල ආර්ථික වටිනාකම තීරණය කිරීමේ ඇගයීම් කමිටුව, ආහාර ප්‍රතිපත්ති කමිටුව සහ අධිවේගී මාර්ග ඇතුළු ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්වල මිල වෙනස් වීම් ගැලපීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා වන කමිටුව ඇතුළු බාහිර ආයතන කිහිපයක කමිටු සහ මණ්ඩල නියෝජනය කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ආර්ථික ස්ථායීතාවය, ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ වර්ධනය ඉහළ නැංවීම සඳහා වන කමිටුවට ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් විවිධ ආකාරයෙන් සහාය දක්වන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වසර තුළ දී වැඩසටහන් කිහිපයක දී මහ බැංකුව නියෝජනය කළ අතර, සමුද්‍ර අවකාශය භාවිතයට ගන්නා ආකාරය පිළිබඳව සැලසුම් කිරීම සහ 30*30 ව්‍යාපාරය : ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ, Global Green Growth (GGGI) ආයතනය මගින් මෙහෙයවූ ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය වැඩසටහන, තිරසාර සංවර්ධනය සඳහා ESCAP සාර්ව ආර්ථික ආකෘතිය ක්‍රියාත්මක කිරීම සහ විදේශ විනිමය ගලා ඒම් ශක්තිමත් කිරීමේ කාර්යසාධක බලකාය වැනි වැඩසටහන් ඒ අතර වේ. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව, ලංකා විදුලිබල මණ්ඩලය, කොළඹ වරාය නගරය (පෞද්ගලික) සමාගම ඇතුළු විවිධ ආයතනවල රැස්වීම් සඳහා සහභාගී විය. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරිත මූල්‍ය වර්ගීකරණය පිළිබඳ මෙහෙයුම් කමිටුවට සහභාගී වූ අතර, හරිත මූල්‍ය වර්ගීකරණය ක්‍රියාවට නැංවීමේ වැඩසටහන සංවිධානය කිරීමට ද සම්බන්ධ විය. එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය නෞකාවෙන් සිදු වූ ව්‍යසනයේ බලපෑම තක්සේරු කිරීම, ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමයෙහි කාර්යසාධනය, ඉල්ලුම කළමනාකරණය කිරීම සඳහා දේශීය ඛනිජ තෙල් මිල කඩිනමින් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය, ආහාර සුරක්ෂිතතාවය සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කෘෂිකාර්මික අංශයෙහි පුනරුදයක් ඇති කිරීම සහ කර්මාන්ත අංශයේ ගැටලු සහ අපේක්ෂාවන් ඇතුළුව කාලීන වැදගත්කමක් සහිත විශ්ලේෂණ අඛණ්ඩව සිදු කරන ලදී. නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා යථාවත් කිරීමේ රජයේ ප්‍රයත්නයන්ට දායක වෙමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ නිලධාරීන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සත්කාරකත්වය දරන චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි සාකච්ඡා සඳහා පිහිටුවන ලද ආයෝජන අනුකමිටුව වැනි කමිටු සහ අනුකමිටුවලට සහභාගී විය.

## 7.4 ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදා හැරීම

මුදල් නීති පනතේ ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහාය ද ඇතිව, 2021 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත්කරන ලදී. මහ බැංකුවේ ප්‍රමුඛතම වාර්ෂික ප්‍රකාශනය වන මෙය 2021 වසරේ අප්‍රේල් මස අවසානයේ දී ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර එය මහජනයා සඳහා ද ලබාදෙන ලදී. මීට අමතරව, පැවති සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ මධ්‍ය වාර්ෂික තක්සේරුවක් සහ 2023 සඳහා ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු සපයන 'මෑත කාලීන ආර්ථික ප්‍රවණතා -2022 සුවිශේෂ සිදුවීම් සහ 2023 අපේක්ෂා' ප්‍රකාශනය අනෙකුත් දෙපාර්තමේන්තුවල සහාය ද ඇතිව 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් මාසික සංඛ්‍යාන විවරණිකා සහ සාර්ව ආර්ථික ප්‍රස්ථාර එකතුව ප්‍රකාශයට පත් කරන ලද අතර, විවිධ මාධ්‍ය සහ මහ බැංකුවේ වෙබ් අඩවියේ මංගත දත්ත පුස්තකාලය හරහා ප්‍රකාශයට පත් කරන ලද දෛනික, සතිපතා සහ මාසික දර්ශක සහ විවරණිකා හරහා ආර්ථික හා මූල්‍ය තොරතුරු අඛණ්ඩව බෙදා හරින ලදී. එමෙන්ම, මහජනතාවගේ දැනුවත්මවත්භාවය ඉහළ නැංවීමේ අරමුණින්, නිතිපතා ප්‍රකාශයට පත්කරන මුදල් ප්‍රතිපත්ති

විවරණ සහ විදේශීය අංශයේ ප්‍රවණතා හා සම්බන්ධ විශේෂ සිදුවීම් පිළිබඳ මාධ්‍ය නිවේදන සහ පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සම්පාදිත සංඛ්‍යාන දත්ත මුද්‍රාහරින ලදී. ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ විසින් බාහිර කටයුතුවල දී මහ බැංකුව නියෝජනය කළ අතර, ප්‍රධාන ආර්ථික ගැටලු පිළිබඳව විද්‍යුත් මාධ්‍යවල සාකච්ඡා රාශියකට ද සහභාගී විය. එමෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් අධිපතිවරයා විසින් නොයෙකුත් අවස්ථාවල පවත්වන ලද දේශන සඳහා කථන කරුණු සහ ඉදිරිපත් කිරීම් පිළියෙළ කළ අතර, ගරු අමාත්‍යවරුන් වෙත විවිධ මාතෘකා පිළිබඳ තොරතුරු ලබාදීම ද සිදු කරන ලදී.

## 7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදා හැරීම

මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදනයට පහසුකම් සැලසීම සඳහා පර්යේෂණ සහ විශ්ලේෂණ හැකියා ඉහළ නංවාලීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය දෙපාර්තමේන්තුව තුළ සහ මහ බැංකුව තුළ පර්යේෂණ පසුබිමක් අඛණ්ඩව ප්‍රවර්ධනය කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් සකස් කරන ලද අභ්‍යන්තර කමිටුවක් වන පර්යේෂණ උපදේශන කමිටුව විසින්, පර්යේෂණ ආශ්‍රිත කාර්යයන් සඳහා මග පෙන්වීම් සහ දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, පර්යේෂණ උපදේශන කමිටුවෙහි සාමාජිකයින් විසින් මහ බැංකුවේ නිලධාරීන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂකයන්ට මග පෙන්වන පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව දායක වූ අතර බැංකු විදු පියෙසෙහි සහාය ඇතිව 'ආර්ථික විද්‍යාත්මක පර්යේෂණ' (Research in Economics) සහ 'Eviews' ඇතුළු පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණු පාඨමාලා කිහිපයක සම්පත් දායකයින් ලෙස කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ සහයෝගිතාව ඇතිව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අඛණ්ඩව තෙවන වරටත් 'සාර්ව ආර්ථික ස්ථායිතාව සඳහා මතුවන ගැටලු' යන තේමාව යටතේ ඒකාබද්ධ වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ පර්යේෂකයන් සමග සාමූහිකව සකස් කරන ලද පර්යේෂණ පත්‍රිකා තුනක් මෙම වැඩමුළුවේ දී ඉදිරිපත් කරන ලදී. 2022 වසරේ අගෝස්තු මාසයේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂකයන් විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අන්ථ්‍ය සම්මන්ත්‍රණයේ දී අප රටෙහි අත්දැකීම් ඇසුරෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂයන් සඳහා සාර්ව ආර්ථික විද්‍යාව, ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ ආර්ථික විද්‍යාව සඳහා ගණිතය යන ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා දීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේය. පර්යේෂණ උපදේශන කමිටුවෙහි සාමාජිකයින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා ඇගයීම සහ විශ්ව විද්‍යාල පද්ධතියේ පශ්චාත් උපාධි සිසුන් සඳහා අධීක්ෂණ සේවා සැපයීම අඛණ්ඩව සිදුකළ අතර, පර්යේෂණ උපදේශන කමිටුවෙහි මගපෙන්වීම යටතේ මහ බැංකුවේ නිල පර්යේෂණ ප්‍රකාශනය වන 'මාණ්ඩලික පත්‍රිකා' 2022 වසරේ ප්‍රකාශයට පත්විය. එපමණක් නොව, පර්යේෂණ උපදේශන මණ්ඩලයෙහි සාමාජිකයින් විසින් 'නිවුස් සර්වේ' (News survey), 'සටහන' සහ 'වෛප්පම්' (Vaippaham) යන මහ බැංකුවේ වාර සඟරා තුනෙහි පල කිරීම සඳහා සම්පාදනය කරන ලද ලිපි සමාලෝචනය කිරීමද සිදු කරන ලදී.

මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පාසල් හා විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියෙස සහ ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව මහ බැංකුව තුළ සහ ඉන් පිටත උනන්දුවක් දක්වන පාර්ශ්වයන් අතර ආර්ථික විද්‍යා දැනුම වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී. එසේම, මහ බැංකුවේ සීමාවාසික වැඩසටහන යටතේ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල සිසුන් 45 දෙනෙකුගේ පර්යේෂණ කුසලතා වර්ධනය කිරීමට සහාය වෙමින් සහ රටේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි සහ මහ බැංකුවෙහි කාර්යභාරය පිළිබඳව ඔවුන් දැනුම්වත් කරමින් උපදේශකත්ව සේවා ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් '2021 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹුවන ශ්‍රී ලංකා ආර්ථිකය, ඉදිරි දැක්ම සහ අභියෝග' යන මැයෙන් ප්‍රධාන මහජන දේශනයක් භාෂා ත්‍රිත්ත්වයෙන්ම පවත්වන ලදී. තවද, මුදල් ප්‍රතිපත්තිය, මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන්, මෑත කාලීන ආර්ථික ප්‍රවණතා සහ වත්මන් ආර්ථික අර්බුදය වැනි අංශ පිළිබඳව මංගත සහ පුද්ගල සහභාගිත්වයෙන් අධ්‍යාපනික සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මීට අමතරව, 2022 වසරේ දී බැංකු විදු පියෙස විසින් සංවිධානය කරනු ලැබූ, 'තක්ෂිලාව' සහ 'අරිවුටෛ' නම් වූ, පිළිවෙළින්, සිංහල සහ දෙමළ භාෂාවලින් පවත්වන ලද, රූපවාහිනී අධ්‍යාපනික දේශන මාලාව වෙත ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය හිමි විය.

## 7.6 ජාත්‍යන්තර සබඳතා

2022 වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව රජය සහ මහ බැංකුව වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන සහ බහුපාර්ශ්වීය ආයතන සමග පවතින ආර්ථික හා මූල්‍ය සබඳතා තවදුරටත් ශක්තිමත් කරන ලදී. වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග මංගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද රැස්වීම් සම්බන්ධීකරණය කළ අතර, IVවන වගන්තිය හා VIII වන වගන්තිය යටතේ වන උපදේශන සහ තාක්ෂණික සහාය ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මෙහෙයුම් කිහිපයක් සඳහා පහසුකම් සලසන ලදී. තවද, අග්නිදිග ආසියානු මහ බැංකු මධ්‍යස්ථානය හරහා අග්නිදිග ආසියානු මහ බැංකු

විධායක කමිටුවේ හා මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික රැස්වීම් සම්බන්ධීකරණය කරමින්, සහ දකුණු ආසියානු මහ බැංකුවල අනෙකුත් සම්බන්ධීකාරකවරු සමග එක්ව දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ කටයුතු සම්බන්ධීකරණය කරමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කලාපීය මහ බැංකු සමග අඛණ්ඩව සක්‍රීය ලෙස කටයුතු කළේය. කොළඹ පිහිටි නවසීලන්ත මහ කොමසාරිස් කාර්යාලය සමග එක්ව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් නවසීලන්ත සංචිත බැංකුවේ හිටපු වැඩබලන අධිපතිවරයාගේ සංචාරයකට සත්කාරකත්වය සැපයූ අතර, එහි දී මහ බැංකු කටයුතු සහ එයට සම්බන්ධ නීති පිළිබඳව සාකච්ඡා කිරීමට අමතරව ප්‍රසිද්ධ දේශනයක් ද පවත්වන ලදී. එසේම, වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ෆිච් (Fitch), එස් ඇන්ඩ් පී (S & P) සහ මූඩීස් (Moody's) යන ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන ත්‍රිත්වය සමග සමීපව කටයුතු කළ අතර, ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සිදු කළ විමසීම් සඳහා අවශ්‍ය කරුණු සපයන ලදී. දරිද්‍රතාවය තුරන් කිරීම, තාක්ෂණය සහ නවෝත්පාදන, ව්‍යුහාත්මක වෙනස් වීම්, කලාපීය ඒකාබද්ධතාවය, දේශගුණික විපර්යාස සහ ඉදිරියේ දී ඇති විය හැකි කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම යන අංශ පිළිබඳව අවධාරණය කරමින් පවත්වන ලද අවම සංවර්ධිත තත්ත්වයක් සහිත රටවල් සඳහා වන එක්සත් ජාතීන්ගේ පස්වන සමුළුව සඳහා අවශ්‍ය තොරතුරු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77 වන සැසිවාරය, විදේශ ආයෝජකයින් සහ තානාපතිවරු සඳහා අවශ්‍ය ආර්ථික තොරතුරු සැපයීමට දායක වූ අතර ආර්ථිකයේ බාහිර පාර්ශ්වකරුවන් සමග පවතින සම්බන්ධතාවයන් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

## 8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (සේ. අ. අ. දෙපාර්තමේන්තුව) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව මුදල් මණ්ඩලය වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමට, රාජකාරීන් ඉටු කිරීමට සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලබයි. සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන වලට අනුව, අරමුදලෙහි සාමාන්‍ය පරිපාලනය කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති අතර අරමුදල් කළමනාකරණය සඳහා වූ සියලු බලතල, කාර්යයන් සහ වගකීම් අරමුදලේ භාරකරු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත.

සේ. අ. අ. පනත යටතේ ගෙවන ලද සියලුම දායක මුදල්, අධිභාර සහ ගාස්තු සහ අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම එක්රැස් කිරීම, අරමුදලෙහි මුදල් වල භාරය දැරීම, එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා ගැනීම, කම්කරු කොමසාරිස් විසින් සහතික කරනු ලැබූ තැනැත්තන් හට පනත යටතේ හිමි ප්‍රතිලාභ ගෙවීම, පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් ආයෝජනය කිරීම, අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සැකසීම, එහි පිටපතක් කම්කරු විෂය සම්බන්ධ ඇමති තුමා වෙත ලබාදීම සහ එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම යන කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

2022 වසරේදී ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව, සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් ඉහත කාර්යයන් ඉටු කළ අතර කම්කරු කොමසාරිස්වරයා සමග ද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

### (අ) දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්

2022 වසරේ දායක මුදල් ලැබීම් රු. බිලියන 194.6 දක්වා පෙර වසරේ පැවති රු. බිලියන 165.7 සිට සියයට 17.4 කින් වැඩි වූ අතර, අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ගෙවූ ප්‍රතිලාභ ද රු.බිලියන 163.0 ක් දක්වා පෙර වසරේ පැවති රු.බිලියන 118.2 සිට සියයට 37.9 කින් වැඩි විය. ඒ අනුව, 2022 වසරේ දී ශුද්ධ දායකත්වය (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු), 2021 වසරේ පැවති රු.බිලියන 47.5 හා සැසඳීමේ දී රු.බිලියන 31.6 ක් දක්වා අඩුවිය. (II-9 සංඛ්‍යා සටහන)

### (ආ) අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

2022 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රු. බිලියන 3,459.9 ක් වූ අතර, එය 2021 වසර අවසානයේ වූ රු.බිලියන 3,166.1 හා සසඳන විට සියයට 9.3 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් ලැබීම් අරමුදලේ වර්ධනයට හේතු විය. 2021 වසරේ රුපියල් බිලියන 3,066.9 ක් ව පැවති අරමුදලේ සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (සාමාජික ශේෂය) 2022 අවසන් වන විට රු. බිලියන 3,380.6 දක්වා සියයට 10.2 කින් වර්ධනය විය (II-9 සංඛ්‍යා සටහන).

**II-9 සංඛ්‍යා සටහන**

**අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2021 | 2022(අ) | වෙනස(%) |
|---|---|---|---|
| අරමුදලෙහි සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 3,166.1 | 3,459.9 | 9.3 |
| සාමාජිකයන් සඳහා වන සමස්ත වගකීම (රුපියල් බිලියන) | 3,066.9 | 3,380.6 | 10.2 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 20.3 | 20.4 | 0.5 |
| දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.5 | 2.4 | (4.0) |
| දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 17.8 | 18.0 | 1.1 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 165.7 | 194.6 | 17.4 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 118.2 | 163.0 | 37.9 |
| ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන) | 47.5 | 31.6 | (33.6) |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 179,681 | 254,630 | 41.7 |

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඈ) අරමුදලෙහි ආයෝජන කටයුතු**

සේවක අර්ථසාධක අරමුදලෙහි අරමුදල් කළමනාකරණ කටයුතු සම්බන්ධ තීරණ සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන කමිටුව විසින් ගනු ලබයි. මෙම කමිටුව මගින් දෛනිකව අරමුදලේ මුදල් ප්‍රවාහය, වෙළඳපොළ තත්ත්වයන්, සහ ආයෝජන අවස්ථා ඇගයීම සිදු කරනු ලබන අතර, ආයෝජන කටයුතු සම්බන්ධ තීරණ ගනු ලබයි. සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව විසින් මාසිකව ආයෝජන කටයුතු අධීක්ෂණය කරනු ලබන අතර, මුදල් මණ්ඩලය අනුමත කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ මූලික කර ගනිමින් උපායමාර්ගික සහ ප්‍රතිපත්තිමය මගපෙන්වීම් සපයනු ලබයි. තවද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් අරමුදල් ආයෝජන සම්බන්ධ ගනුදෙනු පිළිබඳව දෛනිකව සහ සතිපතා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දැනුම්වත් කරන අතර, ආයෝජන සම්බන්ධ ගනුදෙනු සහ ආයෝජන කළඹ පිළිබඳව මාසිකව මුදල් මණ්ඩලය දැනුම්වත් කරනු ලබයි. එමගින් ආයෝජන කටයුතු වල අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

2022 අප්‍රේල් 12 වැනි දින ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සඳහා විදේශ ණය සේවාකරණ ගෙවීම තාවකාලිකව අත්හිටුවන බව රජය ප්‍රකාශ කිරීමත් සමග ඇති වූ ඉහළ සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවයකින් යුත් පරිසරයක් තුළ අරමුදලේ ආයෝජන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ශ්‍රී ලංකා ආර්ථිකය සීඝ්‍ර ලෙස සංකෝචනය වීම, ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම උද්ධමනය මට්ටම කරා ළඟා වීම, පොලී අනුපාතවල තියුණු වැඩිවීම, විදේශ අංශයේ අභියෝගයන්, අත්‍යවශ්‍ය භාණ්ඩ වල හිඟය සහ සමාජ හා දේශපාලන නොසන්සුන්තාවන් 2022 වර්ෂය තුළදී අත්විඳින ලදී. අරමුදලේ වත්කම් උපාය මාර්ගිකව විභජනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශයන්ට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සිය අරමුදල් වලින් වැඩි ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළේය. මූල්‍ය වෙළඳපොළවල දක්නට ලැබුණු සැලකිය යුතු අස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින්, සේ.අ.අ. දිගුකාලීන රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. තවද, වසරේ දෙවන හා තුන්වන කාර්තු තුළ පැවති උද්ධමන පීඩන මත කෙටි කාලීන පොලී අනුපාත වැඩිවීමේ ප්‍රවනතාවයෙහි වාසිය ලබාගැනීම සඳහා, සේ.අ.අ කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් වල ද ආයෝජනය කළේය. කොටස් වෙළඳපොළෙහි සිදු වූ ඉහළ විචලනයන් හමුවේ සේ.අ.අ. විසින් කොටස් වෙළඳපොළ තුළ ආයෝජන කිරීම සීමා කරන ලදී. අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සාංගමික ණයකරවල ආයෝජන අවස්ථා සීමා වූ අතර, සේ.අ.අ. හි සාංගමික ණය කළඹේ ණය අවදානම අවම කිරීම සඳහා ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් සහිත ආයතනවල ආයෝජනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සේ.අ.අ දෙපාර්තමේන්තුව අවධානය යොමු කළේය.

ඒ අනුව, 2022 වසර අවසාන වන විට ආයෝජන කළඹේ රුපියල් බිලියන 3,466.5 ක් වූ වටිනාකමින් සියයට 96.9 ක් රාජ්‍ය සුරැකුම්පත්ද, සියයට 2.3 ක් සමාගම කොටස්ද, සියයට 0.7 ක් සාංගමික ණයකරද, ඉතිරි සියයට 0.1 ප්‍රති විකුණුම් ගිවිසුම් වලින්ද සමන්විත විය.

**(ඈ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්**

සේ.අ. අරමුදල එහි සාමාජිකයින්ට පසුගිය වසර සමග අනුකූල වන පොලී අනුපාතයක් ගෙවීමට අදහස් කරනු ලබයි.

**(ඉ) සාමාජික සේවාවන්හි නිරත වීම**

**(i) සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම**

සාමාජික ගිණුම් ප්‍රකාශන අරමුදලෙහි ලියාපදිංචි කර ඇති සේවායෝජකයන් හරහා වසරකට දෙවරක් සක්‍රීය සාමාජිකයින්ට බෙදා හරිනු ලැබේ. ඒ අනුව, 2021 වසරේ පළමු භාගයට සහ දෙවන භාගයට අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශන 2022 වසරේ දී බෙදා හරින ලදී (II-10 සංඛ්‍යා සටහන).

**II-10 සංඛ්‍යා සටහන**

**නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශන**

| කාලපරිච්ඡේදය | සේවායෝජකයින් සංඛ්‍යාව | ප්‍රකාශන සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2021 පළමු අර්ධ වර්ෂය | 64,257 | 2,001,329 |
| 2021 දෙවන අර්ධ වර්ෂය | 70,257 | 2,498,231 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ණය සුරැකුම් නිකුත් කිරීම**

නිවාස ණය ක්‍රමය යටතේ සේවක අර්ථසාධක අරමුදල මගින් 2022 වසර තුළදී අදළ සාමාජිකයන්ගේ ගිණුම් ශේෂ මත පදනම්ව රුපියල් මිලියන 6,127 ක වටිනාකමක් සඳහා වූ ශේෂ සහතික පත් 9,443 ක ප්‍රමාණයක් එම සාමාජිකයින්ට නිවාස ණය ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ණය ලබාදෙන ආයතන වෙත ලබා දෙන ලදී (II-11 සංඛ්‍යා සටහන). තවද, 2022 වසරේ දී 2021 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් මිලියන 3,669 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම් වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතන වලට ප්‍රේෂණය කරන ලදී.

**II-11 සංඛ්‍යා සටහන**

**නිවාස ණය සුරැකුම් පහසුකම**

| වසර | නිකුත් කළ ශේෂ සහතිකපත් | ශේෂ සහතිකපත්වල වටිනාකම (රුපියල් මිලියන) | පැහැර හරින ලද ණය වෙනුවෙන් සහභාගීවන ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2018 | 10,036 | 4,974 | 2,759 |
| 2019 | 10,022 | 5,097 | 3,164 |
| 2020 | 8,537 | 4,497 | 3,321 |
| 2021 | 9,068 | 5,423 | 3,573 |
| 2022 | 9,443 | 6,127 | 3,669 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(iii) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය**

2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටීන්ට අනුව, පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව, නිවාස ඉදිකිරීම් හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා සාමාජික ගිණුම් ශේෂය රු. 300,000 ට වැඩි සහ වසර 10 ක කාලයක් අරමුදල වෙත දායක මුදල් ගෙවමින් පවතින සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් රු. මිලියන 2 ක උපරිමයකට යටත්ව සියයට 30 ක් ආපසු ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත. මෙම ක්‍රමය සඳහා සාමාජිකයන්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ක්‍රමය යටතේ 2022 වසර තුළ දී ප්‍රතිලාභීන් 27,278 ක් වෙත රුපියල් බිලියන 16.4 ක් නිදහස් කර ඇති අතර, 224,335 ක්වූ ප්‍රතිලාභීන් වෙත රුපියල් බිලියන 123.5 ක මුදලක් 2022 අග වනවිට ගෙවන ලදී.

**(iv) සේ. අ. අ. විද්‍යුත් දායක මුදල් රැස්කිරීම**

සේ.අ.අ. දෙපාර්තමේන්තුව දැනට පවතින විද්‍යුත් එකතු කිරීමේ ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා එහි නිල වෙබ් අඩවිය හරහා යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. එමගින්, සේවායෝජකයින්ට සේ.අ.අ. නිල වෙබ් අඩවිය හරහා ඔවුන්ගේ විද්‍යුත් දත්ත වාර්තා ඉදිරිපත් කිරීමට සහ 'LankaPay Online Payment Platform (LPOPP)' හරහා නියෝජිත වාණිජ බැංකු සමග මාර්ගගතව ගෙවීමට හෝ චෙක්පතක් මගින් හෝ සෘජු හර ක්‍රමය යටතේ ගෙවීමට හැකියාව ලබා දෙනු ලැබේ. 2022 වර්ෂය අග වන විට ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, මෙකී පහසුකම සැපයීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වූ බලපත්‍රලාභී වාණිජ බැංකු වේ. නව ක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ නිවැරදි ලෙස දායක මුදල් ගෙවා දිනක් ඇතුළත සාමාජික ගිණුම් යාවත්කාලීන වීමයි. තවද, මේ නව ක්‍රමය යටතේ, සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි දත්ත ගබඩාවේ ඇති සාමාජික විස්තරයන්හි නිරවද්‍යතාවය සහතික කිරීමට සේවායෝජකයන්ට පහසුකම් සපයයි.

2022 වසර අවසාන වන විට, ආසන්න වශයෙන් සක්‍රිය සාමාජිකත්වයෙන් සියයට 90 ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 12,815 දක්වා වැඩිවූ අතර, අදාළ ගෙවීම් මාසික සමස්ත දායක මුදලෙන් සියයට 91 ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි. මීට අමතරව, විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය තුලින් සේවායෝජකයන්ට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සහ සාමාජිකයන්ගේ තොරතුරු වල ඇති විෂමතාවයන් නිවැරදි කිරීම පිළිබඳව සේවායෝජකයින් තවදුරටත් දැනුම්වත් කිරීම සිදු කරන ලදී. මෙමගින් දායක මුදල් ප්‍රමාදයකින් තොරව අදාළ සාමාජික ගිණුම් වෙත බැර කිරීම සහතික කෙරේ.

**(v) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

ඒකීය සාමාජික හඳුනාගැනීමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සේ. අ. අ. හි සක්‍රිය සාමාජිකයින් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක සහ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් සම්පූර්ණ නම යටතේ නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම යටතේ එහි දත්ත පද්ධතිය වෙත ප්‍රවේශවීමේ හැකියාව ලබා ගැනීමත් සමග ඉහත සඳහන් කල නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය තුළ දී ජාතික හැඳුනුම්පත් දත්තයන්හි නිරවද්‍යතාවය පරික්ෂා කිරමේ පහසුකම සැලසුණි. තවද, සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ අරමුණින් ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබුණි.

2022 වසර තුළ දී සක්‍රිය සාමාජිකයන් 26,959 ක් නැවත ලියාපදිංචි කරන ලද අතර 2022 වසර අවසානය වන විට මුළු සක්‍රිය සාමාජිකයන්ගෙන් 1,682,978 ක ප්‍රමාණයක් නැවත ලියාපදිංචි කර ඇත.

**(vi) වෙනත් සේවා**

2021 වසරේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශය, සමාජ දේශපාලන නොසන්සුන්තාව මධ්‍යයේ වුවද අභියෝගාත්මක වසරක් සනිටුහන් කරන ලදී. කෙසේවෙතත්, සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවායෝජක පැමිණීම් 129,454 ක් වාර්තා වූ අතර, අනුපිළිවෙලින් දුරකථන ඇමතුම් සහ ඊමේල් හරහා පුද්ගලයින් 63,365 දෙනෙකුට සහ සාමාජිකයින් 14,114 දෙනෙකුට ද සේවා සපයා ඇත. තවද, සාමාජිකයින්, සේවා යෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ලිපි 1,630 කට ප්‍රතිචාර දක්වන ලදී.

2022 දී, සේ. අ. අ. දෙපාර්තමේන්තුවේ වාර්තා සංශෝධන අංශය විසින් සේ. අ. අ. සාමාජික ගිණුම්වලට අදාළ සේ. අ. අ. වාර්තා සංශෝධන 89,210 ක් පමණ සිදු කර ඇත. ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාල හරහා ලැබුණු නම/ජාතික හැඳුනුම්පත් සංශෝධන සඳහා ඉල්ලීම් 12,944 ක් ඇතුළුව නම්/ජාතික හැඳුනුම්පත් සංශෝධන 83,537 ක් සහ ගිණුම් සංශෝධන 5,673 ක් 2022 වසරේ දී සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

**(ඊ) ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සහ ධාරිතා සංවර්ධනය**

ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ ධාරිතා සංවර්ධන අංශය විසින් ගිණුම්කරණය, ආයෝජනය, සාමාජික වගකීම් කළමනාකරණය සහ සේ. අ. අ. දෙපාර්තමේන්තුව සඳහා ඒකාබද්ධ දත්ත ගබඩාවක් සහිත තොරතුරු තාක්ෂණ පද්ධතියක් සැලසුම් කිරීමේ සහ ක්‍රියාවට නැංවීමේ පහසුකම් සැලසීම සඳහා පත් කරන ලද උපදේශක ආයතනය සමග සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව, සේ. අ. අ. හි ක්‍රියාකාරකම්වලට අදාළව පවතින ව්‍යාපාර

පිළිවෙත් සහ ක්‍රියාවලීන් පිළිබඳ අධ්‍යයනය වසර තුළ සාර්ථකව සිදුකරන ලදී.

ඉහත අධ්‍යයනයෙන් පසුව, සේ. අ. අ. දෙපාර්තමේන්තුවෙහි ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය (business process review), උපදේශක ආයතනය විසින් සම්පූර්ණ කරන ලදී. තවද, කාර්මික ප්‍රශස්ත භාවිතයන් (industrial best practices) සහ කලාපීය අර්ථසාධක අරමුදල් සඳහා මිණුම් නිර්ණය කිරීම (benchmarking) අවධාරණය කරමින් පරතරය විශ්ලේෂණ (gap analysis) වාර්තාව ද සම්පූර්ණ කර ඇත. ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය සහ පරතරය විශ්ලේෂණය මත පදනම්ව, සේ. අ. අ. දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී සැලසුම් කෙටුම්පත් කිරීම සිදු කරමින් පවතී.

## 9. පහසුකම් කළමනාකරණ

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නවීන තාක්ෂණික භාවිතාවන් මුසුවූ පහසුකම් සහ අනෙකුත් සැපයුම් සේවාවන් මහ බැංකු කාර්ය මණ්ඩලය වෙත මෙන්ම අනෙකුත් සේවාලාභීන් වෙත ලබාදීම උක්ත කාල පරිච්ඡේදය තුළ රටතුල පැවති අහිතකර සමාජීය සහ ආර්ථික තත්ත්වයන් නිසා හටගත් බොහෝ බාධක පරයමින් සිදුකරන ලදී. රට තුල පැතිර පැවති බාධාකාරී ආනයන සීමාවන් අභිමුව පවා වඩා සපලදායී සහ ආරක්ෂාකාරී කාර්යාල වටපිටාවක් සුරක්ෂිත කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව හැකි සෑම උත්සාහයක්ම දරන ලදී.

මහ බැංකු පරිශ්‍රය බාහිර සහ අභ්‍යන්තර පාර්ශවයන්ට වඩාත් ප්‍රියමනාප පරිසරයක් ඇති කරවනු පිණිස, එහි ඇති කල් ඉකුත්වූ මෙවලම් සහ උපාංග ප්‍රතිස්ථාපනය කිරීම තවදුරටත් ක්‍රියාත්මක වූ අතර ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව සතුව පවතින දශක දෙකක් පමණ පැරණි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම මෙම කාල පරිච්ඡේදයේදී සිදුකරනු ලැබීය. මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිලි සඳහා සිදුකරනලද තත්ත්ව පරීක්ෂාවේදී හඳුනාගත් යල්පිනු විද්‍යුත් සහ යාන්ත්‍රික පද්ධතීන් ප්‍රතිස්ථාපනය කිරීම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පසුගිය වසරතුල සිදුකල අතර ඊට අදාළ අවශේෂ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතී. තවද, මහ බැංකුවෙහි විවිධ දෙපාර්තමේන්තු වල ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් ඒ සඳහා අවශ්‍ය අමතර කාර්යාල ඉඩපහසුකම් කඩිනමින් සපයාදීම මගින් එම දෙපාර්තමේන්තුවල කාර්යයන් පහසුවෙන් ඉටුකිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කරනලද බලශක්ති පිරිමැසුම් ක්‍රමවේදයන්ට අනුගත වෙමින් මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිලිවල වැඩි විදුලි පරිභෝජනයක් සහිත සම්ප්‍රදායික විදුලි පහන් වෙනුවට නවීන විදුලි පහන් ප්‍රතිස්ථාපනය කල අතර මධ්‍යගත වායු සමීකරණ පද්ධතියේ සිසිල් ජල පරිවහන නළ සඳහා කල් ඉකුත් වූ තාප පරිවාරක ඉවත්කර නව තාප පරිවාරක යෙදීම සිදුකරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ පිහිටි ප්‍රධාන ගොඩනැගිලිවල ව්‍යුහාත්මක කල්පැවැත්ම තහවුරු කිරීම සහ ටෙරස හරහා ජල කාන්දු නැවතීම අරමුණුකරගෙන ජලවාරක යෙදීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු දියත් කරන ලදී.

උක්ත කාල පරාසයතුල දී මාතලේ ප්‍රාදේශීය කාර්යාලය සහ කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ පිහිටි වයිට්එවේස් ගොඩනැගිල්ල සඳහා නවීන අභ්‍යන්තර ස්වයංක්‍රීය දුරකථන හුවමාරු පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු කරන ලද්දේ එම පරිශ්‍ර සඳහා අදාල සේවාවන් සැපයීමේදී එවන් පද්ධතියක අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමිනි.

කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතෙහි පිහිටි ලොයිඩ් ගොඩනැගිල්ලෙහි අයිතිය අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම් වෙත පැවරීමත් සමග ඇතිවූ තත්වය මත එම ගොඩනැගිල්ලෙහි ස්ථාපිතව තිබූ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, වයිට්එවේස් ගොඩනැගිල්ලේ ණය තොරතුරු කාර්යාංශය පිහිටුවා තිබූ බිම් මහල තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය කඩිනම් කටයුතු සම්පාදනය කරන ලදී. තවද, එම ගොඩනැගිල්ලේ දෙවන මහල තුල සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරමින් මෙම කටයුත්ත සම්පූර්ණ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් මේ වනවිට සම්පූර්ණ කරමින් පවතී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමග එක්ව මහ බැංකු කාර්ය මණ්ඩලයට සේවයට වාර්තා කිරීමට හා නැවත නිවෙස් වලට යාම සඳහා කාර්යාල ප්‍රවාහන පහසුකම් සැපයීමට කටයුතු කරන ලද අතර මෙම විධිවිධානයන් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උක්ත කාලසීමාව තුල ගන්නා ලද වඩාත්ම සාධනීය ක්‍රියාමාර්ගයකි.

තවද, ප්‍රාදේශීය කාර්යාල සඳහා රියදුරන් සමග රථ වාහන බාහිර සේවාලාභීන්ගෙන් ලබා දීම තවදුරටත් සිදුකල අතර අවශ්‍ය නඩත්තු කටයුතු සහ සේවා කිරීම් සමග දැනට මහ බැංකුව සතු වාහන සංචිතය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඉන්ධන සපයාගැනීම ඉතා අසීරු පසුගිය වකවානුවේ දී පවා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සපයන ප්‍රවාහන පහසුකම් නොනවත්වා ක්‍රියාත්මක කිරීම සිදුවිය.

මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ඇති ආරක්ෂක වැට විශේෂිත ආලේපයක් සමග පින්තාරු කිරීම මගින් එය අලංකරණය කිරීමටත් වැටෙහි ආයුකාලය වර්ධනය සඳහා ඉදිරි පියවර ගැනීමටත් පියවර ගැනුනි.

දෙපාර්තමේන්තුව සතු මූලික වගකීමක් ලෙස සලකා අනෙකුත් නඩත්තු කටයුතු, සන්නිවේදන සේවා ඇතුළුව අවශේෂ සේවාවන් සැපයීම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් පවත්වාගෙන යන ලදී.

## 10. මුල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. 2002 වර්ෂයේ සිට මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ රාමුව අදාල කර ගන්නා ලදී. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල

කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වාගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 16 හි ආයෝජන කළඹ කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුළත් වේ.

## 10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය** : 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ විධි විධාන ප්‍රකාරව, 2021 වසරේ දෙසැම්බර් මාසය හා 2022 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම උදෙසා පිළියෙල කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා** : ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ප්‍රගතිය සහ මූල්‍ය තත්ත්වය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** : මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම උදෙසා අවශ්‍ය වන අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කර ඇත. 2022 වර්ෂයේ දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ II වන කොටස ආරම්භයේදී ඉදිරිපත් කර ඇත.

## 10.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්ය සැලසුම්වලට අනුකූලව "පරිඝණකගත අයවැය සැකසුම් පද්ධතියක්" මඟින් පිළියෙළ කරන ලදී. 2023 වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2022 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, එය 2023 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2022 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායී අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## 10.3 අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම

(අ) 2022 වසර තුළදී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය සිදු කරන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2022 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 6,876 ක් සිදු කරන ලද අතර, ඉන් 6,746 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 130 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) ආසන්න වශයෙන්, 2022 වසර තුළදී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා රු. බිලියන 665.41 ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 2,631 ක් සහ රු. බිලියන 751.02 ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 280 ක් සිදු කර ඇත. මීට අමතරව විදේශීය ණය සම්බන්ධයෙන් විදේශීය බැංකු දෙකක් සමග බැංකු එකඟතා ගිවිසුම් තුනක් 2022 වසර තුළදී අත්සන් කරන ලදී.

## 10.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත මධ්‍යගත ආයෝජන ඒකකය මගින් බැංකුවෙහි කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8ක් සහ වෙනත් අරමුදල් 4ක්, නිරාකරණය හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල සහ කාර්ය මණ්ඩල කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3 ක් ඇතුළු අභ්‍යන්තර අරමුදල් 16 ක් කළමණාකරණය කරන ලදී.

මෙම සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. මෙම අරමුදල් කළමණාකරන ක්‍රියාවලිය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය/ක්‍රියාපටිපාටීන් සහ ක්‍රමෝපායිකව වත්කම් ආයෝජනයන් සඳහා වෙන්කිරීම් වෙනුවෙන් වූ ක්‍රියාපටිපාටීන් මඟින් පාලනය වේ. තවද, මෙම ක්‍රියාවලිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර මූල්‍ය අංශය නියාමනය හා අධීක්ෂණ කටයුතු භාර නියෝජ්‍ය අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුව මගින් මෙම ආයෝජන කාර්යයන් අධීක්ෂණය කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා වන මෙම කමිටුව 2022 වසර තුළ 12 වතාවක් රැස් විය. මෙම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි කාර්ය සාධන වාර්තා මාසික වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකර වල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6 ක 2021 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2022 වසර අග වන විට මෙම මුළු අරමුදල රු. බිලියන 173.98 දක්වා වර්ධනය විය.

**II- 12 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ තත්ත්වය - (රු. බිලියන)**

| දෙපාර්තමේන්තුව | 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) | 2021 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) |
|---|---|---|
| මූල්‍ය | 84.52 | 75.27 |
| නිරාකරණ සහ බලගැන්වීම් | 89.39 | 70.98 |
| ප්‍රාදේශීය සංවර්ධන | - | 5.38 |
| කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා | 0.07 | 0.06 |
| එකතුව | 173.98 | 151.69 |

### 10.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යනු ලබයි. මෙයට සම්බන්ධ සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2022 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. ඒ අනුව, අයිතමයන් අත්පත් කර ගැනීම් 554 ක් සහ බැහැර කිරීම් 232 ක් සමගින් 2022 වසර තුළදී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

### 10.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩ ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමණාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2022 වසර තුළ දී පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී රු. බිලියන 2.20 ක වටිනාකමකින් යුත් 1,631 ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

### 10.7 අනෙකුත් කාර්යයන් - මිලදී ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීති වලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව බැංකුවෙහි භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, ටෙන්ඩර් මණ්ඩල සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම් සඳහා වන සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. ඒ අනුව, 2022 වසර තුළ දී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි මිලදී ගැනීම් හා සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල 81 ක් සහ තාක්ෂණික ඇගයීම් කමිටු 56 ක් නියෝජනය කර ඇත.

## 11. මූල්‍ය පාරිභෝගික සබඳතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් 2020 අගෝස්තු මස මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද අතර එමගින් මූල්‍ය පාරිභෝගිකයන්ගේ අයිතීන් හා සබැඳියාවන් මෙන්ම ඔවුන් වෙත සලසනු ලබන මූල්‍ය සේවාවන්වල සාධාරණ බව සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල පාරිභෝගිකයන් හට එම ආයතනවල සේවා සැපයීම හෝ ව්‍යාපාර ක්‍රියාපිළිවෙත් පිළිබඳව පැමිණිලි සහ දුක්ගැනවිලි මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමේදී සම්බන්ධ වන තනි ඒකකය වශයෙන් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව 2022 වසරේදී ක්‍රියාකරන ලදී. දෙපාර්තමේන්තුව මසකට පැමිණිලි 430 කට ආසන්න සාමාන්‍යයකින් යුතුව 2022 වසර තුළදී මුළු පැමිණිලි සහ දුක්ගැනවිලි 5,149 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. මෙම පැමිණිලි හා දුක්ගැනවිලි බොහොමයක් මූල්‍ය ආයතන මගින් ලබා ගත් මූල්‍ය පහසුකම් සඳහා සහන ඉල්ලීම්, ඉහළ පොළී අනුපාතිකයන් අය කිරීම, ණය සහන පිළිබඳ ගැටලු, මූල්‍ය ආයතන විසින් තොරතුරු/ලියකියවිලි ලබා නොදීම, ඉහළ ගාස්තු හා කොමිස් අයකිරීම් යන කරුණු සම්බන්ධයෙන් විය. ලැබෙන මූල්‍ය පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කර ප්‍රතිචාර දැක්වීම සඳහා මූල්‍ය ආයතන වෙත යම් කාලයක් ලබාදෙන අතර 2022 වසර තුළදී ලැබුණු පැමිණිලි අතරින් 75% ක් පමණ පැමිණිලි ලැබී මාස 02ක් ඇතුලතදී මූල්‍ය ආයතනයේ ප්‍රතිචාර ලබාගෙන පැමිණිල්ලට අදාල කටයුතු නිම කිරීමට/ නිරාකරණයන් ලබා දීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් එහි තවත් එක් කාර්යයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සබඳතා මධ්‍යස්ථානය (Contact Centre) අධීක්ෂණය කරනු ලබයි. 2022 වසර තුළදී සබඳතා මධ්‍යස්ථානය විසින් දුරකථන විමසීම් සහ වාචික පැමිණිලි 60,000 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා පිළිතුරු ලබා දී ඇත. මීට අමතරව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ පියවරක් ලෙස මූල්‍ය පාරිභෝගිකයින් මුහුණ දෙන ගැටළු නිරාකරණය කර ගැනීමට ගත හැකි විවිධ ක්‍රියාමාර්ග සහ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ/ ශ්‍රී ලංකා මහ බැංකුවේ සහාය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කරමින් අන්තර්ජාල පෝස්ටරයක් (web poster) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරන ලදී. ඊට අමතරව, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් වඩා වැඩි පිරිසකට දැනුවත්භාවය ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සම්මන්ත්‍රණ හා වැඩසටහන් කීපයක් පවත්වන ලදී. මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවෙහි (International Finance Corporation) සහයෝගය ඇතිව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ මාධ්‍ය ප්‍රචාරක වැඩසටහනක් වෘත්තීමය ප්‍රචාරණ ආයතනයක් මඟින් නිර්මාණය කරමින් පවතින අතර එය 2023 මුල භාගයේදී දියත් කිරීමට නියමිත වේ.

තවද, මූල්‍ය ආයතන තම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී සහ සේවා සැපයීමේදී පාරිභෝගික ආරක්ෂණය ශක්තිමත් කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවලට අදාලව ඒකාබද්ධ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වාදෙමින් නව පුළුල් රෙගුලාසි සමුදායක් සකස් කරන ලදී. මෙම රෙගුලාසි මඟින් වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂකයින් හට අවශ්‍ය විශේෂ නියාමන බලතල ලබා දීම සිදු කරනු ලබන අතර පසුකාලීනව මූල්‍ය පාරිභෝගිකයන් හට පැමිණිලි ඉදිරිපත් කිරීමට සිදුවන අවස්ථා අවම කිරීමේ අරමුණින් මූල්‍ය සේවා සැපයීමේදී සහ ලබා ගැනීමේදී සේවා සපයන්නන් සහ සේවා ලබා ගන්නන් සැලකිලිමත් විය යුතු කාරණා සම්බන්ධව පැහැදිලි කිරීම් ලබා දීම සිදු කරනු ලබයි. පාර්ශ්වකරුවන්ගේ උපදේශනය සඳහා, මෙම කෙටුම්පත් කරන ලද රෙගුලාසි මූල්‍ය අංශය සහ මහජනතාව වෙත ලබා දීමට කටයුතු කර ඇති අතර, අවසන් රෙගුලාසි 2023 මැද භාගයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

## 12. මූල්‍ය බුද්ධි ඒකකය

රට තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කොටගෙන ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2006 වසරේ මාර්තු මාසයේ දී පිහිටුවන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීති රාමුව යටතට ගැනෙන 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත යන ප්‍රධාන නීති ත්‍රිත්වය පාදක කරගෙන, කාර්යක්ෂම වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඒ සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන වගකීම වේ.

### 12.1 මූල්‍ය බුද්ධි තොරතුරු ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15 වැනි වගන්තියට අනුව මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වන සැක කටයුතු මූල්‍ය ගනුදෙනු වාර්තා ලබා ගැනීම, එම වාර්තා විශ්ලේෂණය කිරීම සහ විශ්ලේෂිත තොරතුරු අදාල නීතිය බලාත්මක කිරීමේ හෝ නියාමන ආයතන වෙත යොමු කිරීම 2022 වසරේදී ද සිදුකරන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කාර සමාගම් සහ මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන් විසින් සිය ගනුදෙනුකරුවන් සමග සිදුකළ දේශිය සහ විදේශිය වශයෙන්, රුපියල් මිලියනයකට වැඩි හෝ යම් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වන වටිනාකමක් ඉක්මවන මුදල් ගනුදෙනු වාර්තා සහ විද්‍යුත් අරමුදල් ප්‍රේෂණ වාර්තා අඛණ්ඩව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. 2022 වර්ෂය තුළ දී, ඉහත සඳහන් වාර්තාකරණ ආයතන විසින් 'LankaFin' වාර්තාකරණ පද්ධතිය මෙන්ම අලුතින් හඳුන්වා දුන් 'goAML' වාර්තාකරණ පද්ධතිය හරහා මුදල් ගනුදෙනු වාර්තා මිලියන 7.6 ක් සහ විද්‍යුත් අරමුදල් ප්‍රේෂණ ගනුදෙනු (දේශීය හා විදේශීය) මිලියන 10.8 ක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. 2023 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නියමිත සියලුම ගනුදෙනු වාර්තා කිරීම් 'LankaFin' පද්ධතිය හරහා වාර්තා කිරීම අත්හිටුවන ලදී.

තවද, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 7 වැනි වගන්තිය ප්‍රකාරව වාර්තාකරණ ආයතන විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තා 1,481 ක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කරන ලදී. එලෙස ඉදිරිපත් කරන ලද සැක කටයුතු ගනුදෙනු වාර්තා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, ඒ අතරින් වාර්තා 419 ක් වැඩිදුර විමර්ශනය සඳහා නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. විශ්ලේෂිත වාර්තා අතරින් වාර්තා 605 ක් අඛණ්ඩ පරීක්ෂාව යටතේ තබා ඇති අතර, වැඩිදුර අධ්‍යයනය සහ විශ්ලේෂණය සඳහා වාර්තා 453 ක් තබා ඇත. ඉතිරි සැක කටයුතු ගනුදෙනු වාර්තා වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලදී.

### 12.2 නීතිමය රාමුව සහ ආයතනික රාමුව

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රට තුළ එකී නීතිමය රාමුවෙහි සඵලතාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, 2023 වර්ෂය තුල දී එම නීතිමය රාමුව සඳහා අවශ්‍ය සංශෝධන ගෙන ඒමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම සංශෝධන 2023 වසර තුළදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(2) වැනි වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව, 2022 වර්ෂය තුළ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ පැවති සැකයන් මත පදනම්ව අවස්ථා 14 කට අදාල, පුද්ගලයන් 38 දෙනෙකුට සහ ආයතන 5කට අයත් ගිණුම් 136 ක ගනුදෙනු අත්හිටුවීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, රුපියල් මිලියන 96 ක බැංකු ගිණුම් ශේෂයන් වසර තුළ දී අත්හිටුවන ලදී. මීට අමතරව, නීතිය බලාත්මක කිරීමේ ආයතන විසින් විමර්ශන සඳහා තවදුරටත් කල් ඉල්ලා සිටි බැවින්, පසුගිය වසරවල නඩු 78කට අදාලව අත්හිටවූ බැංකු ගිණුම් 1,000 ක පමණ ගිණුම් ශේෂයන් 2022 වසර තුළ දී මාස දෙකක කාල පරාසයක් සහිතව අත්හිටුවීම් දීර්ඝ කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. වාර්තාකරණ ආයතනයන් හි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2022 වසර තුළ දී චක්‍රලේඛ 4 ක් නිකුත් කරන ලද අතර ඒවා වාර්ෂික වාර්තාවේ III කොටසෙහි අන්තර්ගත වේ.

තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඵලදායී අධීක්ෂණයන් හා බලාත්මක කිරීම්, එතැන්, විතැන් සහ ස්ථානීය නිරීක්ෂණයන්, සහ අනුකූලතා සමාලෝචන රැස්වීම් ආදිය මගින් මූල්‍ය ආයතනයන්හි සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්හි අනුකූලතාව වැඩිදියුණු කිරීමට අඛණ්ඩ පියවර ගෙන ඇත. ඒ අනුව, 2022 වර්ෂයේ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනයන් සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ එතැන් පරීක්ෂණ 22 ක්, එතැන් පරීක්ෂණ 3 ක් සහ ස්ථානීය පරීක්ෂණ 22 ක් පවත්වන ලදී. මීට අමතරව, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා අවදානම් මත පදනම් වූ එතැන් පරීක්ෂණ 17 ක් පවත්වන ලදී. ඉහත පරීක්ෂණයන්ට අමතරව, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා තේමාත්මක සමාලෝචන 5 ක් ද පවත්වන ලදී.

2022 දී සිදු කරන ලද එතැන් පරීක්ෂණ මත පදනම්ව, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු 6 කට රුපියල් මිලියන 11.75 ක මූල්‍යමය දණ්ඩන පනවන ලදී. එසේම, එකී පනත, රීතීන් සහ එකී පනත යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූල නොවීම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත හේතු පැහැදිලි කිරීමේ අවශ්‍යතාව දන්වන ලිපි 8 ක් සහ අනතුරු ඇඟවීමේ ලිපි 9 ක් වසර තුළ දී නිකුත් කරන ලදී. තවද, 2022 වර්ෂය තුළ දී ස්ථානීය පරීක්ෂණ මගින් හඳුනාගත් අඩුපාඩු පිළිබඳව නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් 17කට දැනුම් දීමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් පියවර ගන්නා ලදී. එමෙන්ම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධව අනුකූලතාව දක්වන මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අඛණ්ඩව කටයුතු කිරීමෙන් එම ආයතන වල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

### 12.3 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් දේශීය සම්බන්ධීකරණය සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම

දේශීය හෝ විදේශීය රාජ්‍යයක යම් ආයතනයක් හෝ නියෝජිතායතනයක් සමග තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් වෙත එළැඹීමට 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව මූල්‍ය බුද්ධි ඒකකය වෙත බලය ලබා දී ඇත. 2022 වර්ෂය තුළ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලෙසතෝ රාජ්‍යයේ මූල්‍ය බුද්ධි ඒකකය, නැගෙනහිර ටිමෝර රාජ්‍යයේ මූල්‍ය බුද්ධි ඒකකය සහ උගන්ඩා මූල්‍ය බුද්ධි ඒකකය සමග එවැනි අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.

මූල්‍ය කාර්ය සාධන බලකායේ කලාපීය අධීක්ෂණ ආයතනය වන මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වාර්ෂික සැසිය 2022 ජූලි මාසයේ දී දෙමුහුන් සැසියක් ලෙස පැවැත්වූ අතර ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීහු මෙම සැසිවාරයේ රැස්වීම් සඳහා මාර්ගගතව සහභාගී වූහ. තවද, සාමාජිකයින්ගේ අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තා සහ පසු විපරම් වාර්තා සාකච්ඡා කිරීම සඳහා වසර තුළ දී පවත්වන ලද මාර්ගගත අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීම් කිහිපයකට ද මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීහු සහභාගී වූහ. ශ්‍රී ලංකාව පිළිබඳ නිකුත් කරන ලද 7 වන පසු විපරම් වාර්තාව 2022 ජූලි මාසයේ දී පැවති මාර්ගගත අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීමේ දී අනුමත කරන ලද අතර, එහිදී ශ්‍රී ලංකාව කිසිදු ජාත්‍යන්තර නිර්දේශයක් සඳහා සිය දැනට පවතින අනුකූලතා තත්ත්වය ඉහළ නැංවීමේ ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලදී. ඒ අනුව, 2022 අවසානය වන විට, මූල්‍ය කාර්ය සාධන බලකායේ නිර්දේශ 40 සඳහා ශ්‍රී ලංකාවේ අනුකූලතා මට්ටම, නිර්දේශ 7 ක් අනුකූල ලෙස ද, නිර්දේශ 25 ක් විශාල වශයෙන් අනුකූල ලෙස ද, නිර්දේශ 7 ක් පාර්ශ්වීයව අනුකූල ලෙස ද, එක් නිර්දේශයක් අනුකූල නොවන ලෙස ද පවතී. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වාර්ෂික සැසියේ දී, වසරක කාලයක් සඳහා ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ පාලන කමිටුවේ දකුණු ආසියානු උප කලාපීය නියෝජිතයා ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය තේරී පත් විය.

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, ගෝලීය මූල්‍ය බුද්ධි ඒකක 166 ක සාමාජිකත්වයෙන් සැදි Egmont කණ්ඩායමේ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පවතින ආරක්ෂිත ජාලය වන Egmont Secure Web හරහා සිය විමර්ශන සිදු කිරීමට අවශ්‍ය බුද්ධි තොරතුරු ලබා ගැනීමටත් අනෙකුත් රටවලට දක්වන සහයෝගයක් ලෙස ඔවුන්ගේ විමර්ශනයන් කරගෙන යාම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමටත් කටයුතු කරයි. ඒ අනුව, 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් සාමාජික මූල්‍ය බුද්ධි ඒකක විසින් තමන් වෙත කරන ලද තොරතුරු ඉල්ලීම් 27කට තොරතුරු සපයා දීම මගින් ප්‍රතිචාර දක්වා ඇති අතර, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය දැනට සිදු කරගෙන යන විමර්ශනවලට අදාළ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සාමාජික මූල්‍ය බුද්ධි ඒකක වෙත තොරතුරු ඉල්ලීම් 35ක් ඉදිරිපත් කර ඇත. 2022 වසරේ Egmont කණ්ඩායමේ වාර්ෂික සැසිය පුද්ගල සහභාගිත්වයෙන් පැවැත්වුණු අතර නොවැළැක්විය හැකි හේතූන් මත මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීන්ට මෙම සැසිය සඳහා සහභාගී වීමට නොහැකි විය.

### 12.4 මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව

මූල්‍ය කාර්ය සාධන බලකායේ නිර්දේශයන්හි පළමු නිර්දේශයට අනුකූලව, ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව අඛණ්ඩව කරගෙන යන ලදී. ජාතික අවදානම් තක්සේරුවෙහි ප්‍රතිඵල

2023 වර්ෂයේ පළමු භාගයේ දී ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අපේක්ෂා කරන අතර, එම ප්‍රතිඵලවලට අනුකූල වන ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ඉදිරි ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කෙරෙනු ඇත.

### 12.5 පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමේ උත්සාහයන් අඛණ්ඩව කරගෙන යමින්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2022 වර්ෂය තුළ දැනුවත් කිරීම් මෙන්ම පුහුණු වැඩසටහන් 24 ක් සංවිධානය කිරීම හා සම්පත් දායකත්වය ලබා දීම සිදු කළ අතර, මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්, නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් වල නිලධාරීන් 2,250 කට ආසන්න ප්‍රමාණයක් මෙම වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. එසේම, මෙම වැඩසටහන් පුද්ගල සහභාගීත්වය ඇතිව මෙන්ම මාර්ගගත ක්‍රමවේද හරහා ද පවත්වන ලදී.

## 13. විදේශ විනිමය

විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීමේ හා නියාමනය කිරීමේ අරමුණ පෙරදැරිව, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරි ඇති වගකීම ඉටු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව 2017 නොවැම්බර් 20 වන දින ස්ථාපනය කරන ලදී. පවරනු ලැබූ රාජකාරි ඉටු කිරීම සඳහා ප්‍රතිපත්ති, ප්‍රාග්ධන ගනුදෙනු, අධීක්ෂණ හා ආයතනික සේවා සහ විමර්ශන යන අංශ හතරකින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව සමන්විත වේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ඇමතිවරයා විසින් නිකුත් කරන නියෝගයන් හා නියමයන් සඳහා පහසුකම් සැලසීම.

(ආ) විදේශ විනිමය පනත ප්‍රකාර ව මුදල් අමාත්‍යවරයා විසින් නියම කර ඇති පරිදි විදේශ විනිමය ගනුදෙනු සඳහා පරිසීමිත වෙළෙඳුන් හා වෙනත් පුද්ගලයින් පත් කිරීම.

(ඇ) විදේශ විනිමය පනත යටතේ බලයලත් වෙළඳුන් හට විධාන නිකුත් කිරීම හා පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, නියම හා විධානවලට බලයලත් වෙළෙඳුන් අනුකූල වීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

(ඈ) විදේශ විනිමය කටයුතු හා විදේශ විනිමය ගණුදෙනු පවත්වා ගෙනයාම සඳහා රෙගුලාසි හා විධාන සකස් කිරීම හා නියමයන් නිකුත් කිරීම මගින් විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඉ) අපනයන ආදායම් ලැබීම් අධීක්ෂණ පද්ධතිය (EPMS) මගින් ලබා ගන්නා ලද තොරතුරු මගින් මුදල් නීති පනත යටතේ නිකුත් කරනු ලැබූ රීති වලට අනුකූල ව ශ්‍රී ලංකාව වෙත කරනු ලබන අපනයන ආදායම් ලැබීම් අධීක්ෂණය කිරීම සහ අනුකූල නොවීම් වලට එරෙහි ව නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.

(ඊ) විදේශ විනිමය පනත යටතේ පොදු අවසරයන් ප්‍රදානය කර නොමැති විශේෂ අරමුණු සඳහා අවසර ලබා දීම.

(එ) පවත්නා විදේශ විනිමය ප්‍රතිපත්ති වල ඵලදායීතාවය නිර්ණය කිරීම සහ විදේශ විනිමය වෙළෙඳපොලේ සිදුවන වර්ධනයන්ට සමගාමීව නව ප්‍රතිපත්ති වල අවශ්‍යතාවය හඳුනා ගැනීම සහ එම ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.

(ඒ) විදේශ විනිමය පනතේ විධිවිධාන වලට අනුකූල නොවන අවස්ථාවන්ට අදාලව විමර්ශන කටයුතු සිදු කිරීම.

(ඔ) විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ විමසීම් සඳහා වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශයන් සඳහා විදේශ විනිමය රෙගුලාසි සහ ප්‍රතිපත්ති වලට අදාල කරුණු සකස් කිරීම.

2022 වර්ෂය තුළ දී ගත් මූලික ක්‍රියාමාර්ග වල සාරාංශය පහතින් දැක්වේ.

### 13.1 නව නියෝග, නියම සහ විධානයන් නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම

විනිමය අනුපාතිකය මත පීඩනය ලිහිල් කිරීමට හා දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ විදේශ විනිමය ද්‍රවශීලතාවට උපකාර වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වාදෙනු ලැබූ අනෙකුත් මිනුම් සමග ඒකාබද්ධව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී, විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාර ව නියෝග, නියම හා විධානයන් නිකුත් කරන ලදී. මෙම වාර්තාවේ III කොටසේ දී ඇති විස්තර සමගින් ඇතැම් ප්‍රධාන නියෝග, නියම හා විධානයන් පහතින් ඉස්මතු කර දක්වා ඇත.

(i) නිශ්චිත ප්‍රාග්ධන ගනුදෙනු කිහිපයක් සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ නවතාලමින් සහ සීමා කිරීම් පනවමින් කලින් නිකුත් කරනු ලැබූ විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ වන නියමය, විනිමය අනුපාතිකය ස්ථාවර වීමට උපකාර වීම සඳහා වසර තුළ දී තවදුරටත් දිගු කරනු ලැබී ය.

(ii) රට තුළට විදේශ විනිමය ගලා ඒමේ විභවතාව සැලකිල්ලට ගෙන දැනටමත් විවෘත කර ඇති විශේෂ තැන්පතු ගිණුම්වල ඇති මුදල් රට තුළ රඳවා තබා ගැනීම ධෛර්යමත් කිරීමට එම ගිණුම්

විවෘත කළ දිනයේ සිට උපරිම මාස 36ක කාලයක් දක්වා අලුත් කර පවත්වාගෙන යාමට ඉඩ ලබා දෙන අතරම 2023 අප්‍රේල් 07 දක්වා මාස 12ක කාලයක් සඳහා නව විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සඳහා වන නියෝග දීර්ඝ කරනු ලැබී ය.

(iii) ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික පුද්ගලයකු සන්තකයේ ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු පද්ධතිය වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණ සහිතව තම සන්තකයේ තබා ගත හැකි උපරිම විදේශ ව්‍යවහාර මුදල් සීමාව එ.ජ.ඩො. 15,000 සිට එ.ජ.ඩො. 10,000 දක්වා අඩු කරමින් විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ වන නියමය නිකුත් කරනු ලැබී ය.

(iv) දීර්ඝ කාලීන නේවාසික වීසා අපේක්ෂා කරන ශ්‍රී ලංකාවට පිටත නේවාසිකයන් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක කරන ලද රන් පාරාදීසය වීසා වැඩසටහන යටතේ වන විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට 2022 නොවැම්බර් මුල් භාගයේ දී විධාන නිකුත් කරනු ලැබී ය.

(v) භාණ්ඩ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්වලට එවැනි ආනයන සඳහා අදාල ගෙවීම් මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත මව් සමාගමෙන් හෝ එකම සමාගම් සමූහයේ සමාගමකින් කෙටි කාලීන ණය පහසුකම් ලබා ගැනීමට අදාල අවසරයන් ප්‍රදානය කරමින් නියෝග සහ විධාන නිකුත් කරනු ලැබී ය.

(vi) භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් කොළඹ වරාය නගරයේ විශේෂ ආර්ථික කලාපය තුළ පිහිටි සමාගම් වලින් නේවාසිකයන් හට ගෙවීම් ලබා ගැනීමට හැකියාව ලබාදීම සහ එම ආර්ථික කලාපය තුළ පිහිටි සමාගම්වල සේවකයන් හට විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට ඉඩ ලබා දීම සිදු කරමින් එකී විශේෂ ආර්ථික කලාපය තුළ ආයෝජන කටයුතු සඳහා ආයෝජකයින්ට හා ආයෝජිතයින්ට බැංකු ගිණුම් විවෘත කිරීමට අදාල අවසරයන් ප්‍රදානය කරමින් නියෝග හා විධාන නිකුත් කරනු ලැබී ය.

(vii) ගනුදෙනුකරුවන් හට ඉහළ විනිමය අනුපාතයන් (විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඉහල මිල දී ගැනීමේ අනුපාතයන් පිළිගැන්වීම හේතුකොට ගෙන පරිසීමිත වෙළෙඳුන් විසින් සිදු කරන ලද අනුකූල නොවීම් සලකා බලා) ප්‍රදානය කිරීම තහනම් කරමින් පරිසීමිත වෙළෙඳුන් (එනම් මුදල් හුවමාරුකරුවන්) වෙත විධානයන් නිකුත් කරන ලදී.

නිල නොලත් විදේශ විනිමය ගනුදෙනු වැලැක්වීම සඳහා සුදුසු නියාමන බලගැන්වීමක් ලබා ගැනීම ඇතුළුව විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගත් ගැටළු සහ ඇතැම් කාරණා සම්බන්ධයෙන් විදේශ විනිමය පනතට සංශෝධන යෝජනා කිරීමේ කාර්යය වසර තුළදී තවදුරටත් සිදු කරන ලදී.

## 13.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා අවසර ලබා දීම

**(අ) විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද විශේෂ අවසරයන් පිළිබඳ තොරතුරු පහත II-13 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.**

**II-13 සංඛ්‍යා සටහන**

**විදේශ විනිමය පනත යටතේ ලබාදුන් විශේෂ අවසර**

| අරමුණ | අවසර ගණන | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන |
|---|---|---|
| නේවාසික සමාගම් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන බැංකු/ සමාගම් ඇපකර සඳහා | 2 | 29.1 |
| විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම. | 29 | අ/නො |
| බලයලත් වෙළෙඳුන්/ නේවාසික සමාගම් හට විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයන්ගෙන් ආවරණය නොවන විවිධ විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා | 101 | අ/නො |

අ/නො - අදාළ නොවේ.

**(ආ) මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ යෙදීම සඳහා පරිසීමිත වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ එම මෙහෙයුම් කටයුතු නවතා දැමීම.**

i. 2022 වසර තුළදී විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා හෝටල් සමාගම් වෙත නව බලපත්‍ර 11 ක් නිකුත් කරන ලදී.

ii. එක් මුදල් හුවමාරු කිරීමේ අවසරපතක් අවලංගු කර දැමූ අතර තවත් එකක් තාවකාලිකව අත්හිටුවනු ලැබී ය. තවද, වසර තුළ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 02 ක් ඔවුන්ගේ මුදල් හුවමාරු මෙහෙයුම් කටයුතු නවතා දමනු ලැබී ය.

iii. පරිසීමිත වෙළෙන්දන් වෙත මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතවීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර වර්ග සහ ඔවුන්ගේ ආයතනික වර්ගීකරණය පිළිබඳ විස්තර පහත II-14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-14 සංඛ්‍යා සටහන**

**2022.12.31 වන විට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා අවසරලත් පරිසීමිත වෙළෙඳුන්**

| ආයතන කාණ්ඩය | අවසරලත් ව්‍යාපාරික කටයුතු | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ පමණක් නියැලෙන සීමිත සමාගම් (මුදල් හුවමාරු කරන්නන්) | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම | 59* |
| | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | 06 |
| සංචාරක හෝටල් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම | 14 |
| **එකතුව** | | **79** |

* මුදල් මාරු කිරීමෙහි නියැලෙන ව්‍යාපාරික ස්ථාන/ශාඛා 69 ක් ඇතුළුව සමාගම් 59ක් වෙත බලපත්‍ර නිකුත් කරන ලදී. එම ව්‍යාපාරික ස්ථාන 69න්, 58ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීමට අවසර ලබා දී ඇති අතර, ඉතිරි ව්‍යාපාරික ස්ථාන 11ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 වන විට, එම් එම් බී එල් මුදල් හුවමාරු පුද්. සමාගම (මුදල් මාරු කිරීමේ සේවයේ නිරත) සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සමාගම (විදේශ විනිමයෙන් ණය ඇපකර නිකුත් කිරීමේ නියුතු) ඇතුළුව බලයලත් වෙළෙඳුන් 26 ක් සහ පරිසීමිත වෙළෙඳුන් 81 ක් මෙහෙයුම් කටයුතුවල නිරත වී ඇත. අනුමත විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමට අවසරලත් බලයලත් වෙළෙඳුන් (එනම් අවසරලත් ගනුදෙනු සඳහා විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලපත්‍රලාභී වාණිජ බැංකු සහ අදාල විශේෂිත අවසරය සහිත කාරණා සඳහා විදේශ විනිමයෙන් ගනුදෙනු කිරීම සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු) සහ පරිසීමිත වෙළෙඳුන් (ශාඛා ද ඇතුළුව) පිළිවෙලින් ඇමුණුම II-2 සහ ඇමුණුම II-3 හි සඳහන් වේ.

**(ඇ) සංක්‍රමණිකයින්ගේ අරමුදල් මාරු කිරීම**

ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ විගාමික දීමනාව නිදහස් කිරීමේ අරමුණ සඳහා සහ විගාමිකයන්ට උරුම වූ මුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 215 ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙන ලදී. කෙසේ වෙතත්, ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු අත්හිටුවමින් විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගය හේතුවෙන් මෙම ගිණුම් හරහා හුවමාරු වූයේ එ.ජ.ඩො. මිලියන 1.26ක මුදලක් පමණි.

## 13.3 නේවාසික අයෝජකයන් උදෙසා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති රෙගුලාසිවලට අනුව, ප්‍රතිමුඛ ආයෝජන සිදු කිරීම සඳහා විදේශ විනිමය පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශන නොමැති බවට තහවුරු කරමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නේවාසිකව ආයෝජකයන් වෙත නිෂ්කාශන ලිපි 12ක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

## 13.4 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය සහ විමර්ශනය

i. සියලුම බලයලත් වෙළෙඳුන් ඔවුන් විසින් පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුම්වලට අදාල තොරතුරු, එකී විදේශ මුදල් ගිණුම්වලට අදාලව නිකුත් කර ඇති විධානයන් මඟින් පනවා ඇති වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. තවදුරටත්, මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද 2022 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති, සංශෝධිත, (රීතීන්) ප්‍රකාර ව සියලුම බලයලත් වෙළෙන්දන් විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සහ එම ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමට අදාල තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මෙම තොරතුරු විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණය කොට අධීක්ෂණය, නියාමනය සහ ප්‍රතිපත්ති සැකසීමේ කාරණා සඳහා භාවිතා කරනු ලැබේ.

ii. මීට අමතරව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් බලයලත් වෙළෙඳුන් සහ අපනයනකරුවන් නිකුත් කර ඇති රීති සමග අනුකූල වන්නේ දැයි හඳුනාගැනීමට බලයලත් වෙළෙඳුන්ගේ එතැන් පරීක්ෂා කිහිපයක් පවත්වන ලද අතර අවශ්‍ය වන්නේ නම් නිවැරදි කිරීම් හෝ නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

iii. විදේශ විනිමය පනත යටතේ නිකුත් කරනු ලැබූ නියෝග, නියම හා විධානයන්ට අනුකූල නොවීම්වලට අදාළව විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාර ව බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙඳුන්, සහ අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව නව විමර්ශනයන් 47ක් ආරම්භ කරන ලදී.

iv. තවද, 2022 වසරට පෙර ආරම්භ කරන ලද විමර්ශන 17ක් සහ 2022 වසර තුළ දී ආරම්භ කරන ලද විමර්ශන 23ක් ලෙස විමර්ශන 40ක් වසර තුළ දී අදාල ක්‍රියාමාර්ග පටිපාටිය අනුගමනය කිරීමෙන් පසු අවසන් කරන ලදී.

v. එලෙසම, විදේශ විනිමය පනතෙහි විධිවිධානයන්ට අදාල කරුණු සම්බන්ධයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ සාක්ෂි/දැනුම ලබා දීමෙන් නීති බලාත්මක කිරීමේ බලධාරීන්ට, නඩු පැවරීම් සහ නීතිමය කටයුතු සඳහා සහාය විය.

## 13.5 අපනයන ලැබීම් අධීක්ෂණ පද්ධතිය

2021 වසරේ දී, අපනයන ඉපැයීම් රටතුළට ලබා ගැනීම අධීක්ෂණය කිරීමට තොරතුරු තාක්ෂණය මත පදනම් වූ පද්ධතියක් ඇරඹීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා රේගුවේ සහයෝගයෙන් 2022 ජූනි මාසයේ දී, ස්වයංක්‍රීය අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියක් සකසා ක්‍රියාත්මක කරන ලදී. මෙම අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියේ මූලිකම අරමුණ වනුයේ සියළුම භාණ්ඩ අපනයන එක් දත්ත ගොනුවකට ලබා ගැනීම සහතික කර ගැනීම සහ අපනයන ඉපැයීම්, අපනයන ඉපැයීම් රට තුළට ගෙන ඒමේ රීතීන්ට අනුව සිදු වන්නේදැයි අධීක්ෂණය කිරීම වේ. අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය මගින් ශ්‍රී ලංකා රේගුව වෙබ් සේවාවක් මගින් සපයනු ලබන අපනයන තොරතුරු සහ බලයලත් වෙළෙඳුන් මගින් පද්ධතියට ලබා දෙනු ලබන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ තොරතුරු ද එක්රැස් කරනු ලබයි. ඒ අනුව, අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය තුළින් ශ්‍රී ලංකාවට අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම අධීක්ෂණය කිරීමේ කාර්යය ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

## 13.6 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම

වසර තුළදී, බලයලත් වෙළෙඳුන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ පවතින විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 9ක් පවත්වන ලදී. තවදුරටත්, විදේශ විනිමය නියෝග, නියම හා විධාන සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පුවත්පත් දැන්වීම් 10ක් නිකුත් කරන ලදී. නව විදේශ විනිමය නියෝග පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය

වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dfe.lk) නිසි පරිදි යාවත්කාලීන කිරීම සිදු කෙරුණු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරුණු විමසීම් වලට නොකඩවා පිළිතුරු ලබාදීම ද සිදු කරන ලදී.

**ඇමුණුම II-2**

**2022 දෙසැම්බර් 31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව**

| | |
|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | |
| 1 | අමානා බැන්ක් පී.එල්.සී. |
| 2 | ලංකා බැංකුව |
| 3 | බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් |
| 4 | කාගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 5 | සිටි බැන්ක් |
| 6 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. |
| 7 | ඩොයිෂ් බැන්ක් ඒ.ජී. |
| 8 | ඩී එෆ් සී සී බැන්ක් පී.එල්.සී. |
| 9 | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 10 | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. |
| 11 | ඉන්දියන් බැන්ක් |
| 12 | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 13 | එම්.සී.බී. බැන්ක් ලිමිටඩ් |
| 14 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් |
| 15 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. |
| 16 | පෑන් ඒෂියා බැන්කින් කොපරේෂන් පී.එල්.සී. |
| 17 | මහජන බැංකුව |
| 18 | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 19 | සම්පත් බැන්ක් පී.එල්.සී. |
| 20 | සෙලාන් බැන්ක් පී.එල්.සී. |
| 21 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක් |
| 22 | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 23 | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කොපරේෂන් ලිමිටඩ් |
| 24 | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
| 25 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 26 | සණස සංවර්ධන බැංකුව |

**ඇමුණුම II-3**

**2022 දෙසැම්බර් 31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළඳුන්**

| | |
|---|---|
| මුදල් හුවමාරු කරන ස්ථාන | |
| 1 | ආබ්ඩීන් මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| 2 | අබිලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 3 | ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම |
| 4 | අරුණ ෆොරෙක්ස් (පුද්) සමාගම* |
| 5 | ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 6 | බ්‍රේෂියා ග්‍රාමීන් (පුද්) සමාගම |
| 7 | බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 8 | කැපිටල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 9 | සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 10 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 11 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 12 | දැඩිගම ගෲප් (පුද්) සමාගම |
| 13 | ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම |
| 14 | දයා ඔතොරයිස්ඩ් මනි චේන්ජර් (පුද්) සමාගම |
| 15 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාල්ල |
| 16 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාලු කොටුව |
| 17 | ජෝර්ජ් මයිකල් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම |
| 18 | ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 19 | ගෝල්ඩන් මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| 20 | ගෝල්ඩ් ලංකා ජුවලරි (පුද්) සමාගම |
| 21 | හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්) සමාගම |
| 22 | ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 23 | ජයස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් |
| 24 | ජෙයා ෆොරෙක්ස් එක්ස්චේන්ජ් (පුද්) සමාගම* |
| 25 | කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම* |
| 26 | කේසර් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 27 | කුඩාමඩු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම* |
| 28 | එම්. පී මනි චේන්ජර් (පුද්) සමාගම |
| 29 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - යාපනය |
| 30 | මයූරි මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| 31 | මිඩ්නා මිනි මාර්කට් (පුද්) සමාගම* |
| 32 | මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 33 | නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - යාපනය |
| 34 | නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - කිලිනොච්චි |
| 35 | නිව් ලංකා ගෝල්ඩ් හවුස් (පුද්) සමාගම* |
| 36 | නිව් නටාෂා (පුද්) සමාගම |
| 37 | නිව් රීගල්ස් මනි චේන්ජර් (පුද්) සමාගම |
| 38 | රෆීක්ස් ජෙම්ස් (පුද්) සමාගම* |
| 39 | රිම්හා ජුවෙලරි (පුද්) සමාගම* |
| 40 | රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම |
| 41 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 42 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 43 | රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - අලුත්ගම |
| 44 | රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - කොළඹ 01 |
| 45 | සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම* |
| 46 | සාරංගා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම* |
| 47 | ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 48 | සෝනම් ෆොරෙක්ස් (පුද්) සමාගම* |
| 49 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 50 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 51 | තමාෂා ෆොරෙක්ස් (පුද්) සමාගම* |
| 52 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - කොළොම්බු සිටි සෙන්ටර් |
| 53 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - වන් ගෝල් ෆේස් මෝල් |
| 54 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - නුවර |
| 55 | යුනික් ෆොරෙක්ස් (පුද්) සමාගම |

| | |
|---|---|
| 56 | වසන්තාස් ඉන්ටර්නැෂනල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම* |
| 57 | වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 58 | වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |

**විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීමට හා විකිණීමට අවසර ඇති පරිසීමිත වෙළඳුන්**

| | |
|---|---|
| 59 | අරුජිනා ජුවෙලරි (පුද්) සමාගම |
| 60 | සිටි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 61 | ක්‍රවුන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 62 | දේවි ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 63 | ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 64 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 65 | මෙට්‍රෝ ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 66 | පුෂ්පා මනි චේන්ජර් (පුද්) සමාගම |
| 67 | රවී ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 68 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| 69 | යුනිවර්සල් මනි චේන්ජර්ස් (පුද්) සමාගම* |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | |
| 70 | ඒෂියා ඇසට් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 71 | සිටිසන් ඩිවලොප්මන්ට්ස් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 72 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 73 | එල්. බී ෆයිනෑන්ස් පී. එල්. ස |
| 74 | සෙන්කඩගල ෆයිනෑන්ස් පී. එල්. සී |
| 75 | සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පී. එල්. සී |
| ව්‍යවහාර විදේශ මුදල් මිලදී ගැනීමට, අවසර ඇති පරිසීමිත වෙළඳුන් | |
| 76 | පර්ල් සිටි හොටෙල් |
| 77 | ෂැන්ග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා |
| 78 | ෂැන්ග්‍රිලා හොටෙල් කොළඹ |
| 79 | සිනමන් රෙඩ් කොළඹ |
| 80 | සිනමන් සිටඩෙල් නුවර |
| 81 | සිනමන් ලොජ් හබරණ |
| 82 | හබරණ විලේජ් බයි සිනමන් |
| 83 | ට්‍රින්කො බ්ලූ බයි සිනමන් |
| 84 | සිනමන් බෙන්තොට බීච් |
| 85 | හික්කා ට්‍රාන්ස් බයි සිනමන් |
| 86 | සිනමන් බේ බේරුවල |
| 87 | සිනමන් ග්‍රෑන්ඩ් |
| 88 | සිනමන් ලේක්සයිඩ් |
| 89 | සිනමන් වයිල්ඩ් යාල |
| අනෙකුත් ආයතන | |
| 90 | එම්.එම්. බී. එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්) සමාගම (දේශීය ප්‍රතිලාභීන් වෙත ශ්‍රී ලංකා රුපියල් වලින් බෙදා හැරීමට ආමුඛ ප්‍රේෂණ විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගැනීමට පමණක් අවසර ඇත). |
| 91 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (අපනයනකරුවන්ගේ ගිණුම් මත බලයලත් වෙළෙඳුන් වෙත විදේශ ව්‍යවහාර මුදලින් පෙර/පසු නැව්ගත කිරීමේ ණය ඇපකර නිකුත් කිරීමට අවසර දී ඇත.) |

* මෙම ආයතනවලට 2023 වසර සඳහා මුදල් හුවමාරු ව්‍යාපාරයෙහි යෙදීමට අවසර දී නොමැත.

# 14. විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම්

විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ ප්‍රේෂණවල උගාකරගත හැකි උපරිම මට්ටම ලබාගැනීමට කටයුතු කරමින් විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ගේ එම ප්‍රේෂණ රට තුළට ගලා ඒම පහසු කිරීම සහ එය වඩා විධිමත් කිරීමේ අරමුණින් විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම ඉලක්ක උගාකර ගැනීමේදී, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විදේශීය ප්‍රේෂණ අංශයේ අනෙකුත් අදාළ බලධාරීන් සමග සම්බන්ධ වෙමින් 2022 සහ 2023 මුල් කාලය තුළදී පහත ක්‍රියාකාරකම්වල නිරත විය.

## 14.1 සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන දිරි දීමනා ක්‍රම හඳුන්වා දීම.

(අ) විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් විසින් බලපත්‍රලාභී බැංකුවල පවත්වාගෙන යනු ලබන රුපියල් ගිණුම්වලට සහ කවුන්ටරය හරහා මුදල් ලැබීමට, ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය කිරීමේදී දරනු ලබන ගණුදෙනු පිරිවැය ප්‍රතිපූරණයක් ලෙස රුපියල් 20,000ක් හෝ ඊට වැඩි සෑම ගනුදෙනුවකටම රුපියල් 1,000ක මුදලක් ලබාදීම සඳහා වන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම දිරිගැන්වීමේ ක්‍රමය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට පෙර විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් පාකිස්ථානු මහ බැංකුව (State Bank of Pakistan), විදේශයන්හි ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවක සංගම්, විදේශයන්හි ඇති විනිමය හුවමාරු මධ්‍යස්ථාන වලින් සැදුම්ලත් සංගම් සහශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සමග සාකච්ඡා පවත්වන ලදී. මෙම යෝජනා ක්‍රමය 2022 පෙබරවාරි 01 සිට ක්‍රියාත්මක වේ.

(ආ) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා අතිරේක තීරුබදු රහිත දීමනාවක් (Additional duty-free allowance) හඳුන්වාදීම සඳහා වන යෝජනා ක්‍රමයක් සැලසුම් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය මගින් විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ඉපැයීම් විධිමත් මාර්ග හරහා මෙරටට ප්‍රේෂණය කිරීම දිරිගන්වන අතර එමගින් ණය නොවන විදේශ විනිමය රට තුළට ගලා ඒමේ තිරසාරභාවය සහ එහි මධ්‍ය කාලීන වර්ධනයට පහසුකම් සලසනු ඇත. මෙම යෝජනා ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එය නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

(ඇ) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමේ යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීමට මෙම දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ අතර, මෙම යෝජනා ක්‍රමය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක

කරන ලදී. මෙම යෝජනා ක්‍රමය 2022 මැයි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණයෙන් සියයට 50කට සමාන හෝ ඊට අඩු CIF (මිල, රක්ෂණය සහ ගැල්කුලිය) අගයන් සහිත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී. මෙමගින් විදේශගත ශ්‍රමිකයන්ට ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයීම් විධිමත් මාර්ග හරහා මෙරටට ප්‍රේෂණය කිරීම දිරිමත් කරනු ඇත.

### 14.2 විදේශ විනිමය ප්‍රේෂණ සහ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම

(අ) විදේශ රැකියා සඳහා යොමුවන ශ්‍රමිකයින් ඉලක්ක කරගත් දිරිදීමනා ක්‍රම සහ විධිමත් ක්‍රම ඔස්සේ මුදල් හුවමාරු කිරීමේ වැදගත්කම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම්, පුවත්පත්, ගුවන්විදුලි වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමාජ මාධ්‍ය සහ ප්‍රවෘත්ති වෙබ් අඩවි වැනි විවිධ ක්‍රම හරහා සිදුකරන ලදී.

(ආ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සමග සෘජුව සම්බන්ධ වී සිටින විදේශ විනිමය ප්‍රේෂණ හුවමාරු නියෝජිතයින් සහ අනෙකුත් විදේශ විනිමය ප්‍රේෂණ සිදුකරන මාර්ග ඇතුළත් ලැයිස්තුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද අතර, එය නිරන්තරයෙන් යාවත්කාලීන කරන ලදී. මෙම ලැයිස්තුව ශ්‍රී ලංකාවට එතෙර සිට විදේශ විනිමය ප්‍රේෂණ එවීම සඳහා ඇති විධිමත් මාර්ග හඳුනා ගැනීමට හැකි වන පරිදි බලපත්‍රලාභී බැංකු සමග සෘජුවම සම්බන්ධ වී සිටින විදේශ විනිමය ප්‍රේෂණ හුවමාරු නියෝජිතයින් සහ අනෙකුත් විදේශ විනිමය ප්‍රේෂණ සිදුකරන මාර්ග පිළිබඳව, ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයින්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා උපකාරී වනු ඇත.

(ඇ) විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අදාළ අනෙකුත් ආයතන සමග සම්බන්ධ වෙමින් විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මුහුණ දෙන දුෂ්කරතා සහ සීමාවන් මගහරවා ගැනීමට දායක වෙමින් විදේශ විනිමය මුදල් මෙරටට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්, පැමිණිලි සහ දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවල ද නිරත විය.

### 14.3 විදේශීය විනිමය ප්‍රේෂණ සහ සංක්‍රමණික සේවකයින් පිළිබඳ තොරතුරු බෙදාහැරීම

(අ) සංක්‍රමණික සේවකයින් සහ විදේශ විනිමය ප්‍රේෂණ පිළිබඳ අදාළ දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.

(ආ) සංක්‍රමණික සේවකයින් සහ විදේශ විනිමය ප්‍රේෂණ පිළිබඳ පර්යේෂණ සිදු කර ඒවා සඟරාවල සහ මහ බැංකු ප්‍රකාශනවල පළ කිරීම.

සංක්‍රමණික ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට තම ඉපැයීම් ප්‍රේෂණය කිරීමට භාවිතා කරන ක්‍රම පිළිබඳ තොරතුරු වල පවත්නා අඩුපාඩු මගහැරවීම සහ ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම පිණිස, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික විදේශගත සේවා නියුක්තිකයන් සහ ඔවුන්ගේ ප්‍රේෂණ රටාවන් පිළිබඳව ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මත පදනම් වූ මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡා සහිත ගෘහස්ත සමීක්ෂණයක් දැනට සිදුකරමින් පවතී. ඉදිරියේදී අනෙකුත් අදාළ බලධාරීන් සමග සහයෝගයෙන් විදේශීය විනිමය ප්‍රේෂණ සහ විගමණික සේවක සුබසාධනය ඉහළ නැංවීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රම වැනි නව යෝජනා ක්‍රම හඳුන්වාදීමේ ක්‍රියාවලියට පුළුල් ලෙස සම්බන්ධ වීමට විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. තවද, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව රටවල් අතර විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රවාහයන් පිළිබඳ අධ්‍යයනයක් භාවිතයෙන් දැනට වෙළඳපොලේ පවත්නා ගනුදෙනු පිරිවැය පිළිබඳ විශ්ලේෂණය කිරීමට සැලසුම් කර ඇත.

## 15. මානව සම්පත්

කොවිඩ්-19 වසංගතය පැතිරීම, ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා ආදී විවිධ අභියෝග මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක විය හැකි ඉහළ ඵලදායීතාවයකින් යුතු, අභිප්‍රේරිත, කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ පවත්වා ගැනීම සහතික කිරීමේ අරමුණින් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් කළමනාකරණ (HRM) කාර්යයන් සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වසරේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ සිදුකරන ලද මෙහෙයුම් අතරට නව සේවක බඳවා ගැනීම්, උසස්වීම්, දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරුකිරීම්, සේවක වැටුප්, පුහුණු කිරීම් හා නිපුණතා සංවර්ධනය, කාර්යසාධන ඇගැයීම, සේවක අභිප්‍රේරණය, දුක් ගැනවිලි පිළිබඳව සොයා බැලීම සහ මහ බැංකුවේ අවශ්‍යතාවය පරිදි තෝරාගත් සේවාවන් බාහිර සේවා සපයන්නන් හරහා ලබා ගැනීම හා සම්බන්ධ විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් විය. තව ද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ සියලු ගැටලු සහ අනෙකුත් ආයතනික කාර්යයන් සම්බන්ධ ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසමින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා ආයතනික කළමනාකරණ කමිටු, පුහුණු කමිටු සහ පුහුණු අනු කමිටු ආදී වූ රැස්වීම් සංවිධානය කරන ලදී. එමෙන්ම, මානව

සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්, උපායමාර්ගික හා මෙහෙයුම් කටයුතු සම්බන්ධ ප්‍රතිපත්තිමය මෙන්ම මෙහෙයුම් කරුණු පිළිබඳ සාකච්ඡා කොට තීරණ ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ රැස්වීම් නිරන්තරයෙන් කැඳවන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකාරිත්වය, සියලු මට්ටම්වල සේවකයන් මෙන්ම වෘත්තීය සමිති අතර සාකච්ඡා සඳහා පහසුකම් සැළසීම තුළින් බැංකුවේ කාර්මික සාමය අඛණ්ඩව පවත්වා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් දායකත්වය සපයන ලදී. එපමණක් නොව, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයන්ට සහ විශ්‍රාමිකයන්ගේ සංගම්වලට මහ බැංකුවේ කළමනාකාරිත්වය සමග සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා/ඉල්ලීම් සළකා බැලීමට අවශ්‍ය පසුබිම සකසා දීමට කටයුතු කරන ලදී. එසේම, 2022 වසර ආරම්භයේ දී 2021 - 2023 ත්‍රෛවාර්ෂික වැටුප් සංශෝධනය අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු කළමනාකාරිත්වය සහ සියලුම වෘත්තීය සමිති අතර සාකච්ඡා සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.

තව ද, 2022 වසරේ මුල් භාගයේ දී පැවති කොවිඩ්-19 වසංගත තත්වය මෙන්ම රට තුළ උද්ගත වූ ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා මධ්‍යයේ "නිවසේ සිට වැඩ කිරීමට" පහසුකම් සැළසීම තුළින් මානව සම්පත් දෙපාර්තමේන්තුව බැංකුවේ මෙහෙයුම් කටයුතු සුමටව සහ අඛණ්ඩව පවත්වාගෙන යැම සඳහා දායක විය.

## 15.1 මානව සම්පත් ව්‍යුහය

2022 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,260ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 661කින්, කළමනාකරණ සහකාර පන්තියේ නිලධාරීන් 463කින් සහ කාර්යාල සහායක පන්තියේ සේවකයන් 136කින් සමන්විත විය. එකී සමස්ත සේවක සංඛ්‍යාවෙන් 656ක් පුරුෂ හා 604ක් ස්ත්‍රී වූ අතර, එය පිළිවෙලින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 52ක් හා සියයට 48ක් විය. 2022 වසර අවසානය වන විට මහ බැංකු සේවකයකුගේ සාමාන්‍ය වයස අවුරුදු 40ක් විය.

## 15.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්

II-15 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව, ඉහළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ නිපුණතා වලින් හෙබි විවිධ දක්ෂතා ඇති කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

## 15.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) බඳවා ගැනීම්

2022 වසරේ දී සාමාන්‍ය බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවට කණිෂ්ඨ පෞද්ගලික සහකාර (ඉංග්‍රීසි සහ සිංහල) තනතුරට බඳවා ගැනීම සඳහා කටයුතු කරන ලදී. ඒ අනුව, 2022 ඔක්තොම්බර් 29 දින පවත්වන ලද නිපුණතා පරීක්ෂණය සහ 2022 දෙසැම්බර් 22 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව තෝරාගත් අයදුම්කරුවන්හට පත්වීම් ලබාදීම, 2023 ජනවාරි මාසයේ දී සිදුකිරීමට නියමිත විය. තව ද, මහ බැංකුවේ බැංකු සහකාර (පුහුණු) තනතුරට බඳවා ගැනීම සඳහා වූ තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරන ලදී.

මීට අමතරව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2023 ජනවාරි 02 දින සිට වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ මහ බැංකුවේ ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

### (ආ) කාර්යසාධන කළමනාකරණය

මහ බැංකුවේ කාර්යසාධන ඇගැයීමේ ක්‍රියාවලිය, සේවකයන්ගේ රැකියා විස්තර සකස් කිරීම හා සමාලෝචනය කිරීම, එක් එක් සේවකයන්ට අදාළ වන පරිදි ඉලක්ක හා අරමුණු පිහිටුවීම, කාර්යසාධනය නිරීක්ෂණය සහ කාර්යසාධනය ඇගැයීම යන අංග වලින් සමන්විත වේ.

කාර්යසාධන ඇගැයීමේ ක්‍රියාවලිය යටතේ, කාර්යසාධන ඇගැයීම් පටිපාටියේ සඳහන් වන පරිදි සාමාන්‍ය නිපුණතා සහ තාක්ෂණික නිපුණතා මෙන්ම ළඟා කරගත් කාර්යසාධන ප්‍රමාණනය කර ඒ සඳහා අගයන් ලබා දෙමින් සෑම සේවකයෙකුගේ ම කාර්යසාධන ඇගැයීම සිදුකරනු ලබයි.

**II-15 සංඛ්‍යා සටහන**

**2022.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව**

| සේවක පන්ති | අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව දරන්නන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආචාර්ය උපාධි | ශාස්ත්‍රපති උපාධි, ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්ව | ශාස්ත්‍රපති උපාධි සහ ප්‍රථම උපාධි | ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්ව | ශාස්ත්‍රපති උපාධි හා වෘත්තීය සාමාජිකත්ව | ශාස්ත්‍රපති උපාධි පමණක් | ප්‍රථම උපාධි පමණක් | වෘත්තීය සාමාජිකත්ව පමණක් | එකතුව |
| මාණ්ඩලික පන්තිය | 26 | 123 | 169 | 71 | 44 | 3 | 171 | 10 | 617 |
| කළමනාකරණ සහකාර පන්තිය | - | 11 | 30 | 16 | 20 | 38 | 42 | 24 | 181 |
| **එකතුව** | **26** | **134** | **199** | **87** | **64** | **41** | **213** | **34** | **798** |

මාණ්ඩලික පන්තියේ III (2) ශ්‍රේණිය දක්වා සේවකයන් සඳහා උසස්වීම් පටිපාටියේ එක් නිර්ණායකයක් ලෙස සේවකයන්ගේ අවසාන කාර්යසාධන ලකුණු යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ කාර්යසාධන ඇගැයීම් ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තව ද, 2022 වසරේ සිට කාර්තුමය කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලියක් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලදී. සේවකයන්ගේ කාර්යසාධනය පියවරෙන් පියවර සමීපව නිරීක්ෂණය කිරීමට අධීක්ෂකවරුන්ට අවස්ථාවක් ලබා දීම, දෙපාර්තමේන්තුවල උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයන්ගේ කාර්යසාධනය මෙහෙයවීම සහ සේවකයන්හට අදාළ වාර්ෂික වෘත්තීමය ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා මඟපෙන්වීමක් ලෙස භාවිතා කිරීම මෙහි අරමුණ වේ.

**(ඇ) උසස්වීම්**

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවක උසස්වීම් පටිපාටිය යටතේ, සේවක උසස්වීම් ලබා දීම සඳහා පහසුකම් සලසන ලදී. ඒ අනුව, 2022 වර්ෂයේ දී කාර්ය මණ්ඩල සාමාජිකයන් 272 දෙනෙකු සඳහා පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දෙන ලදී. ඒ යටතේ සහකාර අධිපතිවරයකු නියෝජ්‍ය අධිපතිවරයකු ලෙසත්, දෙපාර්තමේන්තු ප්‍රධානියකු ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියකු ලෙසත්, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් හත් දෙනෙකු අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙසත්, මාණ්ඩලික පන්තියේ III (1) ශ්‍රේණියේ නිලධාරීන් 11 දෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙසත් උසස් කරන ලද අතර, සේවකයින් 252 දෙනෙකු සඳහා පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දෙන ලදී.

**(ඈ) පුහුණු සහ කුසලතා සංවර්ධනය**

මහ බැංකුවේ අරමුණු ඵලදායී ලෙස සපුරාලීමේ අරමුණින් සහ බැංකුව තුළ බහුවිධ නිපුණතාවයන්ගෙන් යුතු දක්ෂ කාර්ය මණ්ඩලයක් බිහිකිරීමේ අරමුණින් මහ බැංකුව විසින් තම කාර්ය මණ්ඩලය වෙත දැනුම වැඩි දියුණු කිරීමට සහ කුසලතා සංවර්ධනය කිරීමට අවස්ථාවන් සලසා දෙනු ලැබේ. ඒ අනුව, මහ බැංකුව විසින් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා වූ මහ බැංකු අනුග්‍රාහක වැඩපිළිවෙළ යටතේ ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා නිලධාරීන් දිරිමත් කරනු ලබයි. තව ද, මහ බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයේ ඇති වන අවශ්‍යතාවන් සපුරාලීමටත්, බැංකුව තුළ දැනුම, ප්‍රවීණත්වය සහ කුසලතා අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහාය වීමටත් මහ බැංකු සේවකයන්හට දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයනු ලබයි. කෙසේ වුව ද, රටේ පවතින වත්මන් ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් 2022 වසර තුළ දී මහ බැංකු නිලධාරීන්හට "පශ්චාත් උපාධි අධ්‍යයනය" කටයුතු ද ඇතුළුව විදේශ පුහුණු අවස්ථාවන් සඳහා පහසුකම් සැළසීමට කිසිදු විදේශ විනිමය වියදමක් නොදැරීමට මහ බැංකුව විසින් තීරණය කරන ලදී. එනමුත්, මහ බැංකුවේ නිලධාරීන්හට මහ බැංකුව විසින් පිළිගනු ලබන ආයතන විසින් අනුග්‍රහ දක්වන "විදේශ පුහුණුවීම්" සඳහා සහභාගීවීමට අවසර ලබා දුන් අතර, මහ බැංකුව විසින් පිළිගනු ලබන බාහිර මූලාශ්‍ර විසින් ප්‍රදානය කරනු ලබන පූර්ණ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන මහ බැංකු නිලධාරීන්හට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට මහ බැංකුව විසින් අවස්ථාව සලසා දෙන ලදී.

ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනමනු ලබන පූර්ණ ශිෂ්‍යත්ව යටතේ, 2022 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් දෙදෙනෙකුහට ඕස්ට්‍රේලියාවේ ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පහසුකම් සපයන ලදී. 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා කාලය තුළ මහ බැංකු අනුග්‍රාහක වැඩපිළිවෙළ යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇති/සම්පූර්ණ කර නැවත පැමිණි නිලධාරීන් සංඛ්‍යාව පහත II-16 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-16 සංඛ්‍යා සටහන**

**මහ බැංකු අනුග්‍රාහකත්වය යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු**

| වර්ෂය | පශ්චාත් උපාධි අධ්‍යයනය | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ආචාර්ය උපාධි | | ශාස්ත්‍රපති උපාධි | | ආරම්භ කරන ලද | සම්පූර්ණ කරන ලද* |
| | ආරම්භ කරන ලද | සම්පූර්ණ කරන ලද* | ආරම්භ කරන ලද | සම්පූර්ණ කරන ලද* | | |
| 2018 | 8 | 1 | 8 | 14 | 16 | 15 |
| 2019 | 4 | 1 | 7 | 7 | 11 | 8 |
| 2020 | 2 | 5 | 6 | 8 | 8 | 13 |
| 2021 | 1 | 4 | 1 | 6 | 2 | 10 |
| 2022 | - | 1 | 2 | 1 | 2 | 2 |
| එකතුව | 15 | 12 | 24 | 36 | 39 | 48 |

*පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසු නැවත පැමිණි.

ඉහත සඳහන් පුහුණුවීම්වලට අමතරව ලොව අනෙකුත් මහ බැංකු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), අග්නිදිග ආසියානු මහ බැංකු සංගමය (SEACEN), ලෝක බැංකුව (World Bank) වැනි ජාත්‍යන්තර සංවිධාන සහ දේශීය ආයතන විසින් පවත්වනු ලබන මාර්ගගත පුහුණු වැඩසටහන් (online training programmes) සඳහා සහභාගීවීමට මහ බැංකු නිලධාරීන්හට 2022 වසර තුළ දී පහසුකම් සලසනු ලැබිය. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් විදේශීය පුහුණු වැඩසටහන් 402ක් සඳහා නිලධාරීන් 621 දෙනෙකුට මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගී වීමටත්, විදෙස් සංවිධායක ආයතනවල මූල්‍ය අනුග්‍රාහකත්වය යටතේ පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන් 36ක් සඳහා නිලධාරීන් 65 දෙනෙකුට සහභාගීවීමටත් පහසුකම් සලසන ලදී.

මේ අතර, බාහිර දේශීය පුහුණු ආයතන (external local training institutes) මගින් පවත්වනු ලබන දේශීය පුහුණු වැඩසටහන් 93කට සහභාගී වීමට නිලධාරීන් 479 දෙනෙකුට සහ බැංකු විදු පියෙස මගින් පවත්වනු ලබන දේශීය පුහුණු වැඩසටහන් 85කට සහභාගී වීමට නිලධාරීන් 1,716 දෙනෙකුට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

මීට අමතරව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්හට දිගුකාලීන දේශීය (අර්ධකාලීන) පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට සහ දේශීය ආයතන විසින් පිරිනමනු ලබන අනෙකුත් සහතික පත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා සහභාගී වීමට පහසුකම් සපයන ලද අතරම වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA) සුදුසුකම් සඳහා වන අනුග්‍රාහක වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන් අතර සහ අනෙකුත් මහ බැංකු කාර්ය මණ්ඩල අතර දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදී. ඒ අනුව, 2022 වසරේ "විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය සහ වෙළඳපොළ ස්ථායීකරණ පියවර" (FX Transaction Monitoring and Market Stabilization Measures) යන මාතෘකාව යටතේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කොරියානු බැංකුව (BOK) සමග දැනුම බෙදාගැනීමේ වැඩසටහන් පවත්වන ලදී. තව ද, කොරියානු බැංකුව (BOK) විසින් පවත්වනු ලැබූ විවිධ දැනුම බෙදාගැනීමේ සැසිවාරයන් කිහිපයකටම සහභාගීවීමට ද ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්හට පහසුකම් සපයන ලදී.

**(ඉ) දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම්**

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ඵලදායිතාවය ඉහළ නංවන අතරම, බැංකුව තුළ බහුවිධ නිපුණතා සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තිය 2022 වසරේදී ද අඛණ්ඩව සිදු කරනු ලැබීය. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර වාර්ෂික සේවක ස්ථාන මාරු කිරීම් යෝජනා ක්‍රමය යටතේ මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 23 දෙනෙකු සහ කාර්යාල සහායක පන්තියේ සේවකයන් 50 දෙනෙකුගේ සේවක ස්ථාන මාරු කිරීම් සිදු කරන ලදී. තව ද, වාර්ෂික සේවක ස්ථාන මාරු කිරීම් යෝජනා ක්‍රමය යටතේ එන වැඩවාර සටහන මත පදනම්ව කාර්යාල සහායක පන්තියේ සේවකයන් 12 දෙනෙකුට සේවක ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.

**(ඊ) කාර්මික සාමය**

මානව සම්පත් දෙපාර්තමේන්තුව, කළමනාකාරීත්වය සහ වෘත්තීය සමිති අතර සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී කළමනාකාරීත්වය සහ වෘත්තීය සමිති අතර රැස්වීම් නවයක් පවත්වන ලද අතර, එමගින් සේවක වැටුප්, උසස්වීම්, පුහුණුවීම්, සුභ සාධනය, නව බඳවා ගැනීම් සහ පරිපාලනය සම්බන්ධයෙන් පැවති ගැටලු විසඳා ගැනීමට අවස්ථාව ලැබිණි.

**(උ) බාහිර සේවා සපයන්නන්ගේ සේවය ලබාගැනීම**

බැංකුවේ මූලික කාර්යයන්ට අදාළ නොවන කාර්යයන් සිදු කිරීම උදෙසා අවශ්‍ය මානව සම්පත් බාහිර සේවා සපයන්නන්ගෙන් ලබා ගැනීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත බලය පවරා ඇත. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ දෙපාර්තමේන්තුවල ඉල්ලීම මත බාහිර සේවා සපයන්නන්ගෙන් සේවා ලබාගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනු ලබයි. 2022 වසර තුළ දී බැංකුවේ අවශ්‍යතා අනුව, ආරක්ෂක සේවය, මෘදුකාංග ඉංජිනේරුවරුන්ගේ සේවය, නිවාඩු නිකේතන කළමනාකරණය සඳහා සේවය, විගණන අංශවල සේවය සහ වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ආදී වූ ක්ෂේත්‍ර පහකට අදාළ සේවා, බාහිර සේවා සපයන්නන් හරහා ලබා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

## 15.4 දෙපාර්තමේන්තු වසා දැමීම

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 33 වැනි වගන්තියේ විධිවිධාන අනුව, මුදල් මණ්ඩලය විසින් 2022 අප්‍රේල් 08 දින පැවැති අංක 11/2022 දරන මුදල් මණ්ඩල රැස්වීමේ දී අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ කටයුතු, ලේකම් දෙපාර්තමේන්තුවට අනුබද්ධිතව අධිපති ලේකම් කාර්යාලය වෙත පැවැරීමටත් 2022 අප්‍රේල් 08 දින සිට බලපැවැත්වෙන පරිදි අධිපති ලේකම් දෙපාර්තමේන්තුව වසා දැමීමටත් අනුමැතිය ලබා දෙන ලදී.

## 15.5 2022 වසර තුළ අධිපතිතුමා සහභාගී වූ රැස්වීම්

(අ) අධිපතිතුමා සිදු කරන ලද විදෙස් සංචාර

i. 2022 ජනවාරි 04 දින කටාර් මහ බැංකුවේ අධිපති අතිගරු ෂෙයික් බන්ඩාර් බින් මොහොමඩ් බින් සවුද් අල්-තානි සමග පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

ii. 2022 මාර්තු 25 සිට 27 දින දක්වා කාලය තුළ දෝහා කටාර්හි, දෝහා සංසදය සඳහා සහභාගී වීම.

iii. 2022 අප්‍රේල් 17 සිට 24 දින දක්වා කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / ලෝක බැංකු (IMF/WB) වසන්ත සෘතු රැස්වීම් (Spring Meeting) සඳහා සහභාගී වීම.

iv. 2022 ඔක්තෝම්බර් 10 සිට 16 දින දක්වා කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / ලෝක බැංකු (IMF/WB) වාර්ෂික රැස්වීම් සඳහා සහභාගී වීම.

(ආ) අධිපතිතුමා සහභාගී වූ විශේෂ අවස්ථා (දේශීය)

i. 2022 ජනවාරි 18 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පැවති ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද 32 වැනි සංවත්සර සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

ii. 2022 පෙබරවාරි 14 දින ජාතික ආරක්ෂක විද්‍යාලයේ දී "ජාතික ආරක්ෂාවේ අනිවාර්ය අංගයක් ලෙස ආර්ථික ආරක්ෂාව" (Economic Security as an integral part of National Security) යන මැයෙන් පැවති සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

iii. 2022 අප්‍රේල් 28 දින ලංකා වාණිජ මණ්ඩලයේ මාසික රැස්වීමේ ආරාධිත දේශනය පැවැත්වීම.

iv. 2022 මැයි 11 දින සංවර්ධනය වෙමින් පවතින රටවල ණය තිරසාරභාවය පිළිබඳ දක්ෂිණ කලාපීය රටවල් අතර ප්‍රතිපත්තිමය අත්දැකීම් බෙදා හදා ගැනීමේ (South-South Sharing of Policy Experiences) මාර්ගගත රැස්වීමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

v. 2022 මැයි 25 දින තරුණ ලාංකික ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ (COYLE) මහා සභා රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහ ප්‍රධාන දේශක ලෙස සහභාගී වීම.

vi. 2022 මැයි 28 දින කොචින් (Cochin) වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මාර්ගගත රැස්වීමේ ආරාධිත දේශක ලෙස සහභාගී වීම.

vii. 2022 ජුනි 03 දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

viii. 2022 ජුනි 24 දින කොළඹ ගොල්ෆ් සමාජය විසින් සංවිධානය කරන ලද රාත්‍රී භෝජන රැස්වීමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

ix. 2022 ජුලි 19 දින කොළඹ සමාජයේ දිවා භෝජන රැස්වීමේ ආරාධිත දේශක ලෙස සහභාගී වීම.

x. 2022 ජුලි 29 දින කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධියෙහි 7වැනි බඳවා ගැනීමේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xi. 2022 අගෝස්තු 31 දින "ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික අර්බුදය සහ ඉන් යථා තත්ත්වයට පත්වීමේ මඟ" යන මැයෙන් ජපාන ප්‍රේක්ෂකයන් සඳහා පැවති මාර්ගගත රැස්වීමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xii. 2022 සැප්තැම්බර් 15 දින ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ රාත්‍රී භෝජන සංග්‍රහයේ ආරාධිත දේශක ලෙස සහභාගී වීම.

xiii. 2022 සැප්තැම්බර් 20 දින කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ආදි සිසුන්ගේ උපාය මාර්ගික සංසදයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xiv. 2022 සැප්තැම්බර් 30 දින කොළඹ තේ ව්‍යාපාරිකයන්ගේ සංගමයේ 128 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා සහ ප්‍රධාන දේශක ලෙස සහභාගී වීම.

xv. 2022 ඔක්තෝම්බර් 22 දින කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ වාර්ෂික රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xvi. 2022 ඔක්තෝම්බර් 25 දින "ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය - ආර්ථික අර්බුදයේ සිට යථා තත්ත්වයට පත්වීම දක්වා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග" යන මැයෙන් පැවති දේශනයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xvii. 2022 නොවැම්බර් 15 දින බැංකු විදු පියෙස (CBS) විසින් සංවිධානය කරන ලද අයවැය විවරණයෙහි ප්‍රධාන දේශනය පැවැත්වීම.

xviii. 2022 නොවැම්බර් 15 දින ඉදිකිරීම් කර්මාන්තය තුළින් කර්මාන්ත අංශයේ ගැටලු විසඳීම සහ ආර්ථිකය ඉහළ නංවාලීම සඳහා වූ සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xix. 2022 නොවැම්බර් 19 දින මාතර රාහුල විද්‍යාලය විසින් සංවිධානය කරන ලද ඕල්කට් රාත්‍රියේ (Olcott Night) ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xx. 2022 නොවැම්බර් 22 දින 2022 වසරේ අන්තර්ජාල දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය විසින් සංවිධානය කරන ලද උත්සවයෙහි සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.

xxi. 2022 නොවැම්බර් 22 දින ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අයවැය පසු විපරම සම්මන්ත්‍රණයේ සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.

xxii. 2022 නොවැම්බර් 24 දින කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර ආර්ථික විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද උත්සවයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxiii. 2022 නොවැම්බර් 25 දින ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලකවරුන්ගේ විද්‍යාලයේ 29 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසියේ පදවි ප්‍රාප්තිය සහ සමාරම්භක උත්සවයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxiv. 2022 නොවැම්බර් 26 දින කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවයේ ප්‍රධාන දේශක ලෙස සහභාගී වීම.

xxv. 2022 නොවැම්බර් 28 දින සී. ටී. සී. එල්. එස්. ඒ. සුරැකුම්පත් (පුද්ගලික) ආයතනය විසින් (CT CLSA Securities (Pvt) Ltd) විදේශ ආයතනික ආයෝජකයන් සඳහා වූ වාර්ෂික ආයෝජක සංසදයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxvi. 2022 නොවැම්බර් 30 දින ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වය පත්කිරීම සඳහා වූ පෙර දැක්ම" (The Road Map for Economic Recovery of Sri Lanka) පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ගෞරවනීය ආරාධිතයා ලෙස සහභාගී වීම සහ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxvii. 2022 දෙසැම්බර් 02 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) තිරසාරභාවය සහ ඩිජිටල් ව්‍යාපාර - 2022 පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xxviii. 2022 දෙසැම්බර් 02 දින වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (CPFA) සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (APFASL) 2022 වසරේ වාර්ෂික සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxix. 2022 දෙසැම්බර් 03 දින බැංකුකරුවන්ගේ මූල්‍ය වෙළඳ සංගමයේ 125 වැනි සංවත්සර උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xxx. 2022 දෙසැම්බර් 05 දින 58 වැනි අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) අධිපතිවරුන්ගේ සම්මේලනයේ මාර්ගගත දේශනය පැවැත්වීම.

xxxi. 2022 දෙසැම්බර් 06 දින 2022 වසරේ ශ්‍රී ලංකා ආර්ථික සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxxii. 2022 දෙසැම්බර් 06 දින ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම සහ තිරසාර වර්ධනය සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ ඉහළ මට්ටමේ වට මේස සාකච්ඡාව සඳහා සම්බන්ධ වීම.

xxxiii. 2022 දෙසැම්බර් 09 දින ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ වාර්ෂික ජාත්‍යන්තර සමුළුවේ සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම සහ ප්‍රධාන දේශනය පැවැත්වීම.

### 15.6 උසස් කිරීම්/පත් කිරීම්

i. ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහත්මිය 2022 දෙසැම්බර් 01 දින සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නම් කරන ලදී.

ii. කේ. එම්. ඒ. එන්. දවුලගල මහත්මිය 2022 ඔක්තෝම්බර් 07 දින සිට නියෝජ්‍ය අධිපති ලෙස උසස් කරන ලදී.

iii. බී. එල්. ජේ. එස්. බාලසූරිය මහතා 2022 පෙබරවාරි 03 දින සිට ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු ලෙස මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

iv. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ආර්. ඒ. ඒ. පෙරේරා මහතා 2022 ජනවාරි 01 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2022 අප්‍රේල් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

v. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර මහතා 2022 ජනවාරි 01 දින සිට දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2022 අප්‍රේල් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

vi. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආර්. එම්. සී. එච්. කේ. ජයසිංහ මහත්මිය 2022 ජනවාරි 03 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

vii. අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩබ්. ආර්. එම්. කේ. ප්‍රනාන්දු මහතා 2022 අප්‍රේල් 08 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) ලෙස ද, අනතුරුව 2022 අප්‍රේල් 12 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

viii. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජී. ඩී. පී. ඩී. ජයතිලක මහතා 2022 අප්‍රේල් 12 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

ix. මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ඩී. ආර්. කරුණාරත්න මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

x. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඊ. එච්. මොහොට්ටි මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xi. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය එච්. කේ. ජේ. ඒකනායක මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xii. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ඒ. අයි. එන්. වික්‍රමසිංහ මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xiii. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී පී. ඩී. ආර්. දයානන්ද මහතා 2022 අප්‍රේල් 17 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

xiv. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්. ජී. එස්. එස්. ජේ. කීර්තිරත්න මහත්මිය 2022 මැයි 06 දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xv. මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්. එම්. ප්‍රියංකර මහතා 2022 මැයි 06 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ අතිරේක ලේකම් ලෙස පත් කරන ලදී.

xvi. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජී. සී. ඒ. ආරියදාස මහතා 2022 මැයි 06 දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xvii. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එන්. ඩී. වයි. සී. වීරසිංහ මහතා 2022 මැයි 06 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස ද, අනතුරුව 2022 දෙසැම්බර් 06 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස ද පත් කරන ලදී.

xviii. ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී. කේ. මායාදුන්න මහත්මිය 2022 මැයි 06 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද, පසුව 2022 ජූනි 15 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී. ඉන් අනතුරුව, ඇය 2022 ජූලි 01 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xix. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ආචාර්ය ඊ. ඩබ්. කේ. ජේ. බී. ඇහැලේපොල මහතා 2022 ජූනි 16 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xx. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්. ආර්. විජේවර්ධන මහතා 2022 ජූලි 14 දින සිට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxi. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. වී. කේ. අල්විස් මහතා 2022 ජූලි 14 දින සිට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxii. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඩී. එල්. නිහාල් මහතා 2022 ජූලි 14 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xxiii. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඩබ්. එල්. එස්. ඩබ්. ජයසුන්දර මහත්මිය 2022 ජූලි 14 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xxiv. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්. එම්. පී. බී. හේරත් මහතා 2022 ජූලි 14 දින සිට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

## 15.7 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

i. 2022 ජනවාරි 01 දින සිට මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ, ආචාර්ය සී. අමරසේකර මහතා, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ii. 2022 අප්‍රේල් 08 දින සිට නියෝජ්‍ය අධිපති කේ. එම්. එම්. සිරිවර්ධන මහතා, භාණ්ඩාගාර ලේකම් ලෙස මුදල් අමාත්‍යාංශය වෙත.

iii. 2022 අප්‍රේල් 11 දින සිට මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ (ආයතනික සේවා), එෆ්. ආර්. බන්සජයා මහත්මිය මුදල් අමාත්‍යාංශය වෙත.

iv. 2022 අප්‍රේල් 11 දින සිට කළමනාකරණ සහකාර පන්තියේ II ශ්‍රේණියේ (නැවත ශ්‍රේණිගත කරන ලද) එම්. ජී. අශෝක මහතා මුදල් අමාත්‍යාංශය වෙත ද, අනතුරුව 2022 ජූනි 01 දින සිට නැවත මහ බැංකුව වෙත.

v. 2022 සැප්තැම්බර් 12 වන දින සිට මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියේ (ආයතනික සේවා) එම්. ඉසෙඩ්. එන්. හනීෆා මහත්මිය පරිපාලන සහකාරවරියක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

### 15.8 විශ්‍රාම ගැනීම්/ සේවයෙන් ඉල්ලා අස්වීම්

2022 වසර තුළ දී, නියෝජ්‍ය අධිපතිවරයෙක්, සහකාර අධිපතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් තිදෙනෙක්, අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙක් සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙක් ඇතුළුව සේවකයින් 42 දෙනෙකු බැංකු සේවයෙන් විශ්‍රාම ගනු ලැබීය. දෙපාර්තමේන්තු ප්‍රධානියෙක්, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් සහ කොන්ත්‍රාත් සේවකයන් තිදෙනෙක් ඇතුළුව සේවකයන් 51 දෙනෙකු බැංකු සේවයෙන් ඉල්ලා අස්විය.

## 16. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු ඒකාබද්ධ මෘදුකාංග සපයමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව (තො.තා.දෙ.) එහි ක්‍රියාකාරී කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී. තො.තා.දෙ. විසින් ව්‍යවසාය මට්ටමේ ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ විසඳුම් සහ ආයතනික සේවා සපයන අතරම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා ආරක්ෂාව අඛණ්ඩව වැඩි දියුණු කරන ලදී.

වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ සිය සේවාවන් සපයන ලදී. (අ) පිරිවැය-ඵලදායී මෘදුකාංග විසඳුම් ලබා දීම, (ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම, (ඇ) අති නවීන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් පිහිටුවීමට දායක වීම, (ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ (ඉ) තොරතුරු තාක්ෂණ සේවා කවුළු සහාය සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා වැඩිදියුණු කිරීම.

**(අ) පිරිවැය-ඵලදායී මෘදුකාංග විසඳුම් ලබා දීම**

අපනයන ආදායම නැවත මෙරටට ගෙන්වා ගැනීම සහ එම අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවට (DFE) පහසුකම් සැලසීම සඳහා තො.තා.දෙ. විසින් අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතියක් (EPMS) නිර්මාණය කරන ලදී. මෙම පද්ධතිය මගින් ශ්‍රී ලංකා රේගුවෙන් භාණ්ඩ අපනයනයට අදාළ දත්ත දෛනික පදනමින් ග්‍රහණය කර ගන්නා අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) මගින් සතිපතා ලබාගත් අපනයන ආදායම ආපසු ගෙන්වා ගැනීමේ දත්ත සමග ගැලපීම සිදු කරයි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කරන ලද සේවා අපනයනය සඳහා ලැබෙන ආදායම ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධ දත්ත ද මෙම දත්ත පද්ධතිය ග්‍රහණය කරයි. මෙම පද්ධතිය මගින් එකතු කර ගත් දත්ත හොඳින් විශ්ලේශනය කර නියාමනය සඳහා අවශ්‍ය වාර්තා සකස් කිරීමට සහ දත්ත මත පදනම් වූ නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට පහසුකම ලැබී ඇත.

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) හි ගනුදෙනුකරුවන්ගේ දේශසීමා විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා තො.තා.දෙ. විසින් සංවර්ධනය කරන ලද ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) තවදුරටත් වැඩිදියුණු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා දේශසීමා ගනුදෙනු දත්ත විශ්ලේෂණය කිරීමට උපකරණ පුවරු සකස් කරන ලදී. තවද, තො.තා.දෙ. විසින් ITRS හි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා LCBs සහ LSBs වෙත තාක්ෂණික සහාය අඛණ්ඩව ලබා දුන්නේය.

මූල්‍ය ආයතනවල අඛණ්ඩ අධීක්ෂණය සහ විභාග ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS-9) අනුකූලව මූල්‍ය තොරතුරු වාර්තා කිරීම සඳහා FinNet පද්ධතිය (LCBs, LSBs සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙතින් නියාමන දත්ත රැස් කිරීමේ පද්ධතිය) තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

නිරාකරණ සහ බලාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව (RED) සඳහා සියලුම බැංකු සහ මූල්‍ය සමාගම් වෙතින් නියමිත කාල පරතරයන්හිදී දත්ත රැස් කිරීම සඳහා තැන්පත්කරුවන්ගේ දත්ත එකතු කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම පද්ධතිය මොඩියුල තුනකින් සමන්විත වේ. එනම්, මූල්‍ය ආයතන සතු මහ බැංකුවට අවශ්‍ය තැන්පතු දත්ත වලංගු කිරීමට සහ ඉදිරිපත් කිරීමට හැකි වලංගු කිරීමේ මෙවලම, ඉදිරිපත් කරන ලද දත්තවල සාරාංශ තොරතුරු ලබා ගැනීමට RED සඳහා වන වෙබ් අතුරු මුහුණත සහ නියමිත කාල පරතරයන්හිදී FinNet හරහා නියාමන වාර්තා ඉදිරිපත් කිරීමේ මොඩියුලය වේ.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (EPFD) විසින් සිදුකරන මෙහෙයුම් කිහිපයක් ස්වයංක්‍රීය කිරීමට තො.තා.දෙ. තවදුරටත් පහසුකම් සලසා ඇත. අන්තර්ජාලය හරහා මෙන්ම අදාළ බැංකු කවුන්ටර හරහා සිදු කරන ලද සේවායෝජකයාගේ ගෙවීම් ප්‍රතිසන්ධානය කිරීම, ප්‍රතිලාභ මුදල් ගෙවීම් මුදා හැරීමට පෙර එම ගෙවීම්වලට අදාළ ශේෂ පිරික්සුම පරීක්ෂා කිරීම, අදාළ බැංකු හරහා ප්‍රතිලාභ මුදල් ගෙවීම් සැකසීම, වීසා බලපත්‍ර අරමුණු සඳහා විද්‍යුත් ලේඛන නිකුත් කිරීම, වසර තුළ ස්වයංක්‍රීය කරන ලද ක්‍රියාවලි කිහිපයකි.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ (CRD) මුදල් කවුන්ටර ක්‍රියාකාරිත්වය, අවශ්‍ය සියලුම වාර්තා සමග මුදල් කළමනාකරණ පද්ධතියට (CIMS) සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කරන ලද අතර, එමගින් කඩදාසි භාවිතය අවම කරන ලදී. තවද, CRD සඳහා නව ව්‍යාජ නෝට්ටු හඳුනාග ැනීමේ පද්ධතියක් සකස් කරන ලදී. මෙම පද්ධතිය මගින් මහ බැංකුව විසින් උසාවි නඩු සඳහා සපයන සියලුම තොරතුරු වාර්තා කරනු ලබන අතර, අනාගත අධිකරණ නඩු සඳහා විමර්ශන මූලාශ්‍ර ලබා දීම පහසු වේ. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD) විසින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම අංශයේ ව්‍යවසායන් වෙත බැංකු හරහා ප්‍රදානය කරන ලද ප්‍රතිමූල්‍යකරණය, පොලී සහනාධාර සහ ණය සහතික

යෝජනා ක්‍රම ණය පහසුකම් කළමනාකරණය කිරීමේ පද්ධතියක් තො.තා.දෙ. විසින් නිර්මාණය කරන ලදී. මෙම ක්‍රමය මඟින් ණය සැකසීම ක්‍රමවත් කිරීමටත්, එලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ. ඉහත පද්ධතියේ ප්‍රතිමූල්‍යකරණ මොඩියුලය සජීවීව ක්‍රියාත්මක කරන ලද අතර අනෙකුත් මොඩියුලවල නිර්මාණ කටයුතු සිදු වෙමින් පවතී.

භාණ්ඩාගාරයේ මුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි පද්ධතිය තුළින් පළමු අදියරේදී සම්පූර්ණයෙන්ම පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර, සෘජු නිකුතු කවුළුවක් හරහා නිකුත් කිරීමේ පහසුකම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව (PDD) වෙත ලබා දෙන ලදී.

මහ බැංකුව තුළ තොරතුරු තාක්ෂණ වත්කම්වල ජීව කාලය කාර්යක්ෂම හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ස්ථාවර වත්කම් සඳහා තොග කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

මාණ්ඩලික සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (SSMD) විසින් සිදු කරනු ලබන කාර්ය මණ්ඩල ණය සැකසීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තො.තා.දෙ. විසින් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (SBS) සඳහා නව සහ වැඩිදියුණු කළ වෙබ් පාදක ණය ප්‍රදානය කිරීමේ පද්ධතියක් සකස් කරන ලද අතර කාර්ය මණ්ඩලය සඳහා නව සහ වැඩිදියුණු කළ නිවාස ණය ප්‍රදානය කිරීමට පද්ධතියක් ද (SHL) සකස් කිරීම ආරම්භ කරන ලදී.

විගණන උපදේශක කමිටුවේ (AAC) නිර්දේශ පරිදි අභ්‍යන්තර වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීය කරන කාර්ය විමසුම් පද්ධතිය (Task Tracker System) නව කාර්ය ප්‍රවාහයක් ඇතුළත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කරන ලදී.

ඉහත සඳහන් කර ඇති සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අමතරව, මහ බැංකුවේ මෙහෙයුම් සඳහා වැදගත් වන තවත් නව පද්ධති සහ වැඩිදියුණු කිරීම් කිහිපයක් තො.තා.දෙ. විසින් කරන ලදී.

ISO 20022 SWIFT MX සංක්‍රමණය සඳහා වන SWIFT මාර්ගෝපදේශයන්ට අනුකූල වීම සඳහා, මහ බැංකුවේ පොදු ලෙජර පද්ධතිය වන iGLAS හි බාහිර පණිවිඩ සඳහා දැනට පවතින SWIFT MT පණිවිඩ ආකෘති ISO 200022 MX පණිවිඩ ආකෘති බවට පරිවර්තනය කිරීම සාර්ථකව පරීක්ෂා කරන ලදී. තො.තා.දෙ. විසින් මහ බැංකුවේ දෙපාර්තමේන්තු වල විශේෂ දත්ත අවශ්‍යතා සඳහා දත්ත ලබා දෙන අතර මෘදුකාංග පද්ධති සහ ඒ ආශ්‍රිත ක්‍රියාවලි සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන ක්‍රියාවලීන් සඳහා ද පහසුකම් සපයන ලදී.

තවද, තො.තා.දෙ. විසින් දෙපාර්තමේන්තු කිහිපයක භෞතික ලේඛන ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සම්පූර්ණ කරමින්, ලේඛන හැසිරවීමට අදාළ පුද්ගල එලදායිතාව වැඩි කරමින් ලේඛන කළමනාකරණ පද්ධතියේ (DMS) භාවිතය තවදුරටත් පුළුල් කළේය.

**(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම**

බැංකුවේ භාවිතා වන සියලු තොරතුරු තාක්ෂණ පද්ධති නවීන තාක්ෂණික සංවර්ධනයන්ට ඔරොත්තු දෙන පරිදි, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වසර තුළදී නඩත්තු කරන ලදී.

විදුලි සංදේශ කර්මාන්ත සංගමය (TIA) 942 Rated-3 ප්‍රමිතියට අනුකූල වන පරිදි තො.තා.දෙ. විසින් නව ප්‍රධාන කාර්යාල දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීම අවසන් කරන ලදී. මෙය පරිගණක උපකරණ සඳහා සේවා සපයන, අතිරික්ත ධාරිතා සංරචක සහ බහු ස්වාධීන බෙදාහැරීමේ මාර්ග ඇති දත්ත මධ්‍යස්ථානයකි.

ඉහත නව දත්ත මධ්‍යස්ථානය සමගින්, අධිවේගී ප්‍රකාශ තන්තු (fibre) සහ ගිගාබිට් ඊතර්නෙට් (Gigabit Ethernet) හරහා අවසාන පරිශීලකයා දක්වා මූල බන්ධකය (backbone) පුළුල් කරමින් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ තත් ප්‍රදේශ ජාලය (Local Area Network) වැඩිදියුණු කිරීමට තො.තා.දෙ. සැලසුම් කර ඇත.

**(ඇ) අති නවීන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට දායක වීම**

වසර තුළ ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කිහිපයකට තො.තා.දෙ. විසින් තාක්ෂණික විශේෂඥතාව ලබා දෙන ලදී.

තො.තා.දෙ. විසින් ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධති නවීකරණ ව්‍යාපෘතියට දායක වූයේ පද්ධති ක්‍රියාවට නැංවීමේ විෂය පථය සැලසුම් කිරීම සහ පරීක්ෂා කිරීමේ අදියරවලදී ක්‍රියාකාරී මැදිහත්වීමෙනි.

**(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම**

තො.තා.දෙ., බැංකුවේ සියලුම තොරතුරු තාක්ෂණ වත්කම් සුරක්ෂිත කිරීමට පියවර ගත් අතර බැංකුවේ සියලුම සේවකයින් සඳහා ආරක්ෂිතව නිවසේ සිට රාජකාරි කිරීමේ (WFH) පරිසරයක් සඳහා අවශ්‍ය පරිදි පහසුකම් සැලසීය. මහ බැංකුවේ තොරතුරු සුරක්ෂිතතාව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ලේඛනය වන තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය සහ ලැප්ටොප් භාවිත ප්‍රතිපත්තිය ඇතුළත් කරමින් යාවත්කාලීන කරන ලදී.

මෘදුකාංග යෙදුම්වල අභ්‍යන්තරව සිදු කරනු ලබන නිරන්තර අවදානම් තක්සේරු (Vulnerability Assessment) කිරීම්වලට අමතරව, ඕනෑම සයිබර් ආරක්ෂණ තර්ජනයක් සඳහා පද්ධති හොඳින් සූදානම් බව සහතික කිරීම සඳහා මූල්‍ය පණිවුඩකරණ ජාලය ආශ්‍රිත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පිළිබඳ අවදානම් තක්සේරුවක් ද සිදු කරන ලදී. ඉහළ මට්ටමේ ආරක්ෂාවක් සහතික කිරීම සඳහා මූල්‍ය පණිවිඩ ජාලය සහ අනෙකුත් තීරණාත්මක මෙහෙයුම් පද්ධති ඉලක්ක කර ගනිමින් බාහිර තොරතුරු ආරක්ෂණ තක්සේරුවක් ද සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්ට අලුතින් හඳුන්වා දුන් ආරක්ෂක ප්‍රතිපත්ති, දත්ත වර්ගීකරණය සහ දත්ත උපස්ථ ක්‍රම (data backup methods) පිළිබඳව දැනුම සහ මග පෙන්වීම ලබා දීම සඳහා අතථ්‍ය පරිශීලක දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තතුබෑම් (phishing) ඊමේල් හඳුනා ගැනීම පිළිබඳ පරිශීලක දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා තතුබෑම් අනුකරණ සිදු කරන ලදී.

**(ඉ) තොරතුරු තාක්ෂණ සේවා කවුළු සහාය සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා වැඩිදියුණු කිරීම**

නිවසේ සිට රාජකාරී කිරීම සඳහා තො.තා.දෙ. මගින් සහය ලබා දුන් අතර, බැංකුවේ දෛනික මෙහෙයුම් දිගටම අඛණ්ඩව කරගෙන යාමට එනිසා හැකි විය. තවද පද්ධති වෙත ආරක්ෂිතව ප්‍රවේශ වීමේ අවස්ථාව සහතික කරමින් මෘදුකාංග භාවිතය පිළිබඳ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් ප්‍රශස්ත ක්‍රමවේද භාවිත කිරීමට සේවකයන්ට අවස්ථාව සලසන ලදී. විවිධ අභියෝග මධ්‍යයේ තො.තා.දෙ. අභ්‍යන්තර තාක්ෂණික සේවා කවුළුව (Help desk) සියලුම සේවා විමසුම් සඳහා එකවර සහය ලබා දීමට සමත් වූ අතර තොරතුරු තාක්ෂණ ප්‍රමිතීන්ට සමගාමීව තීරණාත්මක යටිතල පහසුකම් (99.5% ට වැඩි) ඉහළ මට්ටමක පවත්වා ගෙන ගියේය.

කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නිපුණතා නංවාලීම සඳහා සහ බැංකුව තුළ වඩාත් තාක්ෂණික දැනුමක් ඇති සහ නව අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාවැති සේවක ප්‍රජාවක් ඇති කිරීම සඳහා, තො.තා.දෙ. විසින් දැනුම්වත් කිරීමේ බැනර් අන්තර්ජාලයේ ප්‍රකාශයට පත් කිරීම සහ කාර්ය මණ්ඩලය වෙත විද්‍යුත් තැපැල හරහා ආරක්ෂක උපදේශන ඇඟවීම් බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව, තො.තා.දෙ. හි කාර්ය මණ්ඩලය, බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල සහ අදාළ යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ දියුණුව පිළිබඳ ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර අතථ්‍ය වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා ක්‍රියාකාරීව සහභාගී වූහ.

## 17. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අරමුණ සහ මෙහෙවර, කාර්ය වපසරිය, අධිකාරී බලය, වගකීම, ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයේ අන්තර්ගතව ඇත. විගණන කටයුතු සිදු කිරීමේ දී අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ අන්තර්ජාතික වෘත්තීය පරිචය රාමුව (International Professional Practices Framework of Institute of Internal Auditors) අනුගමනය කරනු ලබයි. 2022 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 17.1 අභ්‍යන්තර විගණන සැලසුම්

2023-2026 සඳහා උපාය මාර්ගික විගණන සැලැස්ම සහ 2023 වසර සඳහා වාර්ෂික විගණන සැලැස්ම සකස් කොට 2022 දෙසැම්බර් මස අග දී මුදල් මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

### 17.2 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

**(අ) ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන්**

2022 වසරේ දී, ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන් සිදු කරන ලදී. සෑම විගණනයක්ම පිළිවෙලින් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, විගණන ප්‍රතිඵල සන්නිවේදනය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල පසු විපරම් කිරීම යන පියවර හතරකින් ක්‍රියාත්මක කරන ලදී. විගණන වාර්තා හතළිස් හතක් (47) වසර තුළ දී නිකුත් කර ඇති අතර ප්‍රතිපත්ති, අනුකූලතා, මෙහෙයුම්, නෛතික සහ වෙනත් අදාල අවදානම් ආවරණය කරමින් විගණන නිරීක්ෂණයන් සහ නිර්දේශයන් සමග අදාල දෙපාර්තමේන්තු වෙත සන්නිවේදනය කරන ලදී.

**(ආ) ප්‍රගතිය වාර්තා කිරීම**

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවට වාර්තා කරන ලදී. එමෙන්ම කරන ලද විගණනයන්හි වාර්තා මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව හරහා ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරීට ඉදිරිපත් කරන ලදී. තව ද 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූලව සහ මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අභ්‍යන්තර විගණන වාර්තාවල අන්තර්ගතයන් මුදල් අමාත්‍යාංශයේ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලදී.

### 17.3 තත්ත්වය ඇගයීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන්

වර්ෂය තුළ දී විගණන කටයුතු පිළිබඳ අඛණ්ඩ ප්‍රගති අධීක්ෂණයන් (Ongoing Monitoring of Performance) සහ කාලානුරූප ස්වයං තක්සේරුකරණයන් (Periodic Self-Assessment) සිදු කරන ලද අතර ඒවායේ ප්‍රතිඵලයන් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව හරහා මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

### 17.4 ධාරිතා ඉහළ නැංවීම සහ දැනුවත් කිරීම

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අදාල විවිධ විෂය පථයන් සම්බන්ධව ධාරිතා ඉහළ නැංවීමේ වැඩසටහන් වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තව ද විගණන සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා "අභ්‍යන්තර විගණන පහසුකම් සැපයීමේ මාර්ගෝපදේශ මාලාව" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ පළමු කාර්තුවේ දී සිදු කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා තොරතුරු පද්ධති විගණන වෘත්තිකයෙකු විසින් ආරාධිත දේශනයක් සිදු කරන ලදී.

### 17.5 මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු මත මුදල් මණ්ඩලයට උපදෙස් දීම එමගින් සිදු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. ඒ අනුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ලේඛන කටයුතු සඳහා පහසුකම් සැලසීම සිදු කරයි. තව ද මෙම කාලපරිච්ඡේදය තුළ දී මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල පසු විපරම් කිරීම ද කාලානුරූපව සිදු කරන ලදී.

## 18. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව, නිල විදේශ විනිමය සංචිත කළමනාකරණ සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් අධීක්ෂණ කාර්යයන් විධිමත්ව හා සුමටව ක්‍රියාත්මක කිරීමේ කාර්යභාර්ය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

### 18.1 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවේ (IRIOC) පුළුල් මගපෙන්වීම යටතේ සකස් කර, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (Investment Policy Statement) සහ ආයෝජන මාර්ගෝපදේශයන්ට (Investment Guideline) අනුකූලව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ. වත්කම් හා වගකීම් ව්‍යුහයට අනුකූලව ගොඩනැගූ විද්‍යාත්මක රාමුවක් මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 වසරේ සිට විදේශ සංචිත කළමනාකරණය සිදු කරනු ලබන අතර, මෙම විද්‍යාත්මක රාමුව ගොඩනැගීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානම දැරීමේ සීමාවන්ට යටත්ව, ද්‍රවශීලතා අවශ්‍යතා, ප්‍රාග්ධන සංරක්ෂණය සහ ආදායම් උත්පාදනය යන කරුණු ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගැනුණි.

2022 වසර ඉතිහාසයේ වඩාත් ම අභියෝගාත්මක වසර සනිටුහන් කළ අතර, එම වසර තුළ දී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට සිය සම්මත සංචිත කළමනාකරණ මෙහෙයුම් කටයුතු සීමා කරමින්, වඩාත් කාලානුරූපී සහ අවස්ථානුකූල වූ විශේෂිත ප්‍රවේශයන් අනුගමනය කිරීමට සිදු විය. 2020 වසරේ සිට පැන නැගුණු පෙර නොවූ විරූ ආකාරයේ විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය මෙන් ම, ගෝලීය වශයෙන් ඇති වූ විවිධ අහිතකර තත්ත්වයන් හේතුවෙන් 2021 මැද භාගයේ සිට සාම්ප්‍රදායික සංචිත කළමනාකරණ අරමුණු වෙනස් මානයකට යොමු කෙරිණි. විදේශ මුදල් ද්‍රවශීලතාවයේ උග්‍ර හිඟයක් ඇතිවීම මෙරට ප්‍රමුඛත ම ප්‍රශ්නයක් බවට පත්වීමත් සමග, ශ්‍රී ලංකාවට දැඩි අභියෝගවලට මුහුණ දීමට සිදු විය. මූලික වශයෙන් ඉන්ධන, ඉවුම් කටයුතු සඳහා භාවිතා කරන ගෑස් සහ ගල් අඟුරු යන අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල ඇතිවූ දැඩි හිඟයයන් සමග, 2021 වසරේ සිට මෙම විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය අතිශය අර්බුදකාරී තත්ත්වයකට පත් වූ අතර, 2022 පළමු කාර්තුව අවසන් වන විට එම තත්ත්වය පෙර නොවූ විරූ මට්ටමකට උග්‍ර විය. මෙම තත්ත්වය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය අර්බුදය පාලනය කිරීම උදෙසා විශේෂිත ක්‍රියාමාර්ග භාවිත කිරීමටත්, අත්‍යවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම් අවම වශයෙන් හෝ පවත්වා ගනු පිණිස අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා අවශ්‍ය විදේශ විනිමය සපුරාලීම සඳහා හිඟ විදේශ සංචිත ප්‍රශස්ත ලෙස යෙදවීමටත් සිදුවිය. අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සම්බන්ධයෙන් දැඩි පීඩනකාරී තත්ත්වයන් සහ දැවැන්ත මහජන විරෝධයක් නැගෙමින් තිබිය දී, අතිශය සීමිත හා ශීඝ්‍රයෙන් අඩුවෙමින් පැවති විදේශ සංචිතවලට සාපේක්ෂව විදේශ මුදල් ඉල්ලුම කළමනාකරණය කිරීම, මහ බැංකුවේ සංචිත කළමනාකරණ කණ්ඩායමට දැඩි අසීරු කාර්යයක් වූ අතර, විදේශ සංචිත කළමනාකරණයේ සම්පූර්ණ අවධානය ද්‍රවශීලතා කළමනාකරණය වෙත යොමු විය. 2022 අප්‍රේල් මාසයේ දී ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රවේශය ප්‍රකාශයට පත් කිරීමත් සමග, විදේශ විනිමය උපයෝගී කරගත යුතු ණය පියවීම, බහුපාර්ශ්වික සංවිධානවලින් ලබාගත් ණය පියවීම සඳහා පමණක් සීමා කෙරිණි.

එසේ වුව ද, සම්මත සංචිත කළමනාකරණ පිළිවෙත්වලින් බැහැරව කාලානුරූපී සහ අවස්ථානුකූලව විශේෂිත පියවර අනුගමනය කිරීමට මහ බැංකුවට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර අවසානයේ දී විදේශ මුදල් සඳහා පැවති දැඩි ඉල්ලුම ක්‍රමයෙන් අඩුවීමක් නිරීක්ෂණය කල හැකි හැකි වූ අතර, දේශීය වෙළෙඳපොළේ විදේශ මුදල් ද්‍රවශීලතාවයේ කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකි විය.

### 18.2 කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම්

විදේශ සංචිත මට්ටම්වල තියුණු පහත වැටීමක් තිබියදීත්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සුපුරුදු පරිදි දෛනිකව, මහ බැංකුව විසින් කළමනාකරණය කෙරෙන සංචිත සහ දළ නිල සංචිත සම්පාදනය කළ අතර උපලබ්ධි ප්‍රතිලාභ ප්‍රවේශය මත පදනම්ව සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වල කාර්යසාධනය තක්සේරු කළේය. සංචිත කළමනාකරණයේ කාර්යසාධනය විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත පිළිවෙලින් මාසික සහ කාර්තුමය පදනමින් ඉදිරිපත් කළ අතර, එහිදී සංචිත කළමනාකරණය හා සම්බන්ධ ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

නිල සංචිත ගොඩනගා ගන්නා තෙක්, කෙටි කාලීන විදේශ විනිමය ද්‍රවශීලතාවය තුළින් හෝ නිල සංචිත සඳහා යම් සහායක් ලබා ගැනීමේ අදහසින් ඉන්දියානු සංචිත බැංකුව, බංග්ලාදේශ බැංකුව සහ චීන මහජන බැංකුව යන කලාපීය මහ බැංකු සමග ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුම් කිහිපයක් ඔස්සේ විදේශ අරමුදල් සලසා ගැනීම සඳහා පියවර ගැනුණි. ඉන්දියානු සංචිත බැංකුව විසින් සපයන ලද ද්විපාර්ශවික මුදල් හුවමාරු පහසුකම දෙවන වර ලබා ගැනීම 2022 ජනවාරි මාසයේදී සිදු කළ අතර, බංග්ලාදේශ බැංකුව විසින් 2021

අගෝස්තු/සැප්තැම්බර් මාසවල දී සපයන ලද සහ දෙවරක් අලුත් කරන ලද ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම, 2022 දී තවදුරටත් අලුත් කරන ලදී. චීන මහජන බැංකුව සමග සිදු කරන ලද ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම තවත් මාස දොළහක කාලයක් සඳහා අලුත් කරන ලදී.

මේ අතර, අතිශය අභියෝගාත්මක ගෝලීය සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ වුව ද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී සක්‍රීය විදේශීය ගණුදෙනුකරුවන්ගේ මුදල් විශුද්ධිකරණයට එරෙහි හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ පිළිපැදීම් අනුකූලතාවන්ට අදාළ වාර්ෂික ඇගයීම සිදු කරන ලදී.

පෙර පැවති භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියේ බලපත්‍රය කල් ඉකුත් වූ පසු, මහ බැංකුව විසින් 2022 වසරේ දී නව සංචිත කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. නව සංචිත කළමනාකරණ පද්ධතියෙහි ප්‍රධාන පරිශීලකයා ලෙස, අනෙකුත් පරිශීලක දෙපාර්තමේන්තු සහ මෘදුකාංග සපයන්නා අතර නිසි සම්බන්ධීකරණයක් සහතික කරන අතර ම, මෙම සංචිත කළමනාකරණ පද්ධතියෙහි පද්ධති පරිපාලන ක්‍රියාකාරිත්වයේ වගකීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

## 18.3 දේශීය විදේශ විනිමය වෙළඳපොළ ප්‍රවණතා

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, වසර තුළ දී, උග්‍ර ද්‍රවශීලතා හිඟයකට මුහුණ දුන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ අධීක්ෂණය කිරීමේ හා මග පෙන්වීමේ කටයුතුවල සක්‍රීයව නිරත විය. 2021 සැප්තැම්බර් මාසයේ දී මහ බැංකුව විසින් සපයන ලද මාර්ගෝපදේශයන්ට අනුව 2022 මාර්තු මස මුල් කාලය දක්වා එ. ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකය රු. 200 - රු. 203 අතර පරාසයක පැවතුණි. කෙසේ වෙතත්, දළ නිල සංචිත තියුණු ලෙස පහළ යෑම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති සැළකිය යුතු පීඩන හේතුවෙන් 2022 මාර්තු 07 වන දින විනිමය අනුපාතිකයේ නිසි ගැලපීමක් සිදුවීමට ඉඩ දීමට මහ බැංකුව ගත් තීරණයෙන් පසුව, එ. ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය විය. අභියෝගාත්මක ද්‍රවශීලතා තත්ත්වයක් යටතේ සහ සක්‍රීය අන්තර්බැංකු විදේශ විනිමය වෙළඳපොළක් නොපැවති තත්ත්වයක් හමුවේ විනිමය අනුපාතිකයේ දිනක් තුළ සිදුවිය හැකි උච්චාවචනය නිසි මට්ටමකින් කළමනාකරණය කිරීමේ පියවරක් ලෙස, 2022 මැයි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත විචල්‍ය ආන්තිකයක් සමග විනිමය අනුපාතික මාර්ගෝපදේශයක් දෛනිකව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විනිමය අනුපාතිකයේ උච්චාවචන ක්‍රමානුකූලව ස්ථාවර වූ අතර, 2022 මැයි මාසයේ මැද සිට දෙසැම්බර් මාසයේ අවසානය දක්වා කාලය තුළ අන්තර්බැංකු විදේශ විනිමය වෙළඳපොළෙහි බර තබන ලද සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය එ. ජ. ඩොලරයකට රු. 360 - රු. 363 අතර පැවතුණි. 2022 මැයි මස මැද භාගයේ සිට, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත විචල්‍ය ආන්තිකය ද සමග එ. ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය සහ අනෙකුත් ජාත්‍යන්තර මුදල් ඒකක පනස් හයක් සඳහා මධ්‍ය විනිමය අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ දිනපතා ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී. මීට අමතරව, ප්‍රධාන මුදල් ඒකක නවයක් සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව විදුලි පැවරුම් සඳහා වූ මිලදී ගැනීමේ සහ විකිණීමේ විනිමය අනුපාතික සාමාන්‍ය අගයයන් ද ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ දෛනිකව ප්‍රකාශයට පත් කළේය.

2022 වසර තුළදී, මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් අනිවාර්යයෙන් රුපියල් බවට පරිවර්තනය කරන ලද භාණ්ඩ අපනයන ආදායමෙන් සහ රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සේවා අපනයන ආදායමෙන් කොටසක් මිල දී ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගල් අඟුරු සහ ඉන්ධන ආනයන මූල්‍යනය කිරීම සඳහා ඉහත ආදායමෙන් තවත් කොටසක් ස්වේච්ඡාවෙන් මහ බැංකුවට ලබා දෙන ලදී. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා, පවතින විදේශ විනිමය ගලා ඒම් තුළ සිය විදේශ විනිමය ගලා යෑම කළමනාකරණය කරමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස සියලුම බැංකුවලට උපදෙස් දෙන අතර ම, පුළුල් පරාසයකට අයත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන සඳහා විදේශ විනිමය මූල්‍යනය කිරීම වැනි නව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ද මහ බැංකුවට සිදු විය. මහජන නොසන්සුන්තාවයන් මධ්‍යයේ ආර්ථික කටයුතු පවත්වාගෙන යාමේ දී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා වන ඉල්ලීම්වල ජාතික වැදගත්කම හේතුවෙන් ඉන්ධන, ගෑස්, ගල් අඟුරු, ඖෂධ සහ ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ඉල්ලීම් සඳහා පහසුකම් සලසමින් ශුද්ධ විකුණුම්කරුවෙකු ලෙස මහ බැංකුව පෙනී සිටීම දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ලක්ෂණයක් විය. මෙම ප්‍රයත්නයේදී, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට රජය, රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන්, පුද්ගලික අංශයේ සහභාගිවන්නන් සහ ගනුදෙනුකරුවන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් සමග ඔවුන්ගේ විමසීම්/ගැටලු නිරාකරණය සඳහා සැලකිය යුතු කාලයක් කැප කිරීමට සිදු විය.

මේ අතර, විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන සහ අනවශ්‍ය විදේශ විනිමය තත්ත්ව ගොඩනැංවීම වළක්වමින් ඉහළ මට්ටමේ වෙළඳපොළ ක්‍රියාකාරීත්වයක් සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු/ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අදාළ ශුද්ධ විදේශ විනිමය අනාවරණ තත්ත්ව සීමාවන් එක් එක් බැංකුවල අවශ්‍යතා අනුව තාවකාලිකව සංශෝධනය කිරීමට පියවර ගත්තේය. වෙළඳපොළ අපේක්ෂාවන්ට අනුකූලව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රමවත්ව පවත්වාගෙන යෑම සහතික කිරීමේ වගකීමට අනුව, විනිමය අනුපාතිකයේ අනිසි උච්චාවචන මැඩපැවැත්වීම සඳහා සිය නිර්දේශ ලබා දුන් අතර, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු මෙන්ම,

බාහිර ආයතන විසින් යොමු කරන ලද විවිධ ප්‍රතිපත්ති, යෝජනා සහ රෙගුලාසිවලින් ඇති විය හැකි බලපෑම් පිළිබඳ සිය අදහස්, නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීම ද වසර තුළ දී සිදු කළේය.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ ලේකම්වරයා වශයෙන් අඛණ්ඩව කටයුතු කළ අතර, එම කමිටුවට වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සම්බන්ධව ඵලදායී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අදාළ සියලු තොරතුරු ලබා දුන්නේය. එමෙන්ම, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ සහ දළ නිල සංචිතවල ප්‍රවණතා පිළිබඳව මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත ද සිය අදහස් හා යෝජනා ලබා දුන්නේය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ප්‍රවණතා පිළිබඳ ගැටලු සහ ඉදිරි දැක්ම පිළිබඳව මුදල් මණ්ඩලය අඛණ්ඩව දැනුවත් කරමින් සුදුසු නිර්දේශ කාලානුරූපීව ලබා දීමට කටයුතු කළේය.

මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ සංවර්ධනය කිරීම මෙන් ම, වෙළඳපොළ අධීක්ෂණ කටයුතු වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිය දායකත්වය සහ නිර්දේශ අඛණ්ඩව ලබා දුන්නේය.

## 19. නීති හා අනුකූලතා

නීති දෙපාර්තමේන්තුව රටේ සාර්ව ආර්ථික ව්‍යාකූලත්වය හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක වටපිටාව නොතකමින් මහ බැංකුවේ සියලු උපාය මාර්ගික ප්‍රමුඛතා ළඟා කර ගැනීමට ක්‍රියාකාරීව දායක විය. එකී කාර්යය සඳහා 2022 වර්ෂය තුළ නීති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සමහරක් පහත පරිදි සාරාංශ ගත කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහනේ පූර්ව ක්‍රියාමාර්ග යක් වූ ශ්‍රී ලංකා මහ බැංකු පනත කෙටුම්පත් කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි විවිධ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව කටයුතු කරන ලද අතර 2019.11.01 වන දින එකී පනත් කෙටුම්පත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදී. මෙකී පනත් කෙටුම්පත ඉහතින් දැක්වූ පාර්ශවයන්ගේ ද සහාය ඇතිව මහ බැංකුකරණයේ නව්‍ය ක්ෂේත්‍රයන් ආවරණය කරනු වස් තව දුරටත් වැඩි දියුණු කරන ලදී. මෙම පනත් කෙටුම්පත වෙනත් කරුණු අතර, වැඩිදියුණු කරන ලද පාලන ප්‍රමිතීන්ගෙන් යුත් මහ බැංකුවේ ස්වාධීනත්වය, එහි අරමුණු සුරක්ෂිත කිරීම පිණිස පවතින උසස් මට්ටමේ පාලන මණ්ඩල ව්‍යුහයක්, වැඩි දියුණු කරන ලද නියාමන හා අධීක්ෂණ බලතල ආදී දෑ සඳහා ප්‍රතිපාදන සලසයි. මෙම කෙටුම්පත පනතක් ලෙස බලාත්මක වීමෙන් අනතුරුව 1949 අංක 58 දරන මුදල් නීති පනත අවලංගු වනු ඇත.

මීට අමතරව, 2022 දී, නීති දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ සහ නිරාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා නව නීති කෙටුම්පත් කිරීමේ නිරත විය. වෙළඳ නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනත, බැංකු (විශේෂ විධිවිධාන) පනත සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත් නව නීති අතරට ඇතුළත්ය. තවද, මහ බැංකුවේ නියාමන, අධීක්ෂණ සහ නිරාකරණ අධිකාරිය වැඩි දියුණු කිරීමේ අරමුණින් වත්මන් වෙළඳපල වර්ධනයන්ගෙන් පැන නගින අභියෝග රාශියකට විසඳුම් සැපයීම සඳහා අනෙකුත් අධීක්ෂණ දෙපාර්තමේන්තුවල සහයෝගයෙන් ද යුතුව නීති දෙපාර්තමේන්තුව විසින් 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සහ 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

2022 දී, රටේ ඇති වූ ආර්ථික පසුබෑමත් සමග මහ බැංකුවට එරෙහිව පවරන ලද නඩු කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් ඇති වූ අතර නීති දෙපාර්තමේන්තුව අදාළ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව බැංකුවේ බැඳියාවන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය කරුණු දැක්වීම් සිදු කරන ලදී. එමෙන්ම අනවසර මූල්‍ය සමාගම්, තහනම් යෝජනා ක්‍රමවලට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීම මෙන්ම මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කර ඇති මූල්‍ය සමාගම් ඈවර කිරීම සඳහා නඩු කටයුතු ආරම්භ කිරීම වැනි නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ යහපත සුරක්ෂිත කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව විසින් රටේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සමග එක්ව, ක්‍රියාමාර්ග ගැනීමද සිදු කරන ලදී.

මහ බැංකුවේ නියාමන අධිකාරිය වැඩි දියුණු කිරීම සහ එමගින් බැංකුකරණයේ සහ මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ව්‍යවස්ථා යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අනු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සහ සංශෝධනය කිරීමට මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග සක්‍රිය දායකත්වයෙන් කටයුතු කිරීමට නීති දෙපාර්තමේන්තුව සමත් විය. 2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ 2021 අංක 11 දරණ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත ඇතුළු පනත්වල අන්තර්ගත ප්‍රතිපාදනවලට නිරීක්ෂණ ලබා දෙමින් මහ බැංකුවෙන් පිටත සකස් කරන ලද පනත් සමාලෝචනය කිරීම සඳහාද නීති දෙපාර්තමේන්තුව දායක විය.

එපමණක් නොව, 2022 දී, විදේශීය සමපාර්ශවයන්ගේ අනුකූලතා අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමෙන් සහ මුදල් විශුද්ධිකරණය පදනම් කර ගනිමින් විදේශීය සමපාර්ශවයන් පිළිබඳ වාර්ෂික සමාලෝචනය කිරීමෙන් නීති දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ අනුකූලතා කර්තව්‍යය මෙහෙයවන ලදී. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට මහ බැංකුවේ අනුකූලභාවය සහතික කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා ඇති තොරතුරු දැනගැනීමේ ඒකකය 2022 වර්ෂය තුළ මහ බැංකුවට අදාළ තොරතුරු ඉල්ලීම් 188 ක් සහ අභියාචනා 23ක් හසුරුවා ඇත. තවද, තහනම් යෝජනා ක්‍රම, අනවසර මූල්‍ය ව්‍යාපාර, සහ මූල්‍ය සහ ලීසිං අංශයේ විකාශනය වන ගැටලු වැනි මූල්‍ය අංශයේ ගැටලු පිළිබඳව මහජනතාවගේ දැනුම පුළුල් කිරීමේ වැඩසටහන් සඳහා

නීති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව සහභාගී විය. නීති දෙපාර්තමේන්තු නිලධාරීන් බැංකුව නියෝජනය කරමින් බොහෝ සංවාදවල සම්පත් දායකයින් ලෙස කටයුතු කර ඇති අතර ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සමාලෝචනය කිරීම, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්හි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය, නිව් යෝර්ක් ෆෙඩරල් අධිකරණයේ හැමිල්ටන් රිසර්ව් බැංකුව මඟින් ගොනු කරන ලද නඩු කටයුත්ත, මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන රාමුව සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග සැලැස්ම ඇතුළත්ව අභ්‍යන්තර/බාහිර කමිටු රැසකටද නීති දෙපාර්තමේන්තුව විසින් තම දායකත්වය සපයා ඇත.

## 20. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මහ බැංකුවේ මූලික ව්‍යවස්ථාපිත අරමුණුවලින් එකක් වන රට තුළ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණ ඇතිව, මූල්‍ය පද්ධතියට බලපෑම් කළ හැකි පද්ධතිමය අවදානම් තක්සේරු කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් පුළුල් පරාසයක විශ්ලේෂණ සිදු කරනු ලබයි. මේ සඳහා නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන වලින්, ලැයිස්තුගත සමාගම්වලින් සහ වෙනත් විවිධ මූලාශ්‍රවලින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විශ්ලේෂණ සිදු කිරීම සඳහා දත්ත රැස් කරයි. මෙම විශ්ලේෂණවල ප්‍රතිඵල මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට පහසුකම් සපයන අතර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම පිණිස පද්ධතිමය අවදානම් අවම කිරීමට සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දීමට ද සහාය වේ. ඒ අනුව, මෙම විශ්ලේෂණ මූල්‍ය පද්ධති ස්ථායීතාවය ඇති කිරීමේ දී ක්ෂුද්‍ර විචක්ෂණ නියාමනයට සහ අධීක්ෂණයට අනුපූරක වේ.

නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් වාර්තා කරන ලද දත්ත මෙන්ම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් වෙනත් මූලාශ්‍රවලින් රැස් කරන ලද දත්ත ද භාවිතා කරමින් සාර්ව විචක්ෂණ නිරීක්ෂණ රාමුව මඟින් ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික වර්ධනයන්, මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සහ මූල්‍ය ආයතන අංශයෙන් මතුවන අවදානම් ආවරණය කරනු ලබයි. තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආයතනවල අවදානම් තක්සේරු කිරීම සඳහා ආතති පරීක්ෂණ සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවයට ඇති බලපෑම තක්සේරු කිරීම සඳහා ගෘහස්ථ හා ආයතනික අංශයේ වර්ධනයන් පිළිබඳ විශ්ලේෂණ ද සිදු කරනු ලබයි. තවදුරටත්, දේශීය මූල්‍ය පද්ධතියේ විවිධ උප අංශවල ස්ථායීතාවය සහ ශක්තිමත්භාවය තක්සේරු කිරීම සඳහා සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක ගණනාවක් අඛණ්ඩව සම්පාදනය කරන අතරම මෙම දර්ශකවල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. එවැනි විශ්ලේෂණවලින් අනතුරුව, 2022 වසර තුළ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ අනෙකුත් කාලීන කරුණු ඉස්මතු කරමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා ඇතුළු මුදල් මණ්ඩල පත්‍රිකා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. තවද, තිරසාර මූල්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව පහසුකම් සැලසීම සිදු කරන ලද අතර ඒ සඳහා වෙනම ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කරන ලදී. 2022 වසර තුළ දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

### (අ) ආතති පරීක්ෂණ රාමුව

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් තාක්ෂණික සහාය ද ඇතිව වැඩි දියුණු කරන ලද ගතික නුබුන්වත් ආතති පරීක්ෂණ (Dynamic Solvency Stress Testing) බැංකු අංශය සඳහා ද්විවාර්ෂික පදනමින් සිදු කරන ලදී. ගතික නුබුන්වත් ආතති පරීක්ෂණ ආකෘතිය උපකල්පිත නමුත් පිළිගත හැකි අවස්ථා යටතේ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම තුළින් සාර්ව විචක්ෂණ දෘෂ්ටිකෝණයක් සපයයි. බැංකු අංශය පිළිබඳ විස්තරාත්මක දත්ත රැස් කිරීමට සහ ආතති පරීක්ෂණ සඳහා සාර්ව ආර්ථික අවස්ථා සම්පාදනය කිරීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ අතර ආතති පරීක්ෂණ කාල රාමුව තුළ දී අවදානම් මොඩියුල සහිත ප්‍රමාණාත්මක මෙවලම් කට්ටලය ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත කම්පන මඟින් බැංකුවල ඔරොත්තුදීමේ හැකියාව මත ඇති කරන බලපෑම ඇගයීමට කටයුතු කළේය. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් උපකල්පිත සාර්ව ආර්ථික අවස්ථා මත පදනම්ව බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශය සඳහා ද්විවාර්ෂිකව ස්ථිතික නුබුන්වත් ආතති පරීක්ෂාව අඛණ්ඩව සිදු කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව වැඩි දියුණු කරන ලද, මුදල් ගලා ඒම් සහ ගලා යෑම් වල නොගැළපීම් හඳුනා ගනු ලබන කල් පිරීමේ ඉනිමං ආකෘතිය (Maturity Ladder Template) හරහා බැංකු අංශයෙන් එක් රැස් කළ දත්ත භාවිත කරමින් සිදු කළ ද්‍රවශීලතා ආතති පරීක්ෂණ මඟින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ පද්ධති අවදානම් විශ්ලේෂණය වැඩි දියුණු කළේය. ද්‍රවශීලතා ආතති පරීක්ෂණ රාමුව මඟින් පද්ධතිමය ද්‍රවශීලතා කම්පනවලට බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කරනු ලබයි.

මෙම වසර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු තාක්ෂණික සහාය ඇතිව බැංකු අංශයේ අන්තර් සම්බන්ධිතභාවය සහ සංස්පර්ශනය විශ්ලේෂණය සඳහා නව රාමුවක් සකස් කළේය. බැංකු අංශයේ අන්තර් සම්බන්ධිතභාවය සහ සංස්පර්ශණය විශ්ලේෂණයේ දී අන්තර් බැංකු නිරාවරණයන් තුළින් බැංකු අංශය කෙරෙහි ඇති වන අවදානම් පිළිබඳ මූලික අවධානය යොමු කරනු ලබන අතර නුබුන්වත්බව සහ ද්‍රවශීලතාව යන සාධක ද සැලකිල්ලට ගනිමින් රාජ්‍ය ව්‍යවසායන් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් තුළින් පැන නගින අවදානම් තක්සේරු කිරීම දක්වා ව්‍යාප්ත කරන ලදී. තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී අන්තර් සම්බන්ධිතභාවය සහ සංස්පර්ශණය පිළිබඳ නියමු විශ්ලේෂණයක් ද සිදු කරන ලදී.

### (ආ) සමීක්ෂණ, දර්ශක සහ දත්ත රැස් කිරීම

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය අවදානම පිළිබඳ ද්විවාර්ෂික සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලද අතර එය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට

ඇතිවිය හැකි පද්ධතිමය අවදානම් සහ දැඩි බලපෑමක් ඇති කළ හැකි සිදුවීම්වල වියහැකියාව පිළිබඳ වෙළඳපොළ සහභාගීවන්නන්ගේ ආකල්ප හඳුනාගැනීමට පවත්වන ඉදිරිදැක්මක් සහිත සමීක්ෂණයකි. මෙම අවදානම් යථාර්ථයක් බවට පත්වුවහොත් මූල්‍ය අතරමැදිකරණ ක්‍රියාවලියට බාධා එල්ල විය හැකි අතර මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසයට ද බලපෑම් කරනු ඇත. තවද, මූල්‍ය පද්ධතියේ දුර්වලතා පිළිබඳ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර තක්සේරු වලංගු කිරීම සඳහා ද පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය උපකාරී වේ.

තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් බැංකු අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය, මූල්‍ය වෙළඳපොළ ස්ථායීතා දර්ශකය සහ මූල්‍ය වෙළෙඳපොළ ස්ථායීතා දර්ශකය, බැංකු අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය භාවිතා කරමින් සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශකය යනාදී දර්ශක කිහිපයක් කාර්තුමය පදනමින් සම්පාදනය කරන ලදී.

දත්ත ගබඩාව වැඩි දියුණු කිරීමේ අරමුණින්, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන, කොළඹ කොටස් හුවමාරුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ණය තොරතුරු කාර්යාංශය වැනි බාහිර ආයතන වලින්ද අඛණ්ඩව විස්තරාත්මක දත්ත රැස් කරන ලදී.

**(ඇ) මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් ප්‍රකාශන සඳහා දායක වීම**

**මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය :** සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය මුහුණ දෙන අවදානම් මෙන්ම සලකා බලනු ලබන කාල සීමාව තුළ අනුගමනය කරන ලද අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කරනු ලබන මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශයට පත් කරන ලදී.

**ව්‍යවස්ථාපිත ප්‍රකාශන:** 2021 වසරේ මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා 2022 හි "මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව" යන පරිච්ඡේදය සම්බන්ධීකරණය කිරීම සහ සම්පාදනය කිරීම හරහා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රකාශන සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව අඛණ්ඩව දායක විය. තවද, මුදල් භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද රහස්‍ය වාර්තාවක් වන සැප්තැම්බර් 15 වාර්තාවේ මූල්‍ය පද්ධතියට අදාළ කොටස සැකසීමට ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය. මීට අමතරව, මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ උප අංශ පිළිබඳ විශ්ලේෂණ සැපයීම මගින් මහ බැංකුවේ අනෙකුත් ප්‍රකාශන සඳහා ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය.

**(ඈ) ආයතනික අංශය සහ ගෘහස්ථ අංශය විශ්ලේෂණය කිරීම**

ආයතනික සහ ගෘහස්ථ යන දෙඅංශයෙන් පැන නගින මූල්‍ය අවදානම් තක්සේරු කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණ සිදු කරයි. මේ අනුව, මූල්‍ය නොවන සමාගම් සඳහා නිදර්ශකයක් වන කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් පිළිබඳ තොරතුරු භාවිතා කරමින්, එම සමාගම් මගින් මූල්‍ය පද්ධතියට පැන නගින අවදානම් තක්සේරු කිරීම තුළින් ආයතනික අංශයේ දුර්වලතා කාර්තුමය පදනමින් විශ්ලේෂණය කෙරේ. මීට අමතරව, ගෘහ හා ආයතනික අංශවල ණය ගැතියන්ගෙන් පැන නගින මූල්‍ය අවදානම් තක්සේරු කිරීමට සහ පද්ධතිමය අවදානම් ගොඩනැගීම හඳුනා ගැනීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් එම ණයගැතියන්ගේ ණයගැතිභාවය විශ්ලේෂණය කරනු ලබයි. ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් බැංකු අංශයේ සහ බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්තුමය ණය දත්ත මත පදනම්ව එම විශ්ලේෂණය සිදු කෙරේ.

**(ඉ) මූල්‍ය පද්ධති ස්ථාවරත්වය පිළිබඳ කමිටු සම්බන්ධීකරණය**

**මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව:** මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම පිණිස පහසුකම් සැලසීම සඳහා මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය සඳහා පිහිටුවා ඇති මහ බැංකුවේ අන්තර් දෙපාර්තමේන්තු සංසදයක් වන මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවෙහි ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. විශේෂිත කරුණු සඳහා අත්‍යවශ්‍යම සාමාජිකයින්ට පමණක් සීමා කරන ලද රැස්වීම් හතක් ඇතුළුව මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු රැස්වීම් 11ක් 2022 වසර තුළ දී පවත්වන ලදී. කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා සහ මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය 2022 මුදල් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර සාමාජිකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලය (Financial System Oversight Council):** මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාව, ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම පිණිස මූල්‍ය අංශයේ නියාමන ආයතන අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීම සඳහා එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලයෙහි ලේකම් කටයුතු ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. ඒ අනුව, අදාළ මූල්‍ය අංශයේ නියාමකයින්ගේ විෂය පථය යටතේ එන අවදානම් සහ එවැනි කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට 2022 වසර තුළ මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිල රැස්වීම් දෙකක් පවත්වන ලදී.

**පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කමිටුව (Stakeholder Engagement Committee):** ආර්ථිකයේ මුදල් හා මූල්‍ය අංශවල අන්තර් සම්බන්ධිතභාවය, ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්වීම් සහ එක් අංශයක් අනෙක් අංශයට දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින්, විවිධ ක්ෂේත්‍ර සමූහයක සාමාජිකයින්ගෙන්

සමන්විත වන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කමිටුව 2022 වසරේ දී පිහිටුවන ලදී. ඒ අනුව, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව පාර්ශවකරුවන්ගේ සහභාගීත්ව කමිටුවෙහි රැස්වීම්වලට සහභාගී වීම, අවශ්‍ය විට දී සාර්ව මූල්‍ය වර්ධනයන් පිළිබඳ කමිටුව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම් සිදු කිරීම, කමිටු රැස්වීම්වල අදාළ සාකච්ඡාවලට සම්බන්ධ වීම සහ කමිටුව විසින් යෝජනා කරන ලද අදාළ ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.

**(ඊ) ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම**

ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පිළිබඳ පෙර දැක්මට සමගාමීව සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් තිරසාර මූල්‍යකරණයේ නියැලී සිටින දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් පෙර දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසන ලදී. තවද, මේ සම්බන්ධයෙන් පිහිටුවා ඇති අභ්‍යන්තර කමිටු සඳහා ලේකම් කාර්යාලය ලෙස ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව කටයුතු කළේය.

**(උ) ජාත්‍යන්තර නියෝජිතායතන සමග සම්බන්ධීකරණය**

සාර්ව විචක්ෂණතා සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා කාණ්ඩයේ සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කටයුතු කරයි. තවද, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පිළිබඳ පෙර දැක්මට අනුකූලව තිරසාර මූල්‍ය කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අධිකාරිය ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකුව සහ ආසියා සහ පැසිෆික් කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම ඇතුළු බහුපාර්ශ්වික ආයතන සමග සම්බන්ධීකරණය කළේය.

**(ඌ) අර්බුද කළමනාකරණ කමිටුවක් පිහිටුවීම**

මූල්‍ය අර්බුද යනු බොහෝ රටවල් පෙර සූදානම් වී නොමැති අඩු සම්භාවිතාවක් සහිත නමුත් ඉහළ බලපෑමක් ඇති සිදුවීම් වේ. එබැවින්, මූල්‍ය අර්බුදයක් ඇති වුවහොත් ඒ සඳහා පෙර සූදානම් වීම ශක්තිමත් කිරීමේ සහ එය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව ජාත්‍යන්තර නියෝජිතායතන සහ මහ බැංකුව විසින් හඳුනාගන්නා ලදී. මේ සඳහා කාලෝචිත සහ ඵලදායී ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා නෛතික, නියාමන සහ ආයතනික රාමුවක් ගොඩනැගීම අවශ්‍ය විය. එබැවින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සඳහා වූ සංසදයක් ලෙස මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුවක් පිහිටුවීම ලෝක බැංකුව විසින් අවධාරණය කරන ලදී. ඒ අනුව, අර්බුදකාරී කාල සීමාවන් තුළ දී ඵලදායී ලෙස මූල්‍ය අර්බුද කළමනාකරණය සඳහා මෙන්ම අර්බුද නොමැති කාලවකවානු තුළ දී රට මූල්‍ය අර්බුද සඳහා පෙර සූදානම් වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා ද ස්ථිර සංසදයක් වන අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවීමේ රාමුව සකස් කිරීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මූලිකත්වය ගත්තේය.

## 21. ගෙවීම් සහ පියවීම්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 5 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධතියේ පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු අධිකාරිය වේ. ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, කාර්යක්ෂමතාව, තරඟකාරිත්වය සහ ස්ථාවරත්වය ඇති කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය කිරීමට ජාතික ගෙවීම් පද්ධති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලැබේ.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සිදු කිරීම, අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT(ස්විෆ්ට්)) හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ස්විෆ්ට් පද්ධතිය කළමනාකරණය, ආසියානු නිෂ්කාශන සංගමය (ACU) සඳහා වන යාන්ත්‍රණ හරහා ගනුදෙනු සිදු කිරීම, ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම හා ගෙවීම් සේවා සපයන්නන්ගේ නියාමනය සහ අධීක්ෂණය, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ප්‍රධාන කාර්යයන් වේ.

### 21.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 62අ වගන්තිය මගින් අරමුදල් හුවමාරු සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීමට, ගෙවීම් සඳහා වන වගකීම් පියවීමට සහ සහභාගීත්ව ආයතන වෙත පද්ධති රීති නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලබා දෙන අතර, ඒ අනුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමග විවට වෙළඳපොළ මෙහෙයුම් මෙන්ම නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් සම්බන්ධ ගනුදෙනු පියවීම වැනි අන්තර් සාමාජිකයන්ගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ කාල සංවේදී සහ විශාල වටිනාකම් සහිත ගෙවීම්, තත්කාලීනව, දළ පියවීම් පදනම මත සිදු කිරීම සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී.

ජාත්‍යන්තර යහ භාවිතයන්ට අනුගත වෙමින්, රාජ්‍ය සුරැකුම්පත් පියවීම් පද්ධතිය සහ තත්කාලීන දළ පියවීම් පද්ධතියෙන් සමන්විත ලංකාසෙට්ල් පද්ධතියෙහි උපයෝගිතාවය වර්ෂය තුළ දී සාමාන්‍යයෙන් සියයට 99.75ක මට්ටමක පවත්වා ගෙන යන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අතිරේක අරමුදල් සඳහා ඉල්ලීම් කරන සහභාගීත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම් ලබා දීම අධීක්ෂණය කරන ලදී. තත්කාලීන දළ පියවීම්

පද්ධතියෙහි සහභාගීත්ව ආයතන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධතිය ඇතුලත් වේ.

2022 වර්ෂය අවසන් වන විට, තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන සංඛ්‍යාව 35 ක් විය. වර්ෂය තුළ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් ගනුදෙනු 638,733 ක් පියවා ඇති අතර එහි මුළු වටිනාකම රු. ට්‍රිලියන 827 කි. දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙළින් 2,661 සහ රුපියල් බිලියන 3,446 කි. එක් දින ද්‍රවශීලතා පහසුකම් සැපයීම පිළිබඳ මෙහෙයුම් කටයුතු වලදී, දෛනිකව සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 658.5 ක් සහභාගීත්ව ආයතන වෙත මුදා හැර ඇත.

## 21.2 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සිදු කිරීම

රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. 2022 වර්ෂය තුළ දී, විදේශ විනිමය අලෙවි සහ මුල්‍යායනය, මුදල් වෙළෙඳපොළ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනුම් /විකුණුම් ගනුදෙනු ඇතුළුව මුළු ගනුදෙනු 3,495 ක් සිදු කර ඇත.

### (ආ) විවට වෙළඳපොල කටයුතු, නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ආශ්‍රිත ගනුදෙනු පියවීම

වෙළඳපොල ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ආශ්‍රිත ගනුදෙනු පියවීමට අමතරව විවට වෙළඳපොල කටයුතු යටතේ ප්‍රතිමිලදී ගැනුම් /විකුණුම් සිදු කරන ලදී.

සමාලෝචනය කරනු ලබන කාලසීමාව තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රු. බිලියන 1,550.3ක් වටිනා ප්‍රතිමිලදී ගැනුම් 232ක්, රු. බිලියන 1,189.5ක් වටිනා ප්‍රතිවිකුණුම් 78ක්, රු. බිලියන 54,183.1ක් වටිනා නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 4,966ක්, රු. බිලියන 163,073.8 ක් වටිනා නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු 9563 ක් සහ රු. බිලියන 27.7ක් වටිනා ස්ථිර පදනම මත මිලදී ගැනීමේ ගනුදෙනු 43ක් සිදු කිරීම සහ පහසුකම් සැලසීම සිදු විය.

## 21.3 ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

පාලන විධිවිධාන, ක්‍රියාපටිපාටීන්, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයන් සහ පාලනය සම්බන්ධයෙන් ස්විෆ්ට් ජාලය විසින් නියම කර ඇති ක්‍රියාදාමයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම පරිශීලකයින් වෙනුවෙන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ස්විෆ්ට් පද්ධතිය කළමනාකරණය කරන ලදී.

2022 වර්ෂය තුළ, ස්විෆ්ට් පද්ධතිය ශක්තිමත් කිරීමට සහ ස්විෆ්ට් සේවය භාවිතා කරන්නන්හට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ස්විෆ්ට් ආයතනය විසින් සපයනු ලබන අනිවාර්ය යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී.

ස්විෆ්ට් ආයතනය විසින් ISO 20022 ප්‍රමිතියට මූල්‍ය පණිවුඩ විතැන් කිරීමේ ගෝලීය ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එය ඉහළ ආකෘතියක් සහිත විවෘත ප්‍රමිතියක් වන අතර වඩා හොඳ තොරතුරු ප්‍රවාහයකටද පහසුකම් සපයයි. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවද, ISO 20022 පණිවුඩකරණ ප්‍රමිතිය සඳහා අනුගත වීමට කටයුතු කරමින් සිටියි.

## 21.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සහ ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් අතර සුදුසුකම් ලද වෙළෙඳ කටයුතු ආශ්‍රිත ගනුදෙනු පියවීම සඳහා අඛණ්ඩව පහසුකම් සැලසීය. කෙසේ වෙතත්, 2022 ඔක්තෝබර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වාණිජ බැංකුවලට නැවත දැනුම් දෙන තුරු ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල බැංකු සමග ඍජුවම නිෂ්කාශන සංගමයෙන් පිටත යාන්ත්‍රණයක් භාවිතා කරමින් ඔවුන්ගේ වෙළෙඳ ආශ්‍රිත ගනුදෙනු පියවීම සඳහා උපදෙස් දෙන ලදී.

2022 ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා ආසියානු නිෂ්කාශන සංගමය සඳහා වන යාන්ත්‍රණය හරහා ක්‍රියාත්මක වූ ආනයන සහ අපනයනවලට අදාළ මුළු ගනුදෙනු සංඛ්‍යාව 3,301ක් වූ අතර මෙම ගනුදෙනුවල වටිනාකම පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,741.8 සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 181.9ක් විය.

2022 අප්‍රේල් මාසයේදී ඉන්දියානු සංචිත බැංකුව විසින් සංවිධානය කරන ලද ආසියානු නිෂ්කාශන සංගමයෙහි විශේෂ ස්ථාවර තාක්ෂණික කමිටු රැස්වීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගී වූ අතර 2022 මැයි මාසයේදී පාකිස්තාන මහ බැංකුව විසින් සංවිධානය කරන ලද ආසියානු නිෂ්කාශන සංගමයෙහි ස්ථාවර තාක්ෂණික කමිටුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ 50 වැනි රැස්වීමට ද සහභාගී විය.

## 21.5 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය, අවේක්ෂණ කටයුතු හා ගෙවීම් සේවා සපයන්නන්ගේ නියාමනය සහ අධීක්ෂණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ඩිජිටල් ගෙවීම් තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සලසන ලද අතර විද්‍යුත් ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා එහි නියාමන, අවේක්ෂණ සහ අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

(අ) අවශ්‍ය සුදුසුකම් සපුරාලීමෙන් පසු ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලංකාසෙට්ල් පද්ධතියේ ප්‍රාථමික සහභාගි කරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අවසර ලබා දෙන ලදී. බලපත්‍රලාභී විශේෂිත බැංකු අතර මෙම අවසරය ලබා ගත් පළමු බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි.

(ආ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව තත්කාලින දළ පියවීම් පද්ධතියේ සහභාගිකරුවෙකු වීමෙන් පසුව බලපත්‍රලාභී

විශේෂිත බැංකුවලට ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියේ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකත්වය ලබා ගත හැකි වන පරිදි 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත යටතේ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධි විධාන, සංශෝධනය කර නිකුත් කරන ලදී.

(ඇ) රට තුළට විදේශ ප්‍රේෂණ ගලා ඒම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම වන 'Lanka Remit' 2022 පෙබරවාරි මාසයේදී දියත් කරන ලද අතර, එමඟින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින්ට, ශ්‍රී ලංකාවට මුදල් යැවීමට සහ විදේශයන්හි නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පත් භාවිතයෙන් උපයෝගිතා බිල්පත් ගෙවීමට හැකියාව ලැබේ. තවද, 2022 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදෙස්ගත සේවා නියුක්තිකයින් අතර Lanka Remit ජංගම යෙදුම ප්‍රචලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

(ඈ) 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සමාලෝචනය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) තාක්ෂණික සහාය ලබා දීමේ මෙහෙය සඳහා එහි සාමාජිකයන් තිදෙනෙක් 2022 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැමිණෙන ලදී. ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද අභ්‍යන්තර කමිටුව ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් සහ තවත් බාහිර පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව එහි රැස්වීම් පවත්වන ලදී.

(ඉ) 2021 ඔක්තෝම්බර් මාසයේදී ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයට අදාල සංකල්ප සාධනය සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව සඳහා, සුදුසු ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේද යෙදුමක් මිලදී ගැනීම ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

(ඊ) ශ්‍රී ලංකාවේ ගෙවීම් උපකරණ/ක්‍රම සහ යටිතල පහසුකම් විදහා දැක්වෙන ශ්‍රී ලංකාවේ ගෙවීම් සේවා සඳහා මාර්ගෝපදේශය නමින් අත්පොතක් මුද්‍රිත සහ විද්‍යුත් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. විද්‍යුත් පිටපත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

(උ) රටේ පුරවැසියන් අතර ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා, ජාතික අධ්‍යාපන ආයතනය වෙත ඩිජිටල් ගෙවීම් භාවිතය පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා නිර්දේශිත විෂය මාලාවක් ලබා දෙන ලදී.

(ඌ) ශ්‍රී ලංකාව තුළ මහ බැංකු ඩිජිටල් මුදල් (CBDC) හඳුන්වාදීමේ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී.

(එ) ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ වෙළඳුන් වෙත සිදු කරන ගෙවීම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව ගෙවීම් උපකරණ හඳුන්වාදීම සඳහා අවසර ඉල්ලා යෝජනා ඉදිරිපත් කළ මූල්‍ය ආයතන කිහිපයකට අනුමැතිය ලබා දෙන ලදී.

(ඒ) ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති පිළිබඳ බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ පද්ධතිවල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා එතැන් පරීක්ෂණ සහ විතැන් අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

(ඔ) හදිසි අවස්ථාවකදී ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ඇති හැකියාව සහතික කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිවන්නන්ගේ සහ ලංකාපේ (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට සහ අධීක්ෂණයට ලක් කරන ලදී.

## 21.6 ජාතික ගෙවීම් කවුන්සිලය

ජාතික ගෙවීම් කවුන්සිලයෙහි, ලේකම් කටයුතු ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ජාතික ගෙවීම් කවුන්සිලය, රටෙහි ගෙවීම් පද්ධතිවල සියලුම පාර්ශ්වකරුවන්ගේ නියෝජනය සහිත වේ. ගෙවීම් සඳහා නව ක්‍රම සහ තාක්ෂණයන් සංවර්ධනයට පහසුකම් සැලසීම, ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට පහසුකම් සැලසීම ජාතික ගෙවීම් කවුන්සිලයෙහි වගකීම් වේ. 2022 වසර තුළ දී, නව ගෙවීම් තාක්ෂණයන්, සුරක්ෂිත ඩිජිටල් ගනුදෙනු සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන 2022-2024 ගෙවීම් පද්ධති සඳහා වන පෙරදැක්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ජාතික ගෙවීම් කවුන්සිලය විසින් අධීක්ෂණය කරන ලදී.

## 21.7 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය විවරණිකාව ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ඩිජිටල් ගෙවීම්, ගෙවීම් ආශ්‍රිත වංචා, අතථ්‍ය මුදල් ආශ්‍රිත අවදානම සහ ගෙවීම් සම්බන්ධ වෙනත් කාලීන මාතෘකා පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

## 22. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල බලපෑම සමාලොචනය හා ඇගයීමත් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීමත් යන අරමුණු පෙරදැරි ව ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව 2007 දී පිහිටුවන ලදි. තවද, බැංකුවේ උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම ද ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

### 22.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම

මහ බැංකුවේ අරමුණු හා අනුගත ව එක් එක් දෙපාර්තමේන්තුව විසින් 2022 දී ක්‍රියාත්මක කළ යුතු උපායයන් සහ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා "Balancing Basics" යන තේමාව යටතේ 2022 උපායමාර්ගික කතිකාවත 2022 පෙබරවාරි මාසයේ දී පවත්වන ලදි. එහි දී සිදු කරන ලද සාකච්ඡා අනුව, 2022 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලැස්ම පිළියෙළ කරන ලදි.

2023 උපාය මාර්ගික කතිකාවත, "Regaining Stability" යන තේමාව යටතේ 2022 නොවැම්බර් මාසයේ දී පවත්වන ලදි. මෙහි දී, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව සිය නිරීක්ෂණ සහ නිර්දේශයන් ද සහිත ව 2022 වර්ෂයේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම්හි සමස්ත ප්‍රගතිය ඉදිරිපත් කළ අතර අනෙකුත් දෙපාර්තමේන්තු බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා 2022 වසරේ ඔවුන්ගේ දායකත්වයත් එහි දී ඔවුන්ට මුහුණ දීමට සිදු වූ අභියෝගත් ඉදිරිපත් කරන ලදි. 2023 දෙපාර්තමේන්තුමය ක්‍රියාකාරී සැලසුම් ද මෙහි දී සාකච්ඡා කරන ලදි. උපාය මාර්ගික කතිකාවතේ දී සාකච්ඡා කරන ලද කරුණු ද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 උපායමාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලැස්ම පිළියෙළ කර ඇත.

මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් ඉහත උපාය මාර්ගික කතිකාවත් දෙකම පවත්වන ලදි.

### 22.2 ප්‍රගති නිරීක්ෂණය

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමට එම එක් එක් ප්‍රධාන කාර්ය සාධන දර්ශක යටතේ හඳුනාගත් කාර්තුමය ඉලක්ක පාදක කරගනිමින් ප්‍රතිපත්ති සමාලෝචන හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, එක් එක් දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදි. ඒ සඳහා එක් එක් දෙපාර්තමේන්තුව සමග කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි.

ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියත් ඇතැම් ක්‍රියාකාරකම් ප්‍රමාද වීමට බල පෑ කරුණුත් ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි නිරීක්ෂණ සහ නිර්දේශයන් ද සහිතව ආයතනික කළමනාකරණ කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

### 22.3 2023 ප්‍රමුඛතා ක්ෂේත්‍ර

සාර්ව ආර්ථික ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර පහක් හඳුනාගෙන ඇත. ඒ අනුව, මැදි කාලීන දැක්මක් සහිත ව බාහිර හා අභ්‍යන්තර සාධක යන දෙකම සැලකිල්ලට ගෙන මෙම ක්ෂේත්‍ර පහ තුළ දැනට පවතින සහ ඉදිරියේ දී ඇති විය හැකි අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය උපායමාර්ගයන් සැලසුම් කිරීම සඳහා එක් එක් ප්‍රමුඛතා ක්ෂේත්‍රයට අදාළ ව ප්‍රධාන දෙපාර්තමේන්තුවක් සහ අනෙකුත් වගකිව යුතු දෙපාර්තමේන්තු හඳුනා ගන්නා ලදි.

2023 වසර සඳහා හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර පහ පහත පරිදි වේ.

- සාර්ව ආර්ථික ස්ථායීකරණ රාමුව ක්‍රියාත්මක කිරීම තුළින් මිල සහ ආර්ථික ස්ථායිතාව නැවත ඇති කිරීම
- අර්බුද සඳහා වන පූර්ව සූදානම හා කළමනාකරණය වැඩිදියුණු කිරීම තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම
- මහජනයාගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා පැහැදිලි සහ සංක්ෂිප්ත සන්නිවේදනය
- ඉහළ ඵලදායිත්වයකින් යුතු, අභිප්‍රේරිත, රාජකාරිය වෙත යොමු වූ සහ තෘප්තිමත් මානව සම්පත් කණ්ඩායමක් ඇති කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ වගවීම සහතික කරමින් ස්වාධීනත්වය සහ අධිකාරිය ඉහළ නැංවීම

### 22.4 ප්‍රතිපත්ති සමාලෝචනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඵලදායිතාව, ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ මහ බැංකුවේ කාර්යභාරය සහ ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම පිළිබඳ ව ප්‍රතිපත්ති අධ්‍යයන තුනක් 2022 වර්ෂය තුළ සිදු කරන ලදි.

## 23. රාජ්‍ය ණය

ශ්‍රී ලංකා මහ බැංකුව 1950 අගෝස්තු මස 28 වන දින ආරම්භ කරන අවස්ථාවේදීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. මුදල් නීති පනතේ 113 වන වගන්තිය ප්‍රකාරව රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. මෙහිලා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ කාර්යක්ෂම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළක් සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම, වෙළඳපොළ සහභාගීකරුවන්ට හා පොදු මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම, විචක්ෂණශීලී අවදානම් මට්ටමක් පවත්වා ගනිමින් අවම පිරිවැයක් යටතේ ප්‍රශස්ත ප්‍රමිතීන්ට හා පරිචයන්ට අනුකූලව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ අදාළ ප්‍රතිපත්තීන්ට අනුකූලව රාජ්‍ය ණය සේවාකරණය යනාදියයි. ඒ අනුව, 2022 වසර තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

### 23.1 රජයේ දළ ණය ලබාගැනීමේ අවශ්‍යතාව සපුරාලීම සඳහා අරමුදල් රැස්කිරීම

(අ) දුර්වල වූ සාර්ව ආර්ථික තත්ත්වයන්, සමාජ දේශපාලනමය අස්ථාවරතා හා ණය කළමනාකරණ පරිමිතිය පිළිබඳ වූ අනුමාන නිසා හටගත් අවිනිශ්චිතතා හේතුවෙන් පැනනැගුණු දැඩි අභියෝගකාරී වාතාවරණයක් මධ්‍යයේ, විචක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රමෝපායන්ට අනුකූලව, කල්පිරෙන ණය හේතුකොටගෙන ඇතිවන රජයේ ඉහළ දේශීය මූල්‍යන අවශ්‍යතාව භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වෙළඳපොළ සහභාගීත්වය තුළින් සපුරාලීමට ක්‍රියාකාරී ලෙස කටයුතු කරන ලදී.

(ආ) භාණ්ඩාගාර බිල්පත් සැලකීමේ දී ආයෝජකයන් කෙටිකාලීන කල්පිරීම් සඳහා වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන ලද අතර භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඔවුන්ගේ නැඹුරුව වැඩි වශයෙන් දිගු කාලීන කල්පිරීම් සඳහා දක්නට ලැබුණි.

(ඇ) 2022 පළමු අර්ධය තුළ දී, භාණ්ඩාගාරයේ විදේශ විනිමය අරමුදල් අවශ්‍යතාවයෙන් කොටසක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසි සහ ඍජු නිකුතු ක්‍රමවේද ඔස්සේ නිකුත් කිරීම හරහා සපුරාගැනීමට හැකිවිය.

(ඈ) එක් එක් අරමුදල් ප්‍රභවය යටතේ සංක්ෂිප්ත ක්‍රියාකාරකම් පහත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

### 23.2 රජයේ ණය සේවාකරණය

විදේශ රාජ්‍ය ණය සේවාකරණය සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 12 දිනැති අන්තර්වාර ප්‍රතිපත්තියට අනුකූලව, රජය විසින් බහුපාර්ශ්වික ආයතන වලට ගෙවිය යුතු ණය හැර විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද විදේශ රාජ්‍ය ණය සේවාකරණය අත්හිටුවන ලදී. මේ අතර, රජයේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කිරීම සඳහා රජය විසින් 2022 මැයි මාසයේදී පිළිවෙලින් මූල්‍ය සහ නීති උපදේශකයන් ලෙස Lazard Frères SAS සහ Clifford Chance LLP පත් කරන ලදී.

2022 අප්‍රේල් 12 දිනැති ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අන්තර්වාර ප්‍රතිපත්තිය යටතේ හඳුන්වා දී ඇති "බලපෑමට ලක් වූ ණය" වලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර බැහැර කොට ඇත. ද්‍රවශීල විදේශ ව්‍යවහාර සම්පත්වල පවත්නා සීමා මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ගෙවීම් සඳහා විකල්ප යාන්ත්‍රණයක් හඳුන්වා දෙමින් ආයෝජකයින් වෙත පහත සඳහන් විකල්ප යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. මුදල් ප්‍රතිපත්ති සීමාවන්ට යටත්ව ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදු කිරීම.

2. මූලික නිකුතුවේ එක් එක් ලංසු සඳහා අදාළ වන පොලී අනුපාතික වැනි නියම සහ කොන්දේසි සහිතව අදාළ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන (පොලී ගෙවීම්ද ඇතුළුව) අවම වශයෙන් මාස හයක කාලයක් දක්වා කල්පිරීම දීර්ඝ කිරීම.

3. අදාළ ප්‍රාථමික වෙන්දේසියේ සිට රාජකාරි දින හතක් ඇතුළත, ප්‍රාථමික වෙළෙඳපොළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය යටතේ රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බැඳුම්කර) නිකුත් කිරීම. පූර්ව ප්‍රාථමික වෙන්දේසියකදී පිරිනමන කල්පිරීම්වලට වඩා වෙනස් ඉතිරිව ඇති

**II- 17 සංඛ්‍යා සටහන**

**2021 සහ 2022 වසරේ ණය උපකරණ සහ නිකුතු ක්‍රියාකාරිත්වය**

| උපකරණය | 2021 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | නිකුත් කිරීම් (රු. බිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (රු. බිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් | 3,821.4 | 6.09 | 0.48 | 53 | 9,942.8 | 25.21 | 0.33 | 52 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,762.0 | 8.70 | 5.12 | 22 | 2,373.0 | 21.24 | 5.15 | 24 |
| | නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (ආ) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර(ඇ) | 1,041.3 | 7.34 | 1.47 | 5 | 622.3 | 7.76 [3.40] | 0.53 | 2 |

(අ) මහ බැංකුවට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්

(ආ) [ ] තුළ ඇති අගයන් මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල විචල්‍ය අනුපාතිකයන්හි බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික ව්‍යාප්තිය පිළිඹිබු කෙරෙයි. 2021 වසරේදී විචල්‍ය අනුපාතික සහිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කර නොමැත.

(ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත්කිරීම් අගයන් 2022 දෙසැම්බර් මස 30 දින තෙක් ලද ආයෝජන තහවුරු කිරීම් සහ විකල්ප පියවීම් ක්‍රමවේදය යටතේ සිදු කරන ලද පරිණතීන් දීර්ඝ කිරීම් වලට අනුව දක්වා ඇත.

කල්පිරීම් සහිත වෙනත් රජයේ සුරැකුම්පත් සඳහා, ප්‍රාථමික වෙළෙඳපොළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික කල්පිරීමට අදාළව ගළපනු ලැබේ.

2022 වර්ෂය තුළ දී රුපියල් මිලියන 2,510,281 ක දේශීය ණය සේවාකරණ ගෙවීම් සහ රුපියල් මිලියන 487,364ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් ද ඇතුළුව, රුපියල් මිලියන 2,997,645ක සමස්ත ණය සේවාකරණ ගෙවීම් සිදුකිරීමට පහසුකම් සලසන ලදී. එහිදී, 2022.04.12 දින ප්‍රකාශයට පත් කරන ලද විදේශ රාජ්‍ය ණය සේවාකරණය සම්බන්ධයෙන් වූ රජයේ අන්තර්වාර ප්‍රතිපත්තියට අනුකූලව විදේශ ණය සේවාකරණය සිදු කරන ලදී. දේශීය ණය සේවාකරණය සම්බන්ධයෙන් සලකා බලන විට, 2022 වසරේදී දේශීය ව්‍යවහාර මුදල් ණය සඳහා පොලී සහ කල් පිරීමේ වටිනාකම් ගෙවීමේදී ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක (ISIN) 218ක් සඳහා ණය සේවාකරණය කරන ලද අතර එය 2021 දී හඳුනාගැනීමේ අංක 224ක් විය. විදේශීය විනිමය ණය සේවාකරණය සම්බන්ධයෙන් සලකා බලන විට, 2022 වසරේදී අවස්ථා 1249කදී විදේශ ණය සේවාකරණය කරන ලද අතර 2021 වසරේ දී එය 1836ක් විය.

## 23.3 රාජ්‍ය සුරැකුම්පත් හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය නිර්ලේඛිත සුරැකුම්පත්හි හිමිකම් ලේඛනය, මධ්‍යම තැන්පතු පද්ධතියෙහි වාර්තා වේ. 2022 දෙසැම්බර් මස අගදී නිර්ලේඛිත සුරැකුම්පත්වල මුළු හිමිකම් ප්‍රමාණයෙහි මුහුණත වටිනාකම රුපියල් බිලියන 12,848.5ක් විය. මෙය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 4,126.3කින් සහ භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 8,722.1කින් සමන්විත විය. 2022 දෙසැම්බර් අවසානය වන විට මධ්‍යම තැන්පතු පද්ධතියෙහි ලියාපදිංචි ගිණුම් සංඛ්‍යාව 129,627ක් ලෙස සටහන් විය.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට ඔවුන්ගේ හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශන යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදුවිය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ විද්‍යුත් තැපෑල මඟින් ප්‍රකාශන 13,424ක් සහ සාමාන්‍ය තැපෑල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 48,530ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 105,863ක් සහ ගෙවීම් ප්‍රකාශන 40,089ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත යවන ලදී.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් සඳහා 2019 වසරේදී හඳුන්වා දෙන ලද තත්කාලීන දැනුම් දීමේ පහසුකම මඟින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි හා තත්කාලීන දැනුම් දීමේ පහසුකම ලබාගත් ගිණුම් හිමියන් වෙත එක් එක් නිර්ලේඛිත සුරැකුම්පත් ගිණුම් හරහා සිදු කරනු ලබන සියලුම හර හා බැර වාර්තා වීම්, කෙටි පණිවුඩ සහ/හෝ විද්‍යුත් තැපෑල මගින් තත්කාලීන දැනුම් දීම් වශයෙන් ලබා දෙන ලදී. 2022 වසර තුළ, ලංකාසෙක්‍යු පද්ධතිය විසින් විද්‍යුත් තැපෑල මඟින් තත්කාලීන දැනුම්දීම් 260,028ක් සහ කෙටි පණිවුඩ මඟින් තත්කාලීන දැනුම් දීම් 121,634ක් ලබාදී ඇති අතර 2021 වසර දී එම අගයන් පිළිවෙළින් 147,744ක් සහ 47,561ක් විය.

මීට අමතරව, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේදී සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීම සඳහා හඳුන්වාදෙනු ලැබූ ආරක්ෂිත ක්‍රියාමාර්ග අතුරින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාලය හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී.

## 23.4 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සහ නඩත්තු කරනු ලබන ලංකාසෙක්‍යු පද්ධතිය, මධ්‍යම තැන්පතු පද්ධතියෙන් හා නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියෙන් සමන්විත වේ. නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය මගින් රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු සඳහා පියවීම් සේවා සපයනු ලබයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ලංකාසෙක්‍යු පද්ධතියෙහි මෙහෙයුම් අඛණ්ඩව හා තත්කාලීනව සිදුවන බව සහතික කරමින්, රජයේ සුරැකුම්පත් ගනුදෙනුවල පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැලසීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

2022 වසර අවසාන වන විට, ලංකාසෙක්‍යු පද්ධතිය, තමන් වෙනුවෙන් සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති තමන්ගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන ඍජු අලෙවි සහභාගීකරුවන් තිස් දෙදෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 1ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 7ක්) සහ තමන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන ඍජු සහභාගීකරුවන් තිදෙනෙකුගෙන් (ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළෙඳපළ සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත විය.

## 23.5 ණය කළමනාකරණ මූලපිරීම් සහ වෙළඳපොළ සංවර්ධනයන්

යෝග්‍ය මූලාශ්‍ර හරහා අවශ්‍ය සම්පත් සපුරාලන අතරම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වැඩි දියුණු කිරීමේ අරමුණින් එහි කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා, පහත සඳහන් පියවර අනුගමනය කරන ලදී.

**(අ) භාණ්ඩාගාර බිල්පත් සඳහා අදියර II හඳුන්වා දීම**

භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියකට පසුව, එම වෙන්දේසියට අදාළ භාණ්ඩාගාර බිල්පත් සඳහා තවදුරටත් ලංසු ඉදිරිපත් කිරීමට, දෙවන අදියරක් හඳුන්වා දෙන ලදී. අදියර II සඳහා පිරිනමන උපරිම මුදල් ප්‍රමාණය, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේදී හිඟයක් ඇති වුවහොත් එම හිඟය සහ වෙන්දේසියේදී පිරිනමන ලද සමස්ත මුදලින් සියයට 25කට සීමා වන අතර, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දී එක් එක් පරිණතයන් සඳහා තීරණය වන බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයන්ට යටත්ව මෙම නිකුතුව සිදු වේ. අදියර II සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණය අභිබවා ලංසු ලැබුණහොත්, වෙන්දේසියට සහභාගී වූ පාර්ශවයන්ගේ සමස්ත සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කෙරෙනු ඇත.

**(ආ) සෘජු නිකුතු කවුළුව හරහා ඉදිරිපත් කරන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා දිරි දීමනා ක්‍රමවේදයක් හඳුන්වාදීම**

විශේෂයෙන්ම, භාණ්ඩ හා සේවා අපනයන ආදායම් උපයන්නන් සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් හිමියන් සඳහා, 2022 පෙබරවාරි සිට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන දිරි ගැන්වීමේ අරමුණින්, සෘජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජන යොමු කරන සැකසුම්කරුවන් වෙත දිරි දීමනාවක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ආයෝජන රැගෙන එන ආයෝජන සැකසුම්කරුවන්ට එකී ආයෝජන වටිනාකමෙන් සියයට 0.5කට (පදනම් අංක 50කින්) සමාන ප්‍රමාණයක ප්‍රවර්ධන හෝ මෙහෙයුම් ගාස්තුවක් පත්කළ නියෝජිතයන් හරහා ශ්‍රී ලංකා රුපියල් වලින් දිරි දීමනාවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලදී.

**(ඇ) භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදී**

විදේශ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම සඳහා දැනට පවතින පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමනාකරණ පද්ධතිය යටතේ නව පද්ධතියක් ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම පද්ධතියේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීමයි. මෙම නව පද්ධතිය 2022 ජනවාරි 01 වැනිදා සිට ක්‍රියාත්මක වේ.

**(ඈ) ප්‍රාග්ධන වෙළඳපොළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය**

දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය (Capital Market Development Project) යටතේ යෝජිත අති නවීන යටිතල පහසුකම් භාවිතය මඟින්, මූල්‍ය වෙළඳපොළ ගනුදෙනු සිදු කිරීම සහ ඒවායේ පියවීම් ක්‍රියාවලියෙහි වෙනසක් ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ පවතින සමස්ත ආයෝජන හැසිරීම්, ජාත්‍යන්තරව පිළිගත් ඉහළ ප්‍රමිතීන් සමග ගැලපීමට අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානියේ ස්ථාපිත බී. ටී. ඒ. කන්සල්ටින්ග් ලිමිටඩ් ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයමින් සිටියි. විද්‍යුත් වෙළඳ පද්ධතියක්, මධ්‍යම ප්‍රතිපාර්ශවීය පද්ධතියකින් සමන්විත නිශ්කාෂණාගාරයක්, වැඩිදියුණු කළ මධ්‍යම සුරැකුම්පත් පද්ධතියක් සහ වෙළඳපොළ ආවේක්ෂණ පද්ධතියක් මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, 2022 වසර තුළ රටේ පැවති ආර්ථික ගැටලු හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොවූ අතර එම කටයුතු ඉදිරි වසරේදී නැවත ක්‍රියාත්මක වනු ඇත.

**(ඉ) ලංකා සෙක්‍යු සේවාවන් ඩිජිටල්කරණ වැඩසටහන ආරම්භ කිරීම**

ලංකා සෙක්‍යු විසින් සපයනු ලබන විද්‍යුත් සේවාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2022 වර්ෂයේ මැද භාගයේ සිට විධිවිධාන සම්පාදනය කර ඇති අතර, 2023 වර්ෂයේ දී ලංකාසෙක්‍යු සේවාවේ දැනට පවතින භෞතික හා කඩදාසි මත පදනම් වූ සේවාවන් සම්පූර්ණයෙන්ම විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. සිය සේවාවන් ඩිජිටල්කරණය කිරීම හරහා ලෝකයේ තාක්ෂණික දියුණුව සමග සමගාමී වීමට බලාපොරොත්තු වන අතර, එමගින් පිරිවැය සහ සන්නිවේදනයේ ඇතිවන ප්‍රමාදයන් අවම කිරීම මෙන්ම ආයෝජකයන්ගේ තොරතුරු පුළුල් කිරීම ද අපේක්ෂා කෙරේ.

**(ඊ) අපේක්ෂිත රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිත ආයතනය පිහිටුවීම සඳහා බලධාරීන්ට සහාය වීම**

පවතින වත්මන් විධිවිධාන වෙනුවට ජාතික ණය කළමනාකරණ නියෝජිත ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව රජය විසින් 2022 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද 2022 අතුරු අයවැය මඟින් නිවේදනය කරන ලදී. මේ සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික සහාය රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තුමේන්තුව මඟින් සපයනු ලැබේ.

### 23.6 ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම

2022 වර්ෂයේදී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල (ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය, මූඩීස් ආයෝජක සේවාව, එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය) ශ්‍රේණිගත කිරීමේ කටයුතු වලට අනුකූලව, ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් සමාලෝචන සඳහා පහසුකම් සලසන ලදී.

## 24. ප්‍රාදේශීය සංවර්ධන

2022 වසරේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා නව ප්‍රතිපත්තිමය ක්‍රමෝපායන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගත් අතර, එවැනි මෙහෙයුම් කටයුතු හා සම්බන්ධව මෙතෙක් පැවති ක්‍රියාවලි යම්තාක් දුරට ස්වයංක්‍රීය කිරීම මඟින් ණය මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ක්‍රමවේදයන් පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ගේ හා අනෙකුත් අගය දාම සහභාගීකරුවන්ගේ මූලික අවශ්‍යතා සහ ජාතික ආර්ථිකය වෙත ඔවුන්ට දායක වීමට ඇති හැකියාව හඳුනා ගනිමින් කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණ ක්‍රියාමාර්ග කෙරෙහි ද සිය අවධානය යොමු කරන ලදී.

මේ අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වසර තුළ දී ණය පරිපූරක සේවා රැසක් සපයන ලද අතර, විවිධ ප්‍රතිමූල්‍යකරණ, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩවම සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, ණය ලබාදෙන නියෝජිත ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් එකී ණය යෝජනා ක්‍රම සඳහා අරමුදල් සපයන ලදී.

මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධයෙන් බැලූකළ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට දියත් කරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ කාර්යයන් සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ලේකම් කාර්යාලය පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය ප්‍රමුඛ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහාය ඇතිව 2022 වසර අවසානය වන විට, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි සුවිශේෂී ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී.

2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනට අරමුදල් සැපයීමේ හැකියාවන් සොයා බැලීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් PricewaterhouseCoopers (PWC) හි උපදේශක මඬුල්ලක්, දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු අදියරයෙහි ප්‍රගතිය සමාලෝචනය කර ඇත.

වෙළඳපොළෙහි සහ ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින් අඩු පහසුකම් සහිත කණ්ඩායම් වලට වඩාත් උචිත නිෂ්පාදන සැපයීම සඳහා වර්ෂය තුළදී අදාළ පොලී අනුපාතික වෙනස් කිරීම, මෙහෙයුම් කාල පරිච්ඡේද දීර්ඝ කිරීම සහ ණය ආපසු ගෙවීම සඳහා ණය සහන කාලයක් සැපයීම යනාදි, ක්‍රියාමාර්ග කිහිපයක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම සම්බන්ධව ගන්නා ලදී. එලෙස සිදු කිරීමේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දරනු ලබන ණය අවදානම සැලකිල්ලට ගනිමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබා දී ඇති ණයවලට අදාල ණය අවදානම ඇප යෝජනා ක්‍රම ඔස්සේ බෙදා ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

සමාජ දුරස්ථ පිළිවෙත් සහ රෙගුලාසි අත්හිටුවීමත් සමග, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන ප්‍රාදේශීය කාර්යාල හා එක්ව ආර්ථිකයේ අවශ්‍යතා ඇති ජන කොටස් සඳහා සහ රටතුළ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාව, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ අනෙකුත් වැඩසටහන් භෞතිකව පැවැත්වීම යළි හඳුන්වා දෙන ලදී.

## 24.1 සහනදායී ණය පහසුකම් පුළුල් කිරීම

2022 වසරේ දී, ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ/හෝ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 22ක් ක්‍රියාත්මක කිරීම මගින් මූල්‍ය ව්‍යාප්තිය පුළුල් කිරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අඛණ්ඩවම කටයුතු කළ අතර, මෙම යෝජනා ක්‍රමවල විස්තර සංඛ්‍යා සටහන II-18 හි දක්වා ඇත.

2022 වසරේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම මගින් ප්‍රතිලාභීන් 63,202ක් වෙත රුපියල් මිලියන 17,244.4 ක මුළු ණය මුදලක් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා මුදා හරින ලදී. මුදා හරින ලද මුළු ණය වලින් සියයට 50.7 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම මගින් මුදා හරින ලද අතර ශ්‍රී ලංකා රජය මගින් සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන යෝජනා ක්‍රම හරහා පිළිවෙළින් සියයට 47.8 ක් (රජය විසින් අරමුදල් සපයනු ලබන පොලී සහනාධාර යෝජනා ක්‍රම හරහා සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් කරන ලද මුදා හැරීම් ඇතුළුව) සහ සියයට 1.5ක් මුදා හරින ලදී. සමස්ත ණය මුදා හැරීම් වලින්, සියයට 57.6ක් ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම හරහා මුදා හරින ලද අතර, ඉතිරි සියයට 42.4 ක ප්‍රමාණය පොලී සහනාධාර සහ/හෝ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම හරහා මුදා හරින ලදී.

### 24.1.1 රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම

රජයේ නියෝජිතයෙකු ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්, 2022 වසරේ දී, රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම 12ක් හරහා ණය මුදල් මුදා හරින ලද අතර එය ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 9ක් සහ පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 3 කින් සමන්විත වේ. මෙම යෝජනා ක්‍රම හරහා 2022 වසරේ දී ප්‍රතිලාභීන් 54,046ක් වෙත මුදා හරින ලද ණය ප්‍රමාණය, රුපියල් මිලියන 8,240.8 ක් එනම්, මුළු ණය බෙදා හැරීම්වලින් සියයට 47.8ක් විය.

#### (අ) රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම

ගොවීන් අතර වඩාත් ප්‍රචලිත ණය යෝජනා ක්‍රමයක් වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් වන අතර, එය දීප ව්‍යාප්ත ගොවීන්ගේ කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලමින්, 2022 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින්, කෙටි කාලීන භෝග වර්ග 34ක් සඳහා ණය පහසුකම් ලබාදෙන අතර 2022 වසරේ දී ගොවීන් 48,762ක් සඳහා රුපියල් මිලියන 7,251ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණය රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම හරහා මුදා හරින ලද මුළු ණය මුදා හැරීම්වලින් සියයට 88.0ක් වේ.

2022 වසරේ දී නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධන කරමින් අදාළ පොලී අනුපාත සහ මූල්‍ය පරිමාණ සංශෝධනය කරන ලදී. ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රටේ කෘෂිකාර්මික කටයුතු දිරිමත් කිරීම, ආහාර ආනයන සඳහා වැය වන විදේශ විනිමය වියදම් අවම කිරීම, ජනතාව කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි වඩාත් නැඹුරු කරවීම සහ කුඩා පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම මෙම සංශෝධනවල අරමුණ විය. මෙම සංශෝධන හඳුන්වා දීමේ දී රටේ පවතින ආර්ථික තත්ත්වය සහ අදාළ රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද සැලකිල්ලට ගන්නා ලදී. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින්

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සඳහා ණය අරමුදල් සපයනු ලබන අතර, රජය විසින් වසරකට සියයට 7ක පොලී සහනාධාරයක් සපයන ලදී. අවසන් ණය ගැනුම්කරු සඳහා අදාල වන පොලී අනුපාතිකය වසරකට සියයට 8ක් වේ. 2022 වසරේ දී, රජය විසින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර ලෙස රුපියල් මිලියන 78.6ක් මුදා හරින ලදී.

2022.12.31 දින නිමා වීමට නියමිත ව තිබූ කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාලය, එම යෝජනා ක්‍රමයෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන ව්‍යාපෘතිය දීර්ඝ කිරීමට අදාලව 2023.06.30 දින තෙක් දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, වෙළෙඳපොළෙහි සංවර්ධනයන්ට අනුකූලව, මෙම යෝජනා ක්‍රමයෙහි පොලී අනුපාතික සුදුසු පරිදි වෙනස් කරමින් කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2022 ජුලි 08 වන දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා අවසන් ණය ගැනුම්කරු සඳහා අදාල වන අනුපාතිකය සියයට 6.5 සිට සියයට 9 දක්වා ඉහළ නැංවීමට කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. මූල්‍යමය වශයෙන් බැලූකළ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමග සහයෝගීව 2022 වසරේ දී ප්‍රතිලාභීන් 180ක් අතරේ රුපියල් මිලියන 37.8ක මුදලක් මුදා හරින ලදී.

**(ආ) රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම**

2022 වසරේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම 9ක් ඔස්සේ ප්‍රතිලාභීන් 5,104 ක් වෙත රුපියල් මිලියන 951.3ක් මුදලක් මුදා හරින ලදී. රජය, කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන හා එක්ව, 2022 වසරේ දී ප්‍රතිමූල්‍ය කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය, ප්‍රතිමූල්‍ය තුරුණු ණය යෝජනා ක්‍රමය, ප්‍රතිමූල්‍ය මූල්‍ය ආයතන තොග ණය යෝජනා ක්‍රමය, ප්‍රතිමූල්‍ය ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය සහ ප්‍රතිමූල්‍ය ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය සඳහා අරමුදල් සපයන ලදී.

තවද, පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් පුහුණුවීම් ලද තරුණ තරුණියන්ට තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍ය ආධාර සැපයීමේ අරමුණින් ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමයෙහි II වන අදියරෙහි (SEPI II අදියර) මෙහෙයුම් කාලය 2023.01.01 දින සිට ආරම්භ වන වසර පහක කාලයක් සඳහා දීර්ඝ කිරීමට රජය සමග අත්සන් කළ පරිපාලන ගිවිසුම සංශෝධනය කෙරිණි.

**24.1.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රම**

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මූල්‍යමය ශක්‍යතාව පුළුල් කිරීමේ අරමුණැතිව, ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේ දී ප්‍රධාන ණය යෝජනා ක්‍රම 7ක් සඳහා අරමුදල් සැපයීමට අඛණ්ඩව ක්‍රියා කළ අතර, මෙම යෝජනා ක්‍රම 07 මගින් ප්‍රතිලාභීන් 8,559 ක් අතරේ රුපියල් මිලියන 8,740 ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛතම ණය යෝජනා ක්‍රමය වන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය 2022 වසරේ දීත් අඛණ්ඩවම ක්‍රියාත්මක වූ අතර එමගින් ප්‍රතිලාභීන් 8,062 ක් අතරේ රුපියල් මිලියන 7,706.3 ක ණය මුදලක් මුදා හරින ලදී. තවද, කෘෂිකාර්මික අංශය වෙත අරමුදල් ගලා යාම තීව්‍ර කිරීමේ ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරිනු ලබන නව ණය ප්‍රමාණය සියයට 80ක්, කෘෂිකර්මය, පශු සම්පත්, ධීවර සහ ආශ්‍රිත කර්මාන්තයන් සඳහා මුදා හරින ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත උපදෙස් ලබා දෙමින් එකී ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතිකය සියයට 9ක් දක්වා ඉහළ නැංවීමට අදාලව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

නිෂ්පාදනය සහ නිෂ්පාදිත ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ මනා ලෙස සම්බන්ධිත කෘෂිකාර්මික අගය දාම ඔස්සේ වෙළෙඳපොළ අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍යාධාර ලබාදෙමින් කුඩා වතු හිමියන් සඳහා පුළුල් සංවර්ධන ක්‍රමවේදයන් හඳුන්වා දීම සඳහා දේශීය කෘෂිකාර්මික නියමු ව්‍යාපෘතිය, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස ස්ථාපිත කරන ලදී. හඳුනාගත් අගය දාමය විධිමත් කිරීමෙහිලා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට අපේක්ෂා කරන සහ අදාල කෘෂිකාර්මික අගය දාමයෙහි ක්‍රියාකරුවන්ගේ සහභාගීත්වය තහවුරු කරනු ලබන සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තෝරා ගන්නා ලද ප්‍රධාන ක්‍රියාකරුවන් මෙයට සම්බන්ධවීම මෙම යෝජනා ක්‍රමයේ සුවිශේෂී ලක්ෂණයකි. ඔවුන් මෙම අගය දාමයට සම්බන්ධ පෞද්ගලික අංශයේ සංවිධාන වල හෝ ප්‍රධාන ක්‍රියාකරුවෙකුගේ භූමිකාව ඉටු කිරීමට එකඟ වූ වෙනත් ඕනෑම අගය දාමයක සහභාගීකරුවෙකු විය හැකිය. මෙම යෝජනා ක්‍රමය 2024 වසරේත් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සමඟින් විස්තීරණ වැඩසටහනක් ලෙස හඳුන්වා දීමට අපේක්ෂිත ය.

මේ සම්බන්ධයෙන් වත්මන් සන්දර්භය තුළ මනා ලෙස සම්බන්ධීකරණය කළ කෘෂිකාර්මික අගය දාම වැඩසටහනක් පිහිටු වීමේ වැදගත්කම සලකා බලමින්, එ.ජ.ඩො. මිලියන 100ක මුදලක් සැපයීම මගින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන අඛණ්ඩව සිදු කරගෙන යැමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව කැමැත්ත පළ කර ඇත. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව නියෝජනය කරන PWC උපදේශක කණ්ඩායමක් 2022 වසරේ අග භාගයේ දී දේශීය කෘෂිකාර්මික සංවර්ධන-වැඩසටහන සමාලෝචනය කර ඇති අතර, මෙම සමාලෝචනයේ නිගමනයන් දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනට ඇතුළත් කිරීමට නියමිත ය.

## II-18 සංඛ්‍යා සටහන
## ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනාක්‍රමවල සාරාංශය

| අරමුදල් ප්‍රභවය | ණය යෝජනා ක්‍රමයේ තොරතුරු/සහනදායී ණය යෝජනා ක්‍රම | | | | |
|---|---|---|---|---|---|
| | නම | අරමුණ | යෝජනා ක්‍රමයේ වර්ගය | 2022 වසරේ දී අරමුදල් මුදා හැරීම (රුපියල් මිලියන) | අවසන් ණය ගැනුම්කරු වෙත පොලී අනුපාතිකය (වසරකට %) |
| ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | ආදායම් උත්පාදන වැඩසටහන් හරහා දිළිඳුකම පිටුදැකීම ප්‍රවර්ධනය සහ අඩු ආදායම්ලාභී ජන කොටස් විධිමත් බැංකු පද්ධති හා සම්බන්ධ කිරීම | ප්‍රතිමූල්‍ය | 69.30 | 12.00 |
| | 'ස්වශක්ති' ණය යෝජනා ක්‍රමය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වල නියුතු සහ නව ව්‍යවසායකයින් සඳහා රැකියා අවස්ථා බිහි කිරීම. | ප්‍රතිමූල්‍ය | 175.00 | 5.50 |
| | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II | පිළිගත් වෘත්තීය පුහුණු ආයතන හරහා පුහුණුව, තරුණ තරුණියන්ට ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම | ප්‍රතිමූල්‍ය | 2.00 | 7.00 |
| | SAPP - RF ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය | කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම දුරලීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය නිෂ්පාදන සහ වාණිජ පද්ධති වල අගය ඉහළ නැංවීම. | ප්‍රතිමූල්‍ය | 83.10 | 6.50 |
| | SAPP - RF කෘෂි ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 161.70 | 6.50 |
| | SAPP - RF තුරුණු ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 357.80 | 6.50 |
| | SAPP - RF FI තොග ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 59.36 | 6.50 |
| | SAPP - RF ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 31.16 | 6.50 |
| | සැපයුම්දාම පුනර්ජීවන ණය යෝජනා ක්‍රමය | තේ සැපයුම්කරුවන්ගේ අගයදාම ශක්තිමත් කරමින් ව්‍යාපාර යළි නඟා සිටුවීම | ප්‍රතිමූල්‍ය | 12.00 | 3.50 |
| | 'සරුසාර' නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS[1]) | වී සහ කෙටිකාලීන බෝග වගාවේ නියුතු ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ වගාකරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම | පොලී සහනාධාර | 5,034.60 | 2022.06.15 තෙක් 4.00 ඉන්පසු 8.00 |
| | ශ්‍රී ලංකාවෙහි ඉස්සන් ගොවිපළ තීව්‍ර කිරීම සඳහා වන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය[1] | ඉස්සන් වගාකරුවන්ගේ ගොවිපල පහසුකම් ඉහල නැංවීමට සහය ලබාදීම. | පොලී සහනාධාර | - | මුල් මාස 18-4.50 ඉදිරි මාස 6-8.50 |
| | කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන STaRR[1] පොලී සහනාධාර වැඩසටහන | නව වගාවන් හරහා නිෂ්පාදනය ජනනය වනතුරු කුඩා තේ හා රබර් වගාකරුවන්ට ස්වයං රැකියා උත්පාදනයට හෝ කෙටි කාලීන ආදායම් ජනනය කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම. | පොලී සහනාධාර | 37.80 | 9.0 |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සම්පාදන කරන ලද | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ස්වභාවික ආපදා හමුවේ හානියට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැවත ගොඩනැංවීම සහ දියුණු කිරීම සඳහා | ප්‍රතිමූල්‍යය | 7,706.6 | 9.00 |
| | කොවිඩ්-19න් බලපෑමට ලක් වූ රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - SCRF IV අදියර | කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම | ප්‍රතිමූල්‍යය | - | 9.00 |
| | දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු ව්‍යාපෘතිය | දේශීය කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම සහ කෘෂිකාර්මික අපනයන ප්‍රවර්ධන කිරීම | ප්‍රතිමූල්‍යය | 337.11 | <රුපියල් මිලියන 1-4.00 > රුපියල් මිලියන 1 සිට රුපියල් මිලියන 25 දක්වා - 5.00 |
| | සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (SCRF) අදියර I | කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම | ප්‍රතිමූල්‍යය | 677.5 | 4.00 |
| | | | ප්‍රතිමූල්‍යය | - | 4.00 |
| | SCRF අදියර II | | පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ | - | 4.00 |
| | SCRF අදියර III | | | | |
| | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය[2] | ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීමට අරමුදල් සපයන සහභාගිත්ව මූල්‍ය ආයතන වලට ණය ඇප ආවරණ ලබාදීම | | - | පවතින වෙළෙඳ අනුපාතිකය |
| දායකයකු විසින් අරමුදල් සපයනු ලබන | SAPP - 4P කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය[3] | කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම පිටුදැකීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය පද්ධති වල අගය ඉහළ නැංවීම | ප්‍රතිමූල්‍ය | 38.78 | 6.50 |
| | SAPP - 4P තුරුණු ණය යෝජනා ක්‍රමය[3] | | ප්‍රතිමූල්‍ය | 45.79 | 6.50 |
| | SAPP මූල්‍ය අතරමැදි තොග ණය[3] | | ප්‍රතිමූල්‍ය | | |

1 සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන පොලී සහනාධාර
2 ශ්‍රී ලංකා මහ බැංකුව - ණය ඇපආවරණය, සහභාගීත්ව මූල්‍ය ආයතන - ණය මූල්‍යනය
3 කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල

### 24.1.3 ණය ලබාදෙන නියෝජිත ආයතන වල අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම

2022 වසරේ දී, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි දායක අරමුදල් සපයනු ලබන සංරචකය යටතේ පොදු - පෞද්ගලික - නිෂ්පාදක - හවුල්කාරීත්ව (4P) කෘෂි ව්‍යාපාර, 4P තුරුණු ණය යෝජනා ක්‍රමය සහ 4P තොග ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අඛණ්ඩවම කටයුතු කරන ලදී. මෙම යෝජනා ක්‍රම යටතේ බෙදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් මිලියන 263.4ක් වූ අතර, එම ණය ප්‍රමාණය කෘෂිකාර්මික අංශයේ ප්‍රතිලාභීන් 597ක් සඳහා මුදා හරින ලදී.

දරිද්‍රතාවය අවම කිරීම සහ ශ්‍රී ලාංකික කුඩා පරිමාණ ප්‍රජාව තුළ තරඟකාරීත්වය ඉහළ නැංවීමට දායක වීම කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වේ. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන හා සම්බන්ධව වාණිජමය වශයෙන් නැඹුරු වූ කෘෂිකාර්මික නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධති හා සම්බන්ධව කුඩාවතු ගොවි පවුල් වල ආදායම සහ පෝෂණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම එමගින් අරමුණු කෙරේ.

## 24.2 ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය 2021 වසරේ මාර්තු මාසයේ දී දියත් කරන ලද අතර එය ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවේ සහ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහයෝගය ඇතිව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ ලේකම් කාර්යාලය විසින් පාර්ශවකරුවන්ගේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කර ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කරන ආයතනක වලට පහසුකම් සලසමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය සහ ඇගයීමට ලක් කරන ලදී. 2022 වසර තුළ දී, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග ලේකම් කාර්යාලය විසින් ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සභා රැස්වීම් 2ක්, කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් සහ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් 25කට වැඩි ගණනක් පවත්වන ලදී. 2022 වසර අවසානය වන විට, ක්‍රියාමාර්ගවලින් සියයට 24ක් පූර්ණ වශයෙන් නිමා කර ඇති අතර, මෙම ක්‍රියාමාර්ගවලින් සියයට 60කට වැඩි ප්‍රමාණයක් නියමිත වේලාවට ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

## 24.3 මූල්‍ය සාක්ෂරතාව

සාමාන්‍ය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව, කුසලතා සහ ධාරිතාව ඉහළ නැංවීමේ ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, 2022 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් 490ක් පවත්වන ලදී.

මූල්‍ය අංශයෙන් බැහැරවීම හේතුවෙන් ඇතිවියහැකි අවාසි සහ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම මෙම වැඩසටහන්වල අරමුණ වූ අතර, ග්‍රාමීය සහ ප්‍රාදේශීය අංශ යන දෙකෙහි ම අවධානමට ලක් විය හැකි සමාජ කොටස් වෙත ළඟා වීම සඳහා ප්‍රයත්නයන් මෙමගින් ගන්නා ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල විසින් විධිමත් මූල්‍ය අංශය වෙත පිවිසීමෙන් සහ සම්බන්ධ වීමෙන් අත්වන ප්‍රතිලාභ පිළිබඳව ඉස්මතු කරමින්, ඉලක්කගත පිරිසගේ අවශ්‍යතා පිරිමැසීම සඳහා වැඩසටහන් නිර්මාණය කරන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාල හා එක්ව ව්‍යවසායකයන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඉහළ ආර්ථික නිමවුමක් උත්පාදනය කිරීමට අවශ්‍ය ශක්‍යතාවයන් තවදුරටත් ඉහළ නැංවීම සඳහා ක්ෂේත්‍ර චාරිකා 799 ක් පවත්වන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-19 හි දක්වා ඇත.

**II-19 සංඛ්‍යා සටහන**

**2022 වසරේ දී පවත්වන ලද දැනුම්වත් කිරීමේ සහ විශේෂ වැඩසටහන්**

| | වැඩසටහන් වර්ගය | වැඩසටහන් ගණන |
|---|---|---|
| 1. | මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ශක්‍යතා ගොඩනැංවීම සහ කුසලතා සංවර්ධන | 476 |
| 2. | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 11 |
| 3. | ගුවන් විදුලි සහ රූපවාහිනි | 02 |
| 4. | දැනුම් හුවමාරු කරගැනීම | 01 |
| 5. | ක්ෂේත්‍ර චාරිකා | 799 |
| | එකතුව | 1,289 |

## 24.4 ප්‍රාදේශීය මට්ටමේ නියෝජනය

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර, කිලිනොච්චි, මාතලේ, මාතර, නුවරඑළිය සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල හය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය මට්ටමේ නියෝජනය තහවුරු කරනු ලබයි. මෙම ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලබන අතරම, සේවක අර්ථසාධක අරමුදල ආශ්‍රිත කරුණු, දත්ත රැස් කිරීමේ කර්තව්‍යයන්, සමීක්ෂණ ආශ්‍රිත කටයුතු, මහ බැංකු ප්‍රකාශන සහ අනුස්මරණ කාසි සහ නෝට්ටු අලෙවිකිරීම වැනි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙ හි අරමුණු වලට අදාලව ප්‍රාදේශීය මට්ටමින් සාමාන්‍ය ජනතාව අතර මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාව මට්ටම ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය කාර්යාල විසින් ඉමහත් පරිශ්‍රමයක් දරන අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ද සහය දක්වනු ලබයි. විධිමත් බැංකුකරණය, බලයලත්/බලපත්‍රලාභී ආයතන මගින් සපයනු ලබන මූල්‍ය සේවා, එම ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය

යෝජනා ක්‍රම සහ ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම වැනි ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවන් සහ කාර්යයන් පිළිබඳ දැනුම්වත් කිරීමේ සැසි, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම මගින්, ප්‍රාදේශීය මට්ටමින්, මහ ජනතාව, නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන, පොදු සහ පෞද්ගලික ආයතනවල දැනුම්වත්භාවය ඉහළ නැංවීමට ද ප්‍රාදේශීය කාර්යාල විසින් ක්‍රියාමාර්ග ගනු ලබයි.

2022 වසරේ දී, ප්‍රාදේශීය කාර්යාල හය විසින් සේ.අ.අ. හා සම්බන්ධ ගැටලු/ ඉල්ලීම් 143,882ක් සහ විවිධ අංශයන් හා සම්බන්ධ මහජන දුක්ගැනවිලි 1,658 ක් සෘජුවම හසුරුවන ලදී. සමීක්ෂණය ආශ්‍රිත කටයුතුවලට අදාළව, සියලුම ප්‍රාදේශීය කාර්යාල මගින්, විවිධ දිස්ත්‍රික්කවල නියැදි 1,262 ක් ආවරණය කරන ලද අතර විදේශ විනිමය ප්‍රේෂණ, නීතිවිරෝධී තැන්පතු භාර ගැනීම, තහනම් කළ මූල්‍ය යෝජනා ක්‍රම, ව්‍යාජ මුදල් නෝට්ටු සහ ව්‍යාජ නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 184ක් පවත්වන ලදී.

### 24.5 අනෙකුත් හඳුන්වාදීම්

#### 24.5.1 හරිත ගම්මාන වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේදී නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දෙන ලද හරිත ගම්මාන වැඩසටහන 2022 වසරේ දී ද අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව තෝරා ගත් ගම්මානවල මුලපිරීම් කිහිපයක් සිදු කරන ලදී. ගෙවතු වගා පුහුණු කිරීම්, වැසි ජල සංරක්ෂණය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, පුනර්ජනනීය බලශක්තිය, රුක් රෝපණය, පරිසර - සංචාරක ව්‍යාපාරය, හරිත ආදායම් උත්පාදන වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති මෙම වැඩසටහන්වලට ඇතුළත් විය. තවද, ගම්වැසියන් හට තම ආදායම් උත්පාදන විභවයන් කරා ළඟා වීමට අවශ්‍ය නව කුසලතා තුළින් සන්නද්ධ කිරීම ඉලක්ක කරගත් විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහනවලින් මෙන්ම, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වන ලද ණය කඳවුරු, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්වලින් ප්‍රතිලාභ රැසක් අත්පත් කර ගැනීමට ගම්වැසියන්ට හැකිවිය.

#### 24.5.2 ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම

2022 වසර තුළ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සංවිධානය, ආසියානු ණය පරිපූරක ආයතන සම්මේලනය හා ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකර්මාන්ත ණය සංගමය වැනි උපාය මාර්ගික වශයෙන් වැදගත් ජාත්‍යන්තර ආයතන සමග සිය සබඳතාවන් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රඥප්තිය අත්සන් කරමින් දකුණු ආසියානු කලාපීය මූල්‍ය අන්තර්ගත මුලපිරීම් සමග ශ්‍රී ලංකා මහ බැංකුව අත්වැල් බැඳගන්නා ලදී.

## 25. නිරාකරණ හා බලගැන්වීම්

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන මූල්‍ය ආරක්ෂණ යාන්ත්‍රණයක් වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල කාර්යක්ෂමව මෙහෙයවීමෙන් දායකත්වය සපයන ලදී. තවද, 1988 අංක 30 දරණ බැංකු පනතේ 83ඇ වගන්තිය යටතේ තහනම් මූල්‍ය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමෙන්ද, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ නියාමනයට හා අධීක්ෂණයට ලක්වන බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සම්බන්ධ නිරාකරණ කටයුතු සම්බන්ධයෙන් පුළුල් නීතිමය ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමෙන්ද දායකත්වය සපයන ලදී.

ඒ අනුව 2022 වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 25.1 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය මගින් අනුමත කරන ලද රෙගුලාසි සහ ප්‍රතිපත්තීන්ට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සියලුම මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු තවදුරටත් සිදුකර ගෙන යන ලදී. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ නීතිමය රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් තැන්පතු රක්ෂණයට අදාළ විධිවිධාන කෙටුම්පත් කර බැංකු (විශේෂ විධිවිධාන) පනතට ඇතුළත් කරන ලද අතර එය 2023 වසර තුළ නීතිගත කිරීමට නියමිතය. බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීමත් සමග, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට යම් යම් නිරාකරණ ක්‍රියාමාර්ග සඳහා දායක වීමට හැකි වන අතර ඒ අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි කාර්ය හා බලතල රාමුව දැනට පවතින "pay box" රාමුවෙන් ඔබ්බට වැඩිදියුණු කරනු ඇත.

2022 අවසන් වන විට, මෙම යෝජනා ක්‍රමය සාමාජික ආයතන හැට හතකින් (67) සමන්විත වූ අතර එහි මුළු අරමුදල් ප්‍රමාණය දළ වශයෙන් රුපියල් මිලියන 86,107.9 (විගණනය කරන ලද) විය. තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි මූල්‍ය විශේෂතා පහත II-20 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-20 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි මූල්‍ය විශේෂ අවස්ථා**

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) | |
|---|---|---|
| | 31.12.2021 වන විට | 31.12.2022 වන විට |
| අරමුදලෙහි ප්‍රමාණය | 67,877.3 | 86,107.9 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | (2,103.0) | (25,931.5) |
| ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සමස්ත ප්‍රාග්ධනය | 65,784.4 | 60,176.4 |
| සමස්ත ආදායම | 19,298.9 | 24,889.9 |
| සමස්ත වියදම | (96.6) | (226.3) |
| වසර සඳහා වූ අතිරික්තය (බදු වලට පෙර) | 19,202.4 | 24,656.6 |
| ආදායම් බදු | (2,647.1) | (6,436.1) |
| වසර සඳහා වූ අතිරික්තය (බදු වලට පසු) | 16,555.2 | 18,220.6 |
| මුළු වත්කම් | 74,443.9 | 69,017.6 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | 69,529.2 | 63,596.0 |
| ණය සහ ලැබිය යුතු මුදල් (හානිකර ප්‍රතිපාදන ශුද්ධ) | 381.9 | 192.7 |

## 25.2 පීඩාවට පත් මුදල් සමාගම්වල තැන්පතුකරුවන්ට වන්දි ගෙවීම

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි රෙගුලාසිවලට අනුව බලපත්‍ර අවලංගු කරන ලද/අත්හිටවූ මූල්‍ය සමාගම් හයක (06) තැන්පතුකරුවන්ට නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් වන්දි ගෙවීම් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල විසින් රුපියල් මිලියන 30,499.24 ක වන්දි මුදලක් එම මුදල් සමාගම් හයේ තැන්පතුකරුවන් 72,641 කට ගෙවීමට හැකි විය. 2022.12.31 දිනට බලපත්‍ර අවලංගු කරන ලද/අත්හිටවූ සමාගම් සහ විස්තර පහත II-21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-21 සංඛ්‍යා සටහන**

**2022.12.31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල විසින් ගෙවන ලද සම්පූර්ණ වන්දිය**

| සමාගමේ නම | සම්පූර්ණ රක්ෂිත වටිනාකම (රු. මිලියන) | ගෙවන ලද තැන්පතුකරුවන් සංඛ්‍යාව | ගෙවා ඇති වන්දි මුදල (රු. මිලියන) | සම්පූර්ණ රක්ෂිත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස ගෙවන ලද වන්දි මුදල |
|---|---|---|---|---|
| සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. | 2,465.66 | 3,497 | 1,982.76 | 80.41% |
| ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆයිනෑන්ස් ලිමිටඩ් | 1,667.84 | 2,536 | 1,311.24 | 78.62% |
| ටී.කේ.එස්. ෆයිනෑන්ස් ලිමිටඩ් | 1,190.74 | 1,876 | 1,017.37 | 85.44% |
| ද ෆයිනෑන්ස් කම්පැනි පීඑල්සී | 14,735.82 | 35,343 | 12,573.62 | 85.33% |
| ඊ.ටී.අයි ෆයිනෑන්ස් ලිමිටඩ් | 13,915.89 | 26,782 | 12,565.68 | 90.30% |
| ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසර්ස් ලිමිටඩ් | 1,253.27 | 2,607 | 1,048.57 | 83.67% |
| **එකතුව** | **35,229.22** | **72,641** | **30,499.24** | **86.57%** |

## 25.3 විමර්ශන කටයුතු

තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් මූල්‍ය වංචාවන් සම්බන්ධයෙන් නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව වෙත විවිධ ආකාරවලින් මහජන පැමිණිලි ලැබී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් සමග එක්ව, බැංකු පනතේ 83ඇ වගන්තියේ විධිවිධානවලට පටහැනි බවට චෝදනා කරන ලද තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳව එතැන් සහ විතැන් පරීක්ෂණ කිහිපයක් වසර තුළදී පවත්වන ලදී. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් විමර්ශන දෙකක් අවසන් කර වාර්තා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ලැබී ඇති මහජන පැමිණිලි පදනම් කරගෙන වසර තුළ කරුණු සෙවීමේ විමර්ශන 16 ක් පවත්වන ලදී.

තවද, සාමාන්‍ය ජනතාව තහනම් යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීම අවම කිරීම සහ වැළැක්වීම සඳහා, රජයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, බැංකු කාර්ය මණ්ඩල, පාසල් ගුරුවරුන්, ළමුන් සහ විශ්ව විද්‍යාල සිසුන් ඇතුළු ප්‍රජාවේ විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් විවිධ ප්‍රවේශයන් ඔස්සේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් පවත්වන ලදී.

**II-22 සංඛ්‍යා සටහන**

**2022 දී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| පුවත්පත් නිවේදන/ගැසට් | 02 |
| පුවත්පත් දැන්වීම්/පුවත්පත් නිවේදන | 04 |
| පිරමීඩ යෝජනා ක්‍රම සම්බන්ධ ෆේස්බුක් විමසීම් | 42 |
| පෝස්ටර්/පත්‍රිකා බෙදාහැරීම් | 11,508 |
| සාකච්ඡා | 01 |
| සම්මන්ත්‍රණ/ වෙබ් සම්මන්ත්‍රණ | 29 |

## 25.4 මහ බැංකුවේ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ රාමුවක් සකස් කිරීම

මහ බැංකුවේ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහ ලෝක බැංකුවේ (WB) තාක්ෂණික සහාය ලබා ගනිමින් බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීමට නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව දායක වී ඇත.

කෙටුම්පත් කරන ලද බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව නිරාකරණ අධිකාරිය ලෙස ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වන අතර මෙම පනතෙහි තැන්පතුකරුවන්ගේ සහ ණයහිමියන්ගේ අයිතීන් ආරක්ෂා කර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවට සහ ශ්‍රී ලංකා රජයට මුදල් සමාගම්හි අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා

නියමිත වේලාවට අදාල නිරාකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියාත්මක කල හැකි පරිදි සවිස්තරාත්මක ක්‍රියාමාර්ගයන් ඇතුළත් වේ.

කෙටුම්පත් කරන ලද බැංකු (විශේෂ විධිවිධාන) පනත සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පනත කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණු පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර නිකුත්කර නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මුදල් සමාගම්වල නිරාකරණ පියවර මෙම පනතේ පවතින ප්‍රතිපාදන මත පදනම්ව ක්‍රියාත්මක කරනු ලැබේ.

# 26. අවදානම් කළමනාකරණ

සිය ප්‍රතිපත්තිමය අරමුණු ඉටු කර ගැනීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍යමය හා මූල්‍යමය නොවන විවිධ අවදානම් වලට මුහුණ දීමට සිදු වේ. මෙවැනි අවදානම් ඇති වීම තුළින්, බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, බැංකුවේ මූල්‍ය තත්වයට සහ කීර්තිනාමයට අහිතකර බලපෑමක් ඇතිවිය හැකි බැවින්, මනා ලෙස පිළියෙළ කල අවදානම් කළමනාකරණ රාමුවක් පැවතීම ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව පිළියෙළ කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ (Risk Management Policy Statement) දක්වා ඇති පරිදි, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහ බැංකුවම ආවරණය කරමින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති සකස් කරයි. මෙම ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පිළිගත් ප්‍රමිතීන්, මාර්ගෝපදේශ සහ අවදානම් කළමනාකරණය සඳහා නිසි භාවිතයන් අනුගමනය කරන අතර, අවදානම්වල හිමිකාරිත්වය සහ එහි කළමනාකරණය පිළිබඳව පැහැදිලි වගවීමක් අදාල පාර්ශ්වකරුවන් වෙත පවරා දී ඇත.

## 26.1 මෙහෙයුම් අවදානම (Operational Risk)

අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය යාවත්කාලීනව තබා ගැනීම සහ මෙහෙයුම් සඳහා වන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි "මෙහෙයුම් අවදානම් වර්ගීකරණය (Operational Risk Taxonomy)" සමාලෝචනය කළ අතර, මේ සඳහා අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරන ලදී.

දෙපාර්තමේන්තු අවදානම් තක්සේරු කිරීම් සඳහා සපයනු ලබන පහසුකම් අඛණ්ඩව පවත්වා ගනිමින්, දෙපාර්තමේන්තු අවදානම් ලේඛන පිළියෙළ කිරීමට සහාය වීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමග සමීපව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අවදානම් පිළිබඳ දැනුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ අදහසින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා වසර මුළුල්ලේම අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, "සිදුවීම් වාර්තාකරණ පද්ධතිය (Incident Reporting System) හරහා වාර්තා වූ සිදුවීම් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, සිදුවීම්වල කේන්ද්‍රීය ගබඩාවක් නිර්මාණය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සිදුකරන ලදී. මෙම ක්‍රමය හරහා රැස්කරගත් තොරතුරු, අවදානම් ප්‍රවණතා හා අවදානම් සහිත කලාප හඳුනා ගැනීමට මෙන්ම, ඒ හා සම්බන්ධ අවදානම් ප්‍රතිකර්ම වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

## 26.2 මූල්‍ය අවදානම (Financial Risk)

දෙවන පෙළ ආරක්ෂක ක්‍රියාදාමය ලෙස, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, මූල්‍ය අවදානම යටතේ ණය, වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය, විශ්ලේෂණය, ඇගයීම සහ වාර්තා කිරීම ස්වාධීනව සිදු කරනු ලැබේ. තවද, ජාත්‍යන්තර සංචිත (International Reserves), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ (Employee's Provident Fund) අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළව, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වැඩිදියුණු කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ වලට අදාළ දෙපාර්තමේන්තුවල අනුකූලතාවය සහතික කිරීමද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ආයෝජන අරමුදල් හා ජාත්‍යන්තර සංචිත සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් (Investment Policy Statement), ආයෝජන මාර්ගෝපදේශයන් (Investment Guidelines) හා උපායමාර්ගික වත්කම් විභජනයන් (Strategic Asset Allocation) ද සේවක අර්ථසාධක අරමුදල සඳහා උපායමාර්ගික වත්කම් විභජනයන් අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරමින් සංස්කරණය කරන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ අවදානම් සහ ණය අවදානම් දර්ශක විශ්ලේෂණය කිරීම නිරන්තරයෙන් සිදු කරනු ලබන අතර, ඉහත සඳහන් අරමුදල් සඳහා අදාළ මාර්ගෝපදේශයන්හි දක්වා ඇති සීමා රාමු පිළිපැදීම නිරීක්ෂණය කරයි. මෙම සියලු අවදානම් තක්සේරු කිරීම් සහ අනුකූල නොවීම් අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු (Investment Oversight Committee) රැස්වීම්වලදී මාසිකව ඉදිරිපත් කරන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දැනට භාවිතා කරනු ලබන අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම උදෙසා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

මීට අමතරව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා අවදානම් අභිරුචි රාමුවක් (Risk Appetite Framework) හඳුන්වා දීම අරමුණු කරගනිමින් ඒ සඳහා මූලාරම්භයක් ලෙස, පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමෙන්

අනතුරුව සකස් කරන ලද වාර්තාව මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (Non-Financial Risk Management Committee) සමග ද, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ (Board Risk Oversight Committee) බාහිර සාමාජිකයින් දෙදෙනා සමග ද සාකච්ඡා කරන ලදී.

මහ බැංකුවේ සියලුම මෙහෙයුම් සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම්, ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කාර්තුමය වශයෙන්, මෙහෙයුම් අවදානම් පිළිබඳ වාර්තාවන්, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම සහ සියලුම මෙහෙයුම් හා මූල්‍යමය අවදානම් පිළිබඳ වාර්තාවන් මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 27. ලේකම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකක් වන ලේකම් දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරෙන කාර්යයන් අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ආයතනික පරිපාලන කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, වත්කම් බැහැර කිරීම් කළමනාකරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම, මුදල් මණ්ඩලයට, අධිපතිතුමාට, නියෝජ්‍ය අධිපතිවරුන්ට හා සහකාර අධිපතිවරුන්ට අවශ්‍ය කාර්යාලයීය සේවා සැපයීම සහ අධිපතිතුමාට අවශ්‍ය සන්ධාන සේවා සැපයීම ප්‍රධාන වේ.

**(අ) සමස්ත ආයතනික පරිපාලනය**

2022 වර්ෂය තුළදී ද, බැංකුවේ සමස්ත ආයතනික පරිපාලනය; පාලන රෙගුලාසි, වගවීම, අවදානම් කළමනාකරණය සහ වෙනත් ප්‍රධාන යහපාලන ගුණාංගවලට අනුකූලව කරගෙන යන ලදී. පසුගිය වසර තුළදී ලේකම් දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ඇති විය හැකි අවදානම් හඳුනාගෙන බැංකුවේ සියලුම දේපල සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. තවද, මේ යටතේ ලේකම් දෙපාර්තමේන්තුව විසින් පිටතින් ලබාගෙන ඇති තැපැල් කළමනාකරණ සේවාව මගින් එන සහ යන ලිපි සම්බන්ධ අවශ්‍ය කටයුතු කිරීම, බැංකුවේ ලිපි ද්‍රව්‍ය ගබඩා කළමනාකරණය කාර්යක්ෂමව සහ පිරිමැසුම්දායක ලෙස කරගෙන යෑම, බැංකුව සම්බන්ධ විශේෂ උත්සව සංවිධානය කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ඉටු කරන ලද අනෙකුත් කාර්යයන් විය. මීට අමතරව, වර්ෂය තුළ බැංකුව සඳහා සේවා සපයන ආයතන සමග මුදල් මණ්ඩලය වෙනුවෙන් මහ බැංකුවේ ලේකම් විසින් ගිවිසුම් වලට එළඹීමද සිදු කරන ලදී.

**(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය**

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික අයවැය පදනම් කරගෙන 2022 වසර සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2022 වසර තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන ලදී. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතෙහි දක්වා ඇති ප්‍රසම්පාදන පටිපාටියට සහ ටෙන්ඩර් ක්‍රමවේදයට අනුකූලව මෙකී භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී. ඊට අමතරව, ඉතා කෙටි කාල සීමාවක් තුළ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවාවන් ගණනාවක් ප්‍රසම්පාදනය කිරීමට ද ලේකම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

**(ඇ) විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

දෙදහස් තුන්සිය හතක (2,307) ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සඳහා මහ බැංකු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළදී ද අඛණ්ඩව කරගෙන යන ලදී. ඒ අනුව, විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම, මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ගෙවීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති නීතිරීති වලට අනුව ජීවත්වීමේ සහතික ලබා ගැනීමත්, විශ්‍රාම ප්‍රතිලාභීන්ගේ නොයෙකුත් අවශ්‍යතා ඉටුකර දීම සඳහා ඔවුන් සමග ලිපි ගනුදෙනු ගණනාවක් සිදු කිරීමත් වසර පුරා ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

**(ඈ) විදේශ අධ්‍යයන කටයුතු හා පුහුණු සංචාර සඳහා පහසුකම් සැලසීම**

මහ බැංකු සේවා නියුක්තයන්ගේ පශ්චාත් උපාධි කටයුතු සහ රාජකාරි විදේශ ගමන් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී අඛණ්ඩව පහසුකම් සලසන ලදී. මේ යටතේ ලේකම් දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලවලට සහ ඉහත කටයුතු සඳහා විදේශගත වූ සේවා නියුක්තයන්ට අදාළ ගෙවීම් කටයුතු සිදු කරන ලද අතර, විදේශගත වන සේවා නියුක්තයන් සඳහා වීසා ලබා ගැනීමට හැකි වනු පිණිස වීසා ලිපි හා අර්ථසාධක අරමුදල් ශේෂය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම, ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සහ රක්ෂණ ආවරණ ලබා ගැනීම සඳහා සහාය වීම ද සිදු කරන ලදී. කෙසේ වුවද, පසුගිය වසරවලට සාපේක්ෂව මෙම වසර තුළ සිදු කළ විදේස් සංචාර ප්‍රමාණය, පැවති COVID-19 වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් අඩු අගයක් ගනු ලැබීය.

**(ඉ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම**

මහ බැංකුව විසින් එහි ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා යොදා ගනු ලබන සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදයට අනුව, යල්පිනූ, හානි වූ, සේවාකරණය කළ නොහැකි සහ අලුත්වැඩියා කළ නොහැකි වත්කම් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරන ලද අතර මහ බැංකු අත්පොතේ අදාළ විධිවිධානවලට යටත්ව හඳුනාගත් එකී වත්කම් බැහැර කිරීම සිදු කරන ලදී.

**(ඊ) අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම**

2022 අප්‍රේල් 08 දින අධිපති ලේකම් දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් පසු මහ බැංකු අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය සහ සන්ධාන සේවා ලේකම් දෙපාර්තමේන්තුවට අනුබද්ධිත කාර්යාලයක් ලෙස අධිපති ලේකම් කාර්යාලය විසින් සපයන ලදී. ඒ අනුව, අධිපතිතුමාගේ නිළ හමුවීම් සහ රැස්වීම් සංවිධානය දේශන හා ලිපි සඳහා කෙටුම්පත් සකස් කිරීම, අධිපතිතුමාගේ දේශීය සහ විදේශීය නිළ සංචාර සංවිධානය කිරීම, අධිපතිතුමාගේ නිළ උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම සහ මහ බැංකුවේ සහ අධිපතිතුමාගේ විශේෂිත ආරාධිත අමුත්තන් හට අවශ්‍ය සන්ධාන සේවා සැපයීම සිදු කරන ලදී.

## 28. ආරක්ෂක සේවා

1. කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත ඇති වූ විවිධ අභියෝග ජය ගනිමින් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ එහි අනෙකුත් ස්ථාපිත ආයතනයන් ද ඇතුළුව සේවකයින්ට, අමුත්තන්ට, දේපළට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීමේ මෙහෙයුම් කටයුතුවල අඛණ්ඩව වසර පුරා නිරත වෙන ලදී. එසේම, හදිසි තත්ත්වයන් යටතේ මුදල් ප්‍රවාහන කටයුතුවලදී ශ්‍රී ලංකා පොලිසිය සමග සම්බන්ධීකරණය වෙමින් ඒවාට විශේෂ ආරක්ෂාවන් සැපයීම ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී වෙමින් දායකත්වය සපයන ලදී.

**(අ) පද්ධතිය වැඩිදියුණු කිරීම**

වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සහ මහ බැංකු පරිශ්‍රයන්හි පිහිටුවා ඇති සියළුම ගිනි නිවීමේ උපකරණයන්හි මෙහෙයුම් යෝග්‍යතාවය නිරන්තරයෙන් පරීක්ෂා කරමින්, නඩත්තු කිරීම සහ ප්‍රතිස්ථාපනය සිදු කරන ලදී. ගමන් මලු පරීක්ෂණ යන්ත්‍ර, භාණ්ඩ පරීක්ෂා කිරීමේ යන්ත්‍රය ඇතුළු අනෙකුත් සියළුම ආරක්ෂක උපකරණ නඩත්තුව අදාළ සේවා සපයන්නන් සමග සේවා ගිවිසුම් ප්‍රකාරව වසර පුරා සිදු කරන ලදී. ජංගම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ යන්ත්‍ර දෙකක් ආරක්ෂක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අළුතින් හඳුන්වා දෙන ලදී. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් නිසි බලධාරීන් සමග සම්බන්ධීකරණය වෙමින් ඒ සම්බන්ධව අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

**(ආ) නිරීක්ෂණ කටයුතු**

අදාළ වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව, මහ බැංකු මූලස්ථානයට පැමිණි අමුත්තන් 85,299 දෙනෙකුගේ සහ ප්‍රාදේශීය කාර්යාලවලට පැමිණි සියළුම අමුත්තන්ගේ ආරක්ෂාවන් තහවුරු කරන ලදී. වර්ෂය තුළදී මුදල් පෙට්ටි හුවමාරු කිරීම් 30,514 ක් නිරීක්ෂණය කිරීම් සඳහා පහසුකම් සලසා ඇත.

**(ඇ) කොවිඩ් - 19 වැළැක්වීම**

සෞඛ්‍ය බලධාරීන් විසින් හඳුන්වාදුන් මාර්ගෝපදේශ ප්‍රකාරව, කොවිඩ්-19 වැළැක්වීම සඳහා මහ බැංකු පරිශ්‍රයට ඇතුළුවීමට පෙර කාර්ය මණ්ඩලයේ සහ අමුත්තන්ගේ ශරීර උෂ්ණත්වය මැනීම, දර්ශන ගත කිරීම හා තොරතුරු ලේඛනගත කිරීම යනාදී විවිධ ක්‍රියාමාර්ග සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සේවය ලබා දිය නොහැකි කාර්ය මණ්ඩලයන්ට ලිපිලේඛන කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීමට සහාය වන ලදී. එසේම වැඩිදුරටත් බැංකු පරිශ්‍රය තුළ කාර්ය මණ්ඩලය අතර සම්බන්ධතා අවම කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා නව රාජකාරී වාර්තා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

**(ඈ) ආරක්ෂක සේවා පාලනයේ ගුණාත්මකභාවය ඇගයීම**

අළුතින් මිලදී ගන්නා ලද ජංගම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ යන්ත්‍ර පිළිබඳව ආරක්ෂක නිලධාරීන් හට පුහුණු වැඩ සටහනක් පැවැත්වූ අතර, එහි දී නව තාක්ෂණික උපකරණ පරිහරණය පිළිබඳ නිපුනතා වර්ධනය කිරීමට හැකි විය. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සංවිධානය කරන පුහුණු වැඩ සටහන් සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබිණි.

## 29. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ

කාර්යක්ෂම, සෞඛ්‍යසම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යහපැවැත්මට පහසුකම් සැලසීම කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එබැවින් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සුබසාධන පහසුකම් සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ගේ යහපත් කායික හා මානසික සෞඛ්‍යය පෝෂණය කිරීම සඳහා වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව තුල සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් ප්‍රවර්ධනය කරනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුබසාධන ණය ක්‍රමය යටතේ වාහන ණය ඇතුළු ණය ලබාදීම, සේව්‍යදායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් හා ආපනශාලා පහසුකම් සැපයීම යනාදිය දැක්විය හැකිය. කාර්යමණ්ඩලයේ නිවාස, වාහන, වෛද්‍ය සහ අනෙකුත් සුභසාධන අවශ්‍යතා ආවරණය වන මෙම සේවාවන් සේවකයින් ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වන අතර, ඉහළ මට්ටමේ කාර්යක්ෂමතාවකින් යුතුව වැඩ කළ හැකි අභියෝගාත්මක සහ අභිප්‍රේරණය වූ ශ්‍රම බලකායක් ඇතිකරනු ලබයි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යැපෙන්නන්ගේ මෙන්ම විශ්‍රාමිකයන්ගේ වෛද්‍ය අවශ්‍යතා ද වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ආවරණය වනු ලැබේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයෙහි වුවද කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව සුබසාධන පහසුකම් ප්‍රතිලාභීන් වෙත ලබාදීම 2022 වර්ෂය තුළද අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූලව කාර්යමණ්ඩලයට අවශ්‍ය නව සේවාවන් සඳහා

පහසුකම් සැලසීමට පියවර ලෙස එන්නත් ලබා ගැනීමේ වැඩසටහන් මහ බැංකු පරිශ්‍රය තුළ සංවිධානය කරන ලදී. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව කාර්යමණ්ඩලය වෙත නිවාස සහ අනිකුත් සුබසාධන ණය පහසුකම් සැපයීම අබන්ධව සිදු කරන ලද අතර වසර තුළ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සියලුම ප්‍රතිලාභීන් විසින් දරන ලද වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරන ලදී. 2022 වසර අවසාන වන විට සේවා නියුක්තියන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් සහ ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 9,842 ක් පමණ විය. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් මහ බැංකු සේවා නියුක්තියන් වෙත කාර්යාල වේලාවන් තුල දී වෛද්‍ය පහසුකම් සපයන ලද අතර සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් ලබා ගැනීමට පහසුකම් සලසන ලදී. ජනවාරි මාසයේදී වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවා සැපයුම්කරු හරහා ඖෂධාලයක් විවෘත කරන ලදී. සුවපත් සිතක්, කොවිඩ් රෝගය හා හදවත් රෝග, නිරෝගිමත් දරු උපතක් සහ ගෙවතු වගාව යන මාතෘකා යටතේ 2022 වසර තුළදී සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් MS Teams මාර්ගගත ක්‍රමය යටතේ සංවිධානය කර පවත්වන ලදී.

කාර්යමණ්ඩලය වෙත කාර්යාල වේලාවන් තුල දී ආපනශාලා පහසුකම් සැපයීම බාහිරින් ලබාගත් සේවා සපයන්නෙකු හරහා සිදු කරන ලදී. කාර්යමණ්ඩලයට සාධාරණ මිලකට ගුණාත්මක ආහාර පාන සැපයීම සහතික කිරීම සඳහා කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව ආපනශාලා කටයුතු නිරන්තරව අධීක්ෂණය කරන ලදී.

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව කාර්ය මණ්ඩල නිවාස (උකස්) ණය ක්‍රමය, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය සහ දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම සඳහා නව තොරතුරු පද්ධති වැඩිදියුණු කරමින් සිටී.

## 30. සංඛ්‍යාන

2022 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව දත්ත රැස් කිරීමේ දී ඇති වූ අපහසුතා සහ ඇතැම් මාසවල පැවති සංචරණ සීමා වැනි අභියෝග මධ්‍යයේ වුව ද සිය කටයුතු සැලසුම් කළ පරිදි සිදු කරන ලදී.

වසර තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කටයුතු අතරට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී භාවිතා කිරීම සඳහා කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පුරෝකථනය කිරීම, දත්ත පදනම් කරගත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා කාලෝචිත තොරතුරු සැපයීමට දත්ත එක්රැස් කිරීම හා දර්ශක සම්පාදනය කිරීම සහ ප්‍රකාශන හරහා තොරතුරු බෙදා හැරීම ඇතුළත් විය.

### 30.1 ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී භාවිතා කිරීම සඳහා කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) සඳහා දායකත්වය ලබා දෙමින් කෙටිකාලීන උද්ධමනය සහ ද.දේ.නි.හි වර්ධනය පිළිබඳව පුරෝකථන අබණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, විවිධ මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරු උපයෝගී කරගනිමින් සංඛ්‍යානමය ආකෘති සහ දර්ශක පදනම් කරගත් පුරෝකථන සිදු කරන ලදී. මෙම පුරෝකථන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම්වල දී සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද අතර ප්‍රතිපත්ති තීරණ ගැනීමට උපකාරී කරගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

#### 30.1.1. කෙටිකාලීන උද්ධමනය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ ආශ්‍රිත නවතම මිල ප්‍රවණතා සහ අපේක්ෂිත මිල විචලන මෙන්ම ආර්ථිකමිතික ක්‍රමවේද පදනම් කරගනිමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළව කෙටිකාලීන උද්ධමන පුරෝකථන සිදු කරන ලද අතර උද්ධමන පුරෝකථනවල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා සැපයුම සහ ඉල්ලුම යන දෙ අංශයෙන්ම උද්ධමනය මත ඇතිවන බලපෑම පෙන්නුම් කෙරෙන නව විචල්‍ය පිළිබඳව අබණ්ඩව අධ්‍යනය කරමින් කාල ශ්‍රේණි (time series) සහ යන්ත්‍ර ඉගෙනුම් ක්‍රමවේද (machine learning techniques) උපයෝගී කොටගෙන නව උද්ධමන පුරෝකථන ආකෘති ගොඩනැගීමේ ප්‍රයත්නයන්හි ද නිරත වන ලදී.

#### 30.1.2. කෙටිකාලීන දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම

කාර්තුමය වශයෙන් කෙටිකාලීන ද.දේ.නි. වර්ධන වේගයන් පුරෝකථනය කිරීම සඳහා ආකෘති සහ දර්ශක පදනම් කරගත් සංඛ්‍යානමය ක්‍රම භාවිතා කරන ලදී. දර්ශක පදනම් කරගත් පුරෝකථන සඳහා ප්‍රාථමික සහ ද්විතීයික පූර්ව ආර්ථික දර්ශක මෙන්ම සමීක්ෂණ මඟින් ලබාගත් තොරතුරු සමග විශේෂඥ දැනුම භාවිතා කරන ලද අතර, සංඛ්‍යානමය ආකෘති පදනම් කරගත් පුරෝකථන සඳහා ආර්ථිකමිතික ක්‍රම උපයෝගී කරගන්නා ලදී.

### 30.2 දත්ත පදනම් කරගත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා කාලෝචිත තොරතුරු සැපයීමට දත්ත රැස් කිරීම සහ දර්ශක සම්පාදනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, සමීක්ෂණ, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල (CWDCS) සහ වෙනත් ආයතන හරහා දත්ත ලබා ගැනීමේත් ඒවා මගින් දර්ශක සම්පාදනය කිරීමේත් අබණ්ඩව නිරත විය. මෙම දත්ත සහ අදාළ විශ්ලේෂණ ද.දේ.නි./උද්ධමනය පුරෝකථනය කිරීමේ දී භාවිතා කරන ලද අතර තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සලකා බැලීමට කළමනාකාරීත්වයට ද ලබා දෙන ලදී. තවද, මේ අතරින් ඇතැම් තොරතුරු මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

### 30.2.1 සමීක්ෂණ පදනම් කරගත් දත්ත රැස් කිරීම සහ දර්ශක සම්පාදනය කිරීම

#### 30.2.1.1 ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක පිළිබඳ සමීක්ෂණ

ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශක (PMI) පිළිබඳ සමීක්ෂණ, ආර්ථිකයේ තත්කාලීන තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මාසිකව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ, නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් සහ සේවා කටයුතු ආවරණය වන පරිදි ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාතේ කේන්ද්‍රගතව ඇති විශාල සමාගම් ඉලක්කකොටගෙන සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණයන්හි ප්‍රතිඵල, දර්ශක පදනම් කරගත් ද.දේ.නි. පුරෝකථනයේ දී අදාළ ආර්ථික කටයුතුවල මැතකාලීන ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සඳහා පූර්ව දර්ශක ලෙස ද භාවිතා කරන ලදී. තවද, සමීක්ෂණවලින් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව කරන ලද විශ්ලේෂණ, ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට යොදා ගැනීම සඳහා කළමණාකාරීත්වය වෙත වාර්තා කරන ලදී. තවද, ආර්ථික විශ්ලේෂකයින් සහ සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයන්හි ප්‍රතිඵල මාසිකව මාධ්‍ය නිවේදන මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

#### 30.2.1.2 ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

ආර්ථිකයේ පවත්නා සහ අපේක්ෂිත ප්‍රවණතාවන් පිළිබඳව පෙන්නුම් කරන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය 2022 වසර තුළ දී ද කාර්තුමය වශයෙන් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා කටයුතු ආවරණය වන පරිදි විශාල සමාගම් ඉලක්කකොටගෙන සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණයේ සමස්ත ප්‍රතිඵල සහ අනෙකුත් තොරතුරු මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලද අතර සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංඛ්‍යාන ක්‍රමවේද භාවිතා කරමින් ආර්ථික වර්ධනය පුරෝකථනය කරන ලදී. තවද, මෙම සමීක්ෂණයේ සාරාංශගත නිරීක්ෂණ සහ ප්‍රධාන දර්ශක බාහිර පරිශීලකයින්ගේ දැන ගැනීම පිණිස කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

#### 30.2.1.3 සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය

කාර්තුමය සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය හරහා ප්‍රමුඛ සහාධිපත්‍ය ඉදිකරන්නන්ගෙන් තත්‍ය විකුණුම් පිළිබඳ තොරතුරු, මිල උච්චාවචනයවීම් සඳහා හේතු, වත්මන් සහ අපේක්ෂිත ඉල්ලුම, අරමුදල් ව්‍යුහය, පවත්නා හා ඉදිරියේ දී ඉදිවන නිවාස ඒකක සංඛ්‍යාව, එක් එක් ව්‍යාපෘතිවල දනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක සංඛ්‍යාව සහ ගැනුම්කරුවන් පිළිබඳ තොරතුරු ඇතුළු සහාධිපත්‍ය අංශය හා සම්බන්ධ දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මූල්‍ය පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සමීක්ෂණ හරහා රැස් කරගත් තොරතුරු කාර්තුමය වාර්තා මඟින් කළමනාකාරීත්වය වෙත යොමු කරන ලදී. මීට අමතරව, නව සහාධිපත්‍යවල මිල මට්ටමේ සමස්ත වෙනස්වීම් හඳුනා ගැනීමට උපකාරීවන නව සහාධිපත්‍ය සඳහා වන කාර්තුමය මිල දර්ශකයක් සමීක්ෂණය හරහා ලබා ගන්නා ලද විකුණුම් දත්ත මත පදනම්ව සම්පාදනය කරන ලදී. සමීක්ෂණයේ ප්‍රතිඵලවල සාරාංශගත වාර්තාවක් කාර්තුමය පදනමින් මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කිරීම ද සිදු කරන ලදී.

#### 30.2.1.4 උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

තෝරාගත් ආර්ථික නියෝජිත කාණ්ඩ දෙකක, එනම් ආයතනික අංශයේ සහ කුටුම්භ අංශයේ, උද්ධමන අපේක්ෂා පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා මාසිකව උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය 2022 වසරේ දී ආයතනික අංශය සඳහා විද්‍යුත් තැපැල හරහා ද, කුටුම්භ අංශය සඳහා මාර්ගගත ක්‍රමයට ද සිදු කරන ලදී. මාතලේ, අනුරාධපුර, කිලිනොච්චි, ත්‍රිකුණාමලය සහ නුවර එළිය යන ප්‍රාදේශීය කාර්යාල සමග ඒකාබද්ධව, රාජ්‍ය අංශයේ තෝරාගත් ආයතනවල සේවක පිරිසක් සඳහා මෙම සමීක්ෂණය මාර්ගගත ක්‍රමයට පවත්වන ලද අතර මෙහිදී සමීක්ෂණයේ අරමුණ, වැදගත්කම සහ උද්ධමනය පිළිබඳ න්‍යායාත්මක කරුණු පිළිබඳව සහභාගීවන්නන් දැනුවත් කරන ලදී. මීට අමතරව, කුටුම්භ අංශයේ සමීක්ෂණය සඳහා ප්‍රතිචාර, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙලට අයත් ගුරු සමීක්ෂකවරුන්ගෙන් මාසිකව රැස් කරගන්නා ලදී. තවද, 2022 සිව්වන කාර්තුව තුළ පර්යේෂණ ආයතනවල උද්ධමන අපේක්ෂාවන් ග්‍රහණය කර ගැනීමේ බලාපොරොත්තුවෙන් උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය තවදුරටත් පුළුල් කරන ලදී. උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ සොයාගැනීම්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සලකා බැලීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත වාර්තා කරන ලදී.

#### 30.2.1.5 වෙනත් සමීක්ෂණ

ණය වෙළඳපොළේ ඉල්ලුම් සහ සැපයුම් අංශවල ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් ණය ඉල්ලුම සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණ 2022 වසරේදී ද අඛණ්ඩව සිදු කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සමග එක්ව වාර්ෂික සමීක්ෂණයක් ලෙස සිදු කරන ලද අතර මෙහිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක විශේෂයෙන්ම මෙම අනපේක්ෂිත කාලසීමාවේ දී සිය මූල්‍යකරණ අවශ්‍යතා සපුරා ගත් ආකාරය සහ මුහුණ දුන් ගැටලු හඳුනා ගැනීම ද අරමුණු කරගන්නා ලදී. මේ අතර, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂ බැංකු ආවරණය වන පරිදි ණය සැපයුම් ආශ්‍රිත මැතකාලීන ප්‍රවණතා සහ අනාගත අපේක්ෂා පිළිබඳව කාර්තුමය වශයෙන් අධ්‍යනය කිරීමේ අරමුණින් ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සිදු කරනු ලබයි. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී උපයෝගී කරගන්නා ලද අතර, ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල බාහිර පරිශීලකයින්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සිල්ලර වෙළඳාම් අංශයේ ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් සාමාන්‍ය සිල්ලර වෙළඳාම් අංශය සඳහා සිල්ලර විකුණුම්

පරිමා සමීක්ෂණය මාසිකව ද, සුපිරි වෙළඳසැල් අංශය සඳහා සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳ කටයුතු සමීක්ෂණය කාර්තුමය වශයෙන් ද අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල, දර්ශක පදනම් කරගත් ආර්ථික වර්ධනය පුරෝකථන ක්‍රියාවලියට භාවිතා කරන ලදී.

ප්‍රවාහන අංශයේ ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින්, ගොඩබිම ප්‍රවාහන සේවා, ගුවන් ප්‍රවාහන සේවා, වරාය සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය හා ගබඩාකරණ සේවා ආවරණය කෙරෙන ප්‍රවාහන සේවා පිළිබඳ සමීක්ෂණය 2022 වසර තුළදී ද මාසික සමීක්ෂණයක් වශයෙන් අඛණ්ඩව සිදුකරන ලදී. තවද, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණ (IT & BPM) අංශයට අදාළ 2022 වසරේ ප්‍රවණතා මෙන්ම 2023 වසර සඳහා වන අපේක්ෂා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල, විශේෂයෙන්ම ආර්ථික වර්ධනය පුරෝකථනය කිරීම ඇතුළුව, අභ්‍යන්තර ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා කරන ලදී.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ ප්‍රවණතා හඳුනාගැනීම සඳහා රාජ්‍ය අංශයේ මධ්‍යම රජයට හා පළාත් සභා යටතට ගැනෙන සියලුම ආයතන ආවරණය වන පරිදි පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය 2022 වසරේ දී ද පවත්වන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නිතිපතා සිදු කරනු ලබන සමීක්ෂණවලට අමතරව සමස්ත ආර්ථිකය කෙරෙහි හෝ මහ බැංකු කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි හදිසි අනපේක්ෂිත සිදුවීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් විවිධ සමීක්ෂණ ද සිදු කරනු ලබයි. ඒ අනුව, 2022 වසර තුළ දී, වෙනත් පුද්ගලික සේවා පිළිබඳ සමීක්ෂණය, ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් කොවිඩ්-19 සහනදායී ණය යෝජනා ක්‍රමයන්හි ඵලදායීතාව පිළිබඳ සමීක්ෂණය සිදු කරන ලදී.

### 30.2.2 දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල

දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල, 2022 වසර තුළ දී ද, ගුරු සමීක්ෂකවරු 53කගේ සහභාගිත්වයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ හරහා ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ භාණ්ඩ පැසට සමාන භාණ්ඩ පැසක සිල්ලර මිල ගණන් මෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල නිෂ්පාදක මිල, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප්, උද්ධමන අපේක්ෂා සහ තෝරා ගත් භාණ්ඩවල සිල්ලර විකුණුම් පරිමා පිළිබඳ දත්ත රැස්කළ අතර එමඟින් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා උපකාරීවන තත්කාලීන තොරතුරු ලබා දීමට හැකි විය. දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහය ඇතිව, ගුරු සමීක්ෂකවරු විසින් කරනු ලබන දත්ත එක් රැස් කිරීමේ කටයුතු පිළිබඳව විතැන් අධීක්ෂණ සිදු කිරීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මීට අමතරව, දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේ දී ගුරු සමීක්ෂකවරුන් මුහුණ දෙන ගැටළු සාකච්ඡා කොට දත්තවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා වාර්ෂිකව සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා මහ බැංකුවේ විදු පියසෙහි දී පවත්වන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල මඟින් එක්රැස් කරන දත්තවලට අදාළ වාර්තා ජනනය කිරීම ටැබ්ලු (Tableau) මෘදුකාංගය හරහා අඛණ්ඩව සිදු කරන ලද අතර, සතිපතා, මාසිකව සහ කාර්තුමය වශයෙන් එක් රැස් කරන දත්ත/තොරතුරු මිල විචලන සහ උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා යොදා ගන්නා ලදී. මීට අමතරව, පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව තෝරා ගත් අයිතමවල දත්ත සතිපතා එම ආයතනයට ලබා දීම ද 2022 වසර තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමණාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන් හරහා පිටකොටුව වෙළඳපොළ, මරදගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පෑලියගොඩ මත්ස්‍ය වෙළඳසැල්වලින් තොග සහ සිල්ලර මිල ගණන්/තොරතුරු දෛනිකව එක්රැස් කිරීම, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තවද, මෙම මිල තොරතුරුවල සාරාංශය ඇතුළත් වාර්තාවක් දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. මීට අමතරව, ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි තෝරාගත් ආහාර අයිතම කිහිපයක මිල ගණන්, දෛනිකව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දීමට ද කටයුතු කරන ලදී.

තවද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන සුපිරි වෙළඳසැල් දෙකක වෙබ් අඩවිවලින් දිනපතා ලබාගත් ආහාර මිල ගණන් යොදා ගනිමින් පූර්ව දර්ශක සකස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

### 30.2.3 වෙනත් මූලාශ්‍ර හරහා දත්ත රැස් කිරීම සහ දර්ශක සම්පාදනය කිරීම

#### 30.2.3.1 වැටුප් ප්‍රමාණ දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශ සඳහා වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරනු ලබන අතර ආර්ථිකයේ වැටුප් සහ වේතනවල විචලන අධ්‍යනය කිරීම සඳහා ඒවා යොදා ගනු ලබයි. ඒ අනුව, රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ මත පදනම්ව රාජ්‍ය අංශය සඳහා නාමික හා මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක මාසිකව සම්පාදනය කරන ලදී. විධිමත් පෞද්ගලික අංශය සම්බන්ධයෙන් ගත් කළ, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, පඩිපාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක මත පදනම්ව මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක මාසිකව සම්පාදනය කරන ලදී.

මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා කරන මූර්ත සහ නාමික අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල හරහා එකතු කරන ලද වැටුප් තොරතුරු මත පදනම්ව සම්පාදනය කරන ලදී. මෙම

දර්ශකයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීමක් ලෙස, 2012 වශයෙන් පැවති එහි පදනම් වර්ෂය 2018 වශයෙන් 2022 වසරේ දී යාවත්කාලීන කරන ලදී. මෙම වැටුප් ප්‍රමාණ දර්ශක, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සලකා බැලීම සඳහා පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය, මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ දත්ත බෙදා හැරීමේ පද්ධතිය (SDDS) සඳහා ලබා දීමටත් අඛණ්ඩව කටයුතු කරන ලදී.

#### 30.2.3.2 දේපල වෙළඳපොළ දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවිවල පළවන වෙළඳ දැන්වීම්වල දත්ත උපයෝගී කර ගනිමින් කොළඹ දිස්ත්‍රික්කයේ නේවාසික දේපළ (සහාධිපත්‍ය, ඉඩම් සහ නිවාස) සඳහා වන මිල දර්ශක මාසික පදනමින් සම්පාදනය කරන ලදී. 2022 වසරේ පළමු කාර්තුවේ සිට මහ බැංකු වෙබ් අඩවියේ දේපළ වෙළඳපොළ විශ්ලේෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර එහි සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය හරහා රැස් කරන ලද තොරතුරු සහ ඉහත මිල දර්ශක ඇතුළත් වේ.

දේපළ වෙළඳපොළේ වර්ධනයන් තක්සේරු කිරීම සඳහා අර්ධ වාර්ෂික පදනමින් ඉඩම් තක්සේරු දර්ශකය (LVI) සම්පාදනය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. මෙම දර්ශකය නේවාසික, වාණිජ සහ කාර්මික යන ඉඩම් කාණ්ඩ තුනකින් සමන්විත වන අතර එම එක් එක් කාණ්ඩ යටතට ගැනෙන ඉඩම්වල වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද ඉඩම් පර්චසයක් සඳහා ඇස්තමේන්තු කරන ලද මිල මත පදනම් වේ. 2022 වසර තුළ දී ඉඩම් තක්සේරු දර්ශකය පිළිබඳ තොරතුරු මාධ්‍ය නිවේදන දෙකක් හරහා ප්‍රකාශයට පත් කරන ලදී.

### 30.2.4 ප්‍රාදේශීය මට්ටමේ සංඛ්‍යාන සම්පාදනය කිරීම

#### 30.2.4.1 ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය යනු ද.දේ.නි. ඇස්තමේන්තු කිරීමේ දී සලකා බලන අංශවලට අමතරව විශේෂයෙන්ම සමාජ ආර්ථික තත්ත්වයන් සලකමින් රටේ ප්‍රගතිය මැන බැලීම සඳහා මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද බහුමාන දර්ශකයකි. පළාත් මට්ටමේ දත්ත සුදුසු පරිදි භාවිතයෙන් වාර්ෂිකව සම්පාදනය කෙරෙන මෙම දර්ශකය ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන අනු දර්ශක තුනකින් සමන්විත වේ. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් විචල්‍ය 41ක් භාවිතා කරමින් 2021 වසර සඳහා වන ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කර 2022 වසර අග දී ප්‍රකාශයට පත් කරන ලදී.

#### 30.2.4.2 පළාත් දළ දේශීය නිෂ්පාදිතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු, කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අදාළ සුදුසු විචල්‍යයන් පළාත්වලට බෙදීමෙන් 2021 වසර සඳහා වන පළාත් දළ දේශීය නිෂ්පාදිතය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මෙම ඇස්තමේන්තු මාධ්‍ය නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ඇස්තමේන්තු මගින් ජාතික දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් පළාතේ දායකත්වය පිළිබඳ දළ තක්සේරුවක් සපයනු ලබන අතර එය පළාත් අතර සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳව තීරණය කිරීමට රාජ්‍ය බලධාරීන්ට ප්‍රයෝජනවත් වේ.

### 30.2.5 ශ්‍රම වෙළඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව මෙන්ම අනෙකුත් විශ්වසනීය දත්ත සපයන්නන්ගේ දත්ත සහ තොරතුරු මත පදනම්ව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම බලකාය, සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට අදාළව සමස්ත ශ්‍රම වෙළඳපොළ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙම විශ්ලේෂණ මත පදනම්ව, ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා කළමණාකාරීත්වය වෙත කාර්තුමය වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

## 30.3 තොරතුරු බෙදා හැරීම

දත්ත රැස්කිරීමේ දී මුහුණ පෑමට සිදු වූ අභියෝග මධ්‍යයේ නිල සංඛ්‍යාන දත්ත නිතිපතා බෙදා හැරීම 2022 දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉලෙක්ට්‍රොනික ක්‍රමවලින් සිදු කරන ලදී. ඒ අනුව, වාර්ෂික සංඛ්‍යාන ප්‍රකාශන, 'ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2022 - XLIV වෙළුම' සහ 'ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2022 - XLV වෙළුම' නිකුත් කරන ලදී. තවද, විනිමය අනුපාත, මුදල් වෙළඳපොළ අනුපාත, කොටස් වෙළඳපොළ සහ බලශක්ති අංශයේ සංඛ්‍යාන ඇතුළත් දෛනික ආර්ථික දර්ශක නිකුත් කිරීම සහ තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල දෛනික මිල වාර්තාව නිකුත් කිරීම සිදු කරන ලදී. සතිපතා සහ මාසික ආර්ථික දර්ශක ද නිසි පරිදි වසර පුරා මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා පිළිබඳ වාර්තාවේ පරිච්ඡේද දෙකකට දායක වන අතරම ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික ප්‍රකාශනය සඳහා ද අඛණ්ඩව දත්ත සපයන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගගත දත්ත ගබඩාව වන 'දත්ත පුස්තකාලය,' පර්යේෂකයන්ගේ සහ අනෙකුත් බාහිර පාර්ශ්වකරුවන්ගේ දත්ත අවශ්‍යතා සපුරාලන පරිදි යාවත්කාලීන කොට පවත්වාගෙන යෑම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

# 31. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි සහ 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතෙහි දක්වා ඇති විධිවිධානයන් යටතේ පිළිවෙළින් බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය

ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බලතල පැවරී ඇත. මීට අමතරව, 2009 අංක 01 දරන සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග හා 2009 අංක 01 දරන සංශෝධිත දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරයි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යයන් යටතට බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතනවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) හා අඛණ්ඩ සුපරීක්ෂණ (විතැන් පරීක්ෂණ) සිදු කිරීම ඇතුළත් වන අතර, නියාමන කාර්යයන් යටතට බලපත්‍ර/ලියාපදිංචි සහතික නිකුත් කිරීම, විචක්ෂණ නියාමනයන් ක්‍රියාත්මක කිරීම හා නියාමන අනුමැතීන් ලබා දීම සහ අනවසර මුදල් ව්‍යාපාර කටයුතු සිදු කරන ආයතන පිළිබඳ විමර්ශනය කිරීම ඇතුළත් වේ. මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, අධිකරණ කාර්යයන් සඳහා මැදිහත් වීම සහ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම වැනි විවිධ කාර්යයන්වල ද නිරත වේ.

2022 වසර අවසානය වන විට, බැංකු නොවන මූල්‍ය ආයතන අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 37කින්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 1කින්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් 4කින් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 7කින් සමන්විත විය. තවද, බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ඇතුළුව, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 54ක් කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කර ඇත. එම බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල නාම ලේඛනය මෙම කොටස අවසානයේ දක්වා ඇත.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී සිදු කරන ලද කාර්යයන්හි සාරාංශය පහත දක්වා ඇත.

## 31.1 ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

### (අ) විචක්ෂණ නියාමන නිකුත් කිරීම

2022 වසර තුළ දී, වත්මන් වෙළෙඳපොළ සහ ජාත්‍යන්තර විශිෂ්ඨ භාවිතයන්ට අනුකූලව බැංකු නොවන මූල්‍ය ආයතනවල පවතින නියාමන රාමුව විධිමත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන සහ මෙම අංශයේ අදාළ ඇල්මැති පාර්ශ්වයන්ගේ උපදෙස් ද ලබා ගනිමින් විචක්ෂණ නියාමන කිහිපයක් නිකුත් කරන ලදී. පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ගන්නා ලද සුවිශේෂ ක්‍රියාමාර්ග ද ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත වසර තුළ නිකුත් කරන ලද එවැනි විචක්ෂණ නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසේ දැක්වේ. 2022 වසර තුළ දී නිකුත් කරන ලද එම ප්‍රධාන විචක්ෂණ නියාමනයන්ගේ සාරාංශයක් පහතින් දක්වා ඇත.

i. තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව.

ii. විදෙස් රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මත ලබා දෙන දිරි දීමනාව.

iii. ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් පිළිබඳ විධානය.

iv. තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාතික සංශෝධනය කිරීම.

v. ක්ෂුද්‍රමූල්‍ය ණය මත උපරිම පොලී අනුපාතිකය ඉවත් කිරීම.

vi. වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් තම ආදායම හෝ ව්‍යාපාර අහිතකර බලපෑම්වලට ලක් වී ඇති ණය ගැනුම්කරුවන් වෙත සහන ලබා දීම.

vii. බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම.

viii. තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ.

### (ආ) මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල සුපරීක්ෂණය, නියාමනය සහ නිරාකරණ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම සහ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරවල තිබෙන අක්‍රමිකතාවන් සඳහා පිළියම් යෙදීමට කල්බදු මූල්‍යකරණ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වී සිටියි.

### (ඇ) බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීම සඳහා වන ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම

i. බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය තුළ පවතින දුර්වලතා සහ අවදානම් නිරාවරණයට පිළියම් යෙදීම සඳහා, මෙම වැඩපිළිවෙළ 2020 වසරේ දී හඳුන්වා දෙන ලදී.

ii. ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි 1 වන අදියර යටතේ, මෙම වසර තුළ දී ගනුදෙනු 5ක් සම්පූර්ණයෙන් නිම කරන ලදී. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගම, කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග, කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග සහ ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එච් එන් බී ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ කිරීම මෙම වසර තුළ දී සම්පූර්ණ කරන ලදී. ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (මින් පෙර ඇසට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් ලෙස හැඳින්වූ) සහ එස් එම් බී ෆිනෑන්ස් පීඑල්සී (මින් පෙර එස් එම් බී ලීසිං පීඑල්සී ලෙස හැඳින්වූ) වෙත

නව මුදල් ව්‍යාපාර බලපත්‍ර නිකුත් කරන ලදී. තවද, 2022 වසරේ දී මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම වැඩපිළිවෙළ යටතේ යෝජිත ඒකාබද්ධ කිරීම් ත්‍රිත්ත්වයක් (03) වර්තමානයේ දී ක්‍රියාත්මක කෙරෙමින් පවතියි.[1]

iii. තවද, මෙම ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ඒකාබද්ධ කිරීමේ හවුල්කරුවෙකු සොයා ගැනීමට නොහැකි වූ සමාගම්වලට, බලපත්‍රය අහෝසි කිරීම මත වෙළෙඳපොළෙන් නික්ම යාමට යොමු කරන ලදී. ඒ අනුව, මුදල් ව්‍යාපාර පනතෙහි 37 (3) වගන්තිය ප්‍රකාරව, ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය අවලංගු කර ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතෙහි 25 (1) (ක) වගන්තිය ප්‍රකාරව, කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගමට එහි මහජන වගකීම් සම්පූර්ණයෙන් නැවත ගෙවීමට කටයුතු කරන ලෙස නියෝග කිරීමට තීරණය කරන ලදී.

## 31.2 බලපත්‍රලාභී සමාගම් අධීක්ෂණය කිරීම

### (අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) පැවැත්වීම

i. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් 13ක සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 4ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කරන ලදී. ඉපැයීම් සහ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම, ණය කළඹ සංකේන්ද්‍රණය වීමේ අවදානම්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇතුළුව යහපාලන ආකෘතීන්වල පවතින දුර්වලතා, අවදානම් කළමනාකරණයේ දුර්වලතා, එවැනි කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීමට ප්‍රමාණවත් සම්පත් නොමැතිවීම ඇතුළුව අභ්‍යන්තර විගණන සහ අනුකූලතා කාර්යයන්හි දුර්වලතා සහ නියාමන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයා ගැනීම් විය.

ii. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල පවත්වන ලද පරීක්ෂණ අතරතුර දී හඳුනා ගන්නා ලද සුපරීක්ෂණ ගැටලු නිවැරදි කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්දේශ සහ ක්‍රියාකාරී සැලසුම් අදාළ සමාගම් වෙත අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනුම් දෙන ලදී.

iii. තවද, හානිකරණ ආදර්ශකය තක්සේරු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් 12ක, සහ නියාමන තොරතුරු ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා යොමු කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් 10ක ස්ථානීය පරීක්ෂණ ඇතුළුව ස්ථානීය පරීක්ෂණ 25ක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

[1] පසුව එල් ඕ එල් සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2023.01.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී.

### (ආ) අඛණ්ඩ සුපරීක්ෂණ (විතැන් පරීක්ෂණ) සිදු කිරීම

i. සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්/බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු පදනම් කර ගනිමින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා ඇතුළුව වෙනත් මූල්‍ය තොරතුරු ද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කරන ලදී. මෙම සමාලෝචනයන් මගින් පූර්ව අනතුරු කල්තියා හඳුනා ගැනීමේ දර්ශකයන් සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය හරහා ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ හානිකරණය ආදී බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

ii. අඛණ්ඩ පරීක්ෂණයන් තුළින් හෙළිදරව් වූ බරපතලභාවය සහ ප්‍රමුඛ ඇගයීම පදනම් කොටගෙන පැහැදිලිව නියම කර ඇති කාල රාමුවක් තුළ අධීක්ෂණ අවශ්‍යතා නිවැරදි කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

iii. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය ඉහළ නැංවීමට, හිමිකාරීත්වය වෙනස් කිරීමට, නව ආයෝජකයන් හරහා ප්‍රාග්ධනය ආයෝජනයට, සාංසමික ව්‍යවස්ථාවලීන් සංශෝධනය කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, වාර්ෂික ශාඛා පුළුල් කිරීමේ සැලසුම්, ප්‍රචාරණ දැන්වීම් සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සහ නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට නියාමන අනුමැතීන් 1180ක් ලබා දෙන ලදී.

iv. එතැන් පරීක්ෂණ මගින් හඳුනාගත් ප්‍රධාන සුපරීක්ෂණ ගැටලු නිවැරදි කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පසු විපරම් කර බැලීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

v. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව මහජනයාගෙන් ලැබී ඇති පැමිණිලි 258ක් විසඳීමට මැදිහත් වී තිබෙන අතර, ඉන් විශාල ප්‍රමාණයක් ප්‍රතිපත්තිමය කරුණු සහ බලපත්‍ර අවලංගු කළ මුදල් සමාගම්වලට අදාළ වේ.

## 31.3 නියාමන සහ නිරාකරණ ක්‍රියාමාර්ග

විචක්ෂණ විධානවලට අනුකූල නොවන සමාගම් මත නියාමන ක්‍රියාමාර්ග කඩිනම් ආකාරයකින් ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍රය අවලංගු කර ඇති හෝ අත්හිටුවා ඇති සමාගම් මත ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම, 2022 වසර තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ විය. ඒ අනුව, මේ සම්බන්ධව පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

i. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව හා අනුකූලව, ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල නොවූ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පතු, ණය දීම් සහ ණය ගැනීම් පිළිබඳ සීමා පැනවීම ඇතුළුව නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කරන ලදී.

ii. 2022 වසර තුළ දී, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් සමාගමෙහි ව්‍යාපාර කටයුතු තාවකාලිකව අත්හිටුවීම 2022.01.05 සහ 2022.07.05 යන දිනවල දී දෙවරක් දීර්ඝ කරන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් පවතින විමර්ශන කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යෑම සඳහා 2023.01.05 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා මෙම අත්හිටුවීම බලපැවැත්වේ.

iii. බලපත්‍ර අවලංගු කර හෝ අත්හිටුවා ඇති සමාගම් තුළ පවතින ගැටලුවලට අදාළව, බලපත්‍රලාභී මුදල් සමාගම්වල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ පත් කළ කළමනාකරණ මණ්ඩල සමග ද රැස්වීම් පවත්වන ලදී.

## 31.4 මහජනයා දැනුම්වත් කිරීම සහ ශක්‍යතාව වැඩිදියුණු කිරීම

**i මහජනතාවට හෙළිදරව් කිරීම**

විචක්ෂණශීලී ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල නොවන සහ නියාමන සීමාවන්ට යටත්ව ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

**ii ශක්‍යතාව වැඩිදියුණු කිරීම**

බැංකු විදු පියසේ පැවති පුහුණු වැඩමුළු ද ඇතුළුව පුහුණු වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්පත් දායකත්වය අඛණ්ඩව ලබා දෙන ලදී.

**iii බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ වෙනත් සම්බන්ධිත පාර්ශ්වයන් සමග පැවති රැස්වීම්**

ආර්ථිකමය කරුණු සහ නියාමන වර්ධනයන් සම්බන්ධව අදහස් හුවමාරු කිරීම සඳහා අවස්ථාවක් සැලසීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සභාපතිවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සමග බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැස්වීම් පවත්වන ලදී. මීට අමතරව, සමස්තයක් ලෙස දෙපාර්තමේන්තුව විසින් එක් එක් බලපත්‍රලාභී ආයතනයට/අංශයට අදාළ ගැටලු සාකච්ඡා කිරීමට සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළව පවතින ගැටලු සාකච්ඡා කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් /විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ෆිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් (Finance House Association), ලීසිං ඇසෝසියේෂන් (Leasing Association), බාහිර විගණකවරුන් සහ ජාත්‍යන්තර නියෝජිත ආයතන සමග අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.

**iv මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුව, සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි වෙනත් දෙපාර්තමේන්තු වෙතින් ලද ඉල්ලීම් අනුව අවශ්‍ය වූ විට ඒ සඳහා දායකත්වය ලබා දෙන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් "අනවසර මුදල් තැන්පතු භාර ගන්නා ආයතන සහ පුද්ගලයන්ගෙන් ප්‍රවේශම් වෙමු" යන මාතෘකාවෙන් පුවත්පත් ලිපියක් ප්‍රකාශයට පත් කරනු ලැබූ අතර, මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක් ප්‍රාදේශීය මට්ටමින් පවත්වන ලද අතර අනවසර මුදල් ව්‍යාපාරවල අවදානම් සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන් 5කට සහභාගී වන ලදී.

## 31.5 අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධව සිදු කරන විමර්ශන

2022 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණු පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව අනවසර තැන්පතු රැස් කිරීම සහ මුදල් ව්‍යාපාර කටයුතු පිළිබඳව විමර්ශන 125ක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. තවද, 2022 වසර තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය විසින් විමර්ශන 04කට අදාළව මුදල් ව්‍යාපාර පනතේ 44 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අත්හිටු වීමේ නියෝග සඳහා කොළඹ මහාධිකරණයෙන් දීර්ඝ කිරීම් ලබා ගන්නා ලදී. එමෙන්ම, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය විසින් විමර්ශන සිදු කිරීමට යටත්ව, ආයතන හතරක සම්බන්ධිත පාර්ශ්වයන්ගේ විදේශ සංචාර වළක්වාලීම සඳහා අදාළ මහේස්ත්‍රාත් අධිකරණවලින් උසාවි නියෝග ලබා ගන්නා ලදී.

**II- 23 සංඛ්‍යා සටහන**

**2022 වසර තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යය විස්තර**

| කාර්යය | සංඛ්‍යාව |
|---|---|
| නියාමන අනුමැතීන් | 1180 |
| හසුරවනු ලැබූ පාරිභෝගික පැමිණිලි | 258 |
| බාහිර පාර්ශ්වයන් සමග පැවැත්වූ රැස්වීම් | 103 |
| විතැන් පරීක්ෂණ වාර්තා | 542 |
| අනවසර මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය | 125 |
| ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) | 17 |
| ස්ථානීය පරීක්ෂණ | 25 |
| මුදල් මණ්ඩලය වෙත යොමු කළ මුදල් මණ්ඩල පත්‍රිකා | 97 |
| හසුරවනු ලැබූ තොරතුරු දැන ගැනීමේ අයිතියට අදාළ ඉල්ලීම් | 35 |

**ඇමුණුම II- 4**

## 2022.12.31 දිනට බලයලත් මූල්‍ය ආයතන

(2022 වර්ෂය අවසානය වන විට)

| බලපත්‍රලාභී මුදල් සමාගම් | | | |
|---|---|---|---|
| 1 | අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී | 20 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී(ඒ) |
| 2 | ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (අ) | 21 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 3 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී | 22 | මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී(ඓ) |
| 4 | ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ආ) | 23 | මල්ටි ෆිනෑන්ස් පීඑල්සී(ඔ) |
| 5 | එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී (ඇ) | 24 | මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්(ඕ) |
| 6 | එල්බී ෆිනෑන්ස් පීඑල්සී | 25 | යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් |
| 7 | එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (ඈ) | 26 | රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්(ඖ) |
| 8 | එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (ඉ) | 27 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී(ක) |
| 9 | එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී | 28 | වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී |
| 10 | එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී (ඊ) | 29 | සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී(ග) |
| 11 | ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 30 | සියපත ෆිනෑන්ස් පීඑල්සී |
| 12 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී | 31 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී |
| 13 | ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 32 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී |
| 14 | කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් (උ) | 33 | සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී |
| 15 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 34 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 16 | ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී | 35 | සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ් |
| 17 | නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී (ඌ) | 36 | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී(ච) |
| 18 | පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී (එ) | 37 | ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 19 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | | |

**ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන**

| (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු | | (ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
|---|---|---|---|
| 1 | අමානා බැන්ක් පීඑල්සී | 1 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 2 | එම්සීබී බැන්ක් ලිමිටඩ් | 2 | ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් |
| 3 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 3 | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 4 | ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී | 4 | සණස සංවර්ධන බැන්ක් පීඑල්සී |
| 5 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී | | |
| 6 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී | | |
| 7 | පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී | | |
| 8 | යූනියන් බැන්ක් ඔෆ් කොළම්බෝ පීඑල්සී | | |
| 9 | ලංකා බැංකුව | | |
| 10 | සම්පත් බැන්ක් පීඑල්සී | | |
| 11 | සෙලාන් බැන්ක් පීඑල්සී | | |
| 12 | හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | | |

| (ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම් | | | |
|---|---|---|---|
| 1 | අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී | 22 | මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (ඓ) |
| 2 | ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (අ) | 23 | මල්ටි ෆිනෑන්ස් පීඑල්සී (ඔ) |
| 3 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී | 24 | මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් (ඕ) |
| 4 | ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ආ) | 25 | යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් |
| 5 | එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී (ඇ) | 26 | රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් (ඖ) |
| 6 | එල්බී ෆිනෑන්ස් පීඑල්සී | 27 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී (ක) |
| 7 | එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (ඈ) | 28 | වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී |
| 8 | එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (ඉ) | 29 | සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (ග) |
| 9 | එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී | 30 | ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් පීඑල්සී (ජ) |
| 10 | එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී (ඊ) | 31 | සියපත ෆිනෑන්ස් පීඑල්සී |
| 11 | ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 32 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී |
| 12 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී | 33 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී |
| 13 | ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 34 | සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී |
| 14 | කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් (උ) | 35 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 15 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 36 | සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ් |
| 16 | ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී | 37 | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී (ච) |
| 17 | නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී (ඌ) | 38 | ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 18 | පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී (එ) | | |

| | | | |
|---|---|---|---|
| 19 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | **(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්** | |
| 20 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී (ඒ) | 1 | කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ් |
| 21 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | | |

**බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්**

| | | | |
|---|---|---|---|
| 1 | දුම්බර මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ් | 3 | ලක් ජය මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ් |
| 2 | බෙරෙන්ඩිනා මයික්‍රො ඉන්වෙස්ට්මන්ට් කම්පැනි ලිමිටඩ් | 4 | සේජය මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ් |

**ප්‍රාථමික අලෙවිකාර සමාගම්**

| | | | |
|---|---|---|---|
| 1 | ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් | 5 | පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්(ඩ) |
| 2 | එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 6 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් |
| 3 | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී(ට) | 7 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී |
| 4 | කැපිටල් එලායන්ස් පීඑල්සී | | |

(අ) ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ඇසට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනය, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් ලෙස 2022.08.29 දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍ර ලබා ඇත. ඒ අනුව එහි නාමය ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 31(5)(ආ) වගන්තිය ප්‍රකාරව ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය ගණන් බේරා වසාදැමීම සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබීමට සැලැස්වීම සඳහා තීරණය කරන ලදී.

(ඇ) ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2022.05.12 දින සිට බලපැවැත්වෙන පරිදි එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ කරන ලදී.

(ඈ) එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2023.01.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී.

(ඉ) කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2022.03.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී. තවද එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2023.01.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී.

(ඊ) එස්එම්බී ලීසිං පීඑල්සී ආයතනය ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ 2022.12.01 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී මුදල් සමාගමක් ලෙස 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලබා දී ඇත. ඒ අනුව, එහි නාමය එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(උ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට නොහැකි වීම හේතුවෙන් ණය නිකුත් කිරීමේ සහ තැන්පතු භාර ගැනීමේ සීමාවන් පනවා ඇත. තවද, නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන වැඩපිළිවෙල යටතේ කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් සහ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී අතර යෝජිත ඒකාබද්ධ කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් කොන්දේසි කිහිපයක් සපුරාලීමේ අවශ්‍යතාවට යටත්ව අනුමැතිය ලබා දී ඇත. තවද, යෝජිත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව අවසන් වූ පසු, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය ව්‍යාපාර කටයුතුවල රැඳී සිටිනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙත එම ආයතනයේ සියලු මහජන වගකීම් (තැන්පතු සහ පොරොන්දු නෝට්ටු) 2022.12.26 සිට 2023.02.28 කාලසීමාව තුළදී සම්පූර්ණයෙන්ම නැවත ගෙවීමට කටයුතු කරන ලෙසට විධාන ලබා දී ඇත.

(ඌ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය වර්ග කිහිපයක් ලබා දීම සහ නව තැන්පතු භාර ගැනීම අත්හිටුවා ඇත. කොන්දේසි කිහිපයක් සපුරාලීමට යටත්ව නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීම සඳහා ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් සහ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී අතර යෝජිත ඒකාබද්ධ කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මෙම යෝජිත ඒකාබද්ධ කිරීම සාර්ථකව නිමා කිරීමෙන් පසු, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය ඉතිරිව පවතින ආයතනය වනු ඇත.

(එ) පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයෙහි නාමය 2022.10.21 දින සිට බලපැවැත්වෙන පරිදි පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ඒ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, නව ණය මුදල් ලබා දීම හෝ නව තැන්පතු භාර ගැනීම අත්හිටුවා ඇත. එම සමාගම විසින් 2022.06.03 දින සිට බලපැවැත්වෙන පරිදි එහි තැන්පතු ආපසු ගෙවිය යුතු වේ.

(ඓ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය ලබා දීම, තැන්පතු සහ උපරිම පොලී අනුපාතිකය පිරිනැමීම මත සීමා පනවා ඇත.

(ඔ) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය දීම් සහ තැන්පතු මත සීමා පනවා ඇත. තවද, ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ මෙම සමාගම එල්බී ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියක පවතියි.

(ඕ) 2022.01.28 දින සිට බලපැවැත්වෙන පරිදි අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත.

(ඖ) රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ඇති 2017 අංක 02 දරන අවම මූලික ප්‍රාග්ධනය හා 2018 අංක 03 දරන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා විධාන සමග පිළිවෙලින් 2022.10.31 හා 2022.11.30 යන දිනයන්හි සිට අනුකූල නොවුවද, පසුව 2023.01.31 දින එම ආයතනය විසින් ඉහත සඳහන් කරන ලද විධාන සමග අනුගත වී ඇත.

(ක) ඒකාබද්ධකරණ වැඩපිළිවෙල යටතේ සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් 2022.01.21 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ග) ඒකාබද්ධකරණ වැඩපිළිවෙල යටතේ සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් 2022.01.06 දින සිට බලපැවැත්වෙන පරිදි සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ච) මෙම සමාගමට නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය ලබා දීම, තැන්පතු සහ උපරිම පොලී අනුපාතිකය පිරිනැමීම මත සීමා පනවා ඇත. නව තැන්පතු භාර ගැනීම 2022.08.12 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවා ඇත.

(ජ) ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය 2022.12.28 වන දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කර ඇති අතර, එම ආයතනය ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීම 2023.01.18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කර ඇත.

(ට) 2017.07.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවා ඇත.

(ඩ) 2017.07.06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අත්හිටුවා ඇති අතර, මෙම අත්හිටුවීම 2023.07.05 දින දක්වා ක්‍රියාත්මක වේ.